සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
ஊழியர் நம்பிக்கைப் பொறுப்பு நிதியச் சபை
Employees' Trust Fund Board



# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT 2024

## Innovation in a Sustainable Journey

# තිරසර ගමනක

## නවෝත්පාදනය

නිරන්තරයෙන් වෙනස් වන ලෝකයක, විවිධ අභියෝගයන්ට මුහුණ දෙන සමාජ ආරක්ෂණ පද්ධතිවල හෙට දවසේ සුරක්ෂිතතාවය තහවුරු කිරීම අත්‍යාවශ්‍ය සාධකයක් වී ඇත. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මේ වසරේ වාර්ෂික වාර්තාවේ පදනම වන්නේ තිරසර ගමනට නවෝත්පාදනය යන්නයි. වර්තමාන සහ අනාගත පරම්පරාවන්ගේ යහපැවැත්ම ආරක්ෂා කිරීම සඳහා තාක්ෂණය, උපාය මාර්ගික ප්‍රතිසංස්කරණය සහ අනුවර්තන ප්‍රතිපත්ති උපයෝගී කර ගැනිම අපගේ නිරන්තර අපේක්ෂාව වේ.

සමාජ ආරක්ෂණය තවදුරටත් සාම්ප්‍රදායික ක්‍රම වලින් ආවරණය කිරීම අසීරු කටයුත්තකි. එය අපේක්ෂා කරන අභියෝග බාධාවකින් තොරව ජයගැනිමට ඩිජිටල් පරිවර්තන වැලඳ ගැනිම සහ දිගුකාලීන තිරසාර භාවය සහතික කිරීම වැනි නව්‍ය විසදුම් කෙරෙහි නැඹුරු විය යුතුමය. අසීරුතාවයන්ගෙන් තොරව සේවා සැපයීමත්, අරමුදල දිර්ඝ කාලීනව සුරක්ෂිත කිරීමත්, තිරසාර ආයෝජන උපාය මාර්ග ශක්තිමත් කිරීම තුලින් සිදුකල හැක. අපගේ සාමාජික පදනම පුළුල් කිරීමෙන්, අරමුදලේ ප්‍රතිලාභ පුළුල් සේවක පිරිසකට ව්‍යාප්ත කිරීමේ අපේක්ෂාවද නවොත්පාදන ක්‍රම හරහා ඉටුකරගත හැකිය.

සාමාජික ප්‍රජාව තුල විශ්වසනීයත්වය ඇති කිරීම සදහා එය මහඟු පිටුවහලක් වේ. පීඩාකාරී වැඩ පරිසරයෙන් මිදී නැවුම් අත්දැකීම් තුලින් කාර්ය සාධනය හා සුහදශීලී සේවක පිරිසක් නිර්මාණය වේ. අපගේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ සමස්ත සාමාජිකයන්ට උසස් සේවයක් සැපයීම හා සේවය අවසාන කිරිමේදි මූල්‍ය සුරක්ෂිත භාවයයි. ඒ යන අභිමානවත් ගමනේදි නවෝත්පාදනය කෙරෙහි නැඹුරු නොවන්නට අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම අසීරු වනු ඇත.

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලෙහි ප්‍රමුඛතම අරමුණ වනුයේ, එහි සාමාජික සාමාජිකාවන්ගේ වෘත්තිය ජීවිතය අවසානයේ දී ඔවුන් විෂයයෙහි මූල්‍ය සුරක්ෂිතභාවය සහතික කිරීමයි. මෙම අරමුණ ඉෂ්ටසිද්ධ කරනු පිණිස අරමුදල පහත සඳහන් ආකාරයෙන් කටයුතු කිරීමට අපේක්ෂා කරයි:

(අ) මූල්‍යකරණය සහ ආයෝජනය මඟින් සේවක හිමිකාරත්වය, සුභසාධනය සහ ආර්ථික ප්‍රජාතාන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීම;

(ආ) කොටස් හිමිකම හරහා කළමනාකරණය තුළ සේවක සහභාගිත්වය දිරිමත් කිරීම;

(ඇ) සේවක දායකත්වය රහිත විශ්‍රාම ප්‍රතිලාභ ලබා දීම;

(ඈ) මෙම පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම.

© සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

# පටුන


## 004
**අපගේ 44 වන වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම**

005 අන්තර්ගතය
006 අප කවුරුන්ද යන වග
007 ප්‍රධාන මූල්‍ය තත්ත්වයන්
008 ප්‍රධාන සන්ධිස්ථාන
010 අගය නිර්මාණය කිරීමේ මාදිලිය
012 මණ්ඩලයේ කොට්ඨාශ/ අංශ/ ඒකකවල කාර්යයන්
014 කාර්ය සාධන සමාලෝචනය

## 016
**ආයතනික භාරකාරීත්වය**

017 සභාපතිවරයාගේ සමාලෝචනය
021 කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ
038 අධ්‍යක්ෂ මණ්ඩලය
043 ජ්‍යෙෂ්ඨ කළමනාකාරිතවය
048 කළමනාකාරීත්ව කණ්ඩායම
050 ආයතනික පාලනය
055 අනු කමිටු
060 අවදානම් කළමනාකරණය

## 067
## මූල්‍ය තොරතුරු


068 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
070 මූල්‍ය තත්ව ප්‍රකාශය
071 ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය
073 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
074 භාණ්ඩාගාර බැදුම්කර කළඹේ වෙළෙඳපොළ අගය
076 ලැයිස්තුගත ණයකර කළඹේ වෙළෙඳපොළ අගය
077 ස්කන්ධ අයෝජන ප්‍රකාශය
081 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති


## 118
## අතිරේක තොරතුරු


115 විගණකාධිපති වාර්තාව 2024
123 විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් මණ්ඩලීය නිරීක්ෂණ
411 දස වසරක සංක්ෂිප්තය
412 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
413 සංඛ්‍යා ලේඛණ ඇමුණුම්
416 අපේ ළඟාවීම්

# 44 වන
# වාර්ෂික වාර්තාව
## පිළිබඳ හැඳින්වීම

# **වාර්ෂික වාර්තාවේ**
# අන්තර්ගතය

වාර්තාවේ අන්තර්ගතයමෙය සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 44 වන වාර්ෂික වාර්තාව වන අතර, මෙමගින් ආයතනය 2024 වසරේදී එහි ප්‍රතිලාභීන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ට වටිනාකමක් ලබා දී ඇති ආකාරය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සපයයි.

2024 වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය 2024 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ප්‍රධාන කාර්යාලය සහ ශාඛා ජාලය පුරා ක්‍රියාත්මක වන මෙහෙයුම් ආවරණය කරයි. නවතම වාර්තාව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන අතර, ඒ සඳහා මෙම වාර්තාව පුරාම සංසන්දනාත්මක තොරතුරු ලබා දී ඇත. මෙම වාර්තාවේ අන්තර්ගතය සංවිධානයට මෙන්ම එහි ප්‍රධාන පාර්ශවකරුවන්ට ද වැදගත් වන කරුණු අවධාරණය කරමින් සංවර්ධනය කර ඇත.

## වාර්තාවේ අරමුණ

අපගේ අනර්ඝ පාර්ශවකරුවන් සමඟ කෙටිකාලීන, මධ්‍යම හා දිගුකාලීනම වටිනාකම් නිර්මානය කිරීමේ අද්වීතීය කාර්යභාරය බෙදාහදා ගැනීම මෙම වාර්තාව ඉදිරිපත් කිරීමේ අරමුණයි. එමෙන්ම එමගින් උපාය මාර්ග, පාලනය සහ අරමුදල් කළමනාකරණය පිළිබඳ සංක්ෂිප්ත සන්නිවේදනයක්ද ඉදිරිපත් කරන අතර, එහි මූල්‍ය කාර්ය සාධනය සහ සංවිධානය විසින් නිර්මාණය කරන ලද සමාජමය මං සලකුණු අතර සම්බන්ධතාවයද පෙන්නුම් කරයි.

වාර්තාව ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත වලින් සමන්විත වන අතර සැසැඳීම් සහ වැඩිදුර විශ්ලේෂණයන් සඳහා පහසුකම් සැපයීම සඳහා හැකි සෑම තැනකම ප්‍රමාණාත්මක දත්ත සැපයීම අපගේ අරමුණයි. මූල්‍ය ප්‍රකාශන සහ අදාළ සටහන් රජයේ විගණක විසින් විගණනය කරනු ලබන අතර සහතික කිරීමේ වාර්තාවද මෙම වාර්තාව තුළ ඇත.

## වාර්තාවේ අනුකූලතාවය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ හොඳම චර්යා ආචාර ධර්ම සංග්‍රහය හා 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනත සමඟ ආයතනය අනුකූල වන්නේ කෙසේද යන්න පිළිබඳව පාලන වාර්තාව සාකච්ඡා කරයි.

## උපාය මාර්ගික දිශානතිය

වසර පුරා කාර්ය සාධනය කෙරෙහි අවධානය යොමු කිරීමට අමතරව, මෙම වාර්ෂික වාර්තාව පාර්ශවකරුවන්ගේ අභිවෘධිය සඳහා මණ්ඩලයේ වත්මන් සහ අනාගත කාර්යයන් පිළිබද අවබෝධයක් ලබාදෙයි.

**විමසීම් කලයුතු නිලධාරිවරයා**


**කේ.ඩී.ඒ.පී. කරුණාරත්න**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**
දුරකථන: +94 11 7747250
ෆැක්ස්: +94 11 7747209
විද්‍යුත් ලිපිනය: finance@etfb.lk

# අප
# කවුරුන්ද යන වග

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 1980 අංක 46 දරණ පනත යටතේ පිහිටුවන ලද අතර 1981 මාර්තු 1 වන දින සිට මෙහෙයුම් ආරම්භ කරන ලදී. එය කම්කරු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරන ලද අතර, දැනට ක්‍රියාත්මක වන්නේ මුදල්, සැලසුම් හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ය. රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමයට හිමිකම් නොපාන සියලුම රාජ්‍ය අංශයේ සේවකයින් සහ සියලුම පෞද්ගලික අංශයේ සේවකයින් මෙම අරමුදලේ සාමාජිකයන් වන අතර ඔවුන්ගේ සේවා යෝජකයින් විසින් සේවකයින්ගේ දළ ඉපැයීම්වලින් 3% ක් මාසිකව අරමුදලට ප්‍රේෂණය කළ යුතුය. එබැවින් සේවක අර්ථසාධක අරමුදල මෙන් නොව, මෙයට සේවකයා/සාමාජිකයා වෙනුවෙන් දායකත්වය සපයන්නේ සේවායෝජකයා පමණක් වන අතර, එබැවින් එය සාමාජිකයා දායක නොවන ප්‍රතිලාභයකි. ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයන ස්වයං රැකියාවල නියුතු පුද්ගලයින්ගේ සහ සංක්‍රමණික සේවකයින්ගේ ස්වේච්ඡා සාමාජිකත්වය වැඩි කිරීම සඳහා විශේෂ අවධානය යොමු කෙරේ.

**මණ්ඩලයේ අරමුණු**

(1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 07 වගන්තිය අනුව)

ඇ) මූල්‍ය සම්පාදනයට හා ආයෝජනයට සහභාගී වීමෙන් සේවක අයිතිය, සේවක සුභසාධනය, ආර්ථික ප්‍රජාතාන්ත්‍රිකය ප්‍රවර්ධනය කිරීම;

ආ) ව්‍යවසායයන්හි සාමාන්‍ය කොටස් අත්කර ගැනීමෙන් කළමනාකරණයෙහි සේවක සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම;

ඇ) සේවා නියුක්තයන්ට විශ්‍රාම ගැනීමේදී දායක නොවන ප්‍රතිලාභයක් ලබාගැනීම සඳහා විධි විධාන සැලැස්වීම: සහ

ඈ) ඉහත (අ), (ආ) සහ (ඇ) යන ඡේදවල සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවැසි විය හැකි අන් සියලු ක්‍රියා හෝ දෑ ඉටු කිරීම.

## අපගේ වගකිම්හි ප්‍රස්තූතය

### දැක්ම

ආයතනික විශිෂ්ටත්වය තුළින් සමස්ත පාර්ශ්වකරුවන් සඳහා වූ ක්‍රියාශීලි හා ස්ථාවර ප්‍රමුඛ භාරයක් බවට පත්වීම.

### මෙහෙවර

සාමාජිකයින් සඳහා වූ පුළුල් පරාසයක වූ මූල්‍ය ප්‍රතිලාභ හා විශිෂ්ට සේවාවක් සලසන සුහදශීලි හා විචක්ෂණශීලී භාරයක් වීම.

### වටිනාකම්

- නිර්මාණශීලි, නව්‍යකරණයෙන් සහ කැපවීමෙන් යුතු කාර්ය මණ්ඩලය
- ජනතාවට සුහදශීලී සේවා වටපිටාව
- සහයෝගීතාව සහිත ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන්
- විශිෂ්ට ක්‍රමවේද සහ ක්‍රියා පිළිවෙත්
- ඉහළ මූල්‍ය ස්ථාවරත්වය
- තෘප්තිමත් පාරිභෝගිකයින්

# ප්‍රධාන **මූල්‍ය තත්වයන්**

| | 2024 | 2023 | වෙනස |
|---|---:|---:|---:|
| | රු. 000' | රු. 000' | % |
| **මෙහෙයුම්** | | | |
| මුළු ආදායම | 65,987,907 | 67,792,678 | (2.7) |
| මුළු පොළී ආදායම | 61,819,095 | 64,380,505 | (4) |
| මෙහෙයුම් වියදම් | 2,811,307 | 2,833,648 | 0.8 |
| බදුවලට පෙර ලාභය | 63,176,600 | 64,959,030 | (2.7) |
| බදු වියදම | 8,678,062 | 9,016,645 | 3.76 |
| බදුවලට පසු ලාභය | 54,498,538 | 55,942,384 | (2.6) |
| **මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය** | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 794,613 | 898,585 | (11.57) |
| FVTPL හි මූල්‍ය වත්කම් | 2,646,191 | 4,463,977 | (40.72) |
| FVTOCI හි මූල්‍ය වත්කම් | 14,708,973 | 10,764,966 | 36.64 |
| ක්‍රමක්ෂය පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම් | 563,248,506 | 499,504,778 | 12.76 |
| සාමාජික අරමුදල් සහ සංචිත | 585,984,840 | 518,804,839 | 12.95 |
| **සාමාජික දෘෂ්ටි කෝණය** | | | |
| සාමාජික අරමුදල | 564,326,576 | 504,434,709 | 11.87 |
| පොළී සහ ලාභාංශ | 51,301,803 | 45,861,319 | 11.86 |
| පොළී හා ලාභාංශ ප්‍රතිශතය (%) | 10% | 10% | 0 |
| සාමාජික ප්‍රතිලාභ | 452,742 | 549,153 | (17.56) |
| ආයෝජන මත ප්‍රතිලාභ | 11.92% | 13.82% | (1.9%) |
| ස්කන්ධ මත ප්‍රතිලාභ | 10.20% | 11.61% | (1.41%) |
| වත්කම් මත ප්‍රතිලාභ | 9.77% | 11.31% | (1.54%) |

**1**
**මුළු වත්කම**
(රු. මිලියන)
**591,256**
524,511 (2023)

**2**
**වර්ෂයේ ලාභය**
(රු. මිලියන)
**54,498**
55,942 (2023)

**3**
**සාමාජික අරමුදල**
(රු. මිලියන)
**564,327**
504,435 (2023)

# ප්‍රධාන සන්ධිස්ථාන

## 1986
**මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
**රු.100,000**

## 1989
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය:
**නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය රු.200,000**

## 1991
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
**හදවත් සැත්කම් සඳහා මුලයාධාරය**
**රු.200,000**

## 1992
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මුල්‍යාධාර
**අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය**
**රු.18,000**

## 1994
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මුල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
**පහ වසර ශිෂ්‍යත්ව සමත් දුදරුවන් 9,000 ක් සඳහා රු. 15,000/= බැගින් මුල්‍යාධාර**

## 1997
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | හදවත් සැත්කම් සඳහා මුල්‍යාධාර | අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය | පහ වසර ශිෂ්‍යත්ව සමත් දුදරුවන් සඳහා මුල්‍යාධාර |
**ශ්‍රමසුව රැකවරණ රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය වසරකට රු.25,000 බැගින් රු.50,000 ක් උපරිමයක් දක්වා මුළු සේවාකාලය තුළදී**

## 2002
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | හදවත් සැත්කම් සඳහා මුල්‍යාධාර | අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය | පහ වසර ශිෂ්‍යත්ව සමත් දුදරුවන් සඳහා මුල්‍යාධාර | ශ්‍රමසුව රැකවරණ රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
**"වියන" අඩු පොළී නිවාස ණය යෝජනා ක්‍රමය**

## 2006

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර | අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය | පහ වසර ශිෂ්‍යත්ව සමත් දරුවන් සඳහා මූල්‍යාධාර | ශ්‍රමසුව රැකවරණ රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | "වියන" අඩු පොළී නිවාස ණය යෝජනා ක්‍රමය

**වකුගඩු බද්ධ කිරීමේ සඳහා මූල්‍යාධාර: රු.200,000**

## 2010

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර | අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය | පහ වසර ශිෂ්‍යත්ව සමත් දරුවන් සඳහා මූල්‍යාධාර | ශ්‍රමසුව රැකවරණ රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | "වියන" අඩු පොළී නිවාස ණය යෝජනා ක්‍රමය | වකුගඩු බද්ධ කිරීමේ සඳහා මූල්‍යාධාර |

**අ.පො.ස. (උ/පෙළ) සමත් සිසුන්ට මූල්‍යාධාර රු.12,000 බැගින් ශිෂ්‍යත්ව 5,000**

## 2016

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර | අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය | පහ වසර ශිෂ්‍යත්ව සමත් දරුවන් සඳහා මූල්‍යාධාර | ශ්‍රමසුව රැකවරණ රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | "වියන" අඩු පොළී නිවාස ණය යෝජනා ක්‍රමය | වකුගඩු බද්ධ කිරීමේ සඳහා මූල්‍යාධාර | අ.පො.ස. (උ/පෙළ) සමත් සිසුන්ට මූල්‍යාධාර

**අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය රු.30,000 ක් දක්වා වැඩි කරන ලදී**

## 2022

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය | පහ වසර ශිෂ්‍යත්ව සමත් දරුවන් සඳහා මූල්‍යාධාර | ශ්‍රමසුව රැකවරණ රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | "වියන" අඩු පොළී නිවාස ණය යෝජනා ක්‍රමය | අ.පො.ස. (උ/පෙළ) සමත් සිසුන්ට මූල්‍යාධාර | **හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර රු.350,000 ක් දක්වා වැඩි කරන ලදී වකුගඩු බද්ධ කිරීම සඳහා මූල්‍යාධාර රු.350,000 ක් දක්වා වැඩි කරන ලදී**

## 2023

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර | අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය | පහ වසර ශිෂ්‍යත්ව සමත් දරුවන් සඳහා මූල්‍යාධාර | ශ්‍රමසුව රැකවරණ රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | "වියන" අඩු පොළී නිවාස ණය යෝජනා ක්‍රමය | වකුගඩු බද්ධ කිරීමේ සඳහා මූල්‍යාධාර |

**අ.පො.ස. උසස්පෙළ සඳහා පෙනී සිටි දුදරුවන්හට වෘත්තිය පුහුණු පාඨමාලා සඳහා මූල්‍යාධාරය "නිපුණතා සවිය" රු.50,000**

## 2024

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර | අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය | පහ වසර ශිෂ්‍යත්ව සමත් දරුවන් සඳහා මූල්‍යාධාර | ශ්‍රමසුව රැකවරණ රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | "වියන" අඩු පොළී නිවාස ණය යෝජනා ක්‍රමය | වකුගඩු බද්ධ කිරීමේ සඳහා මූල්‍යාධාර |

**අ.පො.ස. උසස්පෙළ සඳහා පෙනී සිටි දුදරුවන්හට වෘත්තිය පුහුණු පාඨමාලා සඳහා මූල්‍යාධාරය "නිපුණතා සවිය" රු.50,000 රජයේ විශ්වවිද්‍යාල වලට ඇතුලත් වීමට සුදුසුකම් ලැබූ දරුවන් සඳහා මූල්‍යාධාරය (විශ්ව යාත්‍රා - රු.25,000)**

# අගය නිර්මාණය කිරීමේ මාදිලිය

## අගයන් සබලකාරක (ආදාන)

### ආයෝජන ප්‍රාග්ධනය

- සාමාජික අරමුදල - බිලියන 504

### සාමාජික ප්‍රාග්ධනය

- මුළු සේව්‍යයන් 79,895
- මුළු සක්‍රීය සාමාජික ගිණුම් 2,548,000
- ස්වයං රැකියා හා සංක්‍රමික සේවා 44,494 සේවකයින්

### සේවක ප්‍රාග්ධනය

- මුළු කාර්ය මණ්ඩලය 837
- කාර්ය මණ්ඩලයෙන් 35% වැඩි පිරිසකට මණ්ඩලය සමඟ වසර 20 කට වැඩි පළපුරුද්ද ඇත
- දක්ෂ, පුහුණු සහ සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලය

### හවුල්කාර ප්‍රාග්ධනය

- මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
- සේවක අර්ථසාධක අරමුදල (EPF)
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA)

### සමාජ සහ ප්‍රජා ප්‍රාග්ධනය

- වැඩකරන පුද්ගලයින්

## අගය නිර්මාණය (ක්‍රියාවලි)

### දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

### ඉලක්ක හා අරමුණු

### උපාය මාර්ග සහ කටයුතු

### මූලික කටයුතු

- දායක මුදල් රැස්කිරීම්
- ක්‍රියාත්මක කිරීම්
- සේවා සම්බන්ධතා
- සාමාජික සේවා
- ආයෝජන

### ද්විතීය කටයුතු

- මූල්‍ය
- තොරතුරු තාක්ෂණය
- මානව සම්පත්
- අභ්‍යන්තර විගණන
- සංඛ්‍යා ලේඛණ

### 1980 අංක 46 දරණ පනත

- ආයතනික යහපාලනය
- ආයතනික අවදානම් කළමනාකරණය

## නිර්මාණය කල වටිනානම (නිමැවුම්)

### අයෝජකයන්

- සාමාජික අරමුදල — බිලියන 564
- අයෝජන මත ප්‍රතිලාභ — 11.92%

### සාමාජිකයන්

- පොළිය — 3%
- ලාභාංශ — 7%

### සේවකයින්

- පුද්ගල වියදම් — බිලියන 1.4
- පුහුණු හා සංවර්ධන පිරිවැය — මිලියන 4.4
- සේවක පිරිවැටුම — 7% ට අඩු

### ප්‍රජාව

- හිමිකම් ගෙවීම (පොළි හා ලාභාංශ ඇතුළුව) — බිලියන 33
- හෘද සැත්කම් — මිලියන 127
- මරණ ප්‍රතිලාභ — මිලියන 122
- වසර 5 ශිෂ්‍යත්වය — මිලියන 113
- උසස් අධ්‍යාපනික දීමනාව — මිලියන 2
- නිපුනතා සවිය — මිලියන 0.09
- ශ්‍රම සුව යෝජනා ක්‍රමය — මිලියන 19
- නිත්‍ය දුබලතා — මිලියන 20
- වකුගඩු බද්ධ කිරීම් — මිලියන 1
- අභ්‍යන්තර අක්ෂි කාච — මිලියන 8



# මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම්

## දායක මුදල් රැස්කිරීම් හා සේවායෝජක සබඳතා

පුද්ගලික අංශයෙහි සහ විශ්‍රාම වැටුපක් නොගෙවන රාජ්‍ය ආයතනවල සේවයෙහි නිරත සේවකයන්ගේ දළ ඉපැයීම්වලින් 3%ක් වූ ප්‍රමාණයකින් දායක මුදල් ගෙවීම අදාළ සේවායෝජකයා විෂයෙහි අනිවාර්ය කරුණක් වන්නේ ය. එම සේවායෝජකයන් වෙතින් කලට වේලාවට දායක මුදල් රැස්කර ගැනීම, අධිභාර වෙතොත් ඒවා අයකර ගැනීම, ගෙවීම් පැහැර හරින්නන් හා දායක මුදල් නොගෙවන්නන් සොයා බැලීම සහ ගෙවීම් පැහැර හරින්නන්ට එරෙහිව නීති මගින් කටයුතු කිරීම යනාදිය දායක මුදල් රැස්කිරීමේ ක්‍රියාදාමය හා සම්බන්ධ ප්‍රමුඛ කාර්යන් සමහරකි. රැස්කිරීම් හා සේවායෝජක සබඳතා අංශය, මණ්ඩලය වෙත ලැබිය යුතු දායක මුදල් රැස්කර ගැනීමේ ඉලක්ක සපුරා ගැනීම සම්බන්ධයෙන් වගකීම උසුලයි.

## ආයෝජන

ආයෝජන අංශය යනු, මණ්ඩලයේ ආයෝජන කළඹ කළමනාකරණය කිරීම සඳහා පිහිටුවන ලද ආයතනය සතු ප්‍රධාන ව්‍යාපාරික ඒකක වලින් එකකි. මෙම ඒකකයේ ප්‍රධාන අරමුණු වන්නේ ආයෝජනවල ආරක්ෂාව සහතික කිරීම, ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පවත්වා ගැනීම සහ ප්‍රශස්ත ප්‍රතිලාභ ඉපයීම යන කාර්ය භාරයයි. ආයෝජන තීරණ ගැනීම සඳහා වූ මාර්ගෝපදේශයක් ලෙස පුළුල් ආයෝජන ප්‍රතිපත්තියක් ආයතනය සතුව පවතී.

## සාමාජික සේවා

මෙම කොට්ඨාශය අයත් ප්‍රධාන කර්තව්‍යයන්හීලා, සාමාජික ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම, සාමාජිකයන් වෙත වාර්ෂික සාමාජික ප්‍රකාශ නිකුත් කිරීම, සාමාජික පොදු ප්‍රතිලාභ (සාමාන්‍ය හා මරණ හිමිකම්) ලබාදීමේ ක්‍රියාවලිය කඩිනමින් ඉටුකිරීම සහ සක්‍රීය සාමාජිකයන් වෙනුවෙන් වෙනත් සුභසාධන යෝජනා ක්‍රම පවත්වාගෙන යාම යනාදී කටයුතු අන්තර්ගත වේ. මෙම අංශයේ කටයුතු තවදුරටත් සවිමත් කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ පොදු කාර්ය යටිතල ව්‍යුහය සලසා දීම සඳහා ප්‍රමාණවත් පරිදි පියවර ගනු ලැබ තිබේ.

## මුදල්

මුදල් කොට්ඨාශය හා සහබද්ධව පවත්නා කර්තව්‍යයන්හිලා, මාසික හා වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම, වාර්ෂික අයවැය සකස් කිරීම, රජයේ බදු ඇතුළුව කාර්ය මණ්ඩලය හා අනෙකුත් ගෙවීම් සිදු කිරීම, ආයතනික සැලසුම් හා වෙනත් කළමනාකරණ තොරතුරු වාර්තා පිළියෙළ කිරීම.

## පරිපාලන හා මානව සම්පත්

වත්මන් තරඟකාරී ව්‍යාපාරික පරිසරය තුළ බෙහෙවින් වැදගත් වන්නාවූ නවීන මානව සම්පත් විධික්‍රම හා විශිෂ්ටතම කාර්යාල පරිචයන් සමඟ ගැළපෙමින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය හඳුනාගනු ලැබ තිබේ. සේවා සපයන ආයතනයක් වශයෙන් කටයුතු කරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විෂයයෙහි ද ජනතාවගේ (සේවා නියුක්තයන්ගේ) සේවා අවශ්‍යතාවය මත රැඳෙමින් කටයුතු කිරීම ඉතා ඉහළ තලයක විය යුතු වන්නේය. එබැවින්, පාලන හා මානව සම්පත් කොට්ඨාශය විසින් ඉටු කරනු ලබන කාර්යයන් සංවර්ධනය කර වැඩි දියුණු කිරීම සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ. ඒ අනුව, පාලන හා මානව සම්පත් අංශය විසින් පිළිපදිනු ලැබිය යුතු දැනටමත් පවත්නා ක්‍රම සහ කාර්ය පටිපාටි යාවත්කාලීන කර වැඩි දියුණු කිරීම සඳහාත්, ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයට අවශ්‍ය වන්නාවූ පුහුණුව ලබා දීම සඳහාත් විවිධ මුල පිරීමේ කාර්යයන් සිදු කර ඇත.

## තොරතුරු තාක්ෂණ

අරමුදලේ සාමාජික පාලන මෘදුකාංග පද්ධතිය කළමනාකරණය කරමින් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ කොට්ඨාශය ප්‍රධාන වශයෙන් වගකීම උසුලයි. ශ්‍රී ලංකා තොරතුරු සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා එක්ව ක්‍රියා කරමින් ආයතනයට අයත් තොරතුරු තාක්ෂණ පරිසරය ප්‍රතිව්‍යුහගත කිරීම පිණිස වූ සියලු මූලාරම්භක කටයුතු ඉටු කරනු ලැබ තිබේ.

## අභ්‍යන්තර විගණන

ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය ප්‍රමාණවත් පරිදි ස්ථාපනය කරනු ලැබ ඇති බවටත්, එම පද්ධති අඛණ්ඩව හා ප්‍රශස්ත මට්ටමකින් අනුගමනය කරනු ලබන බවටත් සහතික වීමේ වගකීම අභ්‍යන්තර විගණන අංශය උසුලයි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) ප්‍රධාන විධායක නිලධාරී වරයා වෙත සෘජුවම වාර්තා කරනු ඇත. කළමනාකරණයේ මතය වනුයේ, අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් දැනට පවත්නා ක්‍රම හා කාර්ය පටිපාටිවල ප්‍රමාණවත්භාවය නැවත තක්සේරු කිරීම සඳහාත්, ආයතනයෙහි තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහිලා අභ්‍යන්තර විගණනයේ කාර්ය භාරය ඵලදායි මෙවලමක් ලෙස ශක්තිමත් කිරීම සඳහාත් නිසි අධ්‍යයනයක් කළ යුතුය යන්න ය. රජයේ විගණන කටයුතු සම්බන්ධීකරණය කිරීමේ කටයුතුද අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ මගින් සිදුකරනු ලැබේ.

## නීති

මණ්ඩලයට අදාළ වන්නාවූ සියළුම නෛතික කටයුතු අරබයා උපදේශක සේවා ඒකකයක් ලෙස නීති අංශය ක්‍රියාත්මක වේ. අදාළ නෛතික කටයුතු ප්‍රාදේශීය කාර්යාල ජාල සේවය ව්‍යාප්ත කරනු ලැබීමත් සමඟ ප්‍රාදේශීය මට්ටම කරා විමධ්‍යගත කරනු ලැබ තිබේ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති) අධීක්ෂණය යටතේ නීති අංශය ක්‍රියාත්මක වේ.



# කාර්ය සාධන සමාලෝචනය

## අගය එකතු කිරීමේ ප්‍රකාශය

මණ්ඩලයේ අගය නිර්මාණය පිළිබඳ විශ්ලේෂණයක් සහ සමූහයේ ප්‍රධාන පාර්ශවකරුවන් අතර වෙන්කිරීම පහතින් දැක්වේ.

| | 2024 | 2023 | වෙනස |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | % |
| **එකතුකල වටිනාකම** | | | |
| ප්‍රධාන ව්‍යාපාරවලින් උපයන ලද ආදායම | 65,353.78 | 67,118.20 | (2.63) |
| සේවා පිරිවැය | (375.85) | (357.33) | (5.18) |
| **ප්‍රධාන ව්‍යාපාරවලින් එකතුකල වටිනාකම** | **64,977.93** | **66,760.87** | **(2.67)** |
| වෙනත් ආදායම් | 634.13 | 674.48 | (6) |
| ණය සහ වෙනත් අලාභ සඳහා හානිකරණ අයකිරීම් | (4.91) | (51.45) | 90.5 |
| **වටිනාකම එකතුකිරීම** | **65,607.15** | **67,383.90** | **(2.6)** |
| **වටිනාකම වෙන්කිරීම සේවකයන්ට** | | | |
| වැටුප්, වේතන සහ වෙනත් ප්‍රතිලාභ | 1,400.62 | 1,324.11 | 5.8 |
| **සාමාජිකයන්ට** | | | |
| සාමාජිකයන්ට ගෙවූ පොළිය | 15,390.53 | 13,758.50 | 11.86 |
| සාමාජිකයන්ට ගෙවූ ලාභාංශ | 35,911.28 | 32,102.82 | 11.86 |
| **රජයට** | | | |
| බදු වියදම් | 8,678.06 | 9,016.65 | (3.76) |

| | 2024 | 2023 | වෙනස |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | % |
| **ප්‍රජාවට** | | | |
| සාමාජික ප්‍රතිලාභ | 452.74 | 549.15 | (17.5) |
| **ව්‍යාප්තිය සහ වර්ධනය සඳහා** | | | |
| රඳවාගත් ලාභ | 727.79 | 278.12 | 161.68 |
| ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය | 46.13 | 40.55 | 13.76 |
| ලාභාංශ සමකිරීමේ සංචිතය | 3,000 | 10,314 | (70.91) |
| **වෙන්කළ මුළු වටිනාකම** | **65,607.15** | **67,383.90** | **(2.64)** |

## එකතුකළ ආර්ථික වටිනාකම (EVA)

එකතුකළ ආර්ථික වටිනාකම ආයතනයක සත්‍ය ආර්ථික ලාභය පෙන්නුම් කරයි. එකතුකළ ආර්ථික වටිනාකම යනු සැලැකිය යුතු අවදානමට කොටස් හිමියන් සඳහා අවශ්‍ය අවම ප්‍රතිලාභ ඉක්මවා යන හෝ අඩුකරන ඉපයීම් ප්‍රමාණය පිළිබඳ ඇස්තමේන්තුවයි.

| | 2024 | 2023 |
|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන |
| **ආයෝජිත ප්‍රාග්ධනය** | | |
| සාමාන්‍ය සාමාජික අරමුදල | 534,380.64 | 482,032.66 |
| එකතුකළා: ණය සහ වෙනත් අලාභ සඳහා සමුච්චිත හානිකරණ වෙන්කිරීම | 30.10 | 35.02 |
| | **534,410.74** | **482,067.68** |
| **ආයෝජිත ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ** | | |
| බදුකරණය පසු ලාභය | 54,498.54 | 55,942.38 |
| එකතුකළ ණය සහ වෙනත් අලාභ සඳහා සමුච්චිත හානිකරණ වෙන්කිරීම | (4.91) | (51.45) |
| **ආයෝජිත ප්‍රාග්ධනය මත මුළු ප්‍රතිලාභය** | **54,493.63** | **55,890.93** |
| අයෝජිත ප්‍රාග්ධනයේ ආවස්ථික පිරිවැය | (49,697.40) | (79,824.61) |
| **එකතුකළ ආර්ථික වටිනාකම්** | **4,796.23** | **(23,933.68)** |

*2024 සාමාන්‍ය බරතබන ලද - 9.30% මාස 12 භාණ්ඩාගාර බිල්පත් මත පදනම් වී ගණනය කරන ලදී (2023 - 16.56%)

# ආයතනික භාරකාරීත්වය



# සභාපතිවරයාගේ
## සමාලෝචනය

2024 වර්ෂය තුළ ආර්ථික ක්‍රියාකාරිත්වය දෙස බලන විට බැංකු පොළී අනුපාත 2023 වර්ෂයේ පැවති 14.5 සිට 10.0 දක්වා අඩු වීමක් ද භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාත (දින 91) 14.51% සිට 8.2% දක්වාද දින 364 බිල්පත් සඳහා වන පොළී අනුපාත 12.93% සිට 8.96% දක්වා අඩු වීමක් වාර්තා වු අතර එවායේ ප්‍රතිපල සෘජුවම මණ්ඩලයේ අරමුදල කෙරෙහිද බලපාන ලදි. නමුත් ප්‍රාග්ධන වෙළඳපොළ තුළ සිදු වූ ප්‍රසාරණයේ වාසිය අත්පත් කර ගැනීමට මණ්ඩලය සමත් වූ අතර 2024 වර්ෂය තුළදී ප්‍රාග්ධන වෙළඳපොළ තුළින් රුපියන් බිලියන 3.5 ක් අරමුදලට එක් කිරීමට හැකියාව ලැබුණි.

## හිතවත් පාර්ශවකරුවනි,

ලංකාවේ දෙවන විශාලතම සමාජ ආරක්ෂණ අරමුදල වන සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 2024 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව එහි අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව මම අතිශයෙන්ම සතුටට පත් වෙමි. 2024 වර්ෂය සඳහා මෙම වාර්ෂික වාර්තාව අපි විසින් ඉදිරිපත් කරනු ලබන්නේ සමස්ථයක් ලෙස අප රට ආර්ථික, සමාජ හා දේශපාලනික වශයෙන් යම් හැරවුම් ලක්ෂයක් නියෝජනය කරන අවස්ථාවක යයි සිතමි. ලෝක දේශපාලන හා ආර්ථික තත්ත්වයන් දෙසද අවධානය යොමු කරන විට අප ගෙවමින් සිටින මෙම කාල පරිච්ඡේදය යම් ආකාරයක අභියෝගාත්මක බවක් ඇති බවද අප වටහා ගත යුතුය.

2024 වර්ෂය ආරම්භ වන විට රට තුළ තිබූ දේශපාලන අස්ථාවරත්වය අවසන් වී වසර අවසානය වනවිට මුළුමනින්ම ස්ථාවර දේශපාලන තත්වයක් සහිත රටක් බවට පත් වී ඇතත්, ලෝක ආර්ථික හා දේශපාලන කැළඹීම් දෙස ඉතාමත් සංවේදී වෙමින් එම තතත්වයන් විසින් අප වෙත සිදු කරනු ලබන බලපෑම් පිළිබඳව සාවදාන වෙමින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය මතු වී ඇත. කෙසේ වුවද 2024 වර්ෂයේ සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කාර්යසාධනය විසින් පෙන්නුම් කරන්නේ අභියෝගාත්මක තත්වයන් තුළ වුවද ස්ථාවර අරමුදල් කළමනාකරණයක් හා ප්‍රශස්ථ සේවා සම්පාදනයක් සිදු කිරීමට මණ්ඩලයට ඇති හැකියාවයි.

## අරමුදලේ වර්ධනය සහ මූල්‍ය කාර්ය සාධනය

2023 වර්ෂය අවසන් වන විට රුපියල් බිලියන 504,435 ක් ව තිබූ අරමුදල 2024 වර්ෂය අවසන් වන විට රුපියල් බිලියන 564,327 ක් දක්වා 11.9% කින් ඉහළ ගිය අතර පොළී හා ලාභාංශ ලැබීම්වල පෙන්වූ 11.9% වර්ධනයත්, දායක මුදල් රැස් කිරීම්වල 2023 වර්ෂයට සාපේක්ෂව පෙන්නුම් කළ 12.9% වර්ධනයත්, එම වර්ධනයන්ට සාපේක්ෂව ප්‍රතිලාභ නිදහස් කරගත් සාමාජික සංඛ්‍යාව සහ නිදහස් කළ සාමාජික ගිණුම් ශේෂයන්හි අගය 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂය තුළ අඩු අගයක්ව පැවතිමත් හේතු විය. සාමාජික ගිණුම් ශේෂයන් නිදහස් කර ගැනීම පසුගිය වසරට සාපේක්ෂව ප්‍රමාණාත්මකව අඩුවීම එක්තරා ආකාරයකින් ආර්ථික දර්ශකයක් ලෙස ද සැලකිය හැකි අතර, රට තුළ සිදුව ඇති දේශපාලන ස්ථාවරත්වය හා ආර්ථික ක්‍රියාකාරකම්වල යහපත් ප්‍රවණතාවයන් හේතුවෙන් පුද්ගලික අංශයේ සේවකයින්ගේ සේවය අවසන් වීම් ප්‍රමාණාත්මකව පහළ යාම පිළිබඳ අදහසක් ද මේ ප්‍රවණතාවය තුළ දක්නට ඇත.

ආයෝජන කළඹ 2023 වර්ෂයේ පැවති රු. බි 515.2 සිට 581.1 දක්වා 11.33% ක වර්ධනයක් 2024 වර්ෂය අවසන් වන විට පෙන්නුම් කළ අතර භාණ්ඩාගාර බැඳුම්කර සහ බිල්පත් හි ආයෝජනය 14%කින් ඉහළ ගොස් ඇත. කොටස් වෙළඳපොළ ආයෝජන 13.% කින් වර්ධනය වී ඇත. මණ්ඩලයේ ආයෝජන කළඹ කළමනාකරනය කිරීමේදී මණ්ඩලයේ අනුමත ආයෝජන ප්‍රතිපත්ති රාමුව තුළ සිටිමින් අරමුදලේ ස්ථායිබව තහවුරු කිරීමත්, ප්‍රාග ්ධන වෙළඳපොලෙහි ප්‍රවණතාවයන් කෙරෙහි සංවේදී වෙමින් කෙටිකාලිනව ලබා ගත හැකි මූල්‍ය වාසි අත්පත් කර ගැනීමත් යන උපායමාර්ගික ප්‍රවේශයන්හි සාධනීය බලපෑම හඳුනාගත හැකිය.

2024 වර්ෂය තුළ ආර්ථික ක්‍රියාකාරිත්වය දෙස බලන විට බැංකු පොළී අනුපාත 2023 වර්ෂයේ පැවති 14.5 සිට 10.0 දක්වා අඩු වීමක් ද භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාත (දින 91) 14.51% සිට 8.2% දක්වාද දින 364 බිල්පත් සඳහා වන පොළී අනුපාත 12.93% සිට 8.96% දක්වා අඩු වීමක් වාර්තා වූ අතර එවායේ ප්‍රතිපල සෘජුවම මණ්ඩලයේ අරමුදල කෙරෙහිද බලපාන ලදි. නමුත් ප්‍රාග්ධන වෙළඳපොළ තුළ සිදු වූ ප්‍රසාරණයේ වාසිය අත්පත් කර ගැනීමට මණ්ඩලය සමත් වූ අතර 2024 වර්ෂය තුළදී ප්‍රාග්ධන වෙළඳපොළ තුළින් රුපියන් බිලියන 3.5 ක් අරමුදලට එක් කිරීමට හැකියාව ලැබුණි. ඒ අනුව මණ්ඩලය සතු ශුද්ධ වත්කම් රු. බි. 518.8 සිට රු.බි 585.9 ක් දක්වා 12.9%කින් වර්ධනය කර ගැනීමට හැකි විය. මෙම දත්ත විසින් පෙන්නුම් කරනු ලබන්නේ රටේ සමස්ථ ආර්ථික ක්‍රියාවලට සංවේදී වුවද අරමුදලෙහි ස්ථාවර බව තහවුරු කිරීමට මණ්ඩලය සමත්ව ඇති බවයි. එය එක් අතකින් මණඩලය ස්ථාපිත කිරීමේ මූලික අරමුණක් වන රටේ සේවා නියුක්ත ප්‍රජාවෙහි සමාජ ආරක්ෂණ දැළ ශක්තිමත්ව පවතින බව තහවුරු කිරීමට මණ්ඩලය විසින් ලබා දී ඇති දායකත්වයයි.

## සාමාජික ප්‍රතිලාභ තහවුරු කිරීම

ඇස්තමේන්තු කරන ලද ආකාරයටම 2023 වර්ෂයේ මෙන්ම 2024 වර්ෂය අවසානයේ දී ද සාමාජික ගිණුම් සඳහා 10% පොලි හා ලාභාංශ ප්‍රතිශතයක් සියලුම සාමාජිකයින් වෙත පිරනැමීමට මණ්ඩලය සමත් විය. ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ මෙන්ම සුබසාධන ප්‍රතිලාභ රැසක්ද සිය සාමාජිකයන් වෙත පිරිණාමන සුවිශේෂී අරමුදලක් ලෙස 2024 වර්ෂයේ දි රු. බි. 33.4 ක් මුදලක් සාමාජිකයින් 193,024 ක් අතර සාමාන්‍ය ගිණුම් ශේෂ නිදහස් කිරීම යටතේ ලබා දී ඇති අතර, එමගින් සාමාජිකයින් තුළ අරමුදල කෙරෙහි වන විශ්වාසය තහවුරු කිරීමට මණ්ඩලයට හැකි වී ඇත.
එමෙන්ම, සුබසාධන ප්‍රතිලාභ ලෙස රුපියල් මිලියන 453 ක් සුදුසුකම්ලත් සාමාජිකයින් වෙත ප්‍රදානය කිරීමට මණ්ඩලය සමත් වීම මගින් සිය සාමාජික ගිණුමෙහි පවතින ශේෂයට කිසිඳු බලපෑමක් සිදු නොකර සාමාජිකයින්ගේ සෞඛ්‍ය අවශ්‍යතා සහ සාමාජිකයින්ගේ පවුල්වල දූ දරුවන්ගේ අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් දායකතවය ලබා දිමටත්, එමගින් ඔවුන්ගේ සමාජාරක්ෂණය තහවුරු කිරීම කෙරෙහි මණ්ඩලය සතුව ඇති වගකීම ඉටු කිරීමටත් හැකියාව ලැබී ඇත.

## පරිපාලිත සමාගමේ කාර්ය සාධනය

සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් මණ්ඩලයේ පරිපාලිත සමාගමක් වන ලංකා ලුණු සමාගම වෙතින් මණ්ඩලයේ අරමුදල සඳහා 2024 වර්ෂයේ දී ලාභාංශ ලෙස රු. මි.536

මුදලක් හිමි වූ අතර එය සමස්ථ අරමුදලේ ප්‍රසාරණය සඳහා සාධනිය බලපෑමක් සිදු කරන ලදි. 1997 වර්ෂයේ දි රු. මි. 452.8 ක් ආයෝජනය කරමින් සමස්ථ කොටස් ප්‍රමාණයෙන් 90% ක් අත්පත් කර ගැනිමින් මණ්ඩලයේ දේපලක් බවට පත් වූ මෙම පරිපාලිත ආයතනය වෙනුවෙන් කරන ලද ආයෝජනය මේ වන විට මුළුමනින්ම ආවරණය වී ඇති අතර, එය මේ වන විට මණ්ඩලය සතු ශුද්ධ වටිනාකමක් බවට පත් වී ඇත.

## නව රජයේ ඩිජිටල්කරණ ප්‍රතිපත්තිය සමග අනුගත වීම

මණ්ඩලයේ ප්‍රතිලාභ නිදහස් කිරීම්, සාමාන්‍ය පරිපාලනය හා මූල්‍ය පරිපාලනය යනාදිය සැලකිය යුතු කාලයක සිට විවිධ මෘදුකාංග හා පද්ධති මගින් සිදු කරමින් පවතී. මෙම සියලු ක්‍රියාකාරකම් ඒකාබද්ධ පරිගණක පද්ධතියක් (Core System) මගින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය අනුව මීට වසර ගණනකට පෙර ආරම්භ කර ඇති ඒකාබද්ධ පරිගණක පද්ධති සංවර්ධන ව්‍යාපෘතිය එහි අපේක්ෂිත කාලරාමුව තුළ අපේක්ෂිත ඉලක්ක කරා ළඟා විමට සමත් වී නැත. ඒ අනුව මෙම පද්ධති සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මේ වන විට සිදු කර ඇති ක්‍රියාකාරකම් සහ එම පද්ධතිය ක්‍රියාත්මක තත්වයට පත් කිරීම සඳහා සම්පූර්ණ කළ යුතුව ඇති ක්‍රියාකාරකම් අතර පරතරය පිළිබඳව ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් අවබෝධයක් ලබා ගැනිමට කටයුතු කර ඇති අතර ව්‍යපෘතියේ කටයුතු නැවත ආරම්භ කිරීමට ඇති අවශ්‍යතාවය සහ හැකියාව පිළිබදව විශ්ලේෂණය කරමින් පවතී.

කෙසේ වුවද නව රජයේ ඩිජිටල්කරණ ප්‍රතිපත්තියට අනුගතව ආයතනයේ සේවාවවන් සාමාජිකයින් වෙත ලබා දීමේ අවශ්‍යතාවය මණ්ඩලය විසින් හඳුනාගෙන ඇති අතර එය ප්‍රමුඛ කාර්යයක් ලෙසද සැලකේ. එබැවින් ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු නිශ්චිත කාලරාමුවක් තුළ අවසන් කර එහි සේවා ප්‍රතිලාභ සාමාජිකයින් වෙත හා කාර්යය මණ්ඩලය වෙත ලබා දීම කෙරෙහි විශේෂ අවධානය යොමු වී ඇත.

## මානව ප්‍රාග්ධනය

ආයතනය තුළ පවත්නා මානව සම්පත එම ආයතනයේ දෛනික ක්‍රියාකාරකම්හි කෙටිකාලින මෙන්ම දිගුකාලීව දිශානතිය තීරණය කරනු ලබන තීරණාත්මක සාධකයකි. අධ්‍යක්ෂක මණ්ඩල විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ මෙන්ම කලින් කලට රජයේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු විසින් නිකුත් කරනු ලබන නීති රීති, අණ පනත් හා චක්‍රලේඛවලට අනුගත වෙමින් ක්‍රියාකිරීමත්, සිය නිර්මාණාත්මක කුසලතාවයන් වර්ධනය කරගනිමින් එම වර්ධනයන් සේවා සම්පාදනය සඳහා යෙදවීමත් මානව සම්පත තුළින් අපේක්ෂා කෙරේ. ඒ සඳහා, දැනුම කුසලතා හා ආකල්ප සංවර්ධනය සඳහා අවස්ථා ලබා දිම, අත්‍යාවශ්‍ය සාධකයක් වන අතර සේවා සැපයීමේ ස්වභාවය සහ කාර්යක්ෂමතාවය තීරණය වන්නේ එමගිනි.

අනුමත කාර්ය මණ්ඩලයට වඩා අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යෙදුනද සාමාජිකයින් වෙත ප්‍රශස්ත සේවාවක් සැපයෙන බව ලැබෙන විවිධ බාහිර ප්‍රතිචාර වලින් විද්‍යමාන වේ. තවදුරටත් ප්‍රශස්ථ සේවාවක් සැපයිම වෙනුවෙන් පවතින කාර්ය මණ්ඩලය පුරුදු පුහුණු කිරීම සහ දැනට පුරප්පාඩු වී පවතින අත්‍යාවශ්‍ය තනතුරු වලට නිලධාරින් බඳවා ගැනිම කෙරෙහි අවධානය යොමු කර ඇත.

විශේෂයෙන්ම මණ්ඩලය නිරන්තරයෙන් මුහුණ දෙන මානව සම්පත් විෂයෙහි අභියෝගය වන්නේ අත්‍යාවශ්‍ය ඇතැම් තනතුරු සඳහා නිධාරින් ආකාර්ෂණය කර ගැනිමට දැනට පවතින වැටුප් පරිමාණයන් හා බඳවා ගැනීම් පටිපාටිවල පවතින ඇතැම් කොන්දේසිවල සීමාවන්ය. බාහිර රැකියා වෙළඳ පොළෙහි හැකියාවන්ගෙන් යුත් මානව සම්පත් පැවතියද ඔවුන්ගේ අපේක්ෂාවන් හා මෙවැනි ආයතනවල අනුමත වැටුප් ව්‍යුහ සහ සේවා කොන්දේසි අතර යම් අසමතුළිතතාවයක් පැවතීම නිරීක්ෂණය වේ. මෙය ඉතා අභියෝගාත්මක තත්වයක් වන්නේ සියලුම ව්‍යවස්ථාපිත ආයතන වලට අදාළව ජාතික ප්‍රතිපත්තීන් හා සමාන නීති රීති පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයත්, ඇතැම් ආයතනවල සුවිශේෂී තනතුරු වලට නිලධාරින් ආකර්ෂණය කර ගැනීමට එම තත්වයන් සෘණාත්මකව බලපෑම් කිරීමත් හේතුවෙනි. ඒ අනුව වඩාත් ප්‍රායෝගික තත්වය වන්නේ දැනට පවතන කොන්දේසි යටතේ ආකර්ෂණය කර ගත හැකි මානව සම්පත බඳවාගෙන ඔවුන් සඳහා වැඩි වැඩියෙන් පුහුණු අවස්ථා ලබා දීම තුළින් මානව සම්පත් සංවර්ධනය සිදු කිරීමයි. මේ සඳහා වාර්ෂිකව නිශ්චිත පුහුණු සැලැස්මක් ක්‍රියාත්මක කෙරෙන අතර 2024 වර්ෂයේ දී පුහුණු සැලැස්ම ක්‍රියාත්මක කිරීමට හැකිවීම සාධනිය තත්වයකි.

මානව සම්පත් සංවර්ධනය කෙරෙහි බලපෑම් කරනු ලබන අනෙක් ප්‍රධාන කරුණ වන්නේ අයාතනික වශයෙන් පවතින අභ්‍යන්තර සංස්කෘතික තත්වයන්ය. වාර්ෂික ස්ථානමාරු නිසි ලෙස ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ඇතැම් නිලධාරීන් දිගු කළක් එකම අංශයේ සේවයේ යෙදි සිටිම නිසා යම් යම් මානසික තත්වයන් ඇති විය හැකි අතර, එය ක්ෂණික අවධානය යොමු විය යුතු තත්වයක් ලෙස නිරීක්ෂණය වේ.

රාජ්‍ය අංශයේ ආයතනවල වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමේ දී ආයතන විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාකරණය හා හෙළිදරවු කිරීම්වල විනිවිදභාවය, වගවීම්, සමාජ වගකීම් හා ආයතනික පාලනය යනාදියෙහි ප්‍රමිතිය මැන බැලීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිවරුන්ගේ සංගමය (APFASL) විසින් සංවිධානය කළ 2023 වර්ෂය සඳහා වූ හොඳම වාර්ෂික වාර්තා සම්මාන තරඟයේ දී සමස්ථ රාජ්‍ය අංශයේ ආයතන කාණ්ඩයේ රිදී සම්මානය හිමි කර ගැනීමට අප මණ්ඩලය සමත් වූ අතර එය එක්තරා ආකාරයකින් මණ්ඩලයේ මානව සම්පත් සංවර්ධනයේ තත්වය පෙන්නුම් කිරීමක් ලෙසද සැලකිය හැකිය.

## ආයතනයේ ඉදිරි දැක්ම

ආයතනයේ උපායමාර්ගික සැලැස්ම වඩාත් තාර්කික පදනමක් යටතේ නැවත විශ්ලේෂණයකට ලක් කිරිමට අපේක්ෂා කරන අතර එමගින් ආයතනයේ දිගුකාලීන ඉලක්ක කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම එක් අංශ අතර මෙන්ම නිලධාරීන්ගේ කාර්ය සාධනය තහවුරු කළ හැකි වන පරිදි කාර්ය සාධන දර්ශක සංවර්ධනය කිරීමටත්, කාර්ය මණ්ඩලය ඒ සඳහා අනුගත කිරීමට පියවර ගැනීමත් අත්‍යාවශ්‍ය කරුණකි. අභ්‍යන්තර පරිපාලනය කෙරෙහි බලපාන නෛතික රාමුව නැවත විශ්ලේෂණය කර යාවත්කාලින කිරීමත් එම නෛතික රාමුව කිසිඳු පාර්ශ්වීයභාවයකින් තොරව ආයතනය තුළ ක්‍රියාත්මක වීම තහවුරු කිරීමත් කෙරෙහි අවධානය යොමු වී ඇත.

දැනට ආරම්භ කර ඇති ඒකාබද්ධ පරිගණක පද්ධති සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු නිසි ව්‍යාපෘති කළමනාකරන ක්‍රමවේද යටතේ ක්‍රියාත්මක කර ඉතා කඩිනමින් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර දෛනික සේවා සැපයුම් ක්‍රියාවලියට එක් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු වී ඇත. එයට සමගාමීව සියලු සාමාජික සේවාවන් එක් ස්ථානයකට ගොනුකර සේවා පියස ස්ථාපිත කිරීමටත් එමගින් සේවා ලබා ගැනීමට පැමිණෙන සාමාජිකයින් සඳහා වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබා දීම තහවුරු කිරීමටත් අවශ්‍ය පියවර ගනිමින් පවතී.

ආයතනය තුළ දිගු කලක් තිස්සේ පවතින වැටුප් විෂමතාවයන් පිළිඳව විවිධ පාර්ශ්වයන් විසින් පෙන්වා දී ඇති අතර මෙම වැටුප් විෂමතාවයන් විසඳිම සඳහා පියවර ගැනීමේ අවශ්‍යතාවය මතුව ඇත. ඒ සඳහා නිසි අධ්‍යනයකින් පසුව කටයුතු කිරීම කෙරෙහි අධ්‍යක්ෂක මණ්ඩලයේ අවධානය වොමු වී පවති.

පසුගිය වසර කිහිපය තුළම පැවති රාජ්‍ය ආයතනවල තනතුරු පුරප්පාඩු පිරිවීමේ ක්‍රියාවලියේ සීමාකම් හේතුවෙන් සැලකිය යුතු තරම්  පුරප්පාඩු සංඛ්‍යාවක් ඇති අතර එම තනතුරු සඳහා සුදුසු නිලධාරීන් බඳවා ගැනීමට අපේක්ෂා කරන අතර දැනට සේවා සැපයීමේ ක්‍රියාවලියේ හඳුනාගෙන ඇති පරතරයන් පියවීමට එය ඉවහල් වනු ඇත.

ඒ අනුව පවතින මානව සම්පත් කාර්යක්ෂමව උපයෝජනය කිරීම, නවීන තාක්ෂණය භාවිතය, සමානාත්මතාවය තහවුරු කිරීම හා ශක්තිමත් නෛතික රාමුවක් ස්ථාපිත කිරීම මගින් ප්‍රශස්ථ සේවා සම්පාදනය තහවුරු කරමින් සේවා නියුත්කයින්ගේ භාර අරමුදල් මණ්ඩලය පිහිටුවීමේ පුළුල් අරමුණ සාක්ෂාත් කිරීම වෙනුවෙන් හා එම අරමුණුවල අඛණ්ඩ බව සහතික විය හැකි පරිසරක් නිර්මාණය කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම මණ්ඩලයේ වගකීමක් ලෙස සලකමු.

## සිහිපත් කිරීම

නෛතික හා ව්‍යවස්ථාපිත බැඳීමකට වඩා සමාජ යුතුකමක් හා වගකිමක් ලෙස සලකමින් සිය සේවකයින් වෙනුවෙන් බැර කළ යුතු දායක මුදල් ගෙවීම හා සාමාජික ගිනුම්වල නිරවද්‍යතාවය තහවුරු කිරිම උදෙසා විශාල කර්තව්‍යයක් සිදු කරනු ලබන අප මණ්ඩලය සමග අත්වැල් බැඳ සිටින සේවායෝජක ප්‍රජාව මෙම අරමුදලේ ස්ථායිභාවය වෙනුවෙන් සිදුකරන දායකත්වය ඉමහත්ය. සාමාජිකයින් වශයෙන් අප මණ්ඩලය කෙරෙහි නොබිඳුණු විශ්වාසයක් රඳවමින් කටයුතු කරන මිලියන 2.6 ක පමණ අරමුදලේ සාමාජික ප්‍රජාව ඔවුන්ගේ අයිතිවාසිකම් මණ්ඩලය විසින් සුරකිනු ඇති බවට තබා ඇති මහඟු විශ්වාසය අප නිරන්තරයෙන්ම දිරිමත් කරයි.

ආයතනයේ ප්‍රධාන කාර්යාලයේ මෙන්ම ප්‍රාදේශීය කාර්යාලවලටද අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලය තමා සතු වගකීම කුමක්ද යන්න නිවැරදිව වටහාගෙන සේවා සම්පාදනයේ නියැලීම විසින් සෙසු සමගාමී ආයතන අතර ප්‍රශස්ථ ආයතයක් ලෙස පැවතීමට අවශ්‍ය පසුබිම සකස් කර ගෙන තිබෙන බවට සැකයක් නැත. තමාද මෙම අරමුදලේ සාමාජිකයෙකුය යන්න වටහාගෙන සාමාජිකයෙකු වශයෙන් සහ අරමුදලේ යහ පැවැත්ම වෙනුවෙන් සිය යුතුකම් කොටස නොපිරිහෙලා ඉටු කරන කාර්ය මණ්ඩලයක් සිටීම ආයතනයේ ප්‍රගතිය උදෙසා මහඟු පිටුවහලක් වි ඇත.

ආයතනයේ විෂය අයත්වන මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා, ලේකම් තුමා සහ සියලුම නිලධාරින් විසින් අපගේ ආයතනික පරිපාලනය නිවැරදිව හා විධිමත්ව සිදු කිරීමට ලබා දෙන මාර්ගෝපදේශ, උපදෙස් හා නියාමනයන් ඉතාමත් සාධනීය වන අතර 2024 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන මේ අවස්ථාවේදි අපගේ ප්‍රණාමයේ කොටස්කරුවන් බවට ඔවුන් පත් වේ.

අවසන් වශයෙන් තමාට පැවරි ඇති වගකීම හා මහජන අභිලාෂයන් පිළිබඳව මනාව වටහා ගනිමින් ඉතාමත් සක්‍රියව දායක වෙමින් ආයතනයේ කටයුතු නිවැරදි දිශානතියට යොමු කිරීම වෙනුවෙන් සිය බුද්ධිමය හා නිර්මාණාත්මක දායකත්වය ලබා දෙන සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සහෝදර අධ්‍යක්ෂක මණ්ඩලය වෙත මාගේ ගෞරවය හා හෘදයාංගම භාවය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

**සෝමසිරි ඒකනායක**
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී



# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

## වාර්ෂිකමය සමාලෝචනය : 2024

ශ්‍රී ලංකාවේ ආර්ථිකය, එහි පශ්චාත් අර්බුද ස්ථායිකරණ ක්‍රියාමාර්ග තුළ ධනාත්මක ප්‍රතිඵල විද්‍යාමාන කිරීම ආරම්භ කරන ලද අතර, 2024 වර්ෂය තුළ ක්‍රමිකව සවිමත්ව හිඳ ප්‍රකෘතිමත්භාවය වෙත ලඟා වෙමින් පැවතියේ ය. 2024 වර්ෂයේ දී ජනාධිපති මැතිවරණය හා පාර්ලිමේන්තු මහ මැතිවරණය පැවැත්වීම, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් තනි ඉලක්කම් පොලී අනුපාතයක් හඳුන්වා දීම සහ ෆිච් රේටිංග්ස් (Fitch Ratings) ආයතනය මගින් රටේ ණය මුදල් නොගෙවීම ආශ්‍රිත ණය ශ්‍රේණිගත කිරීම, පරිසීමිත ණය පැහැර හැරීමේ (RD) ශ්‍රේණියේ සිට සී.සී.සී. ප්ලස් (CCC+) ශ්‍රේණිගත කිරීම දක්වා 2024 දෙසැම්බර් මාසයේ දී උසස් කිරීම යනාදී වශයෙන් සිදු වූ වැදගත් කඩඉම්, ශ්‍රී ලංකාවේ ආර්ථිකය විෂයයෙහි ආයෝජක හා අනෙකුත් පාර්ශවකරුවන් තුළ පවත්නා විශ්වාසය ඉහළ නැංවීම කෙරෙහි තවදුරටත් පිටුබලයක් වූයේ ය.

මූල්‍ය පද්ධතියේ ස්ථායිභාවය සහතික කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද පොලී අනුපාත අඩුකිරීම් සහ එහි නම්‍යශීලී උද්ධමන ඉලක්ක, ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය කෙරෙහි ධනාත්මක ලෙස බලපෑ අතර, පසුගිය වසර ඉක්මවා ගිය ඉහළ කාර්ය සාධනයක් එමගින් ගෙන හැර දැක්වී ය. ශ්‍රී ලංකා ආර්ථිකයේ ද්‍රවශීලතා මට්ටම වැඩි දියුණුවට පත් වූ අතර, නම්‍යශීලී උද්ධමන අනුපාත ප්‍රතිපත්තිය යටතේ, ශ්‍රී ලංකා රුපියල නොකඩවා දෙවන වසර සඳහාත් වැඩි අගයක් ගෙන පැවතියේ ය. 2024 දී ප්‍රාථමික ගිණුමේ ශේෂය අතිරික්තයක් ලෙස වාර්තා වූ අතර, එය රාජ්‍ය මූල්‍ය ක්ෂේත්‍රයේ ධනාත්මක සංලක්ෂයක් සේ සනිටුහන් විය. 2022 වසරේ මැද භාගයේ සිට ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ පිළියම් යෙදීමේ ක්‍රියාමාර්ග යටතේ වඩා ස්ථායී ආර්ථික පරිසරයක් බිහි වූ අතර, එය තිරසාර ආර්ථික වර්ධනයකට මඟ පෙන්වී ය. බලශක්ති අංශයේ මිල ගණන් පහත හෙළීම යන ප්‍රධාන කාරණය හේතුවෙන් උද්ගත වූ 2023 වසරේ සිට පැවතෙමින් ආ නිරුද්ධමන ප්‍රවණතාවය, ජීවන වියදම සහ නිෂ්පාදන පිරිවැය අඩු වීම කෙරෙහි දායකවී ඇති අතර, එය සමස්ත ආර්ථිකය විෂයයෙහි ඵලදායී ලෙස බලපෑම් කර තිබිණ.

ආර්ථිකයේ බාහිර ක්ෂේත්‍රය, අභියෝගාත්මක ගෝලීය පරිසරයක් මධ්‍යයේ වුව ද, ඉහළ ස්ථායීභාවයක් නිරූපණය කළේ ය. ආර්ථික අර්බුදයේ පීඩනයෙන් ප්‍රකෘතිමත්භාවය කරා ගමන් කෙරෙන ප්‍රයත්නයේ දී, ශ්‍රී ලංකා රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ අරමුදල් පහසුකම ආශ්‍රිත (IMF - EFF) වැඩසටහන සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු සාර්ථකව ක්‍රියාවට නැංවීමට සමත් විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ අරමුදල් පහසුකම ආශ්‍රිත වැඩසටහන යටතේ එහි තෙවැනි වාරික මුදල ලබා ගැනීම, රජයේ සවිමත් කාර්ය සාධනය විෂයයෙහි බෙහෙවින් හිතකර වූ අතර, එමගින්, 2024 දෙසැම්බර් මසින් අවසන් වූ වර්ෂය සඳහා වන සියලු ප්‍රමාණාත්මක ඉලක්ක සපුරා ගැනිණි.

## 2024 වර්ෂය තුළ ආර්ථිකයේ උද්ධමනය

2024 සැප්තැම්බර් මාසයෙන් ඇරඹෙමින් ආර්ථිකයේ උද්ධමනය, නිරුද්ධමනකාරී තත්වයක් කරා පිවිස, වර්ෂයේ ඉතිරි මාසවල දී එය තව දුරටත් තීව්‍ර වූ අතර, 2024 දෙසැම්බර් මස අවසානය වන විට -1.7% ක් වූ අව නිරුද්ධමනයක් ලෙස වාර්තා විය. කෙසේවුව ද, අගය එකතු කළ බද්ද (VAT) ඉහළ යාම, වැය අයිතම කීපයක් අගය එකතු කළ බද්දෙන් නිදහස් කිරීමේ සහනයෙන් ඉවත් කිරීම සහ ආහාර උද්ධමන තත්ත්වයේ සැලකිය යුතු වැඩි වීම යන කරුණු මත 2024 වර්ෂයේ මුල් භාගයට අයත් මාසවල දී උද්ධමනය තුළ සුළු ඉහළ යාමක් පිළිබිඹු විය. 2024 වර්ෂයේ මුල් භාගයට අයත් මාසවල දී පැවති උද්ධමනයේ එම ඉහළ යාම, 2024 මාර්තු මාසයේ දී විදුලි ගාස්තු අඩු කිරීම කරණකොට ගෙන තව දුරටත් දැඩිව නොපැවතියේ ය.

### කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් වූ ශීර්ෂ උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය)




*මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව*

## වෙළෙඳපළ පොලී අනුපාත

2023 වසරේ ජූනි මස සිට ක්‍රියාත්මක කරන ලද අනුකලනීය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, 2024 වසර පුරා වෙළඳපොළ පොලී අනුපාත පහළ යාමේ ප්‍රවණතාවයක් කරා නැඹුරු වීම සඳහා දායක වී තිබිණි. 2024 වසරේ නොවැම්බර් මස සිට ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාත සහිත ප්‍රතිපත්ති පොලී අනුපාත ක්‍රමවේදයක සිට තනි ඉලක්කමේ ප්‍රතිපත්ති පොලී අනුපාත ක්‍රමවේදයක් වෙත මාරුවීමේ විශිෂ්ට ප්‍රතිපත්ති තීරණයට එළැඹීම ද වෙළඳපොළ පොලී අනුපාත තව දුරටත් පහත හෙළීමක් උදෙසා හේතුකාරක වූයේ ය. වසර මුළුල්ලේ සාමාන්‍ය බර තැබූ කැඳවුම් මුදල් අනුපාතය (AWCMR), මූල්‍ය ප්‍රතිපත්ති තීරණ තව දුරටත් ලිහිල් කිරීම සහ දේශීය මුදල් වෙළඳපොළේ ද්‍රවශීලතාවයේ තත්ත්වය වර්ධනය වීම යන කරුණු අනුව යම් පහත වැටීමේ නැඹුරුවක පැවතියේ ය. මෙම හේතුව මත, රජයේ ඇප සුරැකුම්පත්වල ඉපැයුම්හි ඵලදා අනුපාත ඉහළ යාමේ ප්‍රවණතාවය මන්දගාමී තත්ත්වයකට පත් විය.

2024 වසර තුළ, සාමාන්‍ය බර තැබූ තැන්පතු අනුපාතය (AWDR) සහ සාමාන්‍ය බර තැබූ ස්ථාවර තැන්පතු අනුපාතය (AWFDR) දළ වශයෙන් 4.1% සිට 5.6% දක්වා පහත වැටීම කරණකොට ගෙන, රුපියල අනුව වර්ගගත පොලී දරන තැන්පතු මත උද්ගත වූ සැලකිය යුතු පොලී අනුපාත අඩුවීමක් බලපත්‍රලත් වාණිජ බැංකු (LCBs) විසින් අත්දකින ලද්දේ ය. එමෙන්ම, එක් වසරක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතය, 2024 ජනවාරි මස සිට 2024 දෙසැම්බර් මස දක්වා ඇරැඹී, පිළිවෙළින්, 12.93% සිට 8.96% දක්වා වූ ප්‍රමාණයකින් අඩු විය. සමස්තයක් වශයෙන් සලකා බැලූ විට, මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, 2024 වසර තුළ අරමුදලේ පොලී ආදායම හීන කිරීමට හේතුකාරක වූ බව කිව හැකි ය.

මෙම සිදුවීම් දාමය මගින් යෝජනා කෙරෙනුයේ, පුද්ගලික අංශයේ ණය වර්ධනය උදෙසා වූ සානුබලදායී පරිසරයක් තවදුරටත් පවත්වා ගැනෙන අතරම, වැඩි දියුණුවට පත් සාර්වආර්ථික ස්ථායිතාව කෙරෙහි ප්‍රතිචාර දක්වන පොලී අනුපාත ක්‍රමික වශයෙන් සාමාන්‍යකරණය කරා පරිවර්තනය වීමකි.

### ප්‍රතිපත්ති පොලී අනුපාත




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*







*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

# ආයෝජනය

## ආයෝජන පිළිබඳ දළ විශ්ලේෂණය 2024

2024 වසර තුළ දී, ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු ඇති වූ අවිනිශ්චිතතා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමේ ක්‍රියාවලියට අදාළව ගන්නා ලද ප්‍රතිපත්ති තීරණ සහ ජනාධිපති මැතිවරණය පැවැත්වීම දක්වා වූ වසරේ මුල් භාගය තුළ පැවති දේශපාලනමය දෙගිඩියාව වැනි අභියෝගාත්මක වෙළඳපළ තත්ත්වයන් යටතේ ආයෝජන ක්‍රියකාරකම් සිදු කෙරිණි. ආයෝජන ප්‍රතිපත්තිය මගින් ලද මග පෙන්වීම අනුව යමින්, මණ්ඩලයේ වත්කම් වෙන් කිරීමේ කාර්යයෙහිලා ප්‍රමුඛත්වය ලබා දුන්නේ, ස්වකීය ආයෝජනවල සුරක්ෂිතභාවය යන උච්චතම අරමුණට අනුගතව අති ඉස්තරම් සුරැකුම් තැන්පතු මත ඉතා සැලකිය යුතු ප්‍රමාණවලින් ආයෝජනය කිරීමේ අභිප්‍රාය පෙරදැරිව ය.

2023 වසර හා සංසන්දනාත්මකව බලන කළ, දැනට සිදු වෙමින් පවත්නා ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග හරහා කුළුගැන් වූ වෙළඳපළ පොලී අනුපාත විෂයයෙහි සැලකිය යුතු ලෙස පිරිහෙමින් පවත්නා ප්‍රවණතාව, මණ්ඩලයේ ස්ථාවර ආදායම් සුරැකුම්හී ආයෝජන කළඹ ආශ්‍රිත ඉපැයුම් කෙරෙහි අහිතකර ලෙස බලපෑවේ ය. රාජ්‍ය හා ආයතනික ණය සාධන පත්‍ර හරහා ඉපැයුම් කෙරෙහි සෘජුව බලපෑම් කළ ආර්ථික ක්‍රියාකාරකම් උත්තේජනය කරනු පිණිස, 2024 වසරේ මුල් වකවානුවේ සිට එක් රැයින් පැන නැගි අනපේක්ෂිත පොලී ප්‍රතිපත්ති අනුපාත, පුළුල් ලෙස ප්‍රතික්ෂේප කෙරිණි.

2024 වසර තුළ කොටස් වෙළඳපොළේ ආයෝජන අවස්ථා සලසා ගැනීම සඳහා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වැඩි අවධානයක් සහිත ප්‍රවේශම් සහගත ප්‍රවේශවලට එළඹියේ ය. කොටස් වෙළඳපොළ සුවිශේෂී ලෙස එලදායී කාර්ය සාධනයක් දක්වා සිටි කාල සීමාව තුළ, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, ආදායම් ජනනය කරනු පිණිස විශේෂ ක්‍රියාකාරීත්වයකින් යුතුව කටයුතු කළේ ය. සමස්තයක් වශයෙන් බලන කළ, 2024 වසර සඳහා අයවැය ප්‍රක්ෂේපිත රු. බිලියන 61.9 ක් වූ ආදායමට සාපේක්ෂව, රු.බිලියන 65.87 ක් වූ ප්‍රමාණයේ මුළු ආදායමක් ලබා ගැනීමට මණ්ඩලය සමත් විය. ඒ අනුව, උද්ගත වූ සියලු අභියෝග මධ්‍යයේ වුව ද, දෙවැනි සමගාමී වසර සඳහාත් සිය සාමාජිකයින් වෙත 10% ක් වූ මුළු ප්‍රතිලාභ පිරිනැමීමක් ප්‍රකාශයට පත් කිරීමට මණ්ඩලයට හැකි විය.

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මුළු ආයෝජන කළඹ, 2024 වසර අවසානය වන විට රු. බිලියන 581 දක්වා ඉහළ ගිය අතර, එය, 2023 වසර අවසානයේ දී වාර්තා වූ රු. බිලියන 515 ක් වූ ප්‍රමාණයට සාපේක්ෂව 12.78% ක වර්ධනයක් වේ. තවද, 2023 වසරේ දී රු. බිලියන 1.8 ක් වූ කොටස් ආදායම, 2024 වර්ෂය තුළ රු. බිලියන 2.8 දක්වා පිළිවෙළින් ඉහළ යාමක් විද්‍යාමාන කරමින්, 56% ක වෘද්ධියක් වාර්තා කළේ ය. ඊට හේතු වූයේ, විවිධාංගික අංශවලින් සමන්විත සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සතු කොටස් ආයෝජන කළඹ ගෙන හැර දැක්වූ සුවිශේෂී කාර්ය සාධනයයි.

## 2024.12.31 වන දිනට ආයෝජන කළඹ ව්‍යාප්තිය සහ සංයුතිය

2024.12.31 වන දිනට ආයෝජන කළඹ ව්‍යාප්තිය සහ සංයුතිය




2024.12.31 වන දිනට ආයෝජන කළඹ සංයුතිය




## ස්ථාවර ආදායම් සුරැකුම්පත්හි ආයෝජනය

රු. බිලියන 562.3 ක් වූ මුදලක් වශයෙන් ගණනය වන ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ආයෝජන කළ අරමුදල්වල, 2024 වසරේ දී කළ එහි මුළු ආයෝජන කළඹේ 96.76% ක් වූ ප්‍රමාණයක් සමන්විත වන අතර, ඉන් 95% කින්ම නියෝජනය වන්නේ, රජයේ භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත්වල කළ ආයෝජනයි. 2023 වසර හා සංසන්දනාත්මකව ගත් කළ, 2024 දී වෙළඳපළ පොලී අනුපාත සැලකිය යුතු මට්ටමකින් ක්‍රමයෙන් පහළ ගියේ ය. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විවිධ කාල සීමා යටතේ, රජයේ භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත්වල අරමුදල් ආයෝජනය කිරීමට කටයුතු කරමින් සාමාජික අරමුදල වෙනුවෙන් තිරසාර සාමාන්‍ය ඵලදාවක් පවත්වා ගෙන යාමට සමත්ව සිටී.

2024 වසර තුළ, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ස්ථාවර ආදායම් සුරැකුම්පත් මත රු. බිලියන 62 ක මුළු ආදායමක් ලබා ගැනීමට සමත් වූ අතර, එය, 2023 වසරට සාපේක්ෂව 3.2% ක සුළු අඩුවීමක් ලෙස සලකනු ලැබේ. මෙම අඩුවීම සඳහා ප්‍රධාන හේතුව වූයේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රටේ ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමේ ක්‍රියාවලිය අරබයා ගත් පිළියම් යෙදීමේ ක්‍රියාමාර්ගවල බලපෑමයි.

ආයෝජන කළඹ




## කොටස් ආයෝජන

ජනාධිපති මැතිවරණය සහ පාර්ලිමේන්තු මහ මැතිවරණය යන මැතිවරණ දෙකම ජය ගනිමින් රජය විසින් ශක්තිමත් ජන වරමක් ලබා ගැනීම යන පසුබිම සහිතව, 2024 වසරේ අවසාන කාර්තුව තුළ මූල්‍ය ක්‍රියාකාරකම්වල ඉහළ වර්ධනයක් කෙරෙහි දායක වූ විවර්ධිත ආර්ථික සහ දේශපාලනික ස්ථායීතාවය මධ්‍යයේ, ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපළ 2024 වසර අවසානය වන විට ආකර්ශනීය වෘද්ධියක් වාර්තා කළේ ය. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව තනි ඉලක්කමේ ප්‍රතිපත්ති පොලී අනුපාත ක්‍රමයකට සංක්‍රමණය වෙමින් කටයුතු කොට, එම යාන්ත්‍රණය ආර්ථිකයේ ප්‍රකෘතිමත්භාවය කෙරෙහි පිටුබලයක් වනු පිණිසත්, කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම පිණිසත් ස්වකීය මූල්‍ය ප්‍රතිපත්ති අනුපාතය 8% ක මට්ටමකින් පවත්වා ගෙන ගොස් තිබේ. මෙම පියවර, මූල්‍ය වෙළඳපළ විශ්වාසය සහ ස්ථායීත්වය ගොඩනගමින්, බැංකු ක්ෂේත්‍රයේ ආයෝජක විශ්වසනීයතාව වර්ධනය කිරීම සඳහා ප්‍රබල ලෙස හේතු සාධක වූයේ ය. 2024 වසරේ දී සියලු කොටස් මිල දර්ශකය (ASPI) දළ වශයෙන් 49% කින් ඉහළ වෘද්ධියක් ලබා, 2023 වසර අවසානයේ දී පැවති 10,654 ක් වූ ලක්ෂ්‍යය සීමාව හා සංසන්දනාත්මකව, 2024 දෙසැම්බර් මාසය වන විට 15,944 ක් වූ ලක්ෂ්‍යය සීමාව ඉක්මවා ගියේ ය. 2023 මූල්‍ය වසරේ දී රු. මිලියන 1,696 ක් වූ සාමාන්‍ය දෛනික පිරිවැටුම, 2024 මූල්‍ය වසරේ දී රු. මිලියන 2,240 ක් දක්වා ඉහළ ගිය අතර, එමගින්, වෙළඳපළ ක්‍රියාකාරකම් තුළ සැලකිය යුතු වර්ධනයක් ගෙන හැර දැක්වී ය.

2024 වසර අවසානයේ දී, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, ස්වකීය මුළු අරමුදලෙන් කෙරෙන කොටස් ආයෝජනය 2.31% ක් වූ මට්ටමේ පවත්වා ගැනීමට සමත් විය. කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත බොහොමයක් සමාගම්, සිය සාර්ව ආර්ථික ස්ථායිතාව ප්‍රතිසංස්කරණය කර ගැනීමේ තත්ත්වයන් මධ්‍යයේ වුව ද, තම ව්‍යාපාරික ක්‍රියාකාරකම් දිරි ගන්වමින් මනා කාර්ය සාධනයක් දක්වා ඇත. මේ හේතුව මත, බොහෝ සමාගම්වලට 2024 මූල්‍ය වර්ෂය සඳහා ලාභාංශ ප්‍රකාශ කිරීමට හැකි විය. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, 2024 මූල්‍ය වර්ෂය සඳහා එහි කොටස් ආයෝජන කළඹ මත ලාභාංශ සහ ප්‍රාග්ධන ලාභ වශයෙන් රු. මිලියන 2,427 ක් වූ ආදායමක් ලබා ගැනීමට සමත් වූ අතර, එම කාර්ය සාධනය, 2023 වසරට සාපේක්ෂව සැලකිය යුතු වර්ධනයක් වාර්තා කිරීමක් වූයේ ය. තවද, 2024 වසර අවසානයේ දී වාර්තා වූ සියලු කොටස් මිල දර්ශක අගයේ හිතකර කාර්ය සාධනය හේතුවෙන්, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කොටස් ආයෝජන කළඹ රු. බිලියන 4.8 ක් වූ ප්‍රමාණයකින් ඉහළ අගයක් ගත්තේ ය.




## අනාගත ඉදිරි දැක්ම

2024 වර්ෂය වන විට, ශ්‍රී ලංකාවේ ආර්ථිකය දැඩි මූල්‍ය අර්බුදයක් පසුකර යාමෙන් පසුව, එය නැවත ප්‍රතිසාධනය වන ලකුණු ප්‍රදර්ශනය කරමින්, 2024 වසරේ දී 5% ක දළ ජාතික නිෂ්පාදිත (GDP) වර්ධනයක් අත් කර ගත් අතර, ඊට හේතු සාධක වූයේ, කාර්මික අංශයේ, විශේෂයෙන්, ඉදිකිරීම් සහ ආහාර හා පාන නිෂ්පාදනය යන ක්ෂේත්‍රවල ඇති වූ පුනරුත්ථානයත්, සංචාරක අංශය ආශ්‍රිත සේවාවන්හි සවිමත් කාර්ය සාධනයත් යන කරුණු ය.

පොලී අනුපාත ලිහිල්කරණය යටතේ අපේක්ෂිත යහපත් පුද්ගලික අංශ ණය වර්ධනය සමඟ මූල්‍ය ප්‍රතිපත්ති රැඳී පවතිනු ඇත. බාහිර ක්ෂේත්‍රය පිළිබඳව සලකා බලන කළ, 2025 වසර තුළ ආන්තික වශයෙන් ජංගම ගිණුම් අතිරේකයක් කෙරෙහි සහාය වන සංචාරක සේවා, විදේශ ප්‍රේෂණ හා සේවා අපනයන මඟින් ලැබෙන විදේශ මුදල් ආගලන යනාදිය හා එක්ව පාලනය කර ගත හැකි තත්වයේ වෙළඳ හිඟයක්, වාහන ආනයනවල සීමා ලිහිල් කිරීම මධ්‍යයේ වුව ද, පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉදිරිය දෙස බලන විට, බාහිර ගිණුම, පාලනය කළ හැකි හිඟයකට මාරු වනු ඇති අතර, ණය තිරසාරභාවය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ අරමුදල් පහසුකම ආශ්‍රිත (IMF-EFF) වැඩසටහනේ අඛණ්ඩ ක්‍රියාත්මක වීම කරණකොට ගෙන, මූල්‍ය ගිණුම තුළ ශුද්ධ මුදල් ආගලන වාර්තා විය හැකි ය. ශ්‍රී ලංකා මහ බැංකුව නම්‍යශීලී විනිමය පොලී අනුපාත පවත්වාගෙන යමින් විදේශ සංචිත ගොඩනගා ගැනීමට කටයුතු කරනු ඇත. නව නීති සම්පාදනය කිරීම් සහ අඛණ්ඩව සිදු වන වැඩි දියුණු කිරීම් මගින් අනුග්‍රහිත වූ රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනය ශක්තිමත් ලෙස පවතිනු ඇතැයි ප්‍රක්ෂේපනය කෙරේ. ඔරොත්තු දීමේ හැකියාව සහතික කරමින්, වඩා හොඳ ණය ප්‍රතිගෙවුම් ධාරිතාවක් හා නියාමන වැඩි දියුණු කිරීම් සමඟ මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථායිතාව ද වර්ධනය වීමට අපේක්ෂිත ය. මැදි අවධි ආර්ථික වර්ධනය පවත්වා ගෙන යාම සඳහා ව්‍යුහමය ප්‍රතිසංස්කරණ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන මූලික සාධක ලෙස ක්‍රියා කරනු ඇත.

පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගත කිරීම සිදු වූ යුගයේ දී සහ වර්තමාන ආර්ථික ප්‍රතිසාධන ක්‍රියාවලිය අතරතුර සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, එහි සාමාජිකයින් සඳහා නිපුණතා සවියි සහ විශ්ව යාත්‍රී වැනි නව ප්‍රතිලාභ යෝජනා ක්‍රම පූර්වගාමී කාර්යයන් ලෙස සලකා හඳුන්වා දීම මගින්, වාර්ෂික සාමාජික ප්‍රතිලාභ සලසා දීමෙන් පරිබාහිර වූ ගුණාත්මකභාවයෙන් යුතු සේවා වැඩි දියුණු කළේ ය. ඊට සමගාමීව, ප්‍රතිලාභ ප්‍රශස්තකරණය සිදු කෙරෙන අතරම ඒ හා බැඳි අවදානම් ඵලදායක ලෙස සමනය කිරීමේ අරමුණ පෙරදැරිව, මණ්ඩලය, එහි ආයෝජන කළඹ විවිධාංගීකරණය කිරීම සඳහා ආයතනික ක්ෂේත්‍රය තුළ උදා වන අවස්ථා හඳුනා ගනු පිණිස නිසි සුපරීක්ෂාවෙන් පසු වේ. ඉදිරිය දෙස බලන විට, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, රටේ ආර්ථිකය ප්‍රකෘතිමත් වීම හා දිගු කාලීන තිරසාරභාවය යන කර්තව්‍යයන් උදෙසා කැපවීම කෙරෙහි එක්ව අත්වැල් බැඳ ගනිමින්, සුභවාදී ආයෝජන අවස්ථා ලැබෙතැයි යන අභිලාෂයෙන් යුත් ධනාත්මක අනාගත දෘෂ්ටියකින් සිය කටයුතු නොකඩවා පවත්වාගෙන යයි.

# දායක මුදල් රැස්කිරීම් සහ සේවායෝජක සබඳතා

සේවානියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ රැස්කිරීම් සහ සේවායෝජක සබඳතා කොට්ඨාශය සේවායෝජකයින් විසින් ගෙවීමට නියමිත දායක මුදල් නිසි පිරිදි නියමිත කාලය තුල රැස් කිරීම සහ ප්‍රමාද වන දායක මුදල් සඳහා පැනවෙන අධිභාර අය කිරීම යන කාර්යයන් වෙනුවෙන් වගකීම උසුලයි. ඒ සඳහා සම්බන්ධ වන ප්‍රධාන පාර්ශවකරුවන් වන සේවායෝජකයන්, බැංකු ආයතන සහ තැපැල් දෙපාර්තමේන්තුව සමඟ මනා සම්බන්ධීකරණයක් සිදු කරමින් ප්‍රේෂණය කරනු ලබන දායක මුදල් නිවැරදිව ගිණුම්ගත කිරීම හා වාර්තා කිරීම සිදු කරයි.

එයට අමතරව නව සේවායෝජකයන් හදුනාගැනීම සහ ඔවුන් මෙම අරමුදල යටතේ ලියාපදිංචි කිරීම යන කටයුතු ඉටු කරනු ලබන්නේද මෙම කොට්ඨාශය මගිනි. පවතින ක්‍රමවේදය යටතේ කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශය විසින් 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන අනුව සේවා යෝජකයන් වෙත ලබා දෙන සේව්‍ය අංකය යටතේම සේවා නියුත්තයන්ගේ භාර අරමුදල සඳහා ද ලියාපදිංචි කර සරල අයදුම්පත්‍රයක් මගින් ලබා ගන්නා තොරතුරු මත සේවා යෝජක ගිණුම් සැකසීම සිදුකෙරේ. ඒ අනුව මණ්ඩලය විසින් සේවායෝජක ලියාපදිංචි කිරීමක් සෘජුව සිදු නොකරයි.එයට අමතරව ප්‍රාදේශීය කාර්යාල විසින් සිදුකරන ක්ෂේත්‍ර පරීක්ෂණ වලින් ලබා ගන්නා තොරතුරු පදනම් කරගෙන සහ සේවා යෝජකයන්ගේ ඉල්ලීම් මත නව සේවා යෝජක ගිණුම් සැකසීම සිදු කෙරේ.

සේවායෝජකයන් දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් ඉටු කිරීම මෙන්ම ස්වයං රැකියාවල නියුක්ත වූවන් සහ විදේශ ගතව සංක්‍රමණික රැකියාවල නියුක්තවූවන් සේවානියුකතයන්ගේ

භාර අරමුදල යටතේ සාමාජිකත්වය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් මෙම කොට්ඨාශය කටයුතු කරයි.

ඒ අනුව රැස්කිරීම් සහ සේවායෝජක සබඳතා කොට්ඨාශය මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල ජාලය සමඟ එක්ව නියමිත කාර්ය සාධන ඉලක්ක වෙත ගෙන යාම සිදු කරයි.

| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| සක්‍රීය සේවා යෝජකයන් ගණන | 75,731 | 69,094 | 64,026 | 75,485 | 79,895 |
| සක්‍රීය සමාජිකයන් ගණන | 2,680,000 | 2,430,091 | 2,455,609 | 2,592,923 | 2,548,200 |
| ස්වයං රැකියාවන්හි නියුතු සාමාජිකයන් ගණන | 41,867 | 41,517 | 41,113 | 43,640 | 44,494 |
| සංක්‍රමණික සේවක සාමාජිකයන් ගණන | 220 | 228 | 241 | 274 | 291 |

## තම සේවකයින් සඳහා දායක මුදල් ගෙවීමට අනුකූලතාව දැක්විය යුතු සේවායෝජකයන්

ස්ථිර විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන රාජ්‍ය අංශයේ සහ පුද්ගලික අංශයේ රැකියා වල නියුතු සේවානියුක්තයන් 1980 අංක 46 දරන සේවානියුක්තයන්ගේ භාර අරමුදල් පනත අනුව නීතිමය පදනමක් මත අරමුදලේ සාමාජිකයන් වන අතර ස්වයං රැකියාවල නිරත වන සහ විදේශ ගතව රැකියාවල නියුක්ත සංක්‍රමණික සේවකයින් හටද තම ස්වේච්ඡාවෙන් අරමුදලේ සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කල හැක.

ඒ අනුව ශ්‍රී ලංකාවේ සමස්ත සේවානියුක්තයන්ගෙන් ස්ථිර විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන රැකියා වල නියුතු සියළු සේවානියුක්තයන් ආවරණය වන පරිදි විශ්‍රාම සහ අනෙකුත් සුභසාධන ප්‍රතිලාභ ලබාදීම මෙම අරමුදල මගින් අපේක්ෂා කෙරේ. මෙහිදී සේවා යෝජකයන් තම ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා පමණක් නොව අනියම් හා කොන්ත්‍රාත් පදනමින් වැඩ කරන සේවකයන් මෙන්ම දෛනික හෝ කෑලි පදනම මත වැටුප් ලබන සේවකයන්ද සේවානියුක්තයන්ගේ භාර අරමුදල සඳහා දායක මුදල් ගෙවීම කල යුතුවේ. කෙසේ නමුත් කම්කරු දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාලේඛණ අනුව වාර්තාගත සේවායෝජකයන් සහ ඔවුන් යටතේ වන සියළු සේවකයන් සංඛ්‍යාව සහ මෙම අරමුදල යටතේ ලියාපදිංචි සංඛ්‍යාව අතර සැලකිය යුතු පරස්පරතාවන් පවතී. මෙම අසමතුලිත බව අවම කිරීම සඳහා මණ්ඩලය විසින් යාවත්කාලීන තොරතුරු අදාල ආයතන වලින් ලබාගෙන එම තොරතුරු මත ක්ෂේත්‍ර පරීක්ෂණ පවත්වමින් ක්‍රියාත්මක කිරීමේ කාර්යයන්හි නියැලේ.

මණ්ඩලය විසින් ප්‍රධානය කරනු ලබන විශ්‍රාම ප්‍රතිලාභ වලට අමතරව පිරිනමනු ලබන අනෙකුත් ප්‍රතිලාභ ප්‍රධානය කරනු ලබන්නේ සේවා යෝජකයින් විසින් සේවානියුක්තියන්ගේ භාර අරමුදල සඳහා ගෙවනු ලබන දායක මුදල් අඛණ්ඩව නිසි පරිදි සිදු කර ඇති සාමාජිකයන් වෙත පමණි. එබැවින් එම ප්‍රතිලාභ සඳහා සාමාජිකයන් වෙත හිමිකම් පෑමට හැකිවන සේ දායක මුදල් ප්‍රමාදයකින් තොරව අඛණ්ඩව සේවායෝජකයන් විසින් සිදු කරන්නේද යන්න අප කාර්යය මණ්ඩලය විසින් නියාමනය කෙරේ.

## ප්‍රාදේශීය කාර්යාල මගින් දායක මුදල් අයකිරීම

සේවානියුක්තයන්ගේ භාර අරමුදල වෙත තම සේවකයන් වෙනුවෙන් දායක මුදල් ගෙවිය යුතු සේවායෝජකයන් අලුතින් හදුනාගෙන ඒ සඳහා යොමු කරවීම සහ දැනටමත් ලියා පදිංචි වී සිටින සේවා යෝජකයින්ගේ දායක මුදල් ගෙවීම් අනුකූලතාවය සහතික කිරීම සඳහා දිවයිනේ සෑම ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි පිහිටුවා ඇති සේවානියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල 19 ක් විසින් වාර්ෂිකව සේවා යෝජකයන් නිරීක්ෂණය සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ 40,000 සිට 45,000 දක්වා ගණනක් සිදු කර ඇත. මෙම ක්ෂේත්‍ර පරීක්ෂණ අතරින් 70% ක් පමණ සිදු කර ඇත්තේ ගෙවීම් ප්‍රමාදයන් වාර්තා වී ඇති ආයතන මූලික කරගෙන වේ. ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් හදුනාගනු ලබන නව සේවා යෝජකයින් සංඛ්‍යාව වර්ෂයකට 3,000 ක පමණ සාමාන්‍ය අගයක් ගනී. 2024 වර්ෂයේදී සිදු කර ඇති මුළු ක්ෂේත්‍ර පරීක්ෂණ සංඛ්‍යාව 27,940 ක් වන අතර එමගින් දායක මුදල් නොගෙවන බවට අනාවරණය කරගෙන ඇති සේවා යෝජකයන් සංඛ්‍යාව 22,641 කි. එසේම ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් අනාවරණය කරගත් කරුණු මත අරමුදල සඳහා ලියාපදිංචි වී ඇති නව සාමාජික සංඛ්‍යාව 18,922 කි.

## දායක මුදල් මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ ගෙවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2311/39 හා 2022.12.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් නිකුත් කර ඇති නියෝග අනුව, සේවා නියුත්තයන්ගේ භාර අරමුදල් ප්‍රේෂණය කිරීමේදී, 2023 පෙබරවාරි 01 වැනි දින සිට සේවක සංඛ්‍යාව 15 ට වැඩි ආයතන විසින්, පරිගණක පද්ධතියක් හෝ ජංගම ඉලෙක්ට්‍රොනික උපාංග යක් හරහා ඉලෙක්ට්‍රොනිකව දායක මුදල් ප්‍රේෂණය කළ යුතුය. ඒ අනුව 2024 වර්ෂයේ රැස් කරන ලද දායක මුළු

දායක මුදලින් 82% මාර්ගගත ක්‍රමය මගින් සිදු කර ඇති අතර එය සමස්ථ සක්‍රීය සේවා යෝජකයන්ගේ සංඛ්‍යාවෙන් 19% ක් වේ. රජයේ ඩිජිටල් ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වර්තමාන විධිවිධාන අනුව ඉහත නියෝගයට අනුකූලව මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ දායක මුදල් ගෙවීම හා ප්‍රේෂණ නිවේදන යොමු කිරීම පිළිබඳව සේවායෝජකයන්ගේ දැඩි අවධානය යොමු කර ඇති අතර ප්‍රේෂණ නිවේදන/සාමාජික තොරතුරු එකවර සැපයීමට හැකි නිසා වඩාත් පහසු සහ සුදුසු ක්‍රමය වශයෙන් නිර්දේශ කෙරේ. ඒ අනුව සේවක සංඛාව 15ට අඩු ආයතන සඳහාද මෙම ක්‍රමය මත දායක මුදල් සහ ප්‍රේෂණ නිවේදන යොමු කිරීමට හැකියාව ඇති හෙයින් ඒ සඳහා ඔවුන් පෙළඹවීම සිදු කෙරේ.

ඒ අනුව මෙම ක්‍රමයට අනුගතව දායක මුදල් ප්‍රේෂණය කිරීම මෙතෙක් සිදු නොකරන සේවායෝජකයන් ඒ සඳහා යොමු කිරීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කරනු ලබයි.

මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ සේවායෝජකයන්හට පහත ක්‍රම 2ක භාවිතයෙන් දායක මුදල් ගෙවීම් සිදු කිරීම සඳහා පහසුකම් සලසා ඇත.

1. **විද්‍යුත් බැංකුකරණය** (E-Banking/Online Banking)

   මාර්ගගත ක්‍රම ඔස්සේ විද්‍යුත් බැංකුකරණය (ඍ-ඊබන/ධබකද්‍යබැ ඊබනද්‍යබට) මගින් දායක මුදල් ගෙවීම සඳහා පහත සඳහන් වාණිජ බැංකු නමය මගින් පහසුකම් සලසා ඇත.

   - ලංකා බැංකුව
   - මහජන බැංකුව
   - කොමර්ෂල් බැංකුව
   - සම්පත් බැංකුව
   - සෙලාන් බැංකුව
   - නේෂන්ස් ට්‍රස්ට් බැංකුව
   - ඩී එෆ් සී සී බැංකුව
   - හැටන් නැෂනල් බැංකුව
   - ජාතික සංවර්ධන බැංකුව

2. **සෘජුහර කිරීම්** (Direct Debit)

   සෘජුහර කිරීම් (Direct Debit) ඔස්සේ දායක මුදල් ගෙවීම ඕනෑම වාණිජ බැංකුවක් මගින් සිදුකළ හැකිය.

   ඉහත සඳහන් මාර්ගගත ක්‍රමයට අමතරව සාම්ප්‍රදායික ක්‍රම වන චෙක්පත්, මුදල් ඇණවුම් සහ මුදල් මගින් ප්‍රධාන කාර්යාලයට හෝ ශාඛා කාර්යාල වෙත ගෙවීම් සිදු කිරීමට හැකියාව ඇතත් වර්ථමාන රජයේ ඩිජිටල් ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ උත්සාහයක් ලෙස මෙම ක්‍රම අධෛර්යමත් කෙරේ. ඒ වෙනුවට මාර්ගගත ක්‍රම උපයෝගී කර ගනිමින් අන්තර්ජාලය හරහා ප්‍රේෂණ සිදු කිරීම තුලින් කාර්යයන් වඩාත් සරල, පහසු සහ කාර්යක්ෂම වනු ඇත.

ඒ අනුව මාර්ගගත ක්‍රම සහ සාම්ප්‍රදායික ක්‍රම මත සිදු කර ඇති දායක මුදල් රැස්කිරීම් විශ්ලේෂණය පහත පරිදි වේ.

| # | ගෙවීම් ක්‍රමය | 2023 | | | 2024 | | | වර්ධනය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සේවා යෝජක සංඛ්‍යාව (සාමාන්‍ය අගය) | වටිනාකම (රු. මිලියන) | % | සේවා යෝජක සංඛ්‍යාව (සාමාන්‍ය අගය) | වටිනාකම (රු. මිලියන) | % | සේවා යෝජක සංඛ්‍යාව (සාමාන්‍ය අගය) | වටිනාකම (රු. මිලියන) | % |
| **මාර්ගගත ක්‍රම (Online)** | | | | | | | | | | |
| 1 | මාර්ගගත බැංකු ක්‍රමය | 9,396 | 27,925 | 74.56% | 10,618 | 32,227 | 76.65% | 1,222 | 4,302 | 15.40% |
| 2 | සෘජුහර ක්‍රමය | 191 | 1,853 | 4.95% | 209 | 2,273 | 5.41% | 18 | 419 | 22.62% |
| | එකතුව (1+2) | 9,587 | 29,778 | 79.51% | 10,827 | 34,500 | 82.05% | 1,240 | 4,721 | 15.85% |
| **සාම්ප්‍රදායික ක්‍රම** | | | | | | | | | | |
| 3 | චෙක්පත් | 37,224 | 7,309 | 19.52% | 39,074 | 7,051 | 16.77% | 1,851 | -258 | -3.53% |
| 4 | මුදල් ඇණවුම් | 2,510 | 71 | 0.19% | 2,767 | 86 | 0.20% | 258 | 15 | 20.66% |
| 5 | මුදල් | 2,654 | 293 | 0.78% | 4,128 | 409 | 0.97% | 1,473 | 116 | 39.44% |
| | එකතුව (3+4+5) | 42,388 | 7,673 | 20.49% | 45,969 | 7,546 | 17.95% | 3,582 | -128 | -1.66% |
| **මුළු එකතුව** | | **51,975** | **37,451** | **100.00%** | **56,796** | **42,046** | **100.00%** | **4,822** | **4,593** | **12.26%** |

# සාමාජික සේවා

1980 අංක 46 දරණ පනත මඟින් ස්ථාපිත කර ඇති සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වන්නේ, සේවක අයිතිය, සේවක සුභ සාධනය හා කළමනාකරණයෙහි සේවක සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම හා සාමාජිකයින්ගේ ආර්ථික ප්‍රජාතාන්ත්‍රිකය ප්‍රවර්ධනය කිරීමයි. සාමාජික සේවා කොට්ඨාශය අංශ 7කින් සමන්විත අතර ඒවායේ ප්‍රධාන කර්යයන් වන්නේ සාමාජික ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම, සාමාජිකයින් වෙත වාර්ෂික ගිණුම් ප්‍රකාශ නිකුත් කිරීම සහ සාමාජික ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ හා ව්‍යවස්ථාපිත නොවන සුභසාධන ප්‍රතිලාභ ලබා දීමට කටයුතු සම්පාදනය කිරීමයි.




*Figure 1– Organization Structure of Member Service Division*

## සාමාජික හිමිකම් ගෙවීම. (ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ)

ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ ගෙවීම් කිරීම යටතේ යම් සාමාජිකයෙකු සේවා නියුක්තිය අවසන් කළ පසු හෝ සේවා නියුක්තිය අවසන් වීමට යටත්ව වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු තම ගිණුමේ ශේෂය ලබාගැනීමට හැකියාවක් ඇති අතර සාමාජිකයා මියගිය අවස්ථාවකදී, සාමාජිකයාගේ උරුමකරුවන්, යැපෙන්නන් හෝ නාමිකයන් වෙනුවෙන් ගිණුම් ශේෂය ගෙවීම් කරනු ලැබේ.

2023 වර්ෂයේදී රුපියල් බිලියන 38 ක් සාමාජිකයින් 240,888 වෙනුවෙන් ගෙවීම් කර ඇති අතර 2024 වර්ෂය අවසානයේදී රුපියල් බිලියන 34 ක් සාමාජිකයින් 195,896 දෙනෙකු වෙනුවෙන් ගෙවීම් කර ඇත. රටේ පැවති ආර්ථික තත්ත්වය යම් මට්ටමකට ස්ථාවර වීම, සේවා නියුක්තිකයින් විදේශගත වීමේ ප්‍රවණතාවය අඩුවීම හා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් වසා දැමූ ව්‍යාපාර නැවත ආරම්භ කිරීම යන ප්‍රධාන හේතූන් මත සාමාජිකයින් විසින් 2024 වර්ෂයේදී ඔවුන්ගේ හිමිකම් ආපසු ලබා ගැනීමේ ප්‍රමාණාත්මක අඩුවීමක් පෙන්නුම් කෙරේ. මෙම අඩුවීම 2023 වර්ෂය හා සැසදීමේදී 12.8% ක් ලෙස ප්‍රතිශතාත්මකව දැක්විය හැකිය.




*Figure 2 - Annual Disbursement of Statutory Benefits by Year (2020–2024)*

## සුභසාධන ප්‍රතිලාභ (ව්‍යවස්ථාපිත නොවන ප්‍රතිලාභ)

සේ.නි.භා අරමුදල් මණ්ඩලය ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණු අතර සාමාජික සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ ආර්ථික ප්‍රජාතාන්ත්‍රිකය සුරකීමට ප්‍රමුඛස්ථානයක් හිමි වේ. ඒ අනුව 1986 වර්ෂයේදී "ස්වයංක්‍රීය ජීවිත රක්ෂණ ප්‍රතිලාභ (මරණ ප්‍රතිලාභ)යෝජනා ක්‍රමය" හඳුන්වා දීමේ සිට 2024 වර්ෂයේදී රාජ්‍ය විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා ලියාපදිංචි වන අප මණ්ඩලයේ සක්‍රීය සාමාජිකයිනගේ දූ දරුවන් වෙනුවෙන්"විශ්ව යාත්‍රා" නමින් රුපියල් 25,000.00 ක මූල්‍ය ප්‍රදානය කිරීම දක්වා සුභසාධන ප්‍රතිලාභ 11ක් පිරිනැමෙනු ලැබේ.

සාමාජික ගිණුම් ශේෂයෙන් කිසිදු මුදලක් අඩු නොකර වෛද්‍ය ආධාර ලබා දීමණි සහනදායි පොලි අනුපාතයක් යටතේ නිවාස ණය ලබා දීමෙන් නොනැවතී සාමාජිකයින්ගේ දූ දරුවන්ගේ අනාගතය ශක්තිමත් කිරීම සඳහා අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම මගින් අප මණ්ඩලීය සාමාජිකයින්ට අවැසි මොහොතේ ඔවුන්ගේ අනාගතය සුරැකීමට ශක්තියක් වෙමින් කටයුතු කරනු ලබයි.




*Figure 3: Welfare Benefits Disbursement Summary (2023 & 2024)*




*Figure 4: Breakdown of Scholarship Disbursements in 2024 – Grade 5 and A/L (previous benefit scheme) – 2024*

මෙම සියළුම ප්‍රතිලාභයන් ස්වයං රැකියාවල නියුක්තවූවන්ට හා විගමණික සේවකයින් ලෙස ලියාපදිංචි වී මණ්ඩලයේ සාමාජිකත්වය ලබා ගත් සාමාජිකයින්ටද විවෘතව ඇත.

මෙම සුභසාධන ප්‍රතිලාභවල පිරිවැය සමස්ථ සාමාජිකයින් විසින් සමානුපාතිකව දරාගනු ලැබුවද ඒ තුළින් සියලුම සාමාජිකයින්ට අවැසි මොහොතේදී රැකවරණය සැලසීමට හැකි වීම සියලුම සාමාජිකයින්ගේ නිහඬ අභිමානයක් බවට පත්ව ඇත.

2023 හා 2024 වර්ෂවලදී නිපුණතා සවිය හා විශ්ව යාත්‍රා යන සුභසාධන ප්‍රතිලාභ හඳුන්වා දෙමින් මණ්ඩලයේ සුභසාධන ප්‍රතිලාභ වලට නව මුහුණුවරක් එක් කරමින් අගය එකතු කිරීමේ වැඩපිළිවෙලක් හඳුන්වා දෙන ලදී.

උසස් පෙළ විභාගයට පෙනී සිටි දරුවන් ජාතික වෘත්තීය නිපුණතා (NVQ) 3,4 හා 5 මට්ටමේ පාඨමාලාවන් හැදෑරීමට යොමු කිරීම හරහා දෙස් විදෙස් රැකියා වෙළඳපොලට නිපුණතාවෙන් පරිපූර්ණ හා සුදුසුකම්ලත් පුද්ගලයෙකු ලෙස අභිමානයෙන් ප්‍රවිශ්ඨ වීමට රුපියල් 50,000.00ක් මූල්‍ය ප්‍රදානයක් සිදු කරනු ලබන අතර 2024 වර්ෂ අවසානයේදී සාමාජිකයින්ගේ දූ දරුවන් 05 දෙනෙකු වෙනුවෙන් රුපියල් 91,142.00 මුදලක් මෙම ප්‍රතිලාභය හරහා ගෙවීම් කර ඇත. 2024 වර්ෂයේදී උසස් පෙළ විභාගයෙන් විශිෂ්ට ලෙස සමත් වී රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන සාමාජිකයන්ගේ දූ දරුවන් සඳහා රුපියල් 25,000.00 ක මූල්‍ය ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කළ අතර දූ දරුවන් 504 දෙනෙකු වෙනුවෙන් රුපියල් 12,600,000.00 මුදලක් ගෙවීම් කර ඇත. සාමාජික සුභසාධන ප්‍රතිලාභ පුළුල් කරමින් විශ්ව යාත්‍රා ප්‍රතිලාභය හඳුන්වාදීම සුභසාධන ප්‍රතිලාභවල සුවිශේෂී මඟසළකුණක් ලෙස සටහන් කිරීමට කැමැත්තෙමි.

### සාමාජික ගිණුම් පවත්වාගෙන යාම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතෙ විධිවිධාන අනුව සේවායෝජකයින් විසින් එක් එක් සේවකයන්ගේ මාසික මුළු ඉපයීම් වලින් 3%කට සමාන මුදලක් මාසිකව මණ්ඩලය වෙත ප්‍රේෂණය කළ යුතුය. ස්වයං රැකියාවල නියුක්තවූවන් මසකට රු.500.00 ක් සහ විගමනික සේවකයින් මසකට රු.2000.00 මුදලක් මණ්ඩලය වෙත එවීමෙන් සාමාජිකත්වය ලබා ගත හැකිය.

සාමාජිකයාගේ ගිණුමේ ශේෂයට පනත මගින් නියම කර ඇති පොලී අනුපාතයට අමතරව වාර්ෂිකව ලබා දෙන ලාභාංශ මුදලින් සාමාජික ගිණුම් වර්ධනය වේ. මෙම කාර්යය සාමාජිකයින් 150 වැඩි ආයතන සඳහා සාමාජික ගිණුම් විශාල කාණ්ඩය මගින්ද සාමාජිකයින් 150 වඩා අඩු ආයතන සඳහා සාමාජික ගිණුම් කුඩා කාණ්ඩය විසින්ද සිදු කරනු ලබයි.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 8 (ඒ) වගන්තියට අනුව සෑම ගිණුම් වර්ෂයක් සඳහාම එළඹෙන වර්ෂයේ සැප්තැම්බර් මස 30 වන දිනට පෙර සෑම සක්‍රිය සාමාජිකයින්ගේම පෞද්ලික ගිණුම් ශේෂය වාර්ෂික ගිණුම් ප්‍රකාශණයක් මගින් සාමාජිකයින් වෙත නිවේදනය කළ යුතු වේ.

2024 වර්ෂය අවසන් වන විට අප මණ්ඩලයේ සක්‍රිය සාමාජික ගිණුම් 2,602,200ක් අතුරින් ගිණුම් 2,366,715 ක් යාවත්කාලීන කරමින් ඔවුන්ගේ සේවා යෝජකයන් වෙත සාමාජික ගිණුම් ප්‍රකාශන යවා ඇත. තවද අක්‍රිය සාමාජික ගිණුම් 14,986,000 පමණ පවතින අතර ගිණුම් 14,188,299 පමණ යාවත්කාලීන කර ඇත.

මීට අමතරව මණ්ඩලය මඟින් ක්‍රියාත්මක විද්‍යුත් සේවාව හරහා (E-service) සාමාජිකයින්ට තම පෞද්ගලික ගිණුමේ ශේෂය කෙටි පණිවිඩයක් හරහා දැනගැනීමට අවශ්‍යය පහසුකම් ද සැපයීම මගින් සාමාජිකයින්ගේ තම ගිණුම් තොරතුරු දැනගැනීමේ ප්‍රවේශය පුළුල් කිරීමට මණ්ඩලය ගෙන ඇති සුවිශේෂී පියවරකි.

## මානව සම්පත් කළමනාකරණය

විශ්‍රාම යෑම් සහ ඉල්ලා අස්වීම් හේතුවෙන් 2023 වර්ෂයේ 882 ක්ව සිටි සේවක සංඛ්‍යාවේ සුළු වෙනසක් සහිතව 2024 වසර අවසානයේ දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සතුව සේවකයින් 837 දෙනෙකු සිටියහ.

| **මට්ටම** | **රැකියා ශ්‍රේණිය** | **පුරුෂ** | **ස්ත්‍රී** | **එකතුව** |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | සාමාන්‍යාධිකාරී | 1 | - | 1 |
| | අතිරේක සාමාන්‍යාධිකාරී | - | - | - |
| | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | 7 | - | 7 |
| | සහකාර සාමාන්‍යාධිකාරී | 4 | 1 | 5 |
| | කළමනාකරු | 21 | 19 | 40 |
| | **එකතුව** | **33** | **20** | **53** |
| තෘතියික | කනිෂ්ඨ කළමනාකරු | 26 | 30 | 56 |
| | කළමනාකරණ සහකාර | 76 | 103 | 179 |
| | **එකතුව** | **102** | **133** | **235** |
| ද්විතියික | කළමනාකරණ සහකාර 2-2 | 4 | 2 | 6 |
| | කළමනාකරණ සහකාර 1-2 | 283 | 140 | 423 |
| | **එකතුව** | **287** | **142** | **429** |
| ප්‍රාථමික | ප්‍රාථමික මට්ටම | 114 | 12 | 126 |
| | | **114** | **12** | **126** |
| **මුළු එකතුව** | | **532** | **305** | **837** |

### සේවක පිරිස වයස අනුව

| සේවක පිරිස වයස අනුව (2024.12.31 දිනට)<br>වයස පරාසය (අවුරුදු) | | |
|---|---|---|
| 21-25 | 1 | 1% |
| 26-30 | 74 | 08% |
| 31-35 | 116 | 13% |
| 36-40 | 148 | 18% |
| 41-45 | 126 | 15% |
| 46-50 | 93 | 11% |
| 51-55 | 165 | 20% |
| Above 55 | 114 | 14% |
| **එකතුව** | **837** | **100%** |

### සේවක පිරිස රැකියා ශ්‍රේණිය අනුව

| | රැකියා ශ්‍රේණිය | එකතුව | % |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | සාමාන්‍යාධිකාරී | 1 | 0.12% |
| | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | 7 | 0.84% |
| | සහකාර සාමාන්‍යාධිකාරී | 5 | 0.11% |
| | කළමනාකරු | 40 | 4.78% |
| | **එකතුව** | **53** | **6.33%** |
| තෘතියික | කණිෂ්ඨ කළමනාකරු | 56 | 6.70% |
| | කළමනාකරණ සහකාර 4 | 179 | 21.39% |
| | **එකතුව** | **235** | **28.08%** |
| ද්විතියික | කළමනාකරණ සහකාර 2-2 | 6 | 0.72% |
| | කළමනාකරණ සහකාර 1-2 | 417 | 49.82% |
| | **එකතුව** | **423** | **50.54%** |
| ප්‍රාථමික | ප්‍රාථමික මට්ටම | 126 | 17.32% |
| | **එකතුව** | **126** | **15.05%** |
| **මුළු එකතුව** | | | **100.00%** |

### සේවකයන් ස්ත්‍රී පුරුෂ භාවය අනුව

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවක පුරුෂ හා කාන්තා අනුපාතය 2024 අවසානයේ දී 51.3:48.7 ක් ලෙස පැවතුනි.

| පුරුෂ | ස්ත්‍රී | මුළු එකතුව |
|---|---|---|
| 429 | 408 | 837 |
| 51.3 % | 48.7% | 100% |

### සේවක පිරිස වයස අනුව

| | |
|---|---|
| ප්‍රධාන කාර්යාලය | 505 |
| ශාඛා කාර්යාල | 332 |
| එකතුව | 837 |

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවකයින් 837 දෙනාගෙන් 505 දෙනෙක් ප්‍රධාන කාර්යාලයේ සිටින අතර 332දෙනෙක් ශාඛා ජාලය පුරා විසිරී සිටිති.

### සේවකයන් සේවයේ නිරත වී සිටීම

| විස්තර | විධායක | විධායක නොවන | එකතුව |
|---|---|---|---|
| විශ්‍රාම ගැනීම | 10 | 04 | 14 |

### සේවක ස්ථාන මාරු

මණ්ඩලයේ ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව මණ්ඩලයේ වසර පහකට වැඩි කාලයක් එකම අංශයේ සේවය කළ ලද සේවකයන් ස්ථාන මාරු සිදුකරන ලදි

### වැටුප් හා ප්‍රතිලාභ

මණ්ඩලයේ සියලුම සේවකයන් ස්ථිර තනතුරු දරයි. ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවකයන් වශයෙන් ඔවුන් තම මූලික වැටුපට අමතරව ප්‍රතිලාභ රැසක් සඳහා සුදුසුකම් ලබයි.

| | 2024<br>රු. '000 | 2023<br>රු. '000 | වෙනස්<br>% |
|---|---|---|---|
| වැටුප් | 533,429 | 562,996 | 5.25% |
| ජීවන වියදම් දීමනාව | 163,397 | 82,437 | (98.21)% |
| ආහාර දීමනාව | 11,941 | 12,898 | 7.42% |
| අතිකාල දීමනාව | 38,885 | 27,417 | (41.83)% |
| නිවාඩු දින දීමනා | 16,260 | 12,165 | (33.66)% |
| **එකතුව** | **763,911** | **697,913** | **(9.46)%** |

## ප්‍රතිලාභ

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවක සේවිකාවන්, සේවකයින් වෙත පිරිනැමෙන ප්‍රතිලාභ ගණනාවක් සඳහා සුදුසුකම් ලබයි. ඒවාට මූලික වැටුප අනුව ලබා දෙන දිරිගැන්වීම්, වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණ පහසුකම්, වාර්ෂික ප්‍රසාද දීමනා සහ විවිධ ණය, උසස් අධ්‍යාපන සුදුසුකම් සඳහා වැටුප් වර්ධක සහ සේවකයාගේ ස්ථිර ආබාධිත භාවය හෝ මරණය වෙනුවෙන් පිරිනැමෙන වන්දි යනාදිය ඇතුළත් වේ.

| | 2024 රු. '000 | 2023 රු. '000 | වෙනස % |
|---|---|---|---|
| දිරි දීමනා | 141,870 | 131,941 | (7.53)% |
| නිල ඇඳුම් සහ මැහුම් වියදම් | 24,616 | 16,801 | (46.52)% |
| විශේෂ විශ්‍රාමික ප්‍රසාද දීමනා | 1,600 | 900 | (77.78)% |
| තේ සහ අනෙකුත් කාර්ය මණ්ඩල සුබසාධන වියදම් | 16,569 | 16,019 | (3.43)% |
| නිවාඩු දින වෙනුවෙන් මුදල් ගෙවීම | 19,489 | 28,144 | 30.75% |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 78,113 | 80,801 | 3.33% |
| වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීම | 116,584 | 128,197 | 9.06% |
| නිවාස ණය සඳහා පොලිය | 7,015 | 8,963 | 21.73% |
| පොලී පිරිවැය | 39,439 | 38,786 | (1.68)% |
| වත්මන් සේවා පිරිවැය | 14,511 | 9,548 | (51.98)% |
| සේ.අ.අ. | 104,594 | 95,466 | (9.56)% |
| සේ.නි.භා.අ. | 20,941 | 19,157 | (9.31)% |
| දුරකථන බිල්පත් ප්‍රතිපූරණය කිරීම | 3,690 | 4,007 | 7.91% |
| **එකතුව** | **589,031** | **578,730** | **(1.78)%** |

## දිරි දීමනා

මූලික වැටුප පදනම් කරගෙන  දිරි දීමනාව සකස් කරනු ලබන අතර, මාසික පදනමින් ගෙවනු ලබන පැමිණීමේ සහ කාර්ය සාධන දිරි දීමනා ඇතුළත් වේ.

## වෛද්‍ය පහසුකම්

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල සේවකයින්ගේ වෛද්‍ය පහසුකම්වලට පහත සඳහන් දෑ  ඇතුළත් වේ:

- එක් සේවකයෙකුට රු. 75,000.00 ක් දක්වා වූ වාර්ෂික බාහිර රෝගී සත්කාර වෛද්‍ය ප්‍රතිපූරණය.
- එක් සේවකයෙකුට වාර්ෂිකව රු.125,000.00 ක් දක්වා වූ රෝහල් ගතව ප්‍රතිකාර ලබා ගැනීමේ වියදම් ප්‍රතිපූරණය.

## සේවකයාගේ ස්ථිර අබාධිත භාවය හෝ මරණය වෙනුවෙන් වන්දි

| සිද්ධිය | ශ්‍රේණිය / තනතුර | වන්දි ප්‍රමාණය |
|---|---|---|
| සේවකයාගේ මරණය | සභාපති/ක්‍රියාකාරී අධ්‍යක්ෂ | 1,500,000.00 |
| | ඉහළ කළමනාකරණය (2-1), (1-3) හා (1-1) | 1,450,000.00 |
| | මධ්‍යම කළමනාකරණය (1-3) | 1,350,000.00 |
| | කනිෂ්ඨ කළමනාකරු (1-1) | 1,250,000.00 |
| | කළමනාකරණ සහකාර (4) | 1,125,000.00 |
| | කළමනාකරණ සහකාර (2-2), (1-2) | 1,000,000.00 |
| | ප්‍රාථමික මට්ටම (1),(2),(3) | 875,000.00 |

| සිද්ධිය | ශ්‍රේණිය / තනතුර | වන්දි ප්‍රමාණය |
|---|---|---|
| ස්ථිර අබාධිත | සභාපති/ක්‍රියාකාරී අධ්‍යක්ෂ | 1,750,000.00 |
| | ඉහළ කළමනාකරණය (2-1), (1-3) හා (1-1) | 1,700,000.00 |
| | මධ්‍යම කළමනාකරණය (1-3) | 1,650,000.00 |
| | කනිෂ්ඨ කළමනාකරු (1-1) | 1,500,000.00 |
| | කළමනාකරණ සහකාර (4) | 1,350,000.00 |
| | කළමනාකරණ සහකාර (2-2), (1-2) | 1,200,000.00 |
| | ප්‍රාථමික මට්ටම(1),(2),(3) | 1,050,000.00 |

## වාර්ෂික ප්‍රසාද දීමනා

දෙසැම්බර් මාසයේ දී ගෙවනු ලබන වාර්ෂික ප්‍රසාද දීමනාව මාස දෙකක මූලික වැටුපට සමාන වේ.

## ණය

### විශේෂ ණය

| | |
|---|---|
| ණය මුදල | රු.100,000.00 |
| ප්‍රතිසාධන කාල සීමාව | වාරික 60 |
| පොලිය | වාර්ෂික 4.2% |

**නිවාස ණය**

| | |
|---|---|
| ණය මුදල | රු. 3,000,000.00 |
| ප්‍රතිසාධන කාල සීමාව | අවුරුදු 25 හෝ වයස අවු. 60 සම්පූර්ණ වීම |
| පොලිය | 1 වන රු. 2,000,000 සඳහා වසරකට 4.2% ශේෂ රු. 1,000,000 සඳහා වසරකට 7.0% |

**විශේෂ ආපදා ණය**

| | |
|---|---|
| ණය මුදල | මාස 12 ක වැටුප |
| ප්‍රතිසාධන කාල සීමාව | වාරික 120 |
| පොලිය | වාර්ෂික 4.2% |

**වාහන ණය**

ඕනෑම සේවකයෙකුට පා පැදි ණය සමග මෝටර් වාහන, ත්‍රිරෝද රථ සහ මෝටර් සයිකල් යන ණය කාණ්ඩවලින් එක් ණයක් ලබා ගත හැකි ය

| | | |
|---|---|---|
| මෝටර් රථය | ණය මුදල | රු. 3,000,000.00 |
| | ප්‍රතිසාධන කාල සීමාව | වසර 15 |
| | පොලිය | වාර්ෂික 4.2% |
| ත්‍රිරෝද ණය | ණය මුදල | රු 1,250,000.00 |
| | ප්‍රතිසාධන කාල සීමාව | වසර 15 |
| | පොලිය | වාර්ෂික 4.2% |
| යතුරු පැදිය | ණය මුදල | රු. 500,000.00 |
| | ප්‍රතිසාධන කාල සීමාව | වසර 10 |
| | පොලිය | වාර්ෂික 4.2% |
| පාපැදි ණය | ණය මුදල | රු. 25,000.00 |
| | ප්‍රතිසාධන කාල සීමාව | වාරික 36 |
| | පොලිය | වාර්ෂික 4.2% |

# තොරතුරු තාක්ෂණ

2024 වසර තුළ දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ අංශය විසින් ඩිජිටල් යටිතල පහසුකම් නවීකරණය කිරීම, සයිබර් ආරක්ෂාව ඉහළ නැංවීම, සේවක මණ්ඩල හැකියා වර්ධනය කිරීම සහ පාලන කටයුතු හා සමපාතනය යන කාර්යයන් සම්බන්ධයෙන් වැදගත් ප්‍රගති පියවර ගණනාවක් සාක්ෂාත් කර ගනු ලැබ ඇත. මෙම කාර්ය ප්‍රයත්නයන්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි ජාතික ප්‍රතිපත්ති හා ආයතනික අවශ්‍යතාවලට සමගාමී වූ ඩිජිටල් පරිවර්තනය උදෙසා වන වගකීම් සහිත බැඳියාව තවදුරටත් සවිබල ගන්වයි.

## ප්‍රධාන ව්‍යාපෘති සහ යටිතල පහසුකම් හා සම්බන්ධ ප්‍රගති පියවර

- **මෘදුකාංග නිර්වචිත පුළුල් ප්‍රදේශ ජාල සේවය (SD-WAN) සාර්ථකව ක්‍රියාත්මක කිරීම :**

  2024 වසරේ දී, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, එහි ප්‍රධාන කාර්යාලය හා දත්ත මධ්‍යස්ථාන සහ ප්‍රාදේශීය කාර්යාල මධ්‍යගතව පාලනය කළ හැකි සම්බන්ධක මගින් මුළු මහත් ආයතනයම සම්බන්ධනය වන පරිදි මෘදුකාංග නිර්වචිත පුළුල් ප්‍රදේශ ජාල සේවයක් (SD-WAN) සාර්ථකව ක්‍රියාවට නැංවී ය. මෙම ආරක්ෂිත, අධි කාර්යසාධක ජාල සේවය මගින් ක්‍රියාදාම කාර්යක්ෂමතාවය සහ ජාල දෘශ්‍යතාවය වැඩි දියුණු කිරීමේ කාර්යය ඉටු කරමින් බුද්ධිමය මාර්ගගත කිරීම, යෙදුම් සංජානනිත අන්තර්ජාල පරාස ඔස්සේ පිවිසීම, ප්‍රමුඛතා බලගැන්වීම, සාතිරික්තතා පාලනය සහ ශාඛා මට්ටමේ ෆයර්වෝල් සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති බලාත්මක කරවීම ආදී පහසුකම් සඳහා ඉඩ සලසා දෙයි.

- **ශ්‍රී ලංකා රාජ්‍ය අන්තර්ජාල සේවය (LGN) වෙත ප්‍රවේශය වර්ධනය කිරීම :**

  මෘදුකාංග නිර්වචිත පුළුල් ප්‍රදේශ ජාල සේවය (SD-WAN) ආශ්‍රිත යටිතල පහසුකම ඔස්සේ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සියලුම ප්‍රාදේශීය කාර්යාලවලට දැන් එහි ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත ශ්‍රී ලංකා රාජ්‍ය අන්තර්ජාල සේවා (LGN) සම්බන්ධතාවය වෙත ආරක්ෂිතව පිවිසිය හැකි ය. මෙය, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූලික පරිගණක පද්ධතිය වෙත ප්‍රවේශ වීම සඳහා අත්‍යාවශ්‍ය වූ අතර එම පද්ධතිය සඳහා සත්කාරකත්වය සැලසෙනුයේ, ශ්‍රී ලංකා රාජ්‍ය අන්තර්ජාල සේවා (LGN) පරිසරය තුළ දී ය.

## තොරතුරු තාක්ෂණ අංශයේ ධාරිතා ව්‍යාප්තිය

- **මිනිස් සම්පත් හිඟය ආවරණය වන පරිදි මූලෝපායික ලෙස කාර්ය මණ්ඩලය බඳවා ගැනීම :**

  2024 දී තොරතුරු තාක්ෂණ අංශය සඳහා නව කාර්ය මණ්ඩල සාමාජිකයන් 07 දෙනෙකු බඳවා ගන්නා ලද අතර ඊට තොරතුරු තාක්ෂණ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා ද

ඇතුළත් විය. මෙලෙස බඳවා ගනු ලැබූ තැනැත්තන්, පද්ධති පරිපාලනය, මෘදුකාංග සංවර්ධනය, ජාලකරණය සහ දෘඪාංග උපකරණ සහාය සේවා වැනි ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර තුළ ස්ථානගත කෙරිණි. මෙය, දීර්ඝ කාලීනව ආයතනයේ පැවති මිනිස් සම්පත් හිඟයට විසඳුමක් වූ අතර, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි ඩිජිටල් පද්ධති කළමනාකරණ ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා ද එය ඉවහල් විය.

## ධාරිතා වර්ධනය සහ කාර්ය මණ්ඩල සංවර්ධනය

- **මෘදුකාංග නිර්වචිත පුළුල් ප්‍රදේශ ජාල සේවා (SD-WAN) සහ වයි-ෆයි (Wi-Fi) අන්තර්ජාල යටිතල පහසුකම් පිළිබඳ පුහුණුව :**

  මෙහෙවර පියෙස ගොඩනැගිලි පරිශ්‍රයෙහි අභිනවයෙන් ක්‍රියාත්මක කරන ලද මෘදුකාංග නිර්වචිත පුළුල් ප්‍රදේශ ජාල සේවා (SD-WAN) සහ සහ ව්‍යවසායික වයි-ෆයි (Wi-Fi) අන්තර්ජාල යටිතල පහසුකම් කළමනාකරණයෙහිලා සහය වනු පිණිස සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලය සඳහා විශේෂීකෘත පුහුණු සැසිවාර පැවැත්විණි.

- **තොරතුරු සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් මෙහෙයවනු ලබන NextGenGov (නෙක්ස්ට්ජෙන්ගව්) පිළිබඳ පදනම් වැඩසටහන :**

  ඩිජිටල් පාලනය, නවෝත්පාදනය සහ රාජ්‍ය අංශයේ පරිවර්තනය පිළිබඳව අවධානය යොමු කරමින් තොරතුරු සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) මෙහෙයවීම යටතේ පැවති NextGenGov ධාරිතා ධාරිතා වර්ධන වැඩසටහනට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සහභාගී විය.

- **අතිරේක පුහුණු කටයුතු :**
  - සයිබර් ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවය සහ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ (CERT) ප්‍රතිපත්ති පිළිබඳ සැසි
  - ෆයර්වෝල් ආරක්ෂණය සහ ජාල පරිපාලනය
  - ඩිජිටල් පරිවර්තන ක්‍රියාදාමයන්ට ගැළපෙන තාක්ෂණමය පරිශීලක පුහුණුව

## අනාගතය උදෙසා ඉදිරි දැක්ම

- **ජාතික සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම:**

  MOT/2023/01 දරන චක්‍රලේඛයට අනුව, සයිබර් ආරක්ෂක ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියෙහි පියවරක් ලෙස සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, තොරතුරු තාක්ෂණ සාමාන්‍ය පාලන පද්ධති (ITGC) සම්බන්ධ ආරම්භක සමාලෝචනය සම්පූර්ණ කළේ ය. ඉදිරි අදියරේ දී, සියලු යටිතල පහසුකම් සහ ක්‍රියාවලි සිසාරා ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ (CERT) නිර්දේශ පරිදි අදාළ අනුගතවීම් සිදු කිරීමට යෝජිතය.

- **ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය (NCSOC) සමඟ සුසංයෝජනය වීම :**

  දින හතේ පැය 24 පුරාම සිදු කෙරෙන තත් කාලීන නිරීක්ෂණය, තර්ජන හඳුනා ගැනීම, සිදුවීම් විෂයයෙහි ප්‍රතිචාර දැක්වීම, අවදානම් කළමනාකරණය සහ තර්ජන බුද්ධි තොරතුරු අවේක්ෂණය, ඉලාස්ටික්සර්ච් එන්ටප්‍රයිස් සීම් (Elasticsearch Enterprise SIEM) තාක්ෂණය හරහා සපයනු ලබන ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ (සැසෘඔ) ජාතික සයිබර් ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානය (හසීධක) සමඟ එක්වීමේ කටයුතුවල සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මේ වන විට නිරතව සිටී.

- **සෙන්ටිනල් වන් ඊ.ඩී.ආර්. (SentinelOne EDR (Endpoint Detection and Response) පරීක්ෂණ හා ප්‍රතිචාර ක්‍රමවේදය ඇති කිරීම :**
  **එම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම :**

- ජාතික සයිබර් ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානය (NCSOC) සමඟ ඒකාබද්ධ වීමේ ඉදිරි ක්‍රියාකාරකමෙහි කොටසක් ලෙස, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, සෙන්ටිනල් වන් ඊ.ඩී.ආර්. (SentinelOne EDR (Endpoint Detection and Response) පරීක්ෂණ හා ප්‍රතිචාර ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට නියමිත අතර, එමගින්, සියලු පරිගණක ආශ්‍රිත උපකරණ හරහා කෘතීම බුද්ධිය පදනම් වූ ස්ථානාන්ත උපකරණ ආරක්ෂාව සහ අහිෂ්ට මෘදුකාංග තර්ජන වලින් ආරක්ෂා වීම යනාදිය සම්බන්ධයෙන් වන ස්වයංක්‍රීය ප්‍රතිචාර හැකියාව සහතික කෙරනු ඇත.

- **නව මූලික පද්ධතිය සංවර්ධනය**

  ආරක්ෂිත වූ ද, වෙබ් අවකාශ පාදක වූ සහ සාමාජික කේන්ද්‍රගත වූ ද වේදිකාවක් ලෙස සැලසුම් කර ඇති සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ නව මූලික පද්ධතිය සංවර්ධනය කිරීම, මණ්ඩලීය ඩිජිටල් පරිවර්තන උපාය මාර්ගයේ ප්‍රමුඛස්ථම්භයකි. මෙම පද්ධතිය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) සහය සහිතව සංවර්ධනය වෙමින් පවතින අතර, එය ශ්‍රී ලංකා රජයේ ක්ලවුඩ් (Cloud) පද්ධතිය (LGC) හරහා සත්කාරගත කෙරේ. එමෙන්ම, ඊට ශ්‍රී ලංකා රාජ්‍ය ජාල සේවය (LGN) හරහා ප්‍රවේශය ද ලබාගත හැකි ය. දැනට මෙම පද්ධතිය ඊළඟට නියමිත සුවිශේෂී අදියර, එනම්, මෙහෙයුම් පිළිග ැනීමේ පරීක්ෂණය (OAT) සහ සමාන්තර ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම්ව ඇත. එම අදියර නුදුරේ දීම ආරම්භ වීමට නියමිත ය. මෙම පියවර මඟින්, අදාළ කටයුතු පූර්ණ නිපැයුමට යොදා ගැනීමට පෙර පද්ධතියේ කාර්ය සූදානම සහ මෙහෙයුම් සුසංයෝජනය විධිමත් ලෙස සපථ කෙරේ. මෙම අවසන් ක්‍රියාත්මක අදියර සාර්ථකව නිම කිරීමෙන් පසුව, පද්ධතිය නිල වශයෙන් සජීවී ලෙස ක්‍රියාත්මක වීම සිදු වනු ඇත.

- **සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ඩිජිටල් යටිතල පහසුකම් උපදේශන කමිටුව මගින් මෙහෙයවන මූලෝපායික යටිතල සැලසුම්කරණ ක්‍රියාවලිය**

  රජයේ ජාතික ඩිජිටල්කරණ ප්‍රතිපත්ති යටතේ, ඒ අනුව ක්‍රියා කරමින්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, තම ඩිජිටල් යටිතල පහසුකම් සම්මත මට්ටමින් සහ උපායමාර්ගික ලෙස සමපාත කර ගැනීම සඳහා පූර්වගාමී පියවර ගෙන ඇත. මෙහිලා, ජ්‍යෙෂ්ඨ කළමනාකරණයට යටිතල නවීකරණ සම්බන්ධයෙන් උපදෙස් දීම සඳහාත්, අවශ්‍ය නිර්දේශ ලබාදීම සඳහාත්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය නිරතුරුව සවිමත්ව දියුණුවට පත් වෙමින් ඉදිරියේ බිහිවන ඩිජිටල් පාලන කාර්යරාමුවලට අනුකූලව පැවතීම සඳහා වග බලා ගනු පිණිසත් ඩිජිටල් යටිතල පහසුකම් පිළිබඳ උපදේශක කමිටුවක් පත් කෙරෙනු ඇත.

# මුදල්

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි මුදල් අංශය සතුව පුළුල් හා තීරණාත්මක කාර්ය භාරයක් පවතී. එය සැකෙවින් ගෙන හැර දැක්වීම සඳහා, එහි ප්‍රමුඛ කාර්ය භාරය පහත සඳහන් පරිදි සාරාංශ කර දැක්විය හැකි ය :

**ගිණුම් සැකසීම :**
ව්‍යවස්ථාපිත නියමයන් අනුව සියලුම මූල්‍ය ක්‍රියාකාරකම්වලට අදාළ කටයුතු නිවැරදිව ලේඛනගත කර වාර්තා කර ඇති බවට වග බලා ගනිමින්, මාසික සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සැකසීම ඔවුන් විසින් හසුරුවනු ලබති.

**වාර්ෂික අයවැය :**
ආදායම් සහ වියදම් පුරෝකථනය කිරීම සහ මූල්‍ය සම්පත් කාර්යක්ෂමව වෙන් කර දෙනු ලැබ ඇති බව තහවුරු කිරීම ඇතුළත් වන වාර්ෂික අයවැය ලේඛන කාර්යය වර්ධනය කර පවත්වා ගෙන යාම සහ කළමනාකරණය කිරීම සඳහා ඔවුහු වගකීමෙන් යුතුව බැඳී සිටිති.

**ගෙවීම් කළමනාකරණය :**
රජයට බදු ගෙවීමේ කර්තව්‍යය හැසිරවීම සහ මූල්‍ය රෙගුලාසිවලට අනුකූල වන බවට වග බලා ගැනීම ඇතුළුව කාර්ය මණ්ඩලය වෙත සහ අනෙකුත් ආයතන වෙත සිදු කෙරෙන ගෙවීම් කළමනාකරණය කිරීමේ සහ සැකසීමේ කටයුතුවල ඔවුහු නියැලී සිටිති.

**රජයේ විගණන සම්බන්ධීකරණය :**
අවශ්‍ය හා අදාළ සියලු තොරතුරු සපයා ඇති බවට සහතික වෙමින් සහ විගණන ප්‍රමිති සහ නියමයන්ට අනුකූලව කටයුතු සිදු වන බවට තහවුරු කර ගනිමින් රජයේ විගණන කටයුතු සඳහා පහසුකම් සලසා දීම සහ ඒවා සම්බන්ධීකරණය කිරීම ඔවුන් විසින් ඉටු කරනු ලබති.

**ආයතනික සැලැස්ම පිළියෙළ කිරීම :**
ආයතනයේ උපාය මාර්ගික දිශානතිය සහ ඉලක්ක ගෙන හැර දක්වන ආයතනික සැලැස්ම සංවර්ධනය කිරීමේ කාර්යය උදෙසා ඔවුහු දායකත්වය සපයති.

**කළමනාකරණ තොරතුරු වාර්තා :**
මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳව මනා අවබෝධයක් ලබා දෙන පරිදි සහ ආයතනය තුළ තීරණ ගැනීමේ කාර්යය සඳහා සහාය වන ආකාරයේ විවිධ කළමනාකරණ තොරතුරු හා වාර්තා සකස් කිරීමෙහි ඔවුහු නිරතව සිටිති.

සමස්තයක් වශයෙන් ගත් කළ, මූල්‍ය අඛණ්ඩතාව පවත්වා ගැනීම, උපාය මාර්ගික සැලසුම්කරණයට සහාය වීම සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සඳහා වැදගත් කාර්ය භාරයක් ඔවුහු ඉටු කරති.

2024 දෙසැම්බර් මස 02 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ රාජ්‍ය අංශයීය හස්තය වන, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය විසින් මෙහෙයවන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ 2023 සඳහා වූ වාර්ෂික වාර්තා සම්මාන තරඟය සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ජයග්‍රහණය කළේ ය. ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය විසින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත වාර්ෂික වාර්තා අංශයේ ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකාරී සහ කොමිෂන් සභා යන කාණ්ඩය සඳහා වන "රිදී සම්මානයෙන්" පිදුම් ලැබීය. මෙම තරඟයේ දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත මෙම සම්මාන හිමි වූයේ අඛණ්ඩව හයවන වසරටයි. ආයතනික වාර්තාකරණය සහ මූල්‍ය හෙළිදරව් කිරීම් යන ක්ෂේත්‍රයේ විනිවිදභාවය, වගවීම, සමාජ වගකීම සහ ආයතනික පාලනය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් නිරූපණය කළ රාජ්‍ය අංශයේ ආයතන මෙම සම්මානයෙන් ඇගයීමට ලක් කෙරේ.






# නීති අංශය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ නීති අංශය, මණ්ඩලයේ සියලුම නීතිමය කටයුතු සඳහා උපදේශක සේවා ඒකකයක් ලෙස ක්‍රියාත්මක වන අතර 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ විධිවිධානවලට අනුකූල වීමට අපොහොසත් වන සේවා යෝජකයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගනී. නීති අංශය, වර්තමානයේ දී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති) වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර, නීති කළමනාකරුවන් සහ නීති නිලධාරීන් යන අයවළුන්ගෙන් ද, එහි සහායක කාර්ය මණ්ඩලයෙන් ද සමන්විත වේ. නීති අංශය සෘජුවම සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සභාපති / ප්‍රධාන විධායක නිලධාරී වෙත වාර්තා කරයි. ප්‍රාදේශීය කාර්යාල ජාලය ස්ථාපනය කිරීමෙන් පසුව, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධ නීතිමය ක්‍රියාදාමයන් ප්‍රාදේශීය මට්ටමින් විමධ්‍යගත කර ඇත.

නීති අංශයේ ප්‍රධාන අරමුණක් වන්නේ, අදාළ බලධාරීන්ගෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමෙන් අනතුරුව ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් සොයා ගනු ලබන සමුච්චිත දායක මුදල් / අධිභාර පැහැර හරින සේවා යෝජකයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම හරහා අදාළ හිඟ මුදල් අයකර ගැනීම සහතික කිරීමයි. නීති අංශය විසින්, මණ්ඩලීය කාර්ය මණ්ඩලයේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා නීතියේ මූලික මූලධර්ම සහ කම්කරු නීතියේ නව ප්‍රවණතා පිළිබඳ පුහුණු සැසි සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වනු ලැබේ.

# අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණනය යනු කළමනාකරණය වෙත කෙරෙන සේවාවක් ලෙස ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම සඳහා පවත්නා සංවිධානය තුළ වූ ස්වාධීන තක්සේරුමය කාර්යයකි. එය, සංවිධානයක් තුළ සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා දායකත්වය ලබා දෙන කාර්යයක් ලෙස අභ්‍යන්තර පාලන, මූල්‍ය සහ වෙනත් කරුණුවල සඵලතාවය මැනීම, ඇගයීම සහ වාර්තා කිරීම පාලනය කරන්නා වූ විධි ක්‍රමයකි.

විගණන සහ සහතිකකරණ අංශයේ ප්‍රධානියා ලෙස නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) විගණන කමිටුව හරහා මණ්ඩලයට වාර්තා කරන අතර සියලුම පරිපාලන කටයුතු සඳහා ඔහු වාර්තා කරන්නේ මණ්ඩලයේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරියාට පමණි. ප්‍රමුඛතා කාර්යයන් සකසා නියම කිරීමටත්, විගණන සැලැස්මක් සකස් කිරීමටත්, සොයා ගනු ලබන ප්‍රධාන අනාවරණ හා තොරතුරු නිවැරදිව හා කාලෝචිත ලෙස විගණන කමිටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලයට සැපයීමටත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) විගණන කමිටුව හා එක්ව කටයුතු කරයි.

යම් සංවිධානයක් තුළ ස්ථාවර වූ ද, කාර්යක්ෂම වූ ද පද්ධති සහ පාලන විධි ඇති බව සහතික කිරීම කළමනාකරණයේ වගකීම වේ. අදාළ කළමනාකරණය විසින් එහි වත්කම් සහ ආයෝජන ආරක්ෂා කිරීම, වාර්තා වල විශ්වසනීයත්වය සහතික කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රතිපත්ති, රෙගුලාසි, කොන්ත්‍රාත්තු සහ නියෝග පිළිපැදීම අධීක්ෂණය කිරීම යන කරුණු උදෙසා ස්ථාපිත කරනු ලබන මූල්‍ය සහ වෙනත් ආකාර යන දෙඅංශයෙන්ම හෙබි පාලන ක්‍රමවලට අයත් සමස්ත පද්ධතියම අභ්‍යන්තර පාලනය තුළ සමන්විත වේ.

## මණ්ඩලයේ 44වැනි සංවත්සරය වෙනුවෙන් ලේ දන්දීමේ වැඩසටහන













## පොසොන් බැතිගී 2024



# අධ්‍යක්ෂ මණ්ඩලය

**2024 දෙසැම්බර් 31 දිනට**



### සෝමසිරි ඒකනායක මහතා

සභාපති / ප්‍රධාන විධායක නිලධාරි

මුදල්, සැලසුම් හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් පත් කරන ලදි

සෝමසිරි ඒකනායක මහතා, දශක දෙකකට වැඩි කාලයක් උපායමාර්ගික සැලසුම් සම්පාදනය, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ ජාතික සංවර්ධන මුලපිරීම්හි පළපුරුද්ද සහිත රාජ්‍ය අංශයේ සේවයේ නිරත නිපුණත්වයෙන් හෙබි අධි වෘත්තිකයෙකු වේ. ඔහු වර්තමානයේ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සභාපතිවරයා ලෙස කටයුතු කරයි. තම රාජ්‍ය සේවා ජීවිතය තුළ ඒ මහතා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සැලසුම් අධ්‍යක්ෂ සහ රන්මිනිතැන්න ජාතික ටෙලි සිනමා උද්‍යානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා යන තනතුරු ඇතුළු ප්‍රමුඛ තනතුරුවල කටයුතු කරමින් රාජ්‍ය ආයතන කීපයකම වැදගත් කාර්යභාරයක් ඉටුකර තිබේ. එමෙන්ම, සෝමසිරි ඒකනායක මහතා, ව්‍යාපෘති අධීක්ෂණ හා කළමනාකරණ දෙපාර්තමේන්තුව, ජාතික සමගිය සහ සංහිඳියා කාර්යාලය, සංස්කෘතික හා ජාතික උරුම අමාත්‍යාංශය, මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ කම්කරු දෙපාර්තමේන්තුව යනාදී රාජ්‍යායතනවලට ද ඔහු සිය සේවය දායක කර ඇත.

ඒකනායක මහතා, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිය ද, කොළඹ විශ්ව විද්‍යාලයීය ප්‍රාදේශීය සංවර්ධනය සහ සැලසුම්කරණය පිළිබඳ ආචාර්ය උපාධිය ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජනමාධ්‍යවේදය පිළිබඳ ආචාර්ය උපාධිය ද ලබා සිටී. පාලනතන්ත්‍රය, නායකත්වය සහ ප්‍රතිපත්ති සෑදීම යන ක්ෂේත්‍ර ආශ්‍රිත ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්වලට ද ඒ මහතා සහභාගී වී ඇත. බුද්ධ නායකත්ව ගුණාංග හෙබි ඒකනායක මහතාගේ දැක්ම වනුයේ, නවෝත්පාදක උපායමාර්ග සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ මගින් තිරසාර වර්ධනය සහ ජාතික ප්‍රගතිය ප්‍රවර්ධනය කිරීමයි.



### ඉන්දික බද්දෙවිතාන මහතා

අධ්‍යක්ෂ

මුදල්, සැලසුම් හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් පත් කරන ලදි

ඉන්දික බද්දෙවිතාන මහතා වසර 17 කට වඩා අධික කාලයක් තිස්සේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවය කරන බදු පරිපාලන ක්ෂේත්‍රයෙහි පළපුරුද්ද හිමි කෘතහස්ත වෘත්තිකයෙකු වේ. වර්තමානයෙහි ඔහු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමිසාරිස්වරයෙකු ලෙස කටයුතු කරයි. ඔහුගේ වෘත්තිය ජීවිතය විවිධ භූමිකා පරාසයක පැතිර යන අතර, සුරා බදු පරීක්ෂකවරයෙකු ලෙස සුරා බදු දෙපාර්තමේන්තුවේ අට වසරක ඔහුගේ සේවය සහ කැලණිය විශ්ව විද්‍යාලයේ භෞතික විද්‍යාව පිළිබඳ තාවකාලික සහකාර කතිකාචාර්යවරයකු ලෙස කටයුතු කළ ඔහුගේ කෙටි ධූර කාලය ද ඊට ඇතුළත් වේ. බදු ප්‍රතිපත්ති, ආදායම් පරිපාලනය, නීති ක්‍රියාපරිපාටි හා කාර්යාල කළමනාකරණය පිළිබඳ ඔහු සතු සවිමත් පදනම සහිතව, බදුකරණය සහ පාලනය යන ක්ෂේත්‍ර විෂයයෙහි ඔහු ලබා දී ඇති සේවා දායකත්වය අතිශය වැදගත් ය.

බද්දෙවිතාන මහතා, කැලණිය විශ්ව විද්‍යාලයෙන් භෞතික විද්‍යාව පිළිබඳ විශේෂ (ගෞරව) උපාධියක් ද, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් නීති උපාධියක් (LL.B) සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් තොරතුරු හා සංනිවේදන තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ඇත. සිය වෘත්තීය සංවර්ධනයේ පියවර ලෙස, ඔහු ඉන්දියාවේ බදු ප්‍රතිපත්ති පිළිබඳව සහ මැලේසියාවේ විද්‍යුත් රාජ්‍ය හා වෙනස්කම් කළමනාකරණය පිළිබඳව පුහුණුව ලබා ඇත. තවද, නීතික නඩු තීරණ නීතිය, අධිකරණ පරිපාටි සහ කාර්යාල පරිපාලනය පිළිබඳ දේශීය වශයෙන් පුහුණුව ද ඔහු ලබා ඇත. බදු අනුකූලතාව, ආදායම් එකතු කිරීම සහ නීතිමය කාර්යරාමු ආශ්‍රිත ක්ෂේත්‍රයේ ඔහුගේ ප්‍රගුණතාව, ජාතික මූල්‍ය පරිපාලනය කෙරෙහි විශිෂ්ට අනුබලයක් අඛණ්ඩව සලසයි.



## එස්.එෆ්.එච්. ප්‍රනාන්දු මහතා

අධ්‍යක්ෂ

මුදල්, සැලසුම් හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් පත් කරන ලදි

සුසන්ත ප්‍රනාන්දු මහතා වෘත්තියමය වශයෙන් කීර්තිමත් ගණකාධිකාරියෙකු වන අතර, ශ්‍රී ලංකාවේ සහ එක්සත් රාජධානිය හා ඔස්ට්‍රලියාව යන විදේශ රටවල පුද්ගලික හා රාජ්‍ය යන දෙඅංශයේම ජ්‍යෙෂ්ඨ තනතුරු ගණනාවකම පදවි දරා ඇත. ඔහු, ප්‍රසිද්ධ ලයිස්තුගත සමාගමක් වන බාර්ට්ලීට් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයේ (Bartleet Finance Ltd.) ආරම්භක කළමනාකාර අධ්‍යක්ෂවරයා වූ අතර බාර්ට්ලීට් මැලෝරි ස්ටොක්බ්‍රෝකර්ස් ලිමිටඩ් (Bartleet Mallory Stockbrokers Ltd.), බාර්ට්ලීට් ඇන්ඩ් කම්පනි ලිමිටඩ් (Bartleet and Company Ltd.) හා බාර්ට්ලීට් ට්‍රාන්ස්කැපිටල් ලිමිටඩ් (Bartleet Transcapital Ltd.) ඇතුළු බාර්ට්ලීට් සමූහයෙහි අනුබද්ධ සමාගම් කීපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ද කටයුතු කළේය. ඒ මහතා සංස්ථාපිත ආයතනික ක්ෂේත්‍රයට ලබා දුන් දායකත්වයට අමතරව, ඔහු රටේ විශේෂ ජාතික ආයතන කිහිපයක ප්‍රමුඛත්ව තනතුරුවල ද කටයුතු කළේය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය (NIBM) සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ ඇති ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් (Jaya Container Terminals Ltd.) යන ආයතනයන්හි සභාපතිවරයා ලෙස ද ඒ මහතා සේවය කළේ ය. ශ්‍රී ලංකා සම්මන්ත්‍රණ කාර්යාංශයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ද, සංචාරක අමාත්‍යතුමාගේ උපදේශකයෙකු ලෙස ද සුසන්ත ප්‍රනාන්දු මහතා කටයුතු කර තිබේ. ඔහුගේ ජාත්‍යන්තර අත්දැකීම් අතරට, ඔස්ට්‍රලියාවේ බී ඩී එස් (BDS Corporation) ආයතනයේ මූල්‍ය පාලකවරයා ලෙස සහ එක්සත් රාජධානියේ ඉක්ටොහේටිං ගෲප් ඔෆ් කම්පනීස් (Ictrohating Group of Companies) ආයතනයෙහි සමූහ ගණකාධිකාරීවරයා ලෙස කටයුතු කිරීම ඇතුළත් වේ. තවද, ඔහු ජාතික කම්කරු උපදේශක කමිටුවේ (NLAC) සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කර ඇති අතර කළුතර දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයේ සභාපතිවරයා වශයෙන් ක්‍රීඩා ක්ෂේත්‍රයට ද වටිනා දායකත්වයක් සලසා දී ඇත.



## අතුල හරිස්චන්ද්‍ර මහතා

අධ්‍යක්ෂ

මුදල්, සැලසුම් හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් පත් කරන ලදි

අතුල හරිශ්චන්ද්‍ර මහතා වසර 20 කට වඩා දීර්ඝ පුළුල් වෘත්තිය පළපුරුද්දක් සහිත, බැංකු ක්ෂේත්‍රයෙහි විශේෂඥත්වය සතු ප්‍රකට වෘත්තිකයෙකු වේ. ඔහු මූල්‍ය වෙළඳපොළ සහ ව්‍යවසායක අවදානම් කළමනාකරණය යන ක්ෂේත්‍රවල දැක්වූ ප්‍රබල නායකත්වය මඟින් විශිෂ්ට සේවයක් ඉටු කර ඇත. වර්තමානයෙහි ඔහු ශ්‍රී ලංකාවේ කීර්තිමත් විදේශීය බැංකුවක ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරයා ලෙස කටයුතු කරයි.

ඔහු, මූල්‍ය වෙළඳපොළ, භාණ්ඩාගාර අවදානම, වෙළඳ අවදානම සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණය යන ක්ෂේත්‍ර පිළිබඳව සවිමත් පසුබිමක් සහිත, අත්දැකීම් පිරිපුන් වෘත්තීයවේදීයෙකි. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති (Masters of Financial Economics - MFE) උපාධියක් සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී ගෞරව උපාධියක් (Bachelor of Arts - Honors) ලබා සිටී. එසේම, ඊට අමතරව, අතුල හරිශ්චන්ද්‍ර මහතා අන්තර්ජාතික වෘත්තීය සුදුසුකම් කීපයක් ද ලබා ඇති අතර එහිලා, මූල්‍ය වෙළෙඳපළ මෙහෙයුම් (ප්‍රංශය) පිළිබඳ ඒ සී අයි සහතිකය ද (ACI Operations Certificate in Financial Market Operations), නිෂ්පාදන හා වෙළෙඳපළ අවදානම් පිළිබඳ කීස්ඩී ආවසරික (ඇමරිකාව) සහතිකය ද (KESDEE Intermediate Certificate in Products) Market Risk), ශ්‍රී ලංකා මහ බැංකුවේ දත්ත කළමනාකරණ ඩිප්ලෝමාව ද (Diploma in Database Management (CBSL) ඇතුලත් වේ. විශ්ලේෂණාත්මක චින්තන චර්යාව සහ ගැටලු විසඳීමේ හැකියාව සම්බන්ධයෙන් හසළ දැනුමක් සහිත අතුල හරිශ්චන්ද්‍ර මහතා, වෘත්තියමය සහ ආචාරාත්මකභාවය පිළිබඳ උසස්ම ප්‍රමිති පවත්වා ගන්නා අතරම ආයතනීය සාර්ථකත්වය ඉදිරියට ගෙනයාම සඳහා කැපවී කටයුතු කරන්නෙකු වේ.

# අධ්‍යක්ෂ මණ්ඩලය

## 2024 දෙසැම්බර් 31 දිනට



### ඉන්දික ප්‍රේමරත්න මහතා

අධ්‍යක්ෂ

මහා භාණ්ඩාගාර නියෝජිත

සාර්ව ආර්ථික සැලසුම්කරණය, රාජ්‍ය ආයෝජනය සහ විදේශ සම්පත් කළමනාකරණය පිළිබඳ පුළුල් අත්දැකීම් සම්භාරයක් හිමි ඉන්දික ප්‍රේමරත්න මහතා, රාජ්‍ය අංශයේ සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ වෘත්තීයවේදියෙකු වේ. ඔහු වර්තමානයෙහි ජාතික සැලසුම් සම්පාදන දෙපාර්තමේන්තුවේ සාර්ව ආර්ථික සැලසුම්කරණ අංශයේ ද, කර්මාන්ත, වෙළඳ හා ආයෝජන අංශයේ ද අධ්‍යක්ෂවරයා ලෙස සේවා කටයුතු ඉටු කරයි.

දශක දෙකකට අධික කාලයක් රාජ්‍ය සේවයේ රාජකාරි කටයුතුවල නියැලි ප්‍රේමරත්න මහතා, මුදල් අමාත්‍යාංශය සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව යන ආයතන තුළ ප්‍රධාන තනතුරු හොබවා ඇති අතර, එහි දී, ඒ මහතා, ජාත්‍යන්තර හවුල්කාර පාර්ශවයන් සමඟ සංවර්ධන අරමුදල් සම්බන්ධයෙන් සාකච්ඡා කර, ඒවායේ කාර්ය සංවිධාන කටයුතු ඉටු කිරීමෙහිලා ප්‍රමුඛ භූමිකාවක් ඉටු කර ඇත. විදේශ අරමුදල් සැපයෙන ප්‍රධාන පෙළේ ව්‍යාපෘති කටයුතු සුපරීක්ෂණය කර ඇති ප්‍රේමරත්න මහතා, රජය සතු ව්‍යවසාය සඳහා වූ උපාය මාර්ගික අධීක්ෂණය සලසා දී ඇත.

ඔහු, ඔස්ට්‍රලියාවේ ෆ්ලින්ඩර්ස් විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලන (ප්‍රතිපත්ති) විෂය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද, කැලණිය විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යා විෂයය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද, ජපානයේ අයි.ඩී.ඊ. උසස් පාසැලේ (IDE Advanced School) සංවර්ධන අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද හිමිකර ගෙන ඇත. තවද, ඒ මහතා, කැලණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී (ගෞරව) උපාධියක් ලබා ඇති අතර ව්‍යාපෘති කළමනාකරණය, මූල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය යන විෂයයන් පිළිබඳව විශේෂ පුහුණු පාඨමාලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ ලී ක්වාන් යූ රාජ්‍ය ප්‍රතිපත්ති පාසැල (Lee Kuan Yew School of Public Policy) යනාදී ආයතනවල හදාරා නිම කර ඇත.

ප්‍රේමරත්න මහතා, මධ්‍යම සංස්කෘතික අරමුදල ඇතුළු ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල ගණනාවකම සේවය කර ඇත. රාජ්‍ය අංශය හා එක්වීමට පෙර, ඔහු ප්‍රසිද්ධ සමාගමක කළමනාකරණ අභ්‍යාසලාභී / නිෂ්පාදන විධායක නිලධාරි ලෙස සේවය කර පුද්ගලික අංශයේ සේවා පළපුරුද්ද ද ලබා ඇත.



### කේ.ඒ.පී. ද සිල්වා මහත්මිය

අධ්‍යක්ෂ

වෙළඳ, වානිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා විසින් පත් කරන ලදි.

ද සිල්වා මහත්මිය කැලණිය විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද, කොළඹ විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී උපාධියක් ද ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ලබා ඇත. ඇයට ශ්‍රී ලංකා වරලත් මූල්‍ය ගණකාධිකාරී ආයතනයෙන් ලබා ගත් සුදුසුකම් (CPFA) ඇත. ඇය වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරිනිය ලෙස ද, සී. ඩබ්ලිව්. ඊ. කොන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉංජිනියරින් ප්‍රයිවෙට් ලිමිටඩ් ආයතනයෙහි සභාපතිනිය ලෙස ද වර්තමානයේ කටයුතු කරන්නී ය. ඇය විදේශ කටයුතු අමාත්‍යාංශයේ ද, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ද ප්‍රධාන ගණකාධිකාරීවරිය ලෙස කටයුතු කළා ය. ද සිල්වා මහත්මිය, වී අලෙවි මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් ලෙස සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝජ්‍ය ලේකම්වරිය - මූල්‍ය ලෙස ද සේවා කටයුතු ඉටු කර ඇත.

සේවයට කැපවී ක්‍රියා කරන ප්‍රතිපත්ති සැලසුම්කරුවකු වන ඉන්දික ප්‍රේමරත්න මහතා, උපාය මාර්ගික රාජ්‍ය ආයෝජනය සහ මූල්‍ය පාලනය යන ක්ෂේත්‍ර හරහා ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සංවර්ධන සැලසුම්කරණය උදෙසා නොකඩවා දායකත්වය සලසා දීමෙහි නිරතව සිටියි.



**ඩිනාල් පීරිස් මහතා**

අධ්‍යක්ෂ

ලංකා සේව්‍ය සම්මේලනයේ නියෝජිත

ඩිනාල් පීරිස් මහතා, ව්‍යාපාරික ක්ෂේත්‍රයෙහි වසර ගණනාවක පළපුරුද්දක් ඇති, විශේෂයෙන්ම ඇලුමිනියම්, වානේ, එම්.ඩී.එෆ්. පුවරු, ගොඩනැගිලි ද්‍රව්‍ය, රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදනය යනාදී කර්මාන්ත ක්ෂේත්‍ර ආශ්‍රිත පුළුල් වෙළෙඳ සමාගම් කිහිපයකට සම්බන්ධ වූ නිපුණ ව්‍යාපාරිකයෙකු වේ. ඔහු වෘත්තියමය වශයෙන් ඉංජිනේරුවෙකු වන අතර, ලන්ඩන් ව්‍යාපාර විද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධියක් ද ලබාගෙන ඇත. ඔහු රාජ්‍ය සහ පුද්ගලික සමාගම් කීපයක සභාපතිවරයා සහ අධ්‍යක්ෂවරයා ලෙස ද කටයුතු කරයි. ඩිනාල් පීරිස් මහතා මානව සම්පත පිළිබඳ සුවිශේෂ උනන්දුවක් දක්වන අයෙකු වන අතර, ඔහු ලංකා සේව්‍ය සම්මේලනයේ කවුන්සිල සාමාජිකයෙකු ලෙස ද සේවය ප්‍රදිඩ කරයි.



**චන්න දිසානායක මහතා**

අධ්‍යක්ෂ

වෘත්තීය සමිති නියෝජිත

චන්න දිසානායක මහතා වසර ගණනාවක් පුරා බැංකු ක්ෂේත්‍රයේ සේවයේ නිරත පළපුරුදු බැංකු නිලධාරියෙකු වන අතර, බැංකු සේවකයින්ගේ අයිතිවාසිකම් සහ සුබසාධනය සඳහා කැපවී ක්‍රියා කරන වෘත්තිය සංගම් නායකයකු ලෙස ප්‍රකට ය. ඔහු වර්තමානයෙහි ලංකා බැංකු සේවක සංගමයේ සභාපතිවරයා ලෙස කටයුතු කරමින්, බැංකු ක්ෂේත්‍රය තුළ සාධාරණ ශ්‍රම ක්‍රියාකාරකම් සහ සේවක ප්‍රතිලාභ වෙනුවෙන් උර දෙමින් ප්‍රමුඛ කර්තව්‍යයක් ඉටු කරයි. එමෙන්ම, ඔහු, යුනි ග්ලෝබල් යුනියන් (UNI Global Union) සංවිධානය යටතේ ක්‍රියාත්මක වන යුනි ශ්‍රී ලංකා ලයිසන්ස් කවුන්සිල් (UNI Sri Lanka License Council) සභාවෙහි සභාපතිවරයා ලෙස ද සේවය කරන අතර, ශ්‍රී ලංකාවේ සේවක සේවිකාවන් වෙනුවෙන් ජාත්‍යන්තර වේදිකා නියෝජනය කරමින්, ගෝලීය ශ්‍රම ප්‍රමිතීන් සහ සේවක අයිතිවාසිකම් රැකීම සඳහා ඇප කැප වී සිටියි. චන්න දිසානායක මහතා ජාතික කම්කරු උපදේශක කවුන්සිලයේ (NLAC) සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරයි. ඒ තුළ ඔහු ප්‍රතිපත්ති සාදන්නන් හා පාර්ශවකරුවන් සමඟ සහයෝගීව කටයුතු කරමින් නොයෙකුත් ශ්‍රම ප්‍රතිපත්ති මෙන්ම විවිධ කර්මාන්ත ක්ෂේත්‍ර ආශ්‍රිත සුමට සේවාවැඩ කොන්දේසි හඳුන්වා දීමට ක්‍රියා කර ඇත. බැංකු ක්ෂේත්‍රය සහ ශ්‍රම සබඳතා පිළිබඳ ඔහු සතු අත්දැකීම් මගින් ශ්‍රී ලංකාවේ සේවක අයිතීන් සහ සාධාරණ සේවාස්ථාන පරිසරයක් වර්ධනය කිරීම සඳහා ඔහු දරන අප්‍රතිහත කැපවීම බෙහෙවින් සුවිශාල ය.

# අධ්‍යක්ෂ මණ්ඩලය

## 2024 දෙසැම්බර් 31 දිනට



### කණිෂ්ක ප්‍රේමශාන්ත මහතා

අධ්‍යක්ෂ

වෘත්තිය සමිති නියෝජිත

කණිෂ්ක ප්‍රේමශාන්ත මහතා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයෙන් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ (විශේෂ) විද්‍යාවේදී උපාධියක් ලබා සිටින  වෘත්තීයවේදියෙකි. ශ්‍රමික අයිතීන් සඳහා කැප වී කටයුතු කරන ප්‍රමුඛයෙකු වන ඔහු, වර්තමානයෙහි ලංකාවේ ප්‍රමුඛතම වෘත්තිය සංගමයක් වන, සේවක අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ඇප කැප වූ ආයතනයක් වන අන්තර් සමාගම් සේවක සංගමයේ උප සභාපතිවරයා ලෙස කටයුතු කරයි. ශ්‍රම අයිතීන් සඳහා ඔහුගෙන් පිළිබිඹු වන නායකත්වය සහ අත්දැකීම්, ජාතික සීමා මායිම් ඉක්මවා යයි. ඔහු විශ්ව වෘත්තිය සංගම් සම්මේලනයේ සාමාජිකයෙකු ලෙස ද ශ්‍රී ලංකාව නියෝජනය කරමින් කලාපීය සහ ජාත්‍යන්තර මණ්ඩපවල ද කාර්යභාරයක් ඉටු කර ඇත. පසුගිය දෙවසර තුළ, ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ සමස්ත චීන වෘත්තීය සමිති සම්මේලනය (ACFTU) විසින් සංවිධානය කරන ලද ප්‍රධාන වෘත්තිය සමිති සාකච්ඡා සමුළුවලට ඒ මහතා  ක්‍රියාකාරී ලෙස සහභාගිත්වය දරා  ඇත.

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව කණ්ඩායම

## ඉහළ කළමනාකරණය



**සෝමසිරි ඒකනායක මහතා**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී

සෝමසිරි ඒකනායක මහතා, දශක දෙකකට වැඩි කාලයක් උපායමාර්ගික සැලසුම් සම්පාදනය, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ ජාතික සංවර්ධන මුලපිරීම්හි පළපුරුද්ද සහිත රාජ්‍ය අංශයේ සේවයේ නිරත නිපුණත්වයෙන් හෙබි අධි වෘත්තිකයෙකු වේ. ඔහු වර්තමානයේ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සභාපතිවරයා ලෙස කටයුතු කරයි. තම රාජ්‍ය සේවා ජීවිතය තුළ ඒ මහතා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සැලසුම් අධ්‍යක්ෂ සහ රන්මිනිතැන්න ජාතික ටෙලි සිනමා උද්‍යානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා යන තනතුරු ඇතුළු ප්‍රමුඛ තනතුරුවල කටයුතු කරමින් රාජ්‍ය ආයතන කීපයකම වැදගත් කාර්යභාරයක් ඉටුකර තිබේ. එමෙන්ම, සෝමසිරි ඒකනායක මහතා, ව්‍යාපෘති අධීක්ෂණ හා කළමනාකරණ දෙපාර්තමේන්තුව, ජාතික සමගිය සහ සංහිඳියා කාර්යාලය, සංස්කෘතික හා ජාතික උරුම අමාත්‍යාංශය, මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ කම්කරු දෙපාර්තමේන්තුව යනාදී රාජ්‍යායතනවලට ද ඔහු සිය සේවය දායක කර ඇත.

ඒකනායක මහතා, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිය ද, කොළඹ විශ්ව විද්‍යාලයීය ප්‍රාදේශීය සංවර්ධනය සහ සැලසුම්කරණය පිළිබඳ ආචාර්ය උපාධිය ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජනමාධ්‍යවේදය පිළිබඳ ආචාර්ය උපාධිය ද ලබා සිටී. පාලනතන්ත්‍රය, නායකත්වය සහ ප්‍රතිපත්ති සෑදීම යන ක්ෂේත්‍ර ආශ්‍රිත ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්වලට ද ඒ මහතා සහභාගි වී ඇත. බුද්ධ නායකත්ව ගුණාංග හෙබි ඒකනායක මහතාගේ දැක්ම වනුයේ, නවෝත්පාදක උපායමාර්ග සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ මගින් තිරසාර වර්ධනය සහ ජාතික ප්‍රගතිය ප්‍රවර්ධනය කිරීමයි.



**ආර්.කේ. ජයලත් මහතා**
සාමාන්‍යාධිකාරී (වැඩ බලන)

සාමාන්‍යාධිකාරී (වැඩ බලන) ආර්. කේ. ජයලත් මහතා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය ලබා කැළණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති (ආර්ථික විද්‍යා) උපාධිය ද ලැබුවේ ය. ඔහු ඉන්පසු, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ගත්තේ ය. ජයලත් මහතා, රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇති අතර, තම සේවා කාර්යභාරය ඉටු කිරීම සඳහා අවැසි දැනුම සහ විශේෂ ප්‍රගුණතා සම්භාරයක් තම සන්තකයේ තබා ගනිමින් පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ ආයතනවල මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වසර 20 කට වැඩි පළපුරුද්දක් දරයි.

# නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්



### කේ.එස්. වැලිවිට මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(අභ්‍යන්තර විගණන)

කේ.එස්. වැලිවිට මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) ධූරය හොබවයි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ද, ගිණුම්කරණ කාර්මික ශිල්පීන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනයේ ද ආශ්‍රිය සාමාජිකයෙකි. මීට අමතරව, ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් මුදල් පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධියක් සහ ඉන්දියාවේ වරලත් ගණකාධිකාරී ආයතනයෙන් තොරතුරු පද්ධති ආරක්ෂණය සහ පාලන විගණනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇත. පෞද්ගලික සහ රාජ්‍ය ආයතන යන ද්වයෙහිම මූල්‍ය හා විගණනය පිළිබඳ වසර 30 කට වැඩි පළපුරුද්දක් ඇති වැලිවිට මහතා ඔහු තෝරාගත් ක්ෂේත්‍රයේ කෘතහස්ත විධායක නිලධාරියෙකි.



### එම්.ඒ.කේ. අලුත්ගමගේ මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(ආයෝජන)

එම්.ඒ.කේ. අලුත්ගමගේ මහතා වර්තමානයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයෝජන) ලෙස සේවා කටයුතු ඉටු කරයි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියක් සහ කැලණිය විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය ව්‍යාපාර පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. මීට අමතරව, ශ්‍රී ලංකා ගිණුම්කරණ කාර්මික ශිල්පීන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනයේ සාමාජිකයෙකු වන අලුත්ගමගේ මහතා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි කේන්ද්‍රීය ක්ෂේත්‍රයක් අධීක්ෂණය කරන නිලධරයෙකි.



### ඩබ්ලිව්.ජී.කේ. රත්නායක මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(සාමාජික සේවා)

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සාමාජික සේවා) ඩබ්ලිව්.ජී.කේ රත්නායක මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය යන දෙකෙහිම ආශ්‍රිය සාමාජිකයෙකි. ඊට අමතරව, ඔහු තම තනතුරට සුවිශේෂී අගයක් එකතු කර දෙමින් එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනයේ ii වන අදියර සඳහා ද අර්ධ වශයෙන් සුදුසුකම් ලබා ඇත.



### එච්.එම්.ඒ. ජයන්ත කුමාර මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(නීති)

එච්.එම්.ඒ. ජයන්ත කුමාර මහතා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය හා සම්බන්ධ නීතිමය කටයුතු ඉටු කරමින් දැනට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති) තනතුරෙහි සේවය කරයි. ඒ මහතා, පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධිය (ගෞරව) සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. ඔහු ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයෙන් නීතිපති උපාධියක් ද ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් නීතිවේදී උපාධියක් ද ලබා ඇත. ජයන්ත කුමාර මහතා, ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥවරයෙකු, නොතාරිස්වරයෙකු සහ දිවුරුම් කොමසාරිස්වරයෙකු ද වේ. ඔහු සමාගම් ලේකම්වරයෙකු ලෙස ද ලියාපදිංචිය ලබා ඇත.



### කේ.ඩී.ඒ.පී. කරුණාරත්න මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මුදල්)

කේ.ඩී.ඒ.පී. කරුණාරත්න මහතා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුර දරමින් සේවය කරන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිය සාමාජිකයෙකු ලෙස උසස් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් දරයි. ඒ මහතා, මූල්‍ය හා ගිණුම්කරණ ක්ෂේත්‍රය සඳහා තම හැකියාව සහ කැපවීම ද ප්‍රදර්ශනය කරමින් සිය රාජකාරි කටයුතු ඉටු කරයි. ඔහුගේ මහඟු සේවා සාමාජිකත්වය, ස්වකීය කර්මාන්තය තුළ වෘත්තීය නිපුණතා සහ සදාචාරාත්මක හැසිරීම් පිළිබඳ ඉහළ ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා වන ඔහුගේ කැපවීම අවධාරණය කරයි.



### ආර්.ජේ.සී.එස්. සම්පත් ගුණවර්ධන මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(පරිපාලන හා මානව සම්පත්)

ආර්.ජේ.සී.එස්. සම්පත් ගුණවර්ධන මහතා පරිපාලන හා මානව සම්පත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා ලෙස කටයුතු කරයි. ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණය සහ සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇත. මීට අමතරව, ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් සේවක අධ්‍යාපනය පිළිබඳ උපාධියක් ද ලබා ඇත. ගුණවර්ධන මහතා කැලණිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියක් සහ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ගනිමින් තම දක්ෂතාව තව දුරටත් ඉදිරියට ගෙන ගියේ ඔහු තමා සේවය කරන ආයතනයේ ප්‍රධාන අංශයකට මනාව ගැළපෙමෙනි.

# නියෝජ්‍ය **සාමාන්‍යාධිකාරිවරුන්**



**එස්.පී.ආර්.ඩී. ප්‍රනාන්දු මහතා**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)

ප්‍රදීප් ප්‍රනාන්දු මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තොරතුරු තාක්ෂණ ලෙස වර්තමානයෙහි සේවා කටයුතු ඉටු කරන අතර, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයෙහි වසර 19 කට වඩා වැඩි කාලයක පළපුරුද්දක් ලබා සිටින වෘත්තිකයෙකු වේ. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් මෘදුකාංග ඉංජිනේරු විෂය පිළිබඳව විශේෂ ප්‍රගුණතාව සහිත පරිගණක විද්‍යාවේදී උපාධිය සහ තොරතුරු ආරක්ෂාව පිළිබඳ විද්‍යාපති උපාධිය යන උපාධිද්වයම ලබාගෙන ඇත.

ඔහු තම වෘත්තීය ජීවිතය පුරාවටම විශාල තාක්ෂණික පද්ධති කළමනාකරණය, ප්‍රමුඛ ඩිජිටල් පරිවර්තන ව්‍යාපෘති ඉටු කිරීම සහ ක්‍රියාකාරී තොරතුරු ආරක්ෂාව සහතික කිරීම සම්බන්ධයෙන් ප්‍රබල කුසලතා විද්‍යාමාන කළේ ය. ඔහුගේ නායකත්වය සහ තාක්ෂණික විශේෂඥතාව, නවෝත්පාදනය නැංවීමටත්, මෙහෙයුම් විවර්ධනය කිරීමටත්, එමගින් ආයතනයේ සමස්ත ඉලක්ක සපුරා ගැනීම සඳහා සහය වීමටත් උපස්ථම්භක වී ඇත.



**පී.එල්.එල්.සී.පී. අල්විස් මහත්මිය**

සහකාර සාමාන්‍යාධිකාරී (බලාත්මක කිරීමේ කලාපය iii) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දායක මුදල් රැස්කිරීම් සහ සේවායෝජක සබඳතා) තනතුරේ ආවරණ රාජකාරී

පී.එල්.එල්.සී.පී. අල්විස් මහත්මිය, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දායක මුදල් රැස්කිරීම් සහ සේවායෝජක සබඳතා) තනතුර වෙනුවෙන් රාජකාරී ආවරණය කරන අතිරේක වගකීම් සහිතව සහකාර සාමාන්‍යාධිකාරී (බලාත්මක කිරීමේ කලාපය iii) භාර නිලධාරිනිය ලෙස සේවය කරන්නී ය. ඇය කොළඹ විශ්ව විද්‍යාලයෙන් පළමු පන්තියේ ගෞරව සුදුසුකම් සහිතව විද්‍යාවේදී උපාධියක් ද, පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ජෛව තාක්ෂණය පිළිබඳ විශේෂඥතාව සහිත විද්‍යාපති උපාධියක් ද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත. මීට අමතරව, ඇය ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යාලේඛන ආයතනයේ ව්‍යවහාරික සංඛ්‍යාලේඛනය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබා ඇත. දැනට, අල්විස් මහත්මිය සිය වෘත්තීය සුදුසුකම් පෙළට තව දුරටත් කෙරෙන එකතු කර ගැනීම් සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ නීතිවේදී උපාධියක් ද හදාරමින් සිටින්නී ය.

# සහකාර සාමාන්‍යාධිකාරීවරුන්



### කේ.ජී.එන්. රත්නායක මහතා

සහකාර සාමාන්‍යාධිකාරී
(පරිපාලන හා මානව සම්පත්)

කේ.ජී.එන්. රත්නායක මහතා පරිපාලන හා මානව සම්පත් අධීක්ෂණ කටයුතු ඉටු කරමින් එහි සහකාර සාමාන්‍යාධිකාරීවරයා ලෙස ඉතා දක්ෂ ලෙස සේවය කරයි. ඔහු කැළණිය විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියක් ලබා ඇති අතර පිරිස් කළමනාකරණ වරලත් ආයතනයේ ආශ්‍රිය සාමාජිකයෙකි.



### පුෂ්පරංග වීරසේකර මහතා

සහකාර සාමාන්‍යාධිකාරී
(තොරතුරු තාක්ෂණ)

පුෂ්පරංග වීරසේකර මහතා තම නම ඉදිරියේ සුදුසු සුදුසුකම් රාශියක් ලබා සිටින්නෙකි. ඔහු දැනට සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) ලෙස සේවය කරයි. ඔහු  ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂඥතාවක් සහිතව ඉංජිනේරු තාක්ෂණවේදය පිළිබඳ උපාධියක් ලබා ඇත. මීට අමතරව, ඔහු එක්සත් රාජධානියේ ස්ටැෆර්ඩ්ෂයර් විශ්ව විද්‍යාලයෙන් ලියාපදිංචි ඉංජිනේරු පරිගණක විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. වීරසේකර මහතා ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ ආයතනයේ ආශ්‍රිය සාමාජිකයෙකු වන අතර එක්සත් රාජධානියේ බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ ද සාමාජිකයෙකි. ඒ මහතා, ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ ලියාපදිංචි ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස ද පිළිගැනීමක් ලබා ඇත. තවද, ඔහු කෘතිම බුද්ධි පද්ධති වැඩසටහන පිළිබඳ ඩිප්ලෝමාවක් සහ ජාවා පරිගණක යෙදුම පිළිබඳ ඩිප්ලෝමාවක් ද සම්පූර්ණ කර ඇත.



### එච්.ජී.ඩී. නිහාල් ප්‍රසන්න මහතා

සහකාර සාමාන්‍යාධිකාරී
(සාමාජික සේවා)

එච්.ජී.ඩී. නිහාල් ප්‍රසන්න මහතා, සහකාර සාමාන්‍යාධිකාරී (සාමාජික සේවා) ලෙස වැඩබලන ධාරිතාවකින් කටයුතු කරයි. ඔහු රුහුණු විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියක් සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. මීට අමතරව, ඔහු චීනයේ වුහාන් නුවර හස්ට් (HUST) විශ්ව විද්‍යාලයේ උසස් මට්ටමේ වෘත්තීය වැඩසටහනක් සම්පූර්ණ කර ඇත. ඔහු සතු අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත කැපවීමෙන් යුතුව සේවය කිරීම සඳහා අමතර ශක්තියක් ඔහුට ලබා දෙයි.



### අනුර වික්‍රමසේකර මහතා

සහකාර සාමාන්‍යාධිකාරී
(දායක මුදල් රැස්කිරීම් හා අධිභාර)

අනුර වික්‍රමසේකර මහතා දායක මුදල් රැස්කිරීම් හා අධිභාර  අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා ලෙස සේවා කටයුතු ඉටු කරයි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ විශේෂ කළමනාකරණවේදී විද්‍යා උපාධියක් සහ කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා සිටී. තවද, ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ප්‍රතීතනය සහිත සහතික ලත් ව්‍යාපාර ගණකාධිකාරියෙකු ද වේ.

අනුර වික්‍රමසේකර මහතා, 2024 දෙසැම්බර් මස 3 වන දින සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවයට එක් විය.



# කළමනාකාරිත්ව කණ්ඩායම

## සංස්ථාපිත කාර්යාලය

### දායක මුදල් රැස්කිරීම් හා සේවායෝජක සබඳතා

**කේ. එම්. ඩී. ඒ. යු. ගුණවර්ධන මෙනවිය**
මුල්‍ය කළමනාකරු (දායක මුදල් රැස්කිරීම්)

**ඒ විද්‍යානපතිරණ මහත්මිය**
කළමනාකරු (අධිභාර)

**එන්. සී. ඇපා මහත්මිය**
මුල්‍ය කළමනාකරු (දායක මුදල් රැස්කිරීම්)
01.03.2024

**ඒ. ජේ. ආර්. අනුර මහතා**
කළමනාකරු (ස්වයංරැකියා සහ සංක්‍රමික සේවා)

### සාමාජික සේවා

**එම්. රාහුෆ්ඩීන් මහතා**
කළමනාකරු (සාමාජික ගිණුම්)

**ඒ. එච්. එන්. ප්‍රියන්ති මහත්මිය**
මුල්‍ය කළමනාකරු (ප්‍රතිලාභ ගෙවීම්)

**අයි. විජේතුංග මහත්මිය**
කළමනාකරු (සාමාජික ගිණුම් - කුඩා කාණ්ඩය)

**එස්. ආර්. නන්දසීලි මහත්මිය**
කළමනාකරු (ප්‍රතිලාභ තීරණය කිරීම)

**එච්. කේ. කේ. පී. පුෂ්පකුමාර මහතා**
කළමනාකරු (ප්‍රතිලාභ)

**සිතා කුමාරි බස්නායක**
කළමනාකරු (ප්‍රතිලාභ පරිපාලන)
(2025.07.24 දින විශ්‍රාම යන ලදී)

### ආයෝජන

**එන්. ආර්. එන්. ප්‍රනාන්දු මහත්මිය**
මුල්‍ය  කළමනාකරු

**එච්. එම්. සී. දමයන්ති මහත්මිය**
මුල්‍ය කළමනාකරු

**ඩබ්ලිව්. ඒ. ඒ. හංසමාලි මහත්මිය**
කළමනාකරු (ආයෝජන)

### මුදල් අංශය

**එම්. ඒ. වි. කුමුදිනි මහත්මිය**
මුල්‍ය කළමනාකරු (මුදල්)

### අභ්‍යන්තර විගණන

**ඩී. එල්. සී. ඩී. කුමාර මහතා**
කළමනාකරු (අභ්‍යන්තර විගණන)

### පරිපාලන හා මානව සම්පත්

**බී. සරත් මහතා**
කළමනාකරු (පරිපාලන හා මානව සම්පත්)

**එස් .වීරසිංහ මහත්මිය**
කළමනාකරු (පරිපාලන හා මානව සම්පත්)

**ටී. එම්. අයි. අම්ඩොන් මහතා**
කළමනාකරු (ප්‍රසම්පාදන)
(2025.02.14 දින විශ්‍රාම යන ලදී)

**ටී. එච්. සී. පී. කුමාර මහතා**
කළමනාකරු (ඵලදායිතා)

### තොරතුරු තාක්ෂණ

**බී. ඩී. වඩුගේ මහතා**
කළමනාකරු (තොරතුරු තාක්ෂණ)

### නීති

**එස්. ආර්. එස්. පුංචිහේවා මිය**
කළමනාකරු (නිති)

**එස්. පී. රාජපක්ෂ**
කළමනාකරු (නිති)

## ප්‍රාදේශීය කලමනාකරුවන්

**එම්. ඒ. චන්ද්‍රසේන මහතා**
ප්‍රාදේශිය කළමනාකරු (කොළඹ 1 - 7)

**කේ. එන්. අශෝක මහතා**
ප්‍රාදේශිය කළමනාකරු (කොළඹ 8 -15)

**යූ. එච්. එස් .රංජිත් මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - නුවර එළිය

එන්. කේ. යූ. කේ. නාගසිංහ මහතා
ප්‍රාදේශිය කළමනාකරු - බදුල්ල

**ප්‍රියංගි විජේරත්න මිය**
ප්‍රාදේශිය කළමනාකරු - කළුතර

**ඩී. එම්. කේ. ජී. ඒ. දසනායක මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - කුරුණෑගල

**ඩී. කේ .එස්. එස්. දිසානායක මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - හම්බන්තොට

**ඊ. එම්. එස්. කේ. ඒකනායක මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - මහනුවර

**ඒ. කේ. එන්. ප්‍රසංගනි මිය**
කළමනාකරු (නීති) - මහනුවර

**එස් එම් ගුණසිංහ මිය**
ප්‍රාදේශිය කළමනාකරු - කෑගල්ල

**සාගර හේවාගම මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - ගම්පහ

**සී. අබේගුණසේකර මිය**
ප්‍රාදේශිය කළමනාකරු - මාතර

**ඩබ්ලිව් එම් ඒ ජේ ජේ වෙලේන්ද්‍ර**
කළමනාකරු (නීති) - මාතර

**පී. හෙට්ටිආරච්චි මයා**
ප්‍රාදේශිය කළමනාකරු - අනුරාධපුර
(වැඩ ආවරණ)

**ජේ. තමිල්ලාගන් මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - යාපනය

**ඒ. පී .පී. ගුණේන්ද්‍ර මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - ගාල්ල

**ටී අරුද්ස්තන්**
ප්‍රාදේශිය කළමනාකරු - වව්නියා

**ඩී. ඩී. කුළරත්න මහතා**
ප්‍රාදේශිය කළමනාකරු - රත්නපුර

**ජේ. සී. ජයසිංහආරච්චි මෙනවිය**
ප්‍රාදේශිය කළමනාකරු - අම්පාර



# ආයතනික පාලනය

යහපත් ආයතනික පාලනය, ඉහළ ප්‍රමුඛතා කාර්ය භාරයක් සේ සලකන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය අර්ධ රාජ්‍ය ආයතනයක් වන්නේ ය. ස්වකීය සියලු ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු හරහා ව්‍යාප්ත වන පරිදි අදාළ ව්‍යවස්ථාමය හා නියාමනීය විධිවිධානවලට අනුකූලතාව දක්වමින් කටයුතු කරනු පිණිස මණ්ඩලය බැඳී සිටින්නේ ය. ස්වකීය පාලන කාර්ය භාරයේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම උදෙසා මණ්ඩලය මෙහෙයවනු ලබන ප්‍රධාන මාර්ගෝපදේශ වනුයේ, විනිවිද භාවය, විශ්වාසදායක භාවය හා අනුකූලතාව දැක්වීම යන තෙවැදෑරුම් ප්‍රතිපත්තියයි.

### ආයතනික පාලනයේ කාර්ය රාමුව

මණ්ඩලයේ පාලන ව්‍යුහය ග්‍රැපික් චිත්‍රමය කව අනුසාරයෙන් පහත දක්වා ඇත:

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ආයතනික පාලන ව්‍යුහය, විශේෂිත භූමිකා හා වගකීම් සහිතව පැහැදිලි වාර්තාකරණමය මාර්ග ද සමග බහු ස්ථරවලින් සැදුම් ලත් පාලන ආයතන වලින් සමන්විත වේ. එහි අධ්‍යක්ෂ මණ්ඩලය, මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් සිය අධීක්ෂණමය මෙහෙවර සලසා දෙන අතරම එහි උපාය මාර්ගික දිශානතිය, මූල්‍ය ඉලක්ක, සම්පත් වෙන් කර දීම සහ අවදානම් නැඹුරුව යන කරුණු පිළිබඳව මණ්ඩලයේ ඉහළ කළමනාකරණ පාලනාධිකාරිය සමග නිරන්තර සංකථනයේ යෙදෙයි.

කොටස් හිමියන්
(අරමුදලේ සාමාජිකයින්)

සාමාන්‍යාධිකාරී

අධ්‍යක්ෂ මණ්ඩලය

සාමාන්‍යාධිකාරී

සභාපති/
ප්‍රධාන විධායක නිලධාරී

අධ්‍යක්ෂ මණ්ඩල කමිටුව

සාමාන්‍යාධිකාරී

කළමනාකරණ කමිටුව
(සියළු නියෝජ්‍ය
සාමාන්‍යාකාරීන්/
සහකාර සාමාන්‍යාධිකාරී)

| | |
|---|---|
| විගණන කමිටුව | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/ සහකාර සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) |
| අවදානම් කළමනාකරණ කමිටුව | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/ සහකාර සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) |
| අයෝජන කමිටුව | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/ සහකාර සාමාන්‍යාධිකාරී (ආයෝජන) |
| දුක්ගැනිවිලි කමිටුව | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/ සහකාර සාමාන්‍යාධිකාරී (පරිපාලන හා මානව සම්පත්) |

**අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු**

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු විශේෂිත වගකීම් සහ පැහැදිලි නිශ්චිත විධානයන් මත ක්‍රියාත්මක වේ. කමිටුවේ සභාපතිවරු කමිටුවේ ඵලදායි ක්‍රියාකාරිත්වය සහ අදාළ කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ සිදුකිරීම සඳහා වගකිව යුතුය

**කළමනාකරණ කමිටු**

මෙහෙයුම් තීරණ කළමනාකරණය සාමාන්‍යාධිකාරී විසින් මෙහෙයවනු ලබන ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම් වෙත පවරනු ලැබ ඇත. කළමනාකරණ කමිටුව දෛනික මෙහෙයුම් තීරණ ගැනීමට සහ සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී වෙත නිර්දේශ සිදුකිරීමට ස්ථාපිත කර ඇත.

ආයතනික පාලනයේ ඉහළම මට්ටමේ සම්මත ප්‍රමිති පවත්වාගෙන යමින් ඒ අනුව කටයුතු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ යුතුකම හා වගකීම බව මෙම වාර්තාව තුළින් අවධාරණය කෙරේ. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය, යහපත් පාලන ව්‍යුහ ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිපත්ති රාමු සකස් කිරීම යන කාර්යභාරය විෂයයෙහි ඉතා ඉහළ වගකීමක් දරන අතර මණ්ඩලයේ කාර්යය හා කර්තව්‍යය උදෙසා වන උසස්ම තලයේ පන්නරය ඵලදායි ලෙස ඔවුන් විසින් සලසා දෙනු ලැබිය යුතු ය. නියාමන වෙනස්කම් ද, උද්ගත විය හැකි අවදානම් හා අවස්ථා මෙන්ම අභ්‍යන්තර වෙනස්කම් යනාදිය ද පිළිබිඹු වනු පිණිස පාලන භාවිතා හා චර්යා සමාලෝචනයට හසු කර නිරන්තරව යාවත්කාලීන කෙරේ.

මණ්ඩලයේ පාලන කාර්ය රාමුව පහත ලැයිස්තු ගත කර ඇති පරිදි බාහිර සහ අභ්‍යන්තරික මෙහෙයුම් හා සබැඳි මෙවලම් කීපයකට සාරානුකූල වන ආකාරයෙන් සකසා ඇත:

- 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් අරමුදල් පනත;
- මුදල් රෙගුලාසි (රජය);
- රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ (රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව);
- විශිෂ්ට භාවිත හා චර්යා සංග්‍රහය (රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව);
- ප්‍රධාන පාර්ශවකාර කණ්ඩායම්වල අයිතිවාසිකම් සපුරාලන අතරම සංස්ථාපිත ආයතන ක්‍රියා කළ යුතු ආකාරය ආමන්ත්‍රණය කෙරෙන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද සංස්ථාපිත පාලනය පිළිබඳ විශිෂ්ට චර්යා සංග්‍රහය;
- ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩල පනත;
- ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය;
- සේවක සේවිකාවන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් ආමන්ත්‍රණය කිරීම සඳහා වන 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවක පනත හා ඊට සිදු කරන ලද සංශෝධන;
- මුදල් එකතු කර ගන්නා නියෝජිතයන් සඳහා බදු අධිකාරීන් විසින් නිකුත් කරන ලද පනත්, චක්‍රලේඛ සහ ගැසට් නිවේදන.
- රජයේ අදාළ චක්‍රලේඛ (මහ භාණ්ඩාගාරය හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය)

## 1. අධ්‍යක්ෂ මණ්ඩලය

### 1.1. මණ්ඩලය

රජය සහ එහි පාර්ශවකරුවන් වෙනුවෙන් අරමුදලේ භාරකාරත්වයෙහිලා ව්‍යවස්ථාපිත වගකීමක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙන්නේ ය.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි කළමනාකාරිත්වය, කාර්යක්ෂම මෙහෙයුම් කටයුතු අරභයා සහ අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලතාව දැක්වීම විෂයයෙහි සහතික වන්නා වූ ඵලදායී අභ්‍යන්තර පාලන විධි පද්ධතියක් පවත්වාගෙන යන බවට වග බලාගනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය වෙසෙසා කටයුතු කරයි.

#### 1.1.1. අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම්

අධ්‍යක්ෂවරුන් පත් කරනු ලැබ ඇත්තේ ඉහළ විවිධත්වයක් ආරෝපණය වන අයුරින් පුළුල් සමාජ හරස්කඩක් සහිත පසුබිම් මට්ටමකින් (මුදල, වෙළඳ, හාම්පුතුන්ගේ සම්මේලනය හා වෘත්තීය සමිති යනාදිය) තෝරා ගැනීමෙන් පසුව ය. මෙමගින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කෙරෙන කරුණු සම්බන්ධයෙන් ස්වාධීන මතයක් ගෙන හැර දැක්වීමට ඔවුන්ට හැකියාව ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි සාමාජිකයින් නව දෙනෙකුගෙන් සමන්විත විය යුතු වන්නේ ය:

- අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයින් සිව්දෙනෙකු;
- මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු;
- වෙළඳ විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු;
- ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු;
- සාමාජිකයන් 100,000 දෙනෙකුට වඩා වැඩි පිරිසක් සිටින එක් එක් වෘත්තීය සමිතිවල කෘත්‍යාධිකාරී මණ්ඩලය සමග සාකච්ඡා කිරීමෙන් පසුව අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු.

#### 1.1.2 අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්

අධ්‍යක්ෂ මණ්ඩලය පොදු ජනතාව සතු සම්පත්වල භාරකරු ලෙස තම අධිකාරියට යටත් කර ඇති අයිතිවාසිකම් සහ වගකීම් අවංකව සහ සද්භාවයෙන් ක්‍රියාත්මක කළ යුතු වන්නේ ය. තමන් විසින් නිසි සැලසුමකින් තොරව ගනු ලබන යම් තීරණ හා ඉටු කරනු ලබන ක්‍රියා හේතුවෙන් උද්ගතවන ප්‍රතිඵලය අවසානයේ දී දැරීමට සිදුවන්නේ පොදු මහජනතාවට වන හෙයින් මණ්ඩලය සෑම විටම සිය භාරදූර වගකීම් පිළිබඳව දැනුවත්ව සිටිය යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී විමසුමට භාජනය විය යුතු කරුණු හා ගැටලු පහත දක්වා ඇත:

- ප්‍රතිපත්ති සකස් කිරීම;
- අරමුදලේ කාර්යකරණය අධීක්ෂණය කිරීම හා ඇගයීම;

- උසස්තම සදාචාරාත්මක ප්‍රමිතීන් සහිත ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් සහතික කරන අතරම පරිපාලිත සමාගම්වල, ආශ්‍රය සමාගම්වල හා වෙනත් ආයෝජනවල අරමුණු පිළිබඳ කාර්ය සාධනය අධීක්ෂණය සහ ඇගයීම;
- වාර්ෂික කාර්ය සාධනය සමාලෝචනය කිරීම;
- කාරක ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම;
- කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්ය සාධන වාර්තා විශ්ලේෂණය කිරීම සහ ප්‍රගමනීය ක්‍රියාමාර්ග ගැනීම.

මණ්ඩලය සාමාන්‍යයෙන් මාසික කාල විරාමයක් සහිතව සහ අවශ්‍ය වන අවස්ථාවලදී රැස්වේ. මණ්ඩලය වසර තුළ අවස්ථා 15 ක දී රැස් විය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල ඵලදායිතාව වැඩි දියුණු කිරීම අරබයා ඊට අදාළ මණ්ඩල පත්‍රිකා යෝග්‍ය කාල වේලාවක් සහිතව යටත් පිරිසෙයින් වැඩ කරන දින තුනකට නොඅඩු කාලයකට පෙර බෙදා හරිනු ලැබේ. 2024 වසරේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට එහි සාමාජිකයන්ගේ පැමිණීම පහත දැක්වෙන අයුරින් පැවතියේ ය.

| නම | සහභාගිවූ රැස්වීම් ගණන | 2024 මූල්‍ය වසර තුළ පවත්වන ලද රැස්වීම් ගණන |
|---|---|---|
| ඩී එල් පී රෝහණ අභයරත්න මහතා (2024.10.05 දින දක්වා) | 12 | 15 |
| සෝමසිරි වීකනායක මහතා (2024.10.07 දින සිට පත්කර ඇත) | 03 | 15 |
| කේ ජී එම් හරින්ද්‍ර මහතා (2024.10.07 දින සිට පත්කර ඇත) | 12 | 15 |
| එස් එෆ් එච් ප්‍රනාන්දු මහතා | 13 | 15 |
| එම් පී පාතිපන් මහතා | 08 | 15 |
| එම් සී සුහසිංහ මහතා (2024.10.07 දින සිට පත්කර ඇත) | 02 | 15 |
| කේ ඒ පී ද සිල්වා මහත්මිය | 10 | 15 |
| අතුල හරිස්චන්ද්‍ර මහතා (2024.10.07 දින සිට පත්කර ඇත) | 03 | 15 |
| ඉන්දික බද්දේවිතාන මහතා (2024.10.07 දින සිට පත්කර ඇත) | 03 | 15 |
| කේ එස් දයාරත්න මෙනවිය (2024.10.25 දක්වා) | 08 | 15 |
| කේ ටී අයි ප්‍රේමරත්න මහතා (2024.10.07 දින සිට පත්කර ඇත) | 02 | 15 |
| ජුඩ් ඩිනාල් පීරිස් මහතා | 07 | 15 |
| එල් එස් දේවේන්ද්‍ර මහතා (2024.10.11 දක්වා) | 10 | 15 |
| ඩබ්ලිව් එම් නුරාජිත් සිං මහතා (2024.10.11 දක්වා) | 08 | 15 |
| සී එස් දිසානායක මහතා (2024.10.07 දින සිට පත්කර ඇත) | 03 | 15 |
| කේ එන් ප්‍රේමශාන්ත මහතා (2024.10.07 දින සිට පත්කර ඇත) | 03 | 15 |

### 1.1.3 අධ්‍යක්ෂ මණ්ඩලයේ සමබරතාව

ආයතනය ඵලදායි ලෙස කළමනාකරණය කර එය, යහපාලනයේ ඉහළතම ප්‍රමිතීන් කරා මෙහෙයවමින් ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා අවශ්‍ය වන්නා වූ විශේෂඥ දැනුම, කුසලතාව සහ පළපුරුද්ද අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් සතුව පවතී. ඔවුහු ඉදිරි දැක්ම, නායකත්ව ලක්ෂණ, සාධිත නිපුණතාව සහ ඍජු අවංකභාවය යනාදී ගුණාංගවලින් හෙබි තැනැත්තන් වන්නා හ. මණ්ඩලීය සාමාජිකයින්ගේ පෞද්ගලික වෘත්තීක විස්තර මෙම වාර්තාවේ 38 පිටුවෙහි ගෙනහැර දක්වා ඇත.

### 1.1.4 ඵලදායී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා ප්‍රමාණවත් කාල වෙලාව

සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය මාසික කාල විරාමයක් සහිතව රැස්වේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා වැය වන සාමාන්‍ය කාලය පැය 03 ක් පමණ වන්නේ ය. අදාළ මණ්ඩල පත්‍රිකා පරිශීලනය කර අධ්‍යයනය කිරීම සඳහා ප්‍රමාණවත් කාල වේලාවක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හට ලබා දීම සහතික වනු පිණිස ඒවා සාමාන්‍යයෙන් වැඩ කරන දින තුනකට නොඅඩු කාලයකට පෙර ඔවුන් අතර බෙදා හරිනු ලැබේ.

### 1.1.5 මණ්ඩලීය ලේකම්

නියමිත කාර්ය පටිපාටි, අණපනත් හා වෙනත් අදාළ නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූලතාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම සහ මණ්ඩලය වෙත කලට වේලාවට විශ්වාසදායක සහ අදාළ වන්නා වූ තොරතුරු සැපයීම අරබයා මණ්ඩලයට වගකිව යුතු වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් ආයතනික ලේකම් වරයෙකුගේ උපදෙස් හා සේවා සලසා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයන් හට ඉඩ ප්‍රස්ථාව ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කටයුතු හා සම්බන්ධ කාර්ය පටිපාටි අනුගමනය කෙරෙන බවට මණ්ඩලීය

ලේකම් වගබලා ගත යුතු අතර මණ්ඩලයට එලදායක ලෙස ඔවුන්ගේ කාර්යයන් ඉටු කරනු පිණිස මණ්ඩල පත්‍රිකා කලට වේලාවට බෙදා හැරිය යුතු ය.

### 1.1.6 මණ්ඩලීය ලේකම්ගේ කාර්යභාරය

මණ්ඩලීය ලේකම්, සම්මත අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය පරිපාටි නිසි අයුරින් අනුගමනය කෙරෙන බවට වගබලා ගත යුතු අතර මණ්ඩල රැස්වීම් කටයුතු හා සම්බන්ධ නෛතික නියමයන් පිළිබඳ මාර්ගෝපදේශ ලබාදිය යුතු ය. ඊට අමතර වශයෙන්, පහත සඳහන් කටයුතු ද ලේකම්වරයාගේ කාර්යභාරයෙහිලා ගැනේ:

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ දැනුම් දීම්, රැස්වීම් වාර්තා හා මණ්ඩල පත්‍රිකා අනෙකුත් අදාළ ලිපිලේඛන සමග දන්වා යැවීමට සැලැස්වීම;
- අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු ඉටු කිරීම;
- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට අවශ්‍ය අභ්‍යන්තර හා බාහිර තොරතුරු සපයා දීමෙන් ඔවුන්ට සහය සැලසීම.

## 1.2 සභාපති / ප්‍රධාන විධායක නිලධාරි

සමස්ත ආයතනික පාලන තන්ත්‍ර ව්‍යුහයේ වැදගත්ම පුරුක වන සභාපතිවරයා / ප්‍රධාන විධායක නිලධාරී වරයා ස්වකීය සේවා කණ්ඩායම සහ ආයතනය නිවැරදි දිශානතියක් වෙත මෙහෙයවීම සඳහා නායකත්වය ගෙන ක්‍රියා කරයි. කලින් නිශ්චය කරනු ලැබූ ඉලක්ක මුදුන් පමුණුවා ගැනීම පිණිස ප්‍රධාන කර්තව්‍යයන්ට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහාත්, සැලසුම් හා වැඩ සටහන් සැකසීම සඳහාත් ඔහු වගකිව යුත් වන්නේ ය.

### 1.2.1 සභාපති වරයාගේ පත්කිරීම්

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරීවරයා වනුයේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා ය. සභාපති වරයා පත්කරනු ලබන්නේ අමාත්‍ය තුමා විසිනි.

### 1.2.2 සභාපති වරයාගේ වගකීම්

සමස්ත ආයතනික පාලනතන්ත්‍ර ව්‍යුහයේ වැදගත්ම පුරුක වන සභාපතිවරයා / ප්‍රධාන විධායක නිලධාරි වරයා ස්වකීය සේවා කණ්ඩායම සහ ආයතනය නිවැරදි උපාය මාර්ගික දිශානතියක් වෙත මෙහෙයවීම සඳහා නායකත්වය ගෙන ක්‍රියා කරයි. කලින් නිශ්චය කරනු ලැබූ අරමුණු මුදුන් පමුණුවා ගැනීම පිණිස ප්‍රධාන කර්තව්‍යයන්ට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහාත්, උපාය මාර්ගික සැලසුම් හා මූලාරම්භක වැඩ සටහන් සැකසීම සඳහාත් ඔහු වගකිව යුත් වන්නේ ය.

### 1.2.3 උපායමාර්ගික සහ මෙහෙයුම් කටයුතුවල සමබරතාවය

භූමිකාවන්හි පැහැදිලි බව සහ වගකීම් එලදායී ලෙස වෙන් කිරීම තුළින් සුදුසු බල තුලනය සහතික කෙරේ. සභාපතිවරයාගේ කාර්යභාරය සාමාන්‍යාධිකාරීවරයාගේ කාර්යභාරයෙන් වෙන්ව පවතී. සභාපති විධායක අධ්‍යක්ෂවරයෙකු වන අතර අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයයි. සාමාන්‍යාධිකාරීවරයා මෙහෙයුම් කටයුතුවලට නායකත්වය සපයන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ තනතුරක් දරන්නේ නැත. සභාපතිවරයාගේ සහ සාමාන්‍යාධිකාරීවරයාගේ ප්‍රධාන භූමිකාවන් / වගකීම් පහත දැක්වේ:

**සභාපති**

අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත උපාය මාර්ගික දැක්ම

ඉහල මට්ටමේදි උපායමාර්ගික හැසිරීම් සකස් කිරීම

සියළුම උපාය මාර්ගික දිශානතීන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ එලදායිත්වය

ශ්‍රී ලංකා රජය ඇතුළුව සියලුම පාර්ශවකරුවන් සමග එලදායි සන්නිවේදනය පවත්වා ගැනීම

ප්‍රමාණවත් තොරතුරු සියළුම අධ්‍යක්ෂවරුන්ට ලබාගත හැකි බව සහතික කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සාදාචාර හැසිරීම ස්ථාපිත කිරීම

**සාමාන්‍යාධිකාරි**

දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා පරමාර්ථ සකස් කරමින් උපයා මාර්ගික දැක්ම ක්‍රියාවට නැංවීම

ආයතනික සැලැස්මේ දක්වා ඇති කාර්ය සාධන අරමුණු අත්කර ගැනීම

ඉලක්ක පිළිබද නිරන්තර නියාමනය සහ ඒවායේ අත්කරගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දීම

මණ්ඩලය අනුමත අවදානම් රුචිය සහ ශක්තිමත් අභ්‍යන්තර පාලනය තුළ ක්‍රියාත්මක වන බව සහතික කිරීම

ජ්‍යෙෂ්ඨ කළමනාකරණයට මෙහෙයුම් නායකත්වය ලබාදීම



# විගණන කමිටු
## වාර්තාව - 2024

### කමිටුවේ ප්‍රඥප්තිය

විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලයට අයත් අනු කමිටුවක් ලෙස, මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන විධි හා අභ්‍යන්තර විගණනය යනාදී කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම මගින්අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් ඉටු කිරීම සඳහා ඊට සහය වෙයි.

### කමිටුවේ සංයුතිය සහ රැස්වීම්

විගණන කමිටුව, විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය.

| නම | තනතුර | සහභාගි වූ රැස්වීම් ගණන |
|---|---|---|
| කේ. එස්. දයාරත්න මහත්මිය | කමිටුවේ සභාපතිනි | 2/2 |
| කේ. ජී. මධූෂාන් මහතා | කමිටු සාමාජික | 1/2 |
| කේ. ඒ. පී. ද සිල්වා මහත්මිය | කමිටු සාමාජික | 2/2 |
| කේ.එස්. වැලිවිට මහතා | කමිටුවේ ලේකම් | |

### විගණන කමිටුවේ කාර්යභාරය

විගණන කමිටුවේ ප්‍රධාන කර්තව්‍යයන් පහත ගෙනහැර දැක්වේ:

- ක්‍රියාත්මකව පවත්නා අභ්‍යන්තර පාලන පද්ධති සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලි සමාලෝචනය කිරීම, ඒවා අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් කෙරෙහි දක්වන අනුකූලතාව සමාලෝචනය කිරීම සහ ඊට අදාළ නියාමන අවශ්‍යතා යනාදියෙහි ප්‍රමාණවත්භාවය හා සඵලතාවය සමාලෝචනය කිරීම;
- කළමනාකරණය විසින් සිදු කරනු ලබන අර්ථාන්විත ඇස්තමේන්තු සහ නිශ්චයමතීන් සමාලෝචනය කිරීම;
- අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම.

### අභ්‍යන්තර විගණනය

මණ්ඩලයේ අභ්‍යන්තර විගණන කාර්යය, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) වරයාගේ ප්‍රධානත්වයෙන් මෙහෙයවනු ලැබේ. විගණන කමිටුව විසින්, අභ්‍යන්තර විගණනයේ නිගමන සහ නිර්දේශ, කළමනාකරණය ඊට දක්වන ප්‍රතිචාරය සමඟ සමාලෝචනයට හසු කරනු ලැබ, සමස්ත පාලන යාන්ත්‍රනය සවිමත් කරනු පිණිස එම නිර්දේශ ක්‍රියාත්මකවීමේ ප්‍රගතිය පිළිබඳව නිරන්තර පසු විපරමට භාජනය කරනු ලැබ තිබේ.

### බාහිර විගණනය

විගණන කමිටුව විසින්, විගණකාධිපතිවරයාගේ වාර්තා විධිමත් පරිදි සැලකිල්ලට යොමු කොට, ඒවා සමාලෝචනයට හසු කර සාකච්ඡාවට භාජනය කරනු ලැබ තිබේ.

### අවධානය යොමු කෙරෙන ප්‍රමුඛ ක්ෂේත්‍ර

වෙන් කර නොපැවති ලැබීම්, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය, ප්‍රාදේශිය කාර්යාල විසින් කරනු ලබන රැස්කිරීම් සහ මුදල් හා චෙක්පත් බැංකුගත කිරීම්, පනතට කරනු ලබන සංශෝධනවල ප්‍රගතිය, නවම් මාවතෙහි පිහිටි රථගාලෙහි ආදායම, සාමාජික හිමිකම් ගෙවීමේ ක්‍රියාවලිය විෂයයෙහි අභ්‍යන්තර පාලන විධි, මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සහ අධිකරණය හරහා දායක මුදල් හා අධිභාර එකතු කිරීම් යනාදී කටයුතු පිළිබඳව විගණන කමිටුව විසින් වර්ෂය තුළ දී සලකා බලනු ලැබ ඇත.

### වාර්තාකරණය

කමිටු රැස්වීම්වල වාර්තා සහ එහි නිර්දේශ කිරීම් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී සභාගත කෙරුනු අතර, විගණන කමිටු සභාපතිනිය, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඊට අදාළ කරුණු අවශ්‍ය පරිදි වාචිකව ඉදිරිපත් කර සිටියා ය.

### නිමාව

වසර තුළ දී, කමිටු රැස්වීම්වලට ඉදිරිපත් කරනු ලබන විෂය කරුණු සහ අදාළ විගණන නිරීක්ෂණ යනාදිය පිළිබඳව ගැඹුරු ලෙස සලකා බලා, ඒවා සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කර, මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට අවශ්‍ය මගපෙන්වීම් ද කමිටුව විසින් සලසා දෙනු ලැබ තිබේ. ආයෝජන සුරක්ෂිතව ඇති බවට වග බලා ගනු පිණිස ප්‍රමාණවත් පියවරයන් ගෙන ඇති අතර, මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති මූල්‍ය තත්ත්වය සහ ප්‍රතිඵල, සත්‍ය තොරතුරු සහිතව, ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොරව පවත්නා බවට සහතික කර ගැනීම සඳහා එම පියවර ප්‍රමාණවත් වන බව විගණන කමිටුවේ මතයයි.

විගණන කමිටුව වෙනුවෙන්,

**අත්සන් කළේ**
කේ. එස්. දයාරත්න මහත්මිය
සභාපතිනි,
විගණන කමිටුව.

# කළමනාකරණ අවදානම් කමිටු
## වාර්තාව



### අරමුණ

අපගේ ව්‍යාපාරික පරිසරයට ආවේණික වන්නා වූ අවදානම හඳුනා ගැනීමටත්, එය තක්සේරු කර බැලීමට හා කළමනාකරණය කිරීමටත් ව්‍යවසායික අවදානම් කළමනාකරණය (ERM) නිර්මාපණය කෙරේ. ඉදිරියේ දී විය හැකි විභව අහිතකර අවදානම් තත්ත්වයන් පුරෝකතනය කිරීමටත්, ඒවා විෂයයෙහි ඵලදායී ලෙස ප්‍රතිචාරාත්මක වීමටත් මෙම ප්‍රවේශය මගින් අපට හැකියාව සලසා දෙනු ඇත. අපගේ අවදානම් කළමනාකරණ පරිචය හා භාවිතයන්, උපාය මාර්ගික පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේ හා අප පාර්ශවකරුවන්ගේ අභිලාෂයන් සුරක්ෂිත කිරීමේ කාර්යයෙහිලා මුඛ්‍ය අංගයක් වනු ඇත.

### අවදානම පාලනය කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය, විගණන කමිටුවේ සහ කළමනාකරණ අවදානම් කමිටුවේ සහය සහිතව කටයුත කරමින්, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සඳහා වගකිව යුතු වේ.

### ප්‍රධාන අවදානම්

| අවදානම | සමනය කිරීමේ උපාය මාර්ග |
|---|---|
| ණය අවදානම<br>**සේවා යෝජකයෙකුට තම සාමාජික දායකත්ව වගකීම් හා බැඳීම් ඉටු කිරීමට නොහැකි වූ විට වග බලා ගැනේ.** | • ප්‍රදේශ අනුව නිරන්තර සමාලෝචනය.<br>• මාසික වාරික ගෙවීමේ සැලසුම්.<br>• ප්‍රාදේශිය කාර්යාල ජාල සේවය හරහා සක්‍රීය බලාත්මක කරවීමේ කටයුතු. |
| නීතිමය සහ නියාමන අවදානම<br>**ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවලට සාරානුකූල නොවීම හේතුවෙන් උද්ගත වේ.** | • සියලුම ප්‍රතිපත්ති වෙනස් වීම් සහ නීති අණ පනත් හා රෙගුලාසි වෙනස් වීම් පිළිබඳව විමසිලිමත් ලෙස දැනුවත්ව සිටීම.<br>• නියාමන දැනුවත්භාවය වැඩි දියුණු කර ගැනීම හා ගතික සාකච්ඡා සැසි පැවැත්වීම. |
| ආයෝජන අවදානම්<br>**කිසියම් ආයෝජනයක ඉදිරියේ දී විය හැකි අලාභය හෝ ඌණ කාර්ය සාධනය පිළිබඳ අවදානම හා බැඳේ.** | • නිරන්තර ආයෝජන කමිටු රැස්වීම්.<br>• ආයෝජන කොටස් කළඹ සම්බන්ධයෙන් වෙළඳපොළින් වෙළඳපොළට ප්‍රති ඇගයීම් සිදු කිරීම.<br>• ආයෝජන ප්‍රතිපත්ති සමාලෝචන සහ ඒවාට අනුකූලතාව දැක්වීම.<br>• අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිතිපතා සමාලෝචනය කරනු ලැබීම |

| | |
|---|---|
| **පොලී අනුපාත අවදානම්**<br>**පොලී අනුපාතයන්හි වෙනස්කම් ඇති කරන අවදානම, මූල්‍ය මෙවලම්වල වටිනාකම විෂයයෙහි බලපෑම් ඇති කරනු ඇත.** | • නිරන්තර ආර්ථික සමාලෝචනය.<br>• ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණයේ ප්‍රමිති අනුව තක්සේරු කිරීම්.<br>• විද්‍යාත්මක පුරෝකථන ක්‍රම යොදා ගැනීම. |
| **සංවිධානමය මානව අවදානම්**<br>**ජ්‍යෙෂ්ඨ සහ මධ්‍යම කළමනාකරණ මට්ටම්වල දක්ෂ කාර්ය මණ්ඩලය ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට නොහැකි වීමේ අවදානම.** | • අනුක්‍රමික සැලසුම්කරණය.<br>• නිපුණතා වැඩි දියුණු කිරීමේ වැඩසටහන්.<br>• ශ්‍රම පිරිවැටුම අවම කිරීම සඳහා ගෙන ඇති පියවර.<br>• රේඛීය අමාත්‍යාංශය සමඟ නිරන්තර සාකච්ඡා.<br>• කාර්ය මණ්ඩල සුබසාධන වැඩසටහන්.<br>• සංස්කෘතික වැඩි දියුණු කිරීම්. |
| **මෙහෙයුම් අවදානම්**<br>**ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලි, පද්ධති, පුද්ගලයින් හෝ බාහිර සිදුවීම් හේතුවෙන් ඇති වන අලාභයේ අවදානම.** | • ක්‍රියාවලි සම්බන්ධයෙන් අධීක්ෂණය වැඩි දියුණු කිරීම්.<br>• අභ්‍යන්තර පාලන විධි පිළිබඳ නිරන්තර සමාලෝචනය.<br>• අතින් වැඩ කිරීම වෙනුවට පරිගණක වැඩසටහන් භාවිතයට යොදා ගැනීම.<br>• විගණනය හා සහතිකායනය. |
| **තාක්ෂණය හා දත්ත ආශ්‍රිත අවදානම**<br>**තොරතුරු තාක්ෂණයේ අසමත්කම්, බිඳ වැටීම්, නතරවීම් සම්බන්ධ විභවයන්ට අවදානම අදාළ වන අතර, එය, ප්‍රකෘතිමත් වීමේ ඌණතාව පිළිබඳ පෙර දැනුවත් කිරීම් සිදු කරයි.** | • උපස්ථ නිසි ලෙස නඩත්තු කිරීම.<br>• පද්ධති ආරක්ෂණය වැඩි දියුණු කිරීම්.<br>• දැනට පවත්නා වැඩසටහන් උත්ශ්‍රේණිගත කිරීම.<br>• දත්ත පවිත්‍රණය. |
| **සයිබර් ආරක්ෂණ අවදානම**<br>**තොරතුරු තාක්ෂණ පද්ධතිවල අසාර්ථකත්වය හෝ සයිබර් ප්‍රහාර හේතුවෙන් ඇති විය හැකි විභව මූල්‍ය අලාභවලට, මෙහෙයුම් කටයුතු කෙරෙහි වූ බාධා සිදුවීම්වලට සහ කීර්තිනාම හානි හා සම්බන්ධ අවදානම්වලට මෙම අවදානම අදාළ වේ.** | • අථත්‍ය පුද්ගලික ජාල සේවා (vpn) භාවිතය.<br>• වැඩි දියුණු කළ පද්ධති ආරක්ෂාව හා ෆයර්වෝල් (Firewall) ආරක්ෂණය.<br>• විශේෂඥ උපදේශන.<br>• ආයතනික දැනුවත්වීමේ වැඩසටහන්. |

## නිමාව

විභව අවදානම් හඳුනා ගැනීම සඳහාත්, ඒවා කළමනාකරණය කර සමනය කර ගැනීම සඳහාත් ප්‍රමාණවත් කළමනාකරණ කාර්ය රාමුවක් ස්ථාපනය වී පවතින බවට කළමනාකරණ අවදානම් කමිටුව විසින් වග බලා ගනු ලබනවා ඇත.

**අත්සන් කළේ**
**කේ. එස්. වැලිවිට**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන),
අවදානම් කළමනාකරණ සම්බන්ධීකාරක.



# **ආයෝජන කමිටු** වාර්තාව

මණ්ඩලයේ ආයෝජන කමිටුව පිහිටුවනු ලැබ ඇත්තේ, මණ්ඩලීය ආයෝජන ප්‍රතිපත්තියෙහි ගෙන හැර දක්වා ඇති පරිදි ආරක්ෂාව, ද්‍රවශීලතාව සහ ප්‍රතිලාභ ලබා ගැනීම යන එහි මූලික ආයෝජන අරමුණු සපුරා ගනු වස් ආයෝජන අංශයට මග පෙන්වමින් ඒ සඳහා උපදෙස් ලබා දීම පිණිස ය. තවද, ආයෝජන ප්‍රතිපත්තිවල වත්කම් වෙන්කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සහ පාලන කාර්ය රාමුව තුළ පසුවෙමින් විවිධ මූල්‍ය නිපැයුම්හි සිදු කළ ආයෝජනවල කාර්යක්ෂමතාව නිරීක්ෂණය කිරීමෙහිලා මණ්ඩලයට සහය වීම සඳහා ද මෙම කමිටුවට නියමිත වේ. අවදානම් නැඹුරුවක් සහිත ආයෝජන (කොටස් මිලදී ගැනීමේ සැලැස්ම සහ ණයකර යනාදිය) සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීම සඳහාත්, ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල හා කොටස් ආයෝජනවල කාර්ය සාධනය සමාලෝචනය කිරීම සඳහාත් මෙම කමිටුව යටත් පිරිසෙයින් මසකට එක් වරක් හෝ රැස් වෙයි.

### සංයුතිය

වර්ෂය තුළ ආයෝජන කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ :

| **නම** | **තනතුර** |
|---|---|
| අතුල හරිස්චන්ද්‍ර මහතා⋆ | අධ්‍යක්ෂ |
| කේ. වී. සී. දිල්රුක්ෂි මහත්මිය | මහා භාණ්ඩාගාර නියෝජිත |
| ආර්. කේ. ජයලත් මහතා | සාමාන්‍යාධිකාරී (වැඩ බලන) |
| එම්. ඒ. කේ. අළුත්ග මගේ මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයෝජන) |
| කේ. ඩී. ඒ. පී. කරුණාරත්න මහතා⋆⋆ | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) |
| කේ. එස්. වැලිවිට මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) |

⋆ 2024 ඔක්තෝබර් මස සිට බලපැවැත්වෙන පරිදි පත් කර ඇත.

⋆⋆ 2024 නොවැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි පත් කර ඇත.

| **නම** | **සහභාගි වූ / ස්වීම් ගණන** |
|---|---|
| අතුල හරිස්චන්ද්‍ර මහතා⋆ | 2/10 |
| කේ. වී. සී. දිල්රුක්ෂි මහත්මිය | 10/10 |
| ආර්. කේ. ජයලත් මහතා | 4/10 |
| එම්. ඒ. කේ. අළුත්ගමගේ මහතා | 10/10 |
| කේ. ඩී. ඒ. පී. කරුණාරත්න මහතා⋆⋆ | 2/10 |
| කේ. එස්. වැලිවිට මහතා | 8/10 |

⋆ අථත්‍යව සහ භෞතිකව



# කළමනාකරණ කමිටු වාර්තාව

## සංයුතිය

සමාලෝචිත වර්ෂය තුළ කමිටුවේ සාමාජිකයින් පහත සඳහන් පරිදි විය:

## සභාපති, සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරරිත්වය

අරමුදලට අයත් මෙහෙයුම් කටයුතු කළමනාකරණය කිරීමේ වගකීම සභාපතිවරයාගේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ පාලනය යටතට පැවරී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීමේ වගකීම ඔවුහු දරන්නාහ. මනා විමසුම් සහගත තීරණවලට එළඹීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් ලබා දීමේ කාර්යයෙහි සභාපති වරයා හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම නියැලෙයි. ඔවුහු මණ්ඩලයේ ඉලක්ක හා අරමුණු මුදුන් පමුණුවා ගැනීමට කටයුතු කරන අතරම එහි කාර්යක්ෂම කළමනාකරණය උදෙසා වූ සැලසුම්, අයවැය ලේඛන, පිළිගත් පද්ධති, ක්‍රියාපටිපාටි හා පාලන විධි සැකසීමෙහි ද නිරතව සිටිති.

එබැවින්, මණ්ඩලයේ වාරමය ප්‍රගති පිරික්සුමෙහි මුඛ්‍යාංග යක් ලෙස කළමනාකරණ කමිටුව ක්‍රියා කරයි. කමිටුවේ විශේෂ අවධානය යොමුවන කරුණු පහත දැක්වේ:

- මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති මීට පෙර රැස්වීම්වල දී ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණ.
- ඉලක්ක දිශාභිමුඛ කාර්ය සාධන ක්‍රියාදාමයෙහි ඇතිවන පරතර හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග සහිතව විධිමත් පිළිවෙත්වලින් බැහැරව කටයුතු කිරීමේ යුක්ති සහගත භාවය හඳුනා ගැනීම.
- ඉදිරි කාර්තු සඳහා වන මුදල් ප්‍රවාහයේ ආකාරය හා ඉලක්ක ගත අවශ්‍යතා අතිශය තීක්ෂණ අයුරින් ඇගයීම.
- ණය සහ මුදල් කළමනාකරණය.
- හදිසි මිලදී ගැනීම් වළක්වනු පිණිස ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි ප්‍රමාදවීම් ඇත්නම් ඒවා පිළිබඳව පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම.
- සේවක අර්ථ සාධක අරමුදල, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල හා බදු යනාදී ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත පරිදි සිදු වන බවට වගබලා ගැනීම හා අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසුවනු පිණිස යුක්ති සහගත හේතු මත අවශ්‍ය උසස් තාක්ෂණමය උත්ශ්‍රේණිගත කිරීම් සලසා ගැනීම.
- විවිධ මාධ්‍ය ඔස්සේ පළවන පැමිණිලි ඇතුළුව ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය / අතෘප්තිමත්භාවය පිළිබඳ පසු විපරම් කටයුතු කරමින් ඒවා වැඩි දියුණු කිරීම / නිවැරදි කිරීම සඳහා ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.
- ප්‍රතිශෝධිත ආයතනික සැලැස්ම තුළ ඇතුළත් කළ යුතු යම් යම් නව යෝජනා වේ නම් ඒවා ඉදිරිපත් කිරීම.
- පරිපාලනමය හා ආයතනික කාර්යයන්ට අදාළ සියලු කටයුතු.
- මෙහෙයුම් කාර්යයන් අළලා එදිනෙදා උද්ගත වන වෙනත් යම් ගැටලු.

# අවදානම් කළමනාකරණය

## පසුබිම

මනා අයුරින් පාලනය වන ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සිය කාර්ය නිරාවරණය තුළ යම් අධිකාරිත්වයක් දරමින් අවදානමට මුහුණ දෙන්නේ ව්‍යාපාරික අවස්ථාවක් ලෙස ය. එමෙන්ම, ව්‍යාපාරික අරමුණු යන නිර්වචනයෙන් ආරම්භ වන අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස අවදානම් පාලනය සැලකිල්ලට භාජනය කරයි. ඉන් අනතුරුව විමසා බැලෙනුයේ, උපකල්පනය කළ හැකි, කළ යුතු හෝ නොකළ යුතු ව්‍යාපාරික නිරාවරණයන් පිළිබඳ ප්‍රතිපත්ති පිළිපැදීම, අවදානම් සාධක හඳුනා ගැනීම හා තක්සේරු කිරීම මෙන්ම ස්වකීය ක්‍රියාකාරකම් හා සම්බන්ධ අවදානම් කළමනාකරණය සඳහා වන ක්‍රම සහ විධි සූක්ෂම අයුරින් යොදා ගැනීම යන කරුණු කාරණායි.

සෑම සංවිධානයක්ම එහි සාර්ථකත්වයට තර්ජනයක් වන අවදානම් වලට මුහුණ දෙයි. කම්පන හෝ ස්වභාවික සිදුවීම්, වසංගත අර්බුද හා පාරිසරික / සමාජීය / පාලනමය ගැටලු ජාතික මෙන්ම ගෝලීය ආර්ථිකයට පවා අහිතකර ලෙස බලපෑම් එල්ල කළ හැකි සංසිද්ධීන් ය. තාක්ෂණය අපේ ජීවිතයේ අනිවාර්ය අංගයක් වී ඇති නමුත් නව තාක්ෂණයේ දියුණුව, ආර්ථික වර්ධනය උපදවන ඵලදායිතා මට්ටම් ඉහළට ඔසවා තැබීම දුර්මුඛ කර තිබේ.

කෙසේ වෙතත්, ෆින්ටෙක් (Fintech) හා රෙග්ටෙක් (Regtech), ක්‍රිප්ටොඇසෙට්ස් (Cryptoassets), මූල්‍ය අපරාධ, සයිබර් සෙකියුරිටි (Cyber Security) සහ ඩේටා සෙකියුරිටි (Data Security) යනාදී අනර්ථකාරී නවෝත්පාදනයන්, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය විෂයයෙහි උද්ගතව ඇති හිතකර නොවන සලකා බැලීම් වන්නේ ය.

## ඵලදායී ප්‍රතිපත්ති කරා දිවෙන මාවත

පාලනය, අවදානම සහ අනුකූලතාව හෙවත් 'GRC' යන කෙටි යෙදුම වඩා ඉහළ පිළිගැනීමක් සහිත පාඨයක් වන අතර එකී අංගයන්, වත්මන් ව්‍යවසායන් තම ව්‍යාපාර කාර්යයන් සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කරන නව ආකාරයේ පිළිබිඹුවක් බවට පත් කර ගෙන ඇත. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට ද පාලනය, අවදානම සහ අනුකූලතාව හෙවත් 'GRC' යන පාඨය හැකි උපරිම ආකාරයෙන් තම ව්‍යවසාය වර්ධනය පිණිස ඉවහල් කර ගත හැකි මහාර්ඝ ආදර්ශයකි.

## අවදානම් පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය, අවදානම් කළමනාකරණය පිළිබඳ කාර්යභාරයේ බලය අවදානම් කළමනාකරණ කමිටුව වෙත පවරයි.

සියලු වර්ගවල අවදානම් හඳුනා ගැනීම, මානනය කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම යන කටයුතු ස්වාධීනව සමාලෝචනයට හසු කිරීම අරබයා අවදානම් කළමනාකරණ කමිටුව වගකීම උසුලයි. තව ද, අවදානම් කළමනාකරණ කමිටුව, ආයතනයේ ව්‍යාපාරික උපාය මාර්ගවලට අනුකූලව අනුමත කරනු ලැබීම සඳහා විචක්ෂණශීලී අවදානමක් සහිත මුදල් ප්‍රමාණයක් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරයි. අවදානම අවබෝධ කර ගැනීම සහ කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා අවදානම් විශ්ලේෂණය කිරීම, මානනය කිරීම සහ කළමනාකරණය කිරීම යන අවස්ථාවල දී වැදගත් කාර්යභාරයක් ඉටු කරන ආරක්ෂක මාදිලියේ තෙවැදෑරුම් රේඛා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් අනුගමනය කරනු ලැබ ඇත.


පාලනය
මෙහෙයුම් කළමනාකරණය සහ සහාය තුලින්
ශක්තිමත් ආචාර ධර්ම කාර්යක්ෂමතාව
උපාය මාර්ග
ක්‍රියාවලිය
මහජනතාව
තාක්ෂණය
අවදානම් නැඹුරුව
බාහිර රෙගුලාසි
අවදානම් කළමනාකරනය
අනුකූලවීම

# අවදානම් සැසඳුම


අනෙකුත් සියලු අංශ
සේ.නි.භා.අ.
ගෝලීය අවදානම් වර්ණාවලිය
උපාය මාර්ගික සහ මෙහෙයුම්
ණය, ද්‍රවශීලිතාවය, වෙළඳපොළ ආයෝජනය

| අභ්‍යන්තර අවාදනම් ධාවක | අවදානම් සාධක | අවම කිරීමේ උපාය මාර්ගය |
|---|---|---|
| **උපායමාර්ගික අවදානම** | ව්‍යාපාරික පරිසරයේ වෙනස්වීම් හා අහිතකර ව්‍යාපාරික තීරණ නිසාත්, තීරණ නිසි ලෙස ක්‍රියාත්මක නොකිරීම හෝ ව්‍යාපාරික පරිසරයේ වෙනස්වීම්වලට ප්‍රතිචාර දැක්වීමේ ඌනතාවය හේතුවෙන් පැන නගින ඉපැයීම්වලට සහ ප්‍රාග්ධනය වෙත එල්ල වන වත්මන් හෝ අනාගත අවදානම. | අදාළ මාර්ගෝපදේශ හා චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කිරීමෙන් ද, මුළු මහත් ආයතනය සඳහා ආයතනික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම කල්තියා සකස් කර ගැනීමෙන් ද, විචලනයන් අඛණ්ඩව අධීක්ෂණය කිරීමෙන් ද අභ්‍යන්තර හා බාහිර උපායමාර්ගික අවදානම අවම කර ගැනේ. |
| **මෙහෙයුම් අවදානම** | ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලීන් හේතුවෙන් ද, පුද්ගලයන් සහ පද්ධති හෝ බාහිර සිදුවීම් හේතුවෙන් ද ඇති වන අලාභයේ අවදානම. | පාලන විධි, රක්ෂණය හා පද්ධති විගණනය යොදා ගැනීමෙන් සහ නිතිපතා තොරතුරු තාක්ෂණ පද්ධතිය යාවත්කාලීන කිරීමෙන් ද, ව්‍යාපාර අඛණ්ඩ සැලසුම් හා ආපදා ප්‍රතිසාධන ක්‍රියා පටිපාටි, තොරතුරු සහ සයිබර් ආරක්ෂාව මෙන්ම භෞතික ආරක්ෂාව සම්බන්ධ අවදානම් පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණුව යනාදිය මගින් ද මෙහෙයුම් අවදානම අවම කර ගැනේ. |
| **ණය අවදානම** | තම වගකීම් ඉටු කිරීම සඳහා ප්‍රති පාර්ශවය හෝ නිකුත් කරන්නා විසින් ගනු ලබන පියවර හේතුවන් සිදු වන අලාභයේ අවදානම. | ගිවිසුම් අත්සන් කිරීම, ණය සීමා පවත්වා ගැනීම හා ඒවා අධීක්ෂණය මගින් ද, ඇපකර ලබා ගැනීම මගින් ද ණය අවදානම අවම කර ඇත. |
| **වෙළඳපළ අවදානම** | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි එක් ප්‍රධාන අරමුණක් වන්නේ, දේශීය මූල්‍ය වෙළඳපොළේ මුදල් ආයෝජනය කිරීමෙන් ප්‍රතිලාභ උත්පාදනය කර ගැනීම වන අතර එහි ස්වභාවය මිල අවිනිශ්චිතතාවය මත පදනම් වේ. මූල්‍ය සාධන පත්වල අගයයෙහි සිදු වන වෙනස්වීම් හේතුවෙන් අලාභ උද්ගත වනු ඇත. | අති සුවිශේෂී ආයෝජන පවත්වා ගෙන යාමේ විධි හා මෙවලම් යෙදීම හරහා අස්ථායී අවදානම් වෙළඳපළ තුළ ද්‍රවශීලතා අවදානම් පොලී අනුපාත අවදානම සහ කොටස් මිල අවදානම සලකා බැලීම මගින් වෙළඳපළ අවදානම අවම කර ඇත. |
| **ආයෝජන අවදානම** | ආයෝජනය යනු වර්තමාන සම්පත් භාවිතය අත්හැරීමේ තීරණයයි. ඒ වෙනුවට, ඒවායේ වත්මන් අගයන්හි ආයෝජන අවදානමට වඩා වැඩි අනාගත ප්‍රතිලාභ ලැබීමට ඒවා භාවිතා කළ හැකිවේය යන විශ්වාසය තුළ මෙම අනාගත ප්‍රතිලාභ ක්‍රියාත්මක නොවීම හෝ අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩුවීම අවදානමක් වේ. | පාරිසරික, සමාජීය හා පාලනමය සාධක හරහා වගකිව යුතු ආයෝජන පිළිබඳ සංකල්පය සලකා බැලීමෙන් ආයෝජන ප්‍රතිපත්තියට අනුගත වීම ඔස්සේ ආයෝජන අවදානම් අවම කර ගැනීම සිදු කර ඇත. |
| **ද්‍රවශීලතා අවදානම** | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි ද්‍රවශීලතාවය රඳා පවතින්නේ, වෙනත් දේ අතර, සාමාජික හිමිකම් ගෙවීම සඳහා එහි ක්ෂණික මුදල් අවශ්‍යතාවය, දැනට එහි ඇති මුදල් ප්‍රමාණය සහ එහි ආයෝජන වත්කම් කෙතරම් පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි ද යන කරුණු මත ය. | කල්පිරීමේ හිනිපෙත ඉදිකිරීම, සත්‍ය සහ ගිවිසුම්ගත මුදල් ලැබීම් විශ්ලේෂණය කිරීම, 'රිපෝ' වැනි ප්‍රති මිලදී ගැනුම් ද්‍රව වත්කම්වල ආයෝජනය, විවිධාංගීකරණය වූ අලෙවි කළ හැකි කොටස් වෙළෙඳපොළ තුළ ආයෝජනය යනාදිය මගින් ද්‍රවශීලතා අවදානම අවම කර ඇත. |

## මෙහෙයුම් අවදානම් කළමනාකරණය

මෙහෙයුම් අවදානම හඳුනාගෙන විවිධ හේතූන් යටතේ වර්ගීකරණය කර ඇත: ක්‍රියාවලි, පුද්ගලයින්, පද්ධති සහ බාහිර සිදුවීම් නිසා සේ. නි. භාර අරමුදල් මණ්ඩලය මුහුණ දෙන විවිධ මෙහෙයුම් අවදානම් තක්සේරු කර, පසුව මෙහෙයුම් අවදානමේ ප්‍රතිවිපාක අවදානම අවම කිරීම සඳහා ප්‍රමුඛතා අනුපිළිවෙල තීරණය කිරීම සඳහා අවදානම් ශ්‍රේණිගත කර, අවදානම් ලේඛනයක් ඉදිකර ඇත.

| කොට්ඨාසය / අංශය / කමිටුව | | | | වෙළෙඳපළ අවදානම් පාලනය - 2 වන පෙළ සුරක්ෂිතතාව | | | | | | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර | ක්‍රියාකාරකම හෝ විශේෂ අවදානම | අවදානම් හිමියා | බලපෑම / අවදානමේ දැඩිබව | | | සිදුවීමේ සම්භාවිතාව / විය හැකි බව | | | අවදානම සමනය කිරීමේ උපායමාර්ගය |
| | | | | අඩු | මධ්‍ය | ඉහළ | අඩු | මධ්‍ය | ඉහළ | |
| 1 | සාමාජික ගිණුම් | වංචා කිරීමේ අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -සාමාජික සේවා | | | × | × | | | තොරතුරු තාක්ෂණ පද්ධති පාලන විධි මගින් රාජකාරි වෙන්කර නියම කිරීම |
| 2 | යාවත්කාලීන කිරීම | සවලතා විශ්ලේෂණ ආධාරක MASS පද්ධති ප්‍රවේශ ලොගයේ මුරපද හා එහි විකල්ප අයථා පරිහරණය - වංචා කිරීමේ අවදානම | සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ | | | × | | | × | i. තොරතුරු තාක්ෂණ දත්ත ගබඩාව නඩත්තු කිරීම<br>ii. වඩාත් සංකීර්ණ මුරපද |
| 3 | මුරපද පාලනය | මෙහෙයුම් අවදානම | සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ | | | × | | | × | i. විස්තීරණ තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් සකස් කිරීම<br>ii. තොරතුරු තාක්ෂණ පද්ධති විගණනය කිරීම |
| 4 | තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තිය | වංචා කිරීමේ අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -සාමාජික සේවා | | | × | × | | | i. සාමාජික ප්‍රධාන ගොනු දත්ත වෙනස් කිරීම් සඳහා සීමිතව අවසර දීම සහ අධිගාමී පහසුකම ලබා දීම |
| 5 | සාමාජික ප්‍රධාන ගොනු දත්තවලට සිදු වන වෙනස්කම් | වංචා කිරීමේ අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -සාමාජික සේවා | | | × | × | | | සවලතා විශ්ලේෂණ ආධාරක MASS පද්ධතියෙහි ඇති සාමාජික ජාතික හැඳුනුම්පත් / ගමන් බලපත්‍ර අංක බැංකු පත්‍රිකා ගෙවුම් පද්ධතියට ඒකාබද්ධ කිරීම |
| 6 | හිමිකම් ඉල්ලුම් ක්‍රියාවලිය - වැඩ පත් සකස් කිරීම | වංචා කිරීමේ අවදානම | සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ | | | × | × | | | වැඩ පත්වලට දත්ත අටහන් පිවිසුම සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ පද්ධති පාලනය |
| 7 | වෙන් නොකළ ලැබීම් | වංචා කිරීමේ අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -සාමාජික සේවා | | | × | | | × | වෙන් නොකළ ලැබීම් සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ පද්ධති පාලනය |

| කොට්ඨාසය / අංශය / කමිටුව | | | | වෙළෙඳපළ අවදානම් පාලනය - 2<br>වන පෙළ සුරක්ෂිතතාව | | | | | | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර | ක්‍රියාකාරකම හෝ විශේෂ අවදානම | අවදානම් හිමියා | බලපෑම / අවදානමේ දැඩිබව | | | සිදුවීමේ සම්භාවිතාව / විය හැකි බව | | | අවදානම සමනය කිරීමේ උපායමාර්ගය |
| | | | | අඩු | මධ්‍ය | ඉහළ | අඩු | මධ්‍ය | ඉහළ | |
| 8 | සාමාජිකයාගේ නම සහ හැඳුනුම්පත් අංකය නොමැති සාමාජික ගිණුම් | වංචා කිරීමේ අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -සාමාජික සේවා | | | × | | | × | i. සංක්‍රමණික ගිණුම් අවහිර කිරීම<br>ii. 2015 වර්ෂයට පෙර ගිණුම් අවහිර කිරීම<br>iii. 2015 වර්ෂයේ සිට ගිණුම් යාවත්කාලීන කර කමිටුව වෙත ප්‍රගතිය ඉදිරිපත් කිරීම |
| 9 | සවලතා විශ්ලේෂණ ආධාරක MASS පද්ධති ප්‍රවේශ ලොගය පවත්වා ගෙන යාම | වංචා කිරීමේ අවදානම | සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ | | | × | × | | | උපස්ථ දත්ත වසර 3 ක් දක්වා දීර්ඝ කිරීම |
| 10 | ඉකුත් ජාතික හැඳුනුම්පත මකා දැමීමේ දී නව ජාතික හැඳුනුම්පත ඇතුළත් කිරීම | i. වංචා කිරීමේ අවදානම<br>ii. ද්විත්ව ගෙවීම් අවදානම<br>iii. දත්ත අහිමි වීම | සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ | | | × | × | | | බලාත් ප්‍රවේශය හඳුනා ගැනීම |
| 11 | නවම් මාවත රථ ගාලෙහි ආදායම | i. ආදායම අහිමි වීම<br>ii. ණය අවදානම / පැහැර හැරීමේ අවදානම<br>iii. වංචා කිරීමේ අවදානම<br>iv. වන්දි ගෙවීමේ අවදානම | සහකාර සාමාන්‍යාධිකාරී - පරිපාලන හා මානව සම්පත් | | | × | × | | | i.ii.iii. නිසි අධීක්ෂණය සහ ණය කළමනාකරණය<br>iv. වලංගු සහ බැඳී පවත්නා ද්විපාර්ශ්වික ගිවිසුම් |
| 12 | නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලය - බලාත්මක කිරීමේ ලිපිගොනු | i. අනුකූලතා අවදානම<br>ii. වංචා කිරීමේ අවදානම<br>iii. නීති අවදානම<br>iv. ආදායම අහිමි වීම | වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - දායක මුදල් රැස් කිරීම් හා සේවා යෝජක සබඳතා | | | × | × | | | i. නිසි අධීක්ෂණය සහ එය ක්‍රමිකව ඉහළ නැංවීමේ ක්‍රියාවලිය |
| 13 | වට්ටෝරු බඩු තොග කළමනාකරණය කිරීම | i. වත්කම් අයථා පරිහරණය<br>ii. වත්කම් අහිමි වීම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල් | | | × | × | | | i. සමීක්ෂණ මණ්ඩලය<br>ii. ප්‍රධාන වට්ටෝරු බඩු තොගය |
| 14 | ගෙවා ඇති නමුත් නොගෙවූ ලෙස සවලතා විශ්ලේෂණ ආධාරක MASS පද්ධතියෙහි පෙන්වන සාමාජික ගිණුම් | වංචා කිරීමේ අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -සාමාජික සේවා සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ | | | × | × | | | i. සියලු අනුපත් ගිණුම් හඳුනා ගෙන අවහිර කිරීම |

| කොට්ඨාසය / අංශය / කමිටුව | | | | වෙළෙඳපළ අවදානම් පාලනය - 2<br>වන පෙළ සුරක්ෂිතතාව | | | | | | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර | ක්‍රියාකාරකම හෝ විශේෂ අවදානම | අවදානම් හිමියා | බලපෑම / අවදානමේ දැඩිබව | | | සිදුවීමේ සම්භාවිතාව / විය හැකි බව | | | අවදානම සමනය කිරීමේ උපායමාර්ගය |
| | | | | අඩු | මැද | ඉහළ | අඩු | මැද | ඉහළ | |
| 15 | ව්‍යාජ සේවා යෝජක ගිණුම් | වංචා කිරීමේ අවදානම | වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - දායක මුදල් රැස් කිරීම් හා සේවා යෝජක සබඳතා / නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -සාමාජික සේවා/ සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ | | | × | × | | | ස්ථිර සේවා යෝජක ගිණුම් |
| 16 | ස්වයං -සාමාජික හිමිකම් - සංක්‍රමණික සේවකයින් (අතින් ලියූ හිමිකම්) | ද්විත්ව ගෙවීම් / වංචනික ගෙවීම් | වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - දායක මුදල් රැස් කිරීම් හා සේවා යෝජක සබඳතා / සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ | | × | | × | | | සවලතා විශ්ලේෂණ ආධාරක MASS පද්ධතිය හරහා හිමිකම් ඉල්ලා සිටීමේ ක්‍රියාවලිය |
| 17 | මෝටර් වාහන රක්ෂණ | වාහන අනතුරු / සොරකම් කිරීම් / අලාභ | සහකාර සාමාන්‍යාධිකාරී - පරිපාලන හා මානව සම්පත් | | | × | × | | | පවතින වෙළඳපළ වටිනාකමට රක්ෂණය කිරීම |
| 18 | ස. අතින් ලියූ ස්වයං ප්‍රතිලාභ හිමිකම් ගෙවීම්<br>සස. 2017 ට පෙර අතින් ගෙවන ලද ස්වයං සාමාජික හිමිකම් | ද්විත්ව ගෙවීම් / වංචනික ගෙවීම් | වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - දායක මුදල් රැස් කිරීම් හා සේවා යෝජක සබඳතා / සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ | | | × | × | | | සවලතා විශ්ලේෂණ ආධාරක MASS පද්ධතිය හරහා හිමිකම් ඉල්ලා සිටීමේ ක්‍රියාවලිය |

| කොට්ඨාසය / අංශය / කමිටුව | | | | | | වෙළෙඳපළ අවදානම් පාලනය - 2 වන පෙළ සුරක්ෂිතතාව | | | | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර | ක්‍රියාකාරකම හෝ විශේෂ අවදානම | අවදානම් හිමියා | බලපෑම / අවදානමේ දැඩිබව | | | සිදුවීමේ සම්භාවිතාව / විය හැකි බව | | | අවදානම සමනය කිරීමේ උපායමාර්ගය |
| | | | | අඩු | මධ්‍ය | ඉහළ | අඩු | මධ්‍ය | ඉහළ | |
| 19 | පරිශ්‍රය කුලියට දීම / බදු දීම සඳහා ගිවිසුම් වලට එළඹීම | මෙහෙයුම් අවදානම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති / සහකාර සාමාන්‍යාධිකාරී - පරිපාලන හා මානව සම්පත් | | | × | × | | | වලංගු සහ බැඳී පවත්නා ගිවිසුම්වලට එළඹීම |
| 20 | ස්ථාවර වත්කම් කළමනාකරණය | වත්කම් අස්ථාන ගතවීම් / අලාභ | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල් | | × | | × | | | නිවැරදි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල. තොරතුරු තාක්ෂණ අංශයේ පවත්නා තොරතුරු තාක්ෂණ වත්කම් ලේඛනය. කාලානුරූපීව  ව්‍යපහරණය කිරීම. |
| 21 | ප්‍රාදේශීය කාර්යාලවල චෙක්පත්/ මුදල් තැන්පතු | සොරකම් කිරීම් / අලාභ / ප්‍රමාද | වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - දායක මුදල් රැස් කිරීම් හා සේවා යෝජක සබඳතා / | | × | | | × | | නිසි අධීක්ෂණය සහ වාර්තා පවත්වා ගෙන යෑම |

## නිමාව

ස්වකීය ආයතනය වර්තමානයේ දී නිරාවරණය වීමට ඉඩකඩක් ඇති විභවයක් සහිත පුළුල් පරාසයක් තුළ පවතින අවදානම් සහ එක් එක් ආකාරයේ නිහඬ ගාමක බලවේග පිළිබඳ අවබෝධයක් ලබා ගත් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, එය මුහුණ දෙන සැබෑ අවදානම් කළමනාකරණය කළ හැකි විවිධ ක්‍රම පිළිබඳව අවධානය යොමු කළේ ය. එක් එක් ආකාර අවදානම් වර්ගවල අවදානම් ලේඛනයක් සම්පාදනය කර භාවිතා කරන ලද අතර එමගින්, අදාළ අවදානම් සහ ඒ ආශ්‍රිත සමනමය ක්‍රියා සහ පාලන විධි පිළිබඳව අවබෝධ කර ගැනීමටත්, ඒවා පිළිගැනුමට හා අධීක්ෂණයට ලක් කිරීමටත් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට හැකිවී තිබේ.

# මූලය තොරතුරු

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
## **ලාභ හෝ අලාභ ගිණුම සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය**
2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2024 දෙසැම්බර් 31 දිනට | 2023 දෙසැම්බර් 31 දිනට | 2024 දෙසැම්බර් 31 දිනට | 2023 දෙසැම්බර් 31 දිනට |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **මුළු ආදායම** | | | | | |
| පොලී ආදායම | 4 | 62,194,449 | 64,834,198 | 61,819,095 | 64,380,505 |
| ශුද්ධ වෙළඳ කටයුතු ආදායම | 5 | 1,275,472 | 2,148,913 | - | - |
| ලාභාංශ ආදායම | 6 | 1,494,462 | 1,209,331 | 1,494,462 | 1,209,331 |
| ලාභ/ අලාභ ගිණුම් මත මූලික වත්කම් සාධාරණ අගයට ගැළපීමෙන් ලද ලාභ/(අලාභ) | 7 | 2,040,218 | 1,528,360 | 2,040,218 | 1,528,360 |
| වෙනත් ආදායම් | 8 | 670,069 | 756,921 | 634,132 | 674,482 |
| | | **67,674,670** | **70,477,723** | **65,987,907** | **67,792,678** |
| | | | | | |
| **මුළු මෙහෙයුම් වියදම්** | | | | | |
| සේවක මණ්ඩල වියදම් | 9 | 1,766,683 | 1,940,835 | 1,400,616 | 1,324,106 |
| පරිපාලන වියදම් | 10 | 397,739 | 388,683 | 325,385 | 312,763 |
| මූල්‍ය වියදම් | 11 | 4,614 | 4,385 | 4,336 | 4,013 |
| සාමාජික වියදම් | 12 | 597,330 | 711,058 | 591,126 | 704,507 |
| ක්ෂයවීම් හා ක්‍රමක්ෂයවීම් | 13 | 78,088 | 61,812 | 46,129 | 40,554 |
| ප්‍රවර්තන වර්ෂයේ සාමාජිකයන් වෙත ගෙවන ලද පොලී | | 448,625 | 499,157 | 448,625 | 499,157 |
| කොටස් හිමිකම් ආයෝජනයන්හි වත්කම් හානිකරණය | 14 | (4,910) | (51,452) | (4,910) | (51,452) |
| වෙනත් වියදම් | 15 | 216,672 | 208,011 | - | - |
| | | **3,504,841** | **3,762,488** | **2,811,307** | **2,833,648** |
| | | | | | |
| **බදු වලට පෙර ලාභය** | | **64,169,829** | **66,715,235** | **63,176,600** | **64,959,030** |
| | | | | | |
| අදායම් බදු වියදම | 16 | (8,969,846) | (9,582,180) | (8,678,062) | (9,016,645) |
| | | | | | |
| **බදු වලට පසු ලාභය** | | **55,199,983** | **57,133,055** | **54,498,538** | **55,942,384** |
| | | | | | |
| **ලාභය ආරෝපනය:** | | | | | |
| සමාගම් කොටස් හිමියන් | | 55,129,839 | 57,013,988 | 54,498,538 | 55,942,384 |
| පාලනයට ප්‍රමාණවත් නොවන අයිතීන් | | 70,144 | 119,067 | - | - |
| **වර්ෂය සඳහා ලාභය** | | **55,199,983** | **57,133,055** | **54,498,538** | **55,942,384** |

# අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2024 දෙසැම්බර් 31 දිනට | 2023 දෙසැම්බර් 31 දිනට | 2024 දෙසැම්බර් 31 දිනට | 2023 දෙසැම්බර් 31 දිනට |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ප්‍රතිවර්ගීකරණය කළ හෝ කළ හැකි අයිතිය** | | | | | |
| වෙනත් විස්තීර්ණ සංචිත (කොටස්) තුළින් සාධාරණ අගයට මාරු කිරීම | | 3,922,880 | 3,070,788 | 3,922,880 | 3,070,788 |
| වෙනත් විස්තිර්ණ සංචිත (ඒකක) තුළින් සාධාරණ අගයට මාරු කිරීම | | 32,557 | 29,982 | 32,557 | 29,982 |
| | | | | | |
| **විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ප්‍රතිවර්ගීකරණය නොකළ අයිතම** | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ආයු ගණක ලාභය/(අලාභය) | | (79,318) | (63,865) | (79,318) | (63,865) |
| **වර්ෂය සඳහාවූ බදු පසු වෙනත් මුළු විස්තීර්ණ අදායම** | | **3,876,120** | **3,036,905** | **3,876,120** | **3,036,905** |
| **වර්ෂය සඳහාවූ බදු පසු මුළු විස්තීර්ණ ආදායම** | | **59,076,103** | **60,169,960** | **58,374,658** | **58,979,290** |
| | | | | | |
| **විභජනය කළ හැකි මුළු විස්තිර්ණ ආදායම** | | | | | |
| සමාගමේ කොටස් හිමිකම් හිමියන් | | 59,005,958 | 60,050,893 | 58,374,658 | 58,979,290 |
| පාලනයට ප්‍රමාණවත් නොවන අයිතින් | | 70,144 | 119,067 | - | - |
| **බදුවලට පසු වර්ෂය සඳහාවූ මුළු ශුද්ධ විස්තීර්ණ ආදායම** | | **59,076,103** | **60,169,960** | **58,374,658** | **58,979,290** |
| | | | | | |
| ඉ/ගෙ රඳවාගත් ලාභය | | 6,773,322 | 5,928,466 | 4,900,692 | 4,812,440 |
| වත්කම් මත ශුද්ධ ලාභය/ (අලාභය) | | 215,280 | 321,350 | 215,280 | 321,350 |
| ලාභාංශ සමකිරීමේ සංචිතයට මාරු කිරීම | | (3,000,000) | (10,314,164) | (3,000,000) | (10,314,164) |
| **විසර්ජනය සඳහා වූ ලාභය** | | 55,199,983 | 57,133,055 | 54,498,538 | 55,942,384 |
| **විසර්ජනය සඳහා වූ මුළු ලාභය** | | **59,188,585** | **53,068,708** | **56,614,510** | **50,762,011** |
| අඩුකළා: යෝජිත විසර්ජනය - ලාභාංශ 7% (2023 - 7%) | | (35,911,278) | (32,102,819) | (35,911,278) | (32,102,819) |
| පොළී ආදායම - 3.0% | | (15,390,525) | (13,758,500) | (15,390,525) | (13,758,500) |
| අඩුකළා: ලාභාංශ - ලංකා ලුණු සමාගම | | (535,815) | (315,000) | - | - |
| අඩුකළා: පාලන නොවන අයිතිය | | (70,144) | (119,067) | - | - |
| **වසර්ජනයෙන් පසු ලාභය** | | **7,280,822** | **6,773,322** | **5,312,707** | **4,900,692** |

# සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
## මූල්‍ය තත්ව ප්‍රකාශය
2024 දෙසැම්බර් මස 31 දිනට

| | සටහන | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2024 දෙසැම්බර් 31 දිනට | 2023 දෙසැම්බර් 31 දිනට | 2024 දෙසැම්බර් 31 දිනට | 2023 දෙසැම්බර් 31 දිනට |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | | 1,258,454 | 1,226,541 | 794,613 | 898,585 |
| ලාභ හා අලාභ ඔස්සේ සාධාරණ අගයට නිශ්චය කරන ලද මූල්‍ය වත්කම් | 17 | 2,646,191 | 4,463,977 | 2,646,191 | 4,463,977 |
| පරිපාලිත සමාගමෙහි ආයෝජන | 18 | - | - | 470,961 | 470,961 |
| වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට නිශ්චය කරන ලද මූල්‍ය වත්කම් | 19 | 14,708,973 | 10,764,966 | 14,708,973 | 10,764,966 |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වත්කම් | 20 | 565,832,614 | 501,639,231 | 563,248,506 | 499,504,778 |
| අනෙකුත් වත්කම් | 21 | 5,012,179 | 4,210,470 | 4,552,263 | 3,503,613 |
| දේපළ, පිරියත සහ උපකරණ | 22 | 882,476 | 988,715 | 246,185 | 310,604 |
| කල්බදු දේපළ | 23 | - | 697 | - | - |
| අස්පෘශ්‍ය වත්කම් | 24 | 1,148 | 6,163 | 1,148 | 6,163 |
| ආයෝජන දේපල | 25 | 4,587,406 | 4,587,406 | 4,587,406 | 4,587,406 |
| **මුළු වත්කම්** | | **594,929,441** | **527,888,166** | **591,256,247** | **524,511,053** |
| | | | | | |
| **බැරකම්** | | | | | |
| පොලී දරණ ණය සහ ණය ගැනුම් | 26 | 403,727 | 7,620 | - | - |
| ප්‍රදාන හා සහනාධාර | 27 | 33,069 | 38,399 | 4,873 | 8,490 |
| නිශ්චිත ප්‍රතිලාභ බැරකම | 28 | 838,890 | 593,245 | 381,024 | 303,379 |
| ප්‍රවර්තන බදු බැරකම | 29 | 4,495,212 | 5,144,686 | 4,294,051 | 4,864,069 |
| අනෙකුත් බැරකම් | 30 | 471,513 | 680,320 | 144,088 | 115,112 |
| විලම්භිත බදු වගකීම් | 31 | 15,696 | 70,865 | - | - |
| ප්‍රතිපාදන | 32 | 447,371 | 415,163 | 447,371 | 415,163 |
| **මුළු බැරකම්** | | **6,705,478** | **6,950,298** | **5,271,407** | **5,706,213** |
| | | | | | |
| **කොටස් හිමිකම්** | | **588,223,964** | **520,937,868** | **585,984,840** | **518,804,839** |
| | | | | | |
| සාමාජික අරමුදල | 33 | 564,326,576 | 504,434,709 | 564,326,576 | 504,434,709 |
| සංචිත | | 23,626,379 | 16,242,759 | 21,658,264 | 14,370,130 |
| පාලන නොවන අයිතිය | | 271,008 | 260,399 | - | - |
| **සාමාජිකයින්ට අයත්වන ශුද්ධ වත්කම්/ පාලනය නොවන අයිතිය** | | **588,223,963** | **520,937,868** | **585,984,840** | **518,804,839** |

පිටු අංක 81 සිට 117 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම්කරණ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල මුඛ්‍ය කොටසක් වේ.
නිවැරදි බවට සහතික කළේ:

..................................
**එම් ඒ වි කුමුදිනි**
මූල්‍ය කළමනාකරු

..................................
**කේ ඒ ඩී පි කරුණාරත්න**
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)

..................................
**ආර් කේ ජයලත්**
සාමාන්‍යාධිකාරී (වැ.බ.)

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කර අත්සන් කරන ලදි.

..................................
**සෝමසිරි ඒකනායක**
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
## කොටස් හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය
2024 දෙසැම්බර් මස 31 දිනට

| සමූහය | මණ්ඩලයේ සාමාජිකයන්ට ආරෝපනය කළ යුතු | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | රඳවාගත් ලාභය | වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය | වෙනත් සංචිත | ලාභාංශ සමකාර සංචිත අරමුදල | පශ්චාත් අත්කර ගැනීමේ සංචිත | පාලනය නොවන පොලිය | එකතුව |
| **2023.01.01 දිනට ශේෂය** | **4,812,440** | **(4,008,922)** | **(14,709)** | **142,000** | **1,116,026** | **176,332** | **2,223,167** |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය අනුව මනිනු ලබන ප්‍රතිමානන මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය / (අලාභය) | - | 3,100,770 | - | - | - | - | 3,100,770 |
| සාමාජික අරමුදල් ශේෂය මත පොලිය 3% | (13,758,500) | - | - | - | - | - | (13,758,500) |
| ලාභාංශ 7% | (32,102,819) | - | - | - | - | - | (32,102,819) |
| ලාභාංශ සමකිරීමේ සංචිතයට මාරු කිරීම | (10,314,164) | - | - | 10,314,164 | - | - | - |
| වර්ෂය සඳහා සමුච්චිත ලාභය | 55,942,384 | - | - | - | - | 119,067 | 56,061,451 |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය යටතේ නම් කරනු ලබන මූල්‍ය වත්කම් වලින් ශුද්ධ ලාභය / (අලාභය) | 321,350 | - | - | - | - | - | 321,350 |
| ආයු ගණක ලාභය / (අලාභය) | - | - | (63,865) | - | - | - | (63,865) |
| පරිපාලිතය විසින් ගෙවන ලද ලාභාංශ | - | - | - | - | - | (35,000) | (35,000) |
| උපයෝගී කොටස් හිමිකම් සංචලනය | - | - | - | - | 756,604 | - | 756,604 |
| **2023.12.31 දිනට ශේෂය** | **4,900,692** | **(908,152)** | **(78,574)** | **10,456,164** | **1,872,630** | **260,399** | **16,503,158** |
| | | | | | | | |
| **2024.01.01 දිනට ශේෂය** | **4,900,692** | **(908,152)** | **(78,574)** | **10,456,164** | **1,872,630** | **260,399** | **16,503,158** |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය අනුව මනිනු ලබන ප්‍රතිමානන මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය / (අලාභය) | - | 3,955,437 | - | - | - | - | 3,955,437 |
| සාමාජික අරමුදල් ශේෂය මත පොලිය 3% | (15,390,525) | - | - | - | - | - | (15,390,525) |
| ලාභාංශ 6% | (35,911,278) | - | - | - | - | - | (35,911,278) |
| ලාභාංශ සමකිරීමේ සංචිතයට මාරු කිරීම | (3,000,000) | | | 3,000,000 | | | |
| වර්ෂය සඳහා සමුච්චිත ලාභය | 54,498,538 | - | - | - | - | 70,144 | 54,568,683 |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය යටතේ නම් කරනු ලබන මූල්‍ය වත්කම් වලින් ශුද්ධ ලාභය / (අලාභය) | 215,280 | - | - | - | - | - | 215,280 |
| ආයු ගණක ලාභය / (අලාභය) | - | - | (79,318) | - | - | - | (79,318) |
| පරිපාලිතය විසින් ගෙවන ලද ලාභාංශ | - | - | - | - | - | (59,535) | (59,535) |
| උපයෝගී කොටස් හිමිකම් සංචලනය | - | - | - | - | 95,485 | - | 95,485 |
| **2024.12.31 දිනට ශේෂය** | **5,312,707** | **3,047,285** | **(157,892)** | **13,456,164** | **1,968,115** | **271,008** | **23,897,388** |

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
## **කොටස් හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය**
2024 දෙසැම්බර් මස 31 දිනට

| මණ්ඩලය | මණ්ඩලයේ සාමාජිකයන්ට ආරෝපනය කළ යුතු | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | රඳවාගත් ලාභය | වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය | වෙනත් සංචිත | ලාභාංශ සමකාර සංචිත අරමුදල | |
| **2023.01.01 දිනට ශේෂය** | **4,812,440** | **(4,008,922)** | **(14,709)** | **142,000** | **930,809** |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය අනුව මහිනු ලබන ප්‍රතිමානන මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය / (අලාභය) | - | 3,100,770 | - | - | 3,100,770 |
| සාමාජික අරමුදල් ශේෂය මත පොලිය 3% | (13,758,500) | - | - | - | (13,758,500) |
| ලාභාංශ 7% | (32,102,819) | - | - | - | (32,102,819) |
| ලාභාංශ සමකිරීමේ සංචිතයට මාරු කිරීම | (10,314,164) | - | - | 10,314,164 | - |
| වර්ෂය සඳහා සමුච්චිත ලාභය - අවදානමේ වටිනාකම | 55,942,384 | - | - | - | 55,942,384 |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය යටතේ නම් කරනු ලබන මූල්‍ය වත්කම් වලින් ශුද්ධ ලාභය/ (අලාභය) | 321,350 | - | - | - | 321,350 |
| ආයු ගණක ලාභය / (අලාභය) | - | - | (63,865) | - | (63,865) |
| **2023.12.31 දිනට ශේෂය** | **4,900,692** | **(908,152)** | **(78,574)** | **10,456,164** | **14,370,130** |
| | | | | | |
| **2024.01.01 දිනට ශේෂය** | **4,900,692** | **(908,152)** | **(78,574)** | **10,456,164** | **14,370,130** |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය අනුව මහිනු ලබන ප්‍රතිමානන මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය / (අලාභය) | - | 3,955,437 | - | - | 3,955,437 |
| සාමාජික අරමුදල් ශේෂය මත පොලිය 3% | (15,390,525) | - | - | - | (15,390,525) |
| ලාභාංශ 67% | (35,911,278) | - | - | - | (35,911,278) |
| ලාභාංශ සමකිරීමේ සංචිතයට මාරු කිරීම | (3,000,000) | | | 3,000,000 | |
| වර්ෂය සඳහා සමුච්චිත ලාභය | 54,498,538 | - | - | - | 54,498,538 |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය යටතේ නම් කරනු ලබන මූල්‍ය වත්කම් වලින් ශුද්ධ ලාභය/ (අලාභය) | 215,280 | - | - | - | 215,280 |
| ආයු ගණක ලාභය / (අලාභය) | - | - | (79,318) | - | (79,318) |
| **2024.12.31 දිනට ශේෂය** | **5,312,707** | **3,047,285** | **(157,892)** | **13,456,164** | **21,658,264** |

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | Group | | ETFB | |
|---|---|---|---|---|
| | 2024 | 2023 | 2024 | 2023 |
| | Rs. '000 | Rs. '000 | Rs. '000 | Rs. '000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | | | |
| FVTPL ලෙස නියම කළ මූල්‍ය උපකාරක අලෙවියෙන් ලත් මුදල | 4,245,483 | 1,977,534 | 4,245,483 | 1,977,534 |
| කල් පිරෙන තෙක් රඳවාගත් මූල්‍ය උපකාරකවල කල් පිරීම් | 103,586,509 | 47,760,983 | 103,586,509 | 47,760,983 |
| ණය සහ ලැබිය යුතු මූල්‍ය උපකාරකවල කල් පිරීම් | 127,924 | 135,921 | 127,924 | 135,921 |
| FVTPL ලෙස නියම කළ මූල්‍ය උපකාරක මිලදී ගැනීම් සඳහා ගෙවීම | (789,646) | (631,015) | (789,646) | (631,015) |
| කල් පිරෙන තෙක් රඳවාගත් මූල්‍ය උපකාරක මිලදී ගැනීම් සඳහා ගෙවීම | (171,873,190) | (99,406,414) | (171,873,190) | (99,406,414) |
| අත්පත්කරගැනීම් සඳහා ලබාදුන් ණය සහ ලැබිය යුතු මූල්‍ය උපකාරක | (329,752) | (31,202) | (329,752) | (31,202) |
| පාරිභෝගිකයින්ගෙන් ලත් මුදල් | 4,006 | 4,668 | - | - |
| සැපයුම්කරුවන්ට ගෙවූ මුදල් | (3,097) | (3,148) | - | - |
| ලැබූ පොළිය | 66,365,461 | 66,446,928 | 66,365,461 | 66,446,928 |
| ලැබූ ලාභාංශ | 1,378,225 | 1,111,591 | 1,378,225 | 1,111,591 |
| ලැබූ වෙනත් ආදායම් | 603,703 | 639,060 | 603,703 | 639,060 |
| ගෙවූ මෙහෙයුම් වියදම් | (1,585,381) | (7,596,563) | (1,585,381) | (7,596,563) |
| ගෙවූ සාමාජික වියදම් | (302,738) | (358,684) | (302,738) | (358,684) |
| ගෙවන ලද ආදායම් බදු | (9,013,639) | (7,647,524) | (9,013,639) | (7,647,524) |
| ගෙවූ පොළිය | (448,625) | (499,157) | (448,625) | (499,157) |
| ගෙවූ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | (46,344) | (28) | (46,340) | (24) |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ගෙවූ බිම් කුලිය | - | (8) | - | - |
| 5 වසර ශිෂ්‍යත්ව ගෙවීම්/ නැවත මුදල් ගෙවීම් | (113,391) | (192,949) | (113,391) | (192,949) |
| උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ගෙවීම්/ නැවත මුදල් ගෙවීම් | (2,155) | (73,776) | (2,155) | (73,776) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(8,196,647)** | **1,636,217** | **(8,197,553)** | **1,634,709** |
| | | | | |
| **ආයෝජන කටයුතු** | | | | |
| දේපළ සහ උපකරණ මිලදී ගැනීම | (11,608) | (44,619) | (11,564) | (44,495) |
| දේපළ සහ උපකරණ අලෙවියෙන් උත්පාදිතයන් | - | 8,088 | - | 8,088 |
| අයෝජන අත්පත්කර ගැනීම් | (419) | (894) | - | - |
| ලැබූ පොළිය | 349 | 429 | - | - |
| කාර්ය මණ්ඩල ණය නැවත ගෙවීම/ ශුද්ධ ප්‍රදාන | (30) | (21) | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(11,708)** | **(37,017)** | **(11,564)** | **(36,407)** |
| | | | | |
| **මූල්‍ය කටයුතු** | | | | |
| ලැබුණු දායකත්වය | 41,542,789 | 37,004,419 | 41,542,789 | 37,004,419 |
| නැවත මුදල් ලබාදීම් | (33,435,146) | (38,286,021) | (33,435,146) | (38,286,021) |
| ගෙවූ මූල්‍ය වියදම් | (2,498) | (2,381) | (2,498) | (2,381) |
| ගෙවූ ලාභාංශ | (1,022) | (742) | - | - |
| පොලී දරන ණය සහ ණය ගැනීම් ආපසු ගෙවීම | - | - | - | - |
| මූල්‍ය කල්බදු වගකීම යටතේ මූලික ගෙවීම | - | - | - | - |
| **මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **8,104,124** | **(1,284,724)** | **8,105,146** | **(1,283,982)** |
| | | | | |
| මුදල් සහ මුදලට සමාන දේවල් ශුද්ධ වැඩි වීම | (104,232) | 314,475 | (103,972) | 314,319 |
| ජනවාරි 01 වනදා වන විට මුදල් හා මුදල් සමාන දෑ | 898,905 | 584,431 | 898,585 | 584,266 |
| **දෙසැම්බර් 31 වන දා වන විට මුදල් හා මුදල් සමාන දෑ** | **794,673** | **898,905** | **794,613** | **898,585** |

**2024/12/31 දිනට භාණ්ඩාගාර බැදුම්කර කළඹේ වෙළෙඳපොල වටිනාකම**

(රු. '000)

| වර්ෂය | ප්‍රකාශිත අගය | මිළදී ගැනිමේ පිරිවැය | වෙළෙඳපොළ අගය | ක්‍රමක්ෂය පිරිවැය |
|---|---|---|---|---|
| 2026 | 23,492,979 | 22,837,014 | 24,506,893 | 23,562,472 |
| 2027 | 37,988,188 | 34,946,019 | 39,219,208 | 35,441,613 |
| 2028 | 95,621,256 | 88,030,085 | 98,816,091 | 88,608,482 |
| 2029 | 36,783,406 | 34,257,062 | 37,036,650 | 38,300,537 |
| 2030 | 40,617,980 | 37,283,401 | 40,405,222 | 37,573,087 |
| 2031 | 48,521,728 | 45,613,900 | 50,513,040 | 47,145,782 |
| 2032 | 66,188,785 | 57,907,689 | 63,956,349 | 46,666,963 |
| 2033 | 60,859,072 | 57,337,854 | 63,044,952 | 74,602,885 |
| 2034 | 33,447,954 | 31,065,196 | 33,262,216 | 31,477,041 |
| 2035 | 32,049,144 | 29,771,347 | 31,671,806 | 29,786,470 |
| 2036 | 30,622,954 | 28,248,749 | 29,860,534 | 27,900,426 |
| 2037 | 30,622,954 | 28,248,749 | 31,365,928 | 29,358,729 |
| 2038 | 30,622,954 | 28,248,749 | 31,015,020 | 29,033,057 |
| 2039 | 7,600,000 | 7,676,208 | 7,319,955 | 7,974,151 |
| **එකතුව** | **575,039,355** | **531,472,023** | **581,993,863** | **547,431,692** |

**2024/12/31 දිනට භාණ්ඩාගාර බැදුම්කර කළඹේ වෙළෙඳපොල වටිනාකම**

(රු. '000)

| වර්ෂය | ප්‍රකාශිත අගය | මිළදී ගැනිමේ පිරිවැය | වෙළෙඳපොළ අගය | ක්‍රමක්ෂය පිරිවැය |
|---|---|---|---|---|
| 2026 | 3,553,926 | 3,269,928 | 3,560,515 | 3,468,337 |
| 2027 | 34,084,172 | 31,454,559 | 33,975,152 | 32,999,476 |
| 2028 | 50,262,069 | 44,680,558 | 47,669,876 | 46,585,619 |
| 2029 | 30,622,954 | 28,248,749 | 29,271,747 | 28,868,631 |
| 2030 | 32,959,975 | 30,330,021 | 30,616,329 | 30,653,402 |
| 2031 | 31,845,954 | 29,342,275 | 31,642,323 | 30,560,130 |
| 2032 | 30,622,954 | 28,248,749 | 29,905,673 | 29,406,936 |
| 2033 | 60,859,072 | 57,337,854 | 58,584,398 | 60,144,487 |
| 2034 | 33,447,954 | 31,065,196 | 32,323,401 | 31,975,863 |
| 2035 | 32,049,144 | 29,771,347 | 30,829,231 | 30,315,848 |
| 2036 | 30,622,954 | 28,248,749 | 29,110,762 | 28,447,053 |
| 2037 | 30,622,954 | 28,248,749 | 30,901,439 | 29,354,847 |
| 2038 | 30,622,954 | 28,248,749 | 30,237,932 | 29,351,299 |
| 2039 | 7,600,000 | 7,676,208 | 6,692,286 | 7,975,805 |
| **එකතුව** | **439,777,037** | **406,171,692** | **425,321,064** | **420,107,732** |

## 2024/12/31 දිනට භාණ්ඩාගාර බිල්පත් කළඹේ වෙළෙඳපොල වටිනාකම

(රු. '000)

| වර්ෂය | ප්‍රකාශිත අගය | මිළදී ගැනිමේ පිරිවැය | වෙළෙඳපොළ අගය | ක්‍රමක්ෂය පිරිවැය |
|---|---|---|---|---|
| 2024 | - | - | - | - |
| 2025 | 3,227,000 | 2,952,462 | 3,122,842 | 3,119,900 |

## 2023/12/31 දිනට භාණ්ඩාගාර බිල්පත් කළඹේ වෙළෙඳපොල වටිනාකම

(රු. '000)

| වර්ෂය | ප්‍රකාශිත අගය | මිළදී ගැනිමේ පිරිවැය | වෙළෙඳපොළ අගය | ක්‍රමක්ෂය පිරිවැය |
|---|---|---|---|---|
| 2024 | 63,292,846 | 55,941,271 | 59,864,320 | 59,813,248 |
| 2025 | - | - | - | - |

රජයේ සුරැකුම්පත්වල සාධාරණ අගය මහ බැංකුව විසින් ප්‍රකාශිත පිළිවෙලින් 2023 සහ 2024 දෙසැම්බර් 31 දිනට මිලදී ගැනිමේ හා විකිණිමේ මිළගණන්වල සාමාන්‍යයන් මත පදනම්වයි.

# සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
# ලැයිස්තුගත ණයකර කළඹේ වෙළෙඳපොළ අගය
2024 දෙසැම්බර් මස 31 දිනට

**2024.12.31 දිනට ලැයිස්තුගත ණයකර කළඹේ වෙළෙඳපොළ අගය**

| සමාගමේ නම | මිලදීගත් දිනය | නිදහස් කරගත් දිනය | ණයකර | | වෙළඳපොළ අගය | | | ක්‍රමක්ෂය පිරිවැය රු.'000 |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ගණන | පිරිවැය රු.'000 | විකුණුම් කරයකට | රු.'000 | අනුපාතය (වාර්ෂිකව) | |
| හැටන් නැෂනල් බැංකුව | 25.09.2020 | 24.09.2025 | 4,750,000 | 475,000 | 100.00 | 475,000 | 9.50% | 487,239 |
| ඩී.එෆ්.සී.සී. බැංකුව පීඑල්සී | 23.10.2020 | 23.10.2025 | 5,000,000 | 500,000 | 100.00 | 500,000 | 9.00% | 508,630 |
| සම්පත් බැංකුව පීඑල්සී 2 | 12.04.2021 | 12.04.2028 | 6,000,000 | 600,000 | 100.00 | 600,000 | 9.00% | 639,058 |
| ලංකා විදුලිබල මණ්ඩලය | 16.04.2021 | 15.04.2026 | 20,000,000 | 2,000,000 | 94.20 | 1,884,000 | 9.35% | 2,133,205 |
| සිංගර් ෆයිනෑන්ස් (ලංකා) පීඑල්සී | 25.06.2021 | 25.06.2026 | 1,750,000 | 175,000 | 96.02 | 168,035 | 9.25% | 183,426 |
| පීපල්ස් ලීසින් ෆයිනෑන්ස් | 05.08.2021 | 05.08.2026 | 10,000,000 | 1,000,000 | 95.50 | 955,000 | 9.00% | 1,036,740 |
| නේෂන්ස්ට්‍රස්ට් බැංකුව පීඑල්සී | 09.07.2021 | 09.07.2026 | 8,000,000 | 800,000 | 100.00 | 800,000 | 9.15% | 835,296 |
| **එකතුව** | | | | **5,550,000** | | **5,382,035** | | **5,823,595** |

ලැයිස්තුග කර ඇති ආයතනික ණයකරවල ප්‍රකාශිත අගය කොළඹ කොටස් හුවමාරුව විසින් ප්‍රකාශිත 2024 දෙසැම්බර් 31 දිනට මිලගණන් මත පදනම්වේ.

**2023.12.31 දිනට ලැයිස්තුගත ණයකර කළඹේ වෙළඳපොළ අගය**

| සමාගමේ නම | මිලදීගත් දිනය | නිදහස් කරගත් දිනය | ණයකර | | වෙළඳපොළ අගය | | | ක්‍රමක්ෂය පිරිවැය රු.'000 |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ගණන | පිරිවැය රු.'000 | විකුණුම් කරයකට | රු.'000 | අනුපාතය (වාර්ෂිකව) | |
| සම්පත් බැංකුව පීඑල්සී | 28.02.2019 | 28.02.2024 | 1,750,000 | 175,000 | 100.00 | 175,000 | 13.90% | 195,460 |
| ඩී.එෆ්.සී.සී. බැංකුව පීඑල්සී | 28.03.2019 | 28.03.2024 | 7,500,000 | 750,000 | 100.00 | 750,000 | 13.50% | 827,394 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 10.09.2019 | 10.09.2024 | 13,500,000 | 1,350,000 | 100.00 | 1,350,000 | 11.25% | 1,397,019 |
| හැටන් නැෂනල් බැංකුව 3 | 23.09.2019 | 22.09.2024 | 3,500,000 | 350,000 | 74.00 | 259,000 | 12.30% | 361,795 |
| ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී | 25.09.2020 | 24.09.2025 | 4,750,000 | 475,000 | 100.00 | 475,000 | 9.50% | 487,116 |
| ඩී.එෆ්.සී.සී. බැංකුව පීඑල්සී | 23.10.2020 | 23.10.2025 | 5,000,000 | 500,000 | 100.00 | 500,000 | 9.00% | 508,630 |
| සම්පත් බැංකුව පීඑල්සී | 12.04.2021 | 12.04.2028 | 6,000,000 | 600,000 | 100.00 | 600,000 | 9.00% | 639,058 |
| ලංකා විදුලිබල මණ්ඩලය | 16.04.2021 | 15.04.2026 | 20,000,000 | 2,000,000 | 98.00 | 1,960,000 | 9.35% | 2,133,205 |
| සිංගර් ෆිනෑන්ස් (ලංකා පීඑල්සී) | 25.06.2021 | 25.06.2026 | 1,750,000 | 175,000 | 100.00 | 175,000 | 9.25% | 183,426 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 09.07.2021 | 09.07.2026 | 8,000,000 | 800,000 | 100.00 | 800,000 | 9.15% | 825,296 |
| පීපල්ස් ලීසින් ෆිනෑන්ස් පීඑල්සී | 05.08.2021 | 05.08.2026 | 10,000,000 | 1,000,000 | 100.00 | 1,000,000 | 9.00% | 1,036,740 |
| **එකතුව** | | | | **8,175,000** | | **8,044,000** | | **8,595,139** |

ලැයිස්තුගත කර ඇති ආයතනික ණයකරවල ප්‍රකාශිත අගය කොළඹ කොටස් හුවමාරුව විසින් ප්‍රකාශිත 2023 දෙසැම්බර් 31 දිනට මිලගණන් මත පදනම්වේ.

**2024 දෙසැම්බර් මස 31 දිනට වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය මත නැවත වර්ගීකරණය කරන ලද ලැයිස්තුගත කොටස් වෙළඳපොළ**

| | ආයෝජන සමාගමේ නම | සත්‍ය පිරිවැය (රු. '000) | සාධාරණ අගය (රු. '000) | වෙළඳපොළ අගය (රු. '000) |
|---|---|---|---|---|
| 1 | ඒහොට් දේපල සමාගම | 58,213 | 44,130 | 48,812 |
| 2 | ඒකන්ස් ස්පෙන්ස් සමාගම | 275,623 | 219,889 | 274,861 |
| 3 | ඒකන්ස් ස්පෙන්ස් හෝටලය | 206,275 | 149,354 | 199,376 |
| 4 | ආසිරි රෝහල | 129,516 | 104,869 | 108,690 |
| 5 | ආසිරි සර්ජකල් රෝහල | 66,124 | 57,002 | 53,025 |
| 6 | බහිරා ෆාම්ස් | 206,974 | 176,665 | 172,628 |
| 7 | කාසන් කම්බර්බැච් පීඑල්සී | 16,147 | 8,991 | 13,540 |
| 8 | සෙන්ට්‍රල් ෆිනෑන්ස් | 33,249 | 29,310 | 52,716 |
| 9 | සිලෝන් ඉන්වෙස්මන්ට් | 8,575 | 3,137 | 5,109 |
| 10 | සිලෝන් ගාඩියන් ඉන්වෙස්මන්ට් | 143,302 | 40,753 | 77,332 |
| 11 | සිලෝන් ග්‍රේන් ඉලිවේටර් | 92,623 | 113,364 | 134,620 |
| 12 | සෙන්ට්‍රල් ඉන්ඩස්ට්‍රීස් | 95,319 | 73,893 | 128,233 |
| 13 | සීඅයිසී හෝල්ඩිංග්ස් | 118,893 | 149,314 | 219,306 |
| 14 | කලම්බු ඩොක්යාඩ් ෆෝට්ලන්ඩ් | 55,327 | 21,701 | 25,901 |
| 15 | කොමර්ෂල් බැංකුව | 1,419,161 | 1,098,149 | 1,696,903 |
| | කොමර්ෂල් බැංකුව (x) | 586,737 | 425,690 | 620,279 |
| 16 | ඩී.එෆ්.සී.සී. බැංකුව | 691,674 | 378,537 | 536,190 |
| 17 | ඩොක්යාඩ් | 437,865 | 87,701 | 114,620 |
| 18 | ඩයලොග් ආසියාටා | 355,601 | 272,111 | 356,768 |
| 19 | ඩිප් ප්‍රොඩක්ට්ස් | 86,955 | 53,650 | 105,001 |
| 20 | ඒඩන් හෝටලය | 75,885 | 16,136 | 26,577 |
| 21 | ෆස්ට් කැපිටල් ට්‍රෂරීස් | 10,841 | 650,717 | 697,382 |
| 22 | හැටන් නැෂනල් බැංකුව (x) | 108,608 | 109,010 | 199,561 |
| 23 | එච්එන්බී ඇෂුවරන්ස් | 175,944 | 194,871 | 276,922 |
| 24 | හේලීස් ෆැබ්‍රික්ස් | 77,572 | 88,508 | 120,353 |
| 25 | හේකාබ් පීඑල්සී | 82,261 | 73,440 | 97,348 |
| 26 | ජෝන් කීල්ස් | 15,800 | 10,913 | 13,939 |
| 27 | ජේකේඑච් | 2,140,032 | 2,480,956 | 2,935,582 |
| 28 | කැළණි කේබල්ස් | 8,417 | 16,335 | 31,427 |
| 29 | කැළණි ටයර්ස් | 246,394 | 178,645 | 238,194 |
| 30 | කීල්ස් ෆුඩ්ස් | 7,847 | 8,193 | 8,596 |
| 31 | ලන්කෙම් සිලෝන් | 16,823 | 5,307 | 6,583 |
| 32 | ලංකා අයිඕසී | 14,746 | 82,704 | 102,415 |
| 33 | ලංකා මිල්ක් ෆුඩ්ස් | 2,754 | 3,723 | 7,544 |
| 34 | ලංකා ටයිල්ස් | 16,745 | 15,430 | 20,907 |

# ස්කන්ධ ආයෝජන ප්‍රකාශය

2024 දෙසැම්බර් මස 31 දිනට

| | ආයෝජන සමාගමේ නම | සත්‍ය පිරිවැය | සාධාරණ අගය | වෙළඳපොළ අගය |
|---|---|---|---|---|
| | | (රු. '000) | (රු. '000) | (රු. '000) |
| 35 | ලංකා වෝල්ටයිල්ස් | 25,053 | 15,798 | 21,542 |
| 36 | ලාෆ් ගෑස් | 780 | 1,587 | 1,455 |
| 37 | ලාෆ් ෆවර්ස් | 815 | 405 | 576 |
| 38 | ජාතික සංවර්ධන බැංකුව | 1,469,852 | 915,277 | 1,592,621 |
| 39 | නවලෝක රෝහල | 68,652 | 30,889 | 33,978 |
| 40 | ඕවසීස් රියලිටි | 156,882 | 149,113 | 242,558 |
| 41 | පීපල්ස් ලීසිං | 190,416 | 144,449 | 229,386 |
| 42 | පීපල්ස් ඉන්ෂුවරන්ස් | 54,925 | 48,933 | 69,242 |
| 43 | පීජීපී ග්ලාස් පීඑල්සී | 16,214 | 25,191 | 31,309 |
| 44 | රේණුකා හොල්ඩිංග්ස් | 116,906 | 39,311 | 57,573 |
| 45 | රිසර්ස් එනර්ජි | 49,445 | 28,552 | 53,298 |
| 46 | රිචඩ් පීරිස් කොම්පැනි | 115,544 | 116,986 | 147,801 |
| 47 | රෝයල් සෙරමික් | 2,138 | 2,138 | 3,514 |
| 48 | සම්පත් බැංකුව | 421,670 | 507,070 | 848,713 |
| 49 | සෙලාන් බැංකුව | 397,733 | 227,877 | 406,417 |
| | සෙලාන් බැංකුව (x) | 88,452 | 66,843 | 106,834 |
| 50 | සිංගර් ෆිනෑන්ස් | 23,608 | 13,214 | 30,169 |
| 51 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 110,326 | 307,103 | 230,163 |
| 52 | ටීජේ ලංකා | 115,357 | 97,195 | 139,501 |
| 53 | ට්‍රාන්ස් ඒෂියා | 37,073 | 22,306 | 25,737 |
| 54 | ටොකියෝ සිමෙන්ට් පීඑල්සී | 230,952 | 179,654 | 274,558 |
| 55 | වැලිබල් ෆවර් | 66,740 | 54,412 | 86,909 |
| 56 | වින්ඩ්ෆෝස් පීඑල්සී | 131,443 | 133,181 | 175,018 |
| | **එකතුව** | **11,975,802** | **10,570,583** | **14,536,111** |

## ලැයිස්තුගත නොවන සමාගම්වල කොටස්

| | | | | |
|---|---|---|---|---|
| 1 | ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට්ස් | 5 | 45 | - |

ප්‍රොපර්ටි ඩිවලොප්ටන්ට්ස් පීඑල්සී 2022 ඔක්තෝම්බර් මස 27 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ලැයිස්තුගත කර ඇත.

**2024.12.31 දිනට විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකම් ලෙස නැවත වර්ගීකරණය කරන ලද ලැයිස්තුගත නොවන කොටස් ආයෝජන**

| | සමාගමේ නම | පිරිවැය (රු. '000) | ශුද්ධ වත්කම් වටිනාකම (රු. '000) 31.12.2023 | ශුද්ධ වත්කම් වටිනාකම (රු. '000) 31.12.2024 |
|---|---|---|---|---|
| 1 | ෆිච් රේටින් ලංකා ලිමිටඩ් | 1,649 | 4,923 | 3,779 |
| | **එකතුව** | **1,649** | **4,923** | **3,779** |

**2024.12.31 දිනට අනුබද්ධිත සමාගම්වල ආයෝජන**

| | සමාගමේ නම | පිරිවැය (රු. '000) |
|---|---|---|
| 1 | ලංකා ලුණු සමාගම | 470,961 |
| | **එකතුව** | **470,961** |

**2024.12.31 දිනට ලාභ හෝ අලාභ තුළින් සාධාරන අගය මත වර්ගීකරණය කරන ලද ලැයිස්තුගත කොටස් ආයෝජනය**

| | සමාගමේ නම | සත්‍ය පිරිවැය (රු. '000) | සාධරණ අගය (රු. '000) | වෙළඳපොළ අගය 2024.12.31 (රු. '000) |
|---|---|---|---|---|
| 1 | ඇක්සස් ඉන්ජිනියරින් | 17,549 | 12,034 | 20,676 |
| 2 | සී.අයි.සී. හෝල්ඩිංග්ස් පීඑල්සී | 2,612 | 2,589 | 3,788 |
| | සී.අයි.සී. හෝල්ඩිංග්ස් (x) | 2,541 | 2,058 | 3,198 |
| 3 | කොමර්ෂල් බැංකුව | 543,282 | 414,131 | 639,932 |
| | කොමර්ෂල් බැංකුව (x) | 55,763 | 45,343 | 66,070 |
| 4 | ඩයලොග් ආසියාටා | 216,249 | 170,095 | 223,013 |
| 5 | ඩිප් ප්‍රොඩක්ට්ස් | 220,950 | 112,005 | 219,210 |
| 6 | හැටන් නැෂනල් බැංකුව | 93,361 | 90,365 | 170,775 |
| 7 | හේකාබ් පීඑල්සී | 36,002 | 36,002 | 39,414 |
| 8 | හේලිස් පීඑල් සී | 4,170 | 4,170 | 5,940 |
| 9 | හේමාස් හෝල්ඩිංග්ස් | 50,905 | 49,758 | 74,235 |
| 10 | ලංකා අයිඕසී | 26,287 | 68,053 | 84,272 |
| 11 | ලංකා ටයිල්ස් පීඑල්සී | 183,850 | 118,179 | 156,723 |
| 12 | ලංකා වෝල්ටයිල්ස් | 314,486 | 179,792 | 245,171 |
| 13 | ලාෆ් ෆවර් | 3,196 | 1,401 | 1,990 |
| 14 | මෙල්ස්ටාකෝප් පීඑල්සී | 9,735 | 10,189 | 15,421 |
| 15 | පීපල්ස් ඉන්ෂුවරන්ස් | 58,622 | 40,124 | 56,777 |
| 16 | රිචර්ඩ් පීරිස් | 55,918 | 66,820 | 84,422 |
| 17 | රිසර්ස් එනර්ජි | 25,447 | 16,218 | 30,273 |
| 18 | රෝයල් සෙරමික් | 326,434 | 197,059 | 318,122 |
| 19 | සම්පත් බැංකුව | 24,501 | 25,479 | 42,645 |

# ස්කන්ධ ආයෝජන ප්‍රකාශය

2024 දෙසැම්බර් මස 31 දිනට

| | සමාගමේ නම | සත්‍ය පිරිවැය (රු. '000) | සාධාරණ අගය (රු. '000) | වෙළඳපොළ අගය 2024.12.31 (රු. '000) |
|---|---|---|---|---|
| 20 | සෙලාන් බැංකුව | 73,854 | 46,364 | 82,690 |
| | සෙලාන් බැංකුව (x) | 1,343 | 1,103 | 1,763 |
| 21 | සීරා කේබල්ස් පීඑල්සී | 34,477 | 27,303 | 30,745 |
| 22 | සිංගර් ෆිනෑන්ස් | 23,911 | 12,670 | 28,927 |
| | **එකතුව** | **2,405,445** | **1,749,304** | **2,646,191** |

**2024.12.31 දිනට ලැයිස්තුගත ඒකක භාර**

| | වර්ගය | සත්‍ය පිරිවැය (රු. '000) | සාධාරණ අගය (රු. '000) | වෙළඳපොළ අගය 2024.12.31 (රු. '000) |
|---|---|---|---|---|
| 1 | CTCLSA ඇසට් | 4,370 | 13,702 | 19,274 |
| 2 | නැෂනල් ස්කන්ධ අරමුදල | 27,996 | 110,268 | 148,685 |
| 3 | නාමල් වර්ධන අරමුදල | 50 | 818 | 1,079 |
| | **එකතුව** | **32,416** | **124,788** | **169,039** |

## 1. සාංගමික තොරතුරු

### 1.1 නිත්‍ය පදිංචි හා නෛතික ආකෘතිය

1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ 1981 මාර්තු 01 දින ස්ථාපිත කරන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය රජය සතු ව්‍යවසායකි. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මුදල්, සැලසුම් හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ලංකා සෝල්ට් ලිමිටඩ් හෙවත් සීමාසහිත ලංකා ලුණු සමාගම ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කරනු ලැබ නිත්‍ය පදිංචිය සහිත පොදු සීමිත සමාගමකි. මෙම සමාගමේ ලියා පදිංචි කරන ලද කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය හම්බන්තොට මහලේවාය යන ස්ථානයෙහි පිහිටා ඇත.

### 1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ

2024 දෙසැම්බර් මස 31 වන දිනට සහ අවසන් වූ වර්ෂය සඳහා වූ මණ්ඩලයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවලට, මණ්ඩලය (පරිවාරිත) සහ එහි පූර්ණ හිමිකාරීත්වය දරන පරිපාලිත ආයතනය (එක්ව කියැවෙන කල්හි, "සමූහය" ලෙස හඳුන්වනු ලබන) ඇතුළත් වේ. 2024 දෙසැම්බර් මස 31 වන දිනට මණ්ඩලයේ පරිපාලිත සමාගම වූයේ, ලංකා සෝල්ට් ලිමිටඩ් යනුවෙන් හඳුන්වනු ලබන ආයතනයයි. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, සමූහයේ අත්‍යන්ත ආයතනය වන්නේ ය.

මණ්ඩලයේ සහ එහි පරිපාලිත ආයතනයේ මූල්‍ය ප්‍රකාශ විෂයයෙහි සෑම වසරකම දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් ඇත. "මණ්ඩලයේ" සහ "සමූහයේ" මූල්‍ය ප්‍රකාශ, සෑම වසරකම දෙසැම්බර් මස 31වන දිනෙන් අවසන් වන මාස 12 ක් වූ කාල පරිච්ඡේදය සඳහා සකස් කර ඇත.

### 1.3 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

වර්ෂය තුළ, මෙම මූල්‍ය ප්‍රකාශ තුළ සිටිමින් මෙහෙයවන ලද සමාගමට හා එහි අනුබද්ධිත සමාගම්වලට අයත් ප්‍රධාන කාර්යයන් පහත දැක්වෙන පරිදි වූයේ ය.

| ආයතනයේ නම | ව්‍යාපාරයේ සවභාවය |
|---|---|
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය | රාජ්‍ය සේවා විශ්‍රාම වැටුපට හිමිකම් නොලබන සියලුම රාජ්‍ය සේවක සේවිකාවන් හා පෞද්ගලික අංශට අයත් සියලුම සේවා නියුක්තයන් මෙම අරමුදලෙහි සාමාජිකයන් වන අතර, එම ආයතනයන්හි ඔවුන්ගේ සේවා යෝජකයින් එකී සේවක සේවිකාවන්ගේ දළ මාසික ඉපයීමෙන් 3% ක් වූ ප්‍රමාණයක් මෙම අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතු වන්නේ ය. මෙම අරමුදලට විගමනික ශ්‍රමිකයන් සහ ස්වයං රැකියා ක්ෂේත්‍රවල නියුතු සේවක සේවිකාවන් ද අන්තර්ගත වේ. මෙම අංශය තවදුරටත් ඉදිරියේදී වඩාත් ප්‍රසාරණය වීමට නියමිතය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, මෙම අරමුදල කළමනාකරණය කිරීමට අමතර වශයෙන් ස්වකීය සේවා නියුක්තයන්ගේ සේවා කාලය තුළ ඔවුන් වෙත සමාජීය හා සුභසාධන ප්‍රතිලාභ ගණනාවක් සලසා දීමේ කාර්යයෙහි ද නිරතව සිටී. |
| ලංකා ලුණු සමාගම | මෙම සමාගමෙහි ප්‍රධාන කර්තව්‍යය වනුයේ ලුණු නිෂ්පාදනය කර බෙදා හැරීමයි. |

### 1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම්

1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත සහ සංශෝධිත පනතේ විධිවිධාන හා ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති (LKAS/SLFRS) අනුව සමූහයේ සහ මණ්ඩලයේ මූල්‍ය ප්‍රමිති සකස් කිරිම හා ඉදිරිපත් කිරිම සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලය සතු වගකීමකි.

### 1.5 නිකුතුව සඳහා බලය පවරන ලද දිනය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ 2025 මාර්තු මස 17 වන දිනැති අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව ප්‍රකාරව නිකුත් කරනු ලැබීම සඳහා බලය පවරන ලදී.

## 2. වැදගත් ගිණුම් ප්‍රතිපත්තිවල සම්පිණ්ඩනය

### 2.1 පොදු ප්‍රතිපත්ති

### 2.1.1 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශ ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඉදිරිපත් කරනු ලැබ ඇති ව්‍යාපාර ආයතනය සතු වත්කම් හා බැරකම් ඒවායේ ස්වභාවය අනුව කාණ්ඩ ගතකර ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාව නිරූපිත වන අයුරින් ලැයිස්තු ගත කර ඇත. මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම් ඇති කරන උද්ධමනීය සාධකයන් සඳහා ගැළපුම් කිසිවක් සිදුකර නොමැත. රපෝර්තු දිනයේ සිට මාස 12 ක් ඇතුළත සහ මාස 12 කට වැඩි කාලයකින් පසුව ආපසු අයකර ගනු ලැබීම් හෝ බේරුම් කරනු ලැබීම් පිළිබඳ විශ්ලේෂණයක් මෙහිදී ඉදිරිපත් කරනු ලැබ තිබේ.

### 2.1.2 අනුකූලතාව දැක්වීමේ ප්‍රකාශය

2024 දෙසැම්බර් මස 31 වන දින වන විට හා එදිනට අවසන් වර්ෂය සඳහා වන සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සටහන් ("මූල්‍ය ප්‍රකාශ") සමඟ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශය, කොටස් හිමිකම් හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලතාව දක්වන අයුරිනි.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති හා අනුකූල වන පරිදි පිළියෙළ කරනු ලැබ තිබේ. මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතෙහි දක්වා ඇති නියමයන් හා අනුකූල වේ.

### 2.1.3 වැදගත් ගිණුම් තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන

මණ්ඩලය ස්වකීය අනාගතය සම්බන්ධයෙන් ඇතැම් ඇස්තමේන්තු වලට හා උපකල්පන වලට එළැඹේ. එකී ඇස්තමේන්තු හා විනිශ්චයන් ඓතිහාසික පරිචය හා අනාගත අපේක්ෂා ද ඇතුලත් වෙනත් සාධකයන් මත අඛණ්ඩව ඇගයුමට ලක් කෙරේ.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශ කුඩා හා මධ්‍ය පරිමානයේ ව්‍යාපාර ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රතිපත්ති හා අනුකූලතාව දැක්වෙන පරිදි සැකසීම සඳහා ඇතැම් සුවිශේෂි ගිණුම් ඇස්තමේන්තු භාවිතය අවශ්‍ය වේ. ඉහළ මට්ටමේ නිශ්චයමතියක් හෝ සංකීර්ණතාවයක් සම්බන්ධ වන්නා වූ ක්ෂේත්‍ර හෝ මූල්‍ය ප්‍රකාශ කෙරෙහි උපකල්පනයන් හා ඇස්තමේන්තු වැදගත් වන්නා වූ ක්ෂේත්‍ර පහත සඳහන් පරිදි හෙළිදරව් කර ඇත.

**තීන්දු**

**විලම්බිත බදු වත්කම්:**
සියලු ආභාවිත බදු අලාභ වෙනුවෙන් විලම්බිත බදු වත්කම් හඳුනා ගැනෙනුයේ, අලාභ උපයෝජනය කොටගත හැකි බදු අයකර ගත හැකි අලාභ එල්ලේ ඒවා පවතිනු ලැබෙතැයි අනුමාන කෙරෙන තාක් දුරකට ය. හඳුනා ගනු ලැබිය හැකි විලම්බිත බදු වත්කම්වල ප්‍රමාණය නිශ්චය කිරීම පිණිස ඉදිරි බදු සැලසුම්කරණයෙහි මූලොපායන් ද සහිත අනාගත බදු අයකර ගත හැකි ලාභ ප්‍රමාණ උද්ගත විය හැකි කාල නිර්ණය හා ඒවායේ මට්ටම මත පදනම් වූ වැදගත් කළමනාකරණ නිශ්චයමතියක් අවශ්‍ය වේ.

### 2.1.4. මානනය කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශ, සාධාරණ අගය අනුව මනිනු ලබන ඇතැම් වත්කම් සහ බැරකම් සඳහාත්, ශ්‍රී ලංකා ගිණුම් වාර්තාකර ප්‍රමිති අංක 09 වන, මූල්‍ය මෙවලම්වල අවශ්‍යතා අනුව ක්‍රමක්ෂිත පිරිවැය යටතේ ඉදිරියට ගෙන යන මූල්‍ය වත්කම් සඳහාත් හැරුනු විට, ලංකා ගිණුම් ප්‍රමිති අංක 26 ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශ

සකස් කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේ දී, ලංකා ගිණුම් ප්‍රමිති අංක 26 වන ගිණුම්කරණය සහ විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් මගින් වාර්තාකරණය කිරීම යොදා ගනු ලැබ ඇත.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී එම මණ්ඩලය විසින් ලංකා ගිණුම් ප්‍රමිති අංක 26 ප්‍රකාරව ගිණුම්කරණය සහ විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් මගින් වාර්තාකරණය කිරීම යොදා ගන්නා ලද්දේය යන කාරණය, පෙර මූල්‍ය ප්‍රකාශවල නිශ්චිතව අනාවරණය කර නොතිබුණි. මෙම කාරණය පෙළිදරව් නොකිරීම කරණ කොට ගෙන පෙර මූල්‍ය ප්‍රකාශවල වාර්තා කරන ලද මුදල් ප්‍රමාණ ප්‍රති ප්‍රකාශ කිරීමක් අවැසි නොවන්නේ ය.

සීමාසහිත ලංකා ලුණු සමාගමෙහි මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත. සමාගමේ ක්‍රියාත්මක මුදල් ඒකකය, ශ්‍රී ලංකා රුපියල වන අතර මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා රුපියල මගිනි.

### 2.1.5 ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

සමාගමේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල අනුසාරයෙන් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන ලැබ ඇත. සියලු මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා රුපියල් අනුසාරයෙන් ඉදිරිපත් කර තිබේ.

### 2.1.6 වැටයීම

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණයන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම (LKAS 1) පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 1 විසින් අවසරදී ඇති පරිදි සඳහන් කර ඇති අවස්ථා හැර ආසන්න රුපියල් දහසට වටයා ඇත.

### 2.1.7 හිලව් කිරීම

ගිනුම්කරණ ප්‍රමිතියක් හෝ අර්ථ නිරූපනයක් (IFR අර්ථ නිරූපන කමිටුව සහ ප්‍රමිති අර්ථ නිරූපන කමිටුව විසින් නිකුත් කළ) විසින් අවශ්‍යනම් හෝ අවසරදී ඇතිනම් මිස, ආදායම් සහ වියදම් ආදායම් ප්‍රකාශය තුළ හිලව් නොකෙරේ. හඳුනාගත් ප්‍රමාණ හිලව් කිරීමට නෛතිව බලාත්මක අයිතියක් ඇත්නම් පමණක් සහ ශුද්ධ පදනමක් මත නිරවුල් කිරීමට හෝ එකවර වත්කම් මුදාහැර වගකීම් නිරවුල් කිරීමේ අභිප්‍රායක් ඇත්නම් පමණක් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ ප්‍රමාණය SOFP හි වාර්තා කරයි.

### 2.1.8 ප්‍රමාණාත්මක බව සහ සමූහනය

සමාන අයිතමවල එක් එක් වැදගත් පන්තිය මූලය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කෙරේ. අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරීත්වය පිළිබඳ අයිතම LKAS 1 විසින් සහ 2016 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වූ අනාවරණ මුල්පිරීම පිළිබඳ LKAS 1 ට විසින් අවසරදී ඇති පරිදි ඒවා වැදගත් නොවන්නේනම් මිස වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

### 2.1.9 ක්‍රියාත්මක ව්‍යාපාර තත්වය

නුදුරු ආනගත කාලය තුළ ක්‍රියාත්මක ව්‍යාපාරයක් වශයෙන් සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමට ඊට ඇති හැකියාව සම්බන්ධයෙන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය තක්සේරුවක් කර ඇති අතර ස්වකීය මෙහෙයුම් කටයුතු නොකඩවා සිදුකර ගෙන යාමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව පවතින බවට මණ්ඩලය සෑහීමට පත්ව සිටී. තවද, ක්‍රියාත්මක තත්වයේ ව්‍යාපාරයක් ලෙස සමාගම පවත්වාගෙන යා හැකි මණ්ඩලයේ හැකියාව සම්බන්ධයෙන් වැදගත් සැක සංකා මතු කෙරන යම් සැලකිය යුතු අවිනිශ්චිතතා පවතීදැයි කළමනාරණය දැනුවත් නොමැත. එහෙයින්, සමාගම ක්‍රියාත්මක තත්වයේ ව්‍යාපාරයක්ය යන පදනම මත පිහිටා එහි මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම නොකඩවා සිදු කෙරේ.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තම සමාගම ක්‍රියාත්මක ව්‍යාපාර තත්වයෙන් පවත්වාගෙන යාමේ ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර සමාගම සතු ව්‍යාපාරය ඈවර කිරීමට හෝ එහි වෙළඳ කටයුතු නවතා දැමීමට හෝ ඔවුහු අපේක්ෂා නොකරති.

### 2.1.10. සංසන්දනාත්මක තොරතුරු

සමාගම විසින් ගිණුම් ප්‍රතිපත්ති සුසංගත අයුරින් යොදා ගනු ලැබ ඇති අතර ඉකුත් වසරට අදාළ ගිණුම් ප්‍රතිපත්ති සමඟ ද සාරානුකූල වේ. පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇති අතර වඩා හොඳ ඉදිරිපත් කිරීමකට අදාළ වන අතර වත්මන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සැසැඳිය හැකියග

### 2.2 ඒකාබද්ධ කිරීමේ පදනම

**(අ) ඒකාබද්ධ කිරීම**

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ තුළ, 2024 දෙසැම්බර් මස 31 වන දිනට අයත් සමාගමේ සහ එහි පාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශ අන්තර්ගත වේ. පාලිත සමාගම, එය සමාගමට අත්කර ගත් දිනයේ සිට එනම්, සමූහය එහි පාලනය ලබාගත් දිනයේ සිට ඒකාබද්ධ කරනු ලැබ ඇති අතර එකී පාලනය නතර කෙරෙන දිනය දක්වා එසේ ඒකාබද්ධව පැවතීම අඛණ්ඩව සිදුවනු ඇත. පාලිත සමාගමට අයත් මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරනු ලබනුයේ ද එහි මව් සමාගමට අදාළ සමාන රපෝර්තු කාල පරිච්ඡේදයට අනුව ය.

එසේ වුවද, මෙම ආයතන දෙකෙහි ගිණුම් ප්‍රතිපත්ති වෙනස් වන අතර ඒවා සමූහයට අයත් ගිණුම් ප්‍රතිපත්ති තුළ ඉස්මතු කර දක්වා ඇත.

**(ආ) පරිපාලිත සමාගම්**

පරිපාලිත සමාගම් යනු, ඡන්දය දීමේ අයිතිවාසිකම් වලට අයත් එක් අර්ධයකට වැඩි ප්‍රමාණයේ කොටස් හිමිකාරීත්වයක් පොදුවේ දරනු ලබන්නාවූ ද, අදාළ මූල්‍ය හා මෙහෙයුම් ප්‍රකාශ සෘජුව හෝ වක්‍රව පාලනය කළ හැකි වන පරිදි සමාගම සතුව බලය පවතින්නා වූ ද සියලුම ව්‍යාපාරික ආයතන වන්නේ ය. දැනට භාවිතා කළ හැකි හෝ පරිවර්තනය සේ සැලකෙන ඡන්දය දීමේ අයිතිවාසිකම් පැවතීම හෝ ඒවායින් සිදුවිය හැකි බලපෑම, සමූහය විසින් වෙනත් ව්‍යාපාර ආයතනයක් පාලනය කරනු ලබන්නේ ද යනුවෙන් තක්සේරුවකට එළැඹීමේදී සලකා බැලෙනු ඇත. පාලනය සමූහය වෙත පවරා දෙනු ලබන දිනයේ සිට පරිපාලිත සමාගම් පූර්ණ වශයෙන් ඒකාබද්ධ කෙරේ. එකී පාලනය නතර කෙරෙන දිනයේ සිට ඒවායේ ඒකාබද්ධ කිරීම අත් හැරේ.

ඒකාබද්ධ කිරීමේදී සමාගමට සහ එහි පාලිත සමාගම්වලට අයත් වර්ෂය වෙනුවෙන් ඇතුළත් කරන ලද මුළු ලාභ හෝ අලාභ ප්‍රමාණ සහ ඒකාබද්ධ කිරීමේදී අන්තර්ගත කළ සමාගමට සහ එහි පාලිත සමාගම්වලට අයත් මුළු වත්කම් හා බැරකම් ප්‍රමාණ, ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සහ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි පිළිවෙළින් දක්වා ඇත.

**(ඇ) රපෝර්තු දිනය**

පාලිත සමාගම් හී මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරනු ලබන්නේ පොදු වාර්තා කිරීමේ කාල පරිච්ඡේදය වන දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන්නා වූ දොළොස් මසක කාල සීමාවක් සඳහාය.

### 2.3 ලාභ සහ අලාභ මානනය කිරීමේ පදනම

#### 2.3.1 ආදායම

ආදායම හඳුනා ගැනෙනුයේ එමඟින් ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරික ආයතනය වෙත ගලා එතැයි අනුමාන කෙරෙන හා එම ආදායම විශ්වාසදායක ලෙස මානනය කළ හැකිතාක් දුරකටය. ආදායම හඳුනා ගැනීමට පෙර පහත දැක්වෙන විශේෂිත හඳුනා ගැනීමේ නිර්නායක ද සපුරා ලිය යුතු වන්නේ ය.

භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනා ගැනෙනුයේ, භාණ්ඩ විකිණීම සඳහා පිටත් කර යවනු ලැබ එහි අයිතිය පවරා දෙනු ලැබ ඇති කල්හී ය. වට්ටම් සහ අලෙවි කටයුතු ආශ්‍රිතව රජය වෙනුවෙන් රැස් කරනු ලබන බදු මුදල් රහිත වූ ලද හෝ ලැබීමට නියමිත මුදල් ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය මත ආදයම මානනය කෙරේ. ආදායම හඳුනා ගැනිමට පෙර පහත දැක්වෙන විශේෂිත හඳුනා ගැනීමේ නිර්නායක ද සපුරාලිය යුතු වන්නේ ය.

**අ) භාණ්ඩ විකිණීම**

සාමාන්‍යයෙන් විකිණීම සඳහා භාණ්ඩ පිටත් කරනු ලැබීම මත භාණ්ඩවලට ආවේනික සුවිශේෂි අවදානම් සහ භාණ්ඩවල හිමිකාරීත්වය සතු ප්‍රතිලාභ ඒවා මිලදී ගනු ලබන්නා වෙත පවරා දෙනු ලැබ ඇති කල්හි භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනා ගැනේ.

**ආ) සේවා ඉටු කිරීම**
එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා ඇස්තමේන්තුගත කරන ලද මුළු මිනිස් ශ්‍රම පැය ගණනේ ප්‍රතිශතයක් ලෙස වත්මන් දිනය දක්වා වැය කළ මුළු මිනිස් ශ්‍රම පැය ගණන සැලකිල්ලට ගනිමින් නිශ්චය කරන ලබන අදාළ කාර්යයන් නිමකළ අදියරට සැදිහුම් දක්වමින් සේවා ඉටු කිරීම මඟින් ලබා ගන්නා ආදායම හඳුනා ගැනේ. අදාළ කොන්ත්‍රාත් කාර්යයෙහි ප්‍රතිඵලය විශ්වාසදායක ලෙස මිණිය නොහැකි විට ආපසු අයකර ගත හැකි දරන ලද වියදමේ ප්‍රමාණය දක්වා වූ දුරකට පමණක් ආදයම හඳුනා ගැනේ.

**ඇ) පොලිය**
වත්කම් මත සඵල පොලී අනුපාතය ගණනය කිරීමේ කාල අනුපාතික පදනමක් මත ආදායම හඳුනා ගැනේ.

**ඈ) වෙනත්**
වෙනත් ආදායම් උපචිත පදනමක් මත හඳුනා ගනී

**2.3.2 පොලී සහ සමාන ආදායම් සහ වියදම්**
විකිනීමට ඇති ලෙස වර්ග කර ඇති පොළි දරණ මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමින්නම් කරන සියලුම මූල්‍ය උපකරණයන් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ. පොලිය දරන මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ ගිණුම් හරහා විකිණිම සඳහා පවත්නා මූල්‍ය වත්කම් ලෙස සාධාරණ අගය අනුව වර්ගීකරණය කරනු ලබන අතර පොලී ආදායම හෝ වියදම සඵල පොලී අනුපාත භාවිතයට ගනිමින් වාර්තා කරනු ලැබේ. සඵල පොලී අනුපාතය යනු අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් වල ඇස්තමේන්තු කළ ආදළ පරිදි වන්නාවූ අපේක්ෂිත ආයු කාලයක් හෝ ඊට අඩු කාලයක් තුළ මූල්‍ය වත්කමෙහි හෝ මුදල් බැරකමෙහි හෝ ශුද්ධ ධාරණ වටිනාකම වේ. එම ගණනය මගින් මූල්‍ය මෙවලමෙහි දැක්වෙන සියලුම ගිවිසුම්ගත කොන්දේසි (නිදසුනක් වශයෙන් පෙර ගෙවුම් විකල්ප) සලකා බලනු ලබන අතර අදාළ මූල්‍ය මෙවලමට සෘජුවම ආරෝපනය කළ හැකි සඵල පොලී අනුපාතයේ ද මුඛ්‍යාංගයක් වන එහෙත් අනාගත ණය අලාභ නොවන යම් ගාස්තු හෝ වර්ධක පිරිවැය එකී ගණනයෙහිලා අන්තර්ගත වේ. පොලී ආදායම තුළ කූපන් ආදායම සහ වට්ටම් ක්‍රමක්ෂය කිරීම හෝ මෙවලම් අධි මිල කිරීම මත ලැබූ යම් ලාභ හෝ අලාභ සමන්විත වේ.

දුබලතා අලාභයක් හේතුවෙන් මූල්‍ය වත්කමක හෝ වත්කම් සමූහයක වාර්තා කරන ලද වටිනාකම අඩු කරනු ලැබ ඇති කල්හි දුබලතා අලාභ ගණනය කිරීමේ කාර්යය සඳහා ඉදිරි මුදල් ප්‍රවාහ වට්ටම් කිරීම පිණිස යොදා ගැණුනු මුල් පොලී අනුපාතය භාවිතයට ගනිමින් පොලී ආදායම හඳුනා ගැනීම නොකඩවා සිදු කෙරේ.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 22 වන වගන්තියට අනුව පොලී වියදම හඳුනා ගැනේ. ඉන් කියැවෙනුයේ, "අරමුදලේ ආයෝජනයෙන් ලැබෙන ආදායමෙන්, අමාත්‍ය වරයා සහ මුදල් විෂය භාර අමාත්‍ය වරයාගේ එකගත්වය ඇතිව මණ්ඩලය විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි, වර්ෂයක සියයට තුනකට නොඅඩු යම් අනුපාතයක පොලියක්, එකී වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනට අරමුදලේ එක් එක් සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමේ බැරට තිබෙන මුදලට එක් එක් වර්ෂය සඳහා ගෙවනු ලැබිය යුතුය" යනුවෙනි.

**2.3.3 ලාභාංශ ආදායම් හා වියදම්**
ලාභාංශ ආදායමට අදාළ ගෙවීම් ලබා ගැනිමේ ව්‍යාපාරික ආයතනය සතු අයිතිය තහවුරු වූ කල්හි ලාභාංශ ආදායම හඳුනා ගැනේ. ලාභාංශ වියදම් හඳුනා ගැනෙනුයේ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 14 වන වගන්තිය අනුවය. ඉන් කියැවෙනුයේ, අරමුදලේ මුදල් ආයෝජනයන්ගෙන් ලබා ගත් ලාභවලින් ලාභාංශ ප්‍රකාශ කරනු ලැබිය යුතුය යනුවෙනි.

**2.3.4 වෙනත් ආදායම්**
සේවකයන්ගේ සේවා කාලය මුළුල්ලේ ක්‍රමක්ෂය කරනු ලබන සේවක මණ්ඩල ණය මුදල්හි සාධාරණ අගය මානනය කිරීම මත ලැබෙන පොලී ආදායම හැරුණු විට, වෙනත් අදාළ ගෙවීම් ලබා ගැනිමේ ව්‍යාපාරික ආයතනය සතු අයිතිය තහවුරු වූ කල්හි වෙනත් ආදායම් හඳුනා ගැනේ.

## 2.4 බදුකරණය

### 2.4.1 ප්‍රවර්තන බදු

රපොර්තු දිනට පනවන ලද හෝ ප්‍රමාණවත් ලෙස පනවන ලද බදු අනුපාතික සහ ඉකුත් වසරට අදාළව ගෙවිය යුතු බදු සඳහා වන යම් ගැළපුම් යොදා ගනිමින් වර්ෂය සඳහා බදුවන අදායම හෝ අලාභය මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු වන්නා වූ අපේක්ෂිත බදු ප්‍රවර්තන බදු වන්නේ ය.

ක්‍රමක්ෂය ලාභය සහ ආදායම් බදු වියදම පිළිබඳව යුක්ති සහගත මතයක් ලබා ගැනිමේ අරමුණින් යුතුව එය ක්‍රමක්ෂ්‍ය ලාභ ගිණුමට ආපසු එකතු කරනු ලැබීමේ අටියෙන් වර්ෂය සඳහා වූ භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් මත ඉපැයූ ආදායමට අදාළ රඳවා ගැනිමේ බද්දෙහි ප්‍රමාණය හඳුනා ගනු පිණිස මණ්ඩලය ස්වකීය ගිණුම් ප්‍රතිපත්තිය වෙනස් කළේය.

දැනට ගෙවිය යුතු සහ කල් දැමූ බදුවල එකතුව ආදායම් බදු වියදම් නියෝජනය කරනු ලබයි.

ගෙවිය යුතු ප්‍රවර්තන බද්ද පදනම්වී ඇත්තේ වර්ෂය සඳහා බදුවන ලාභය මතය. ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදනය පදනම්වී ඇත්තේ මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පරිදි සහ දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව ආගණනය කර ඇති පරිදි වන්නා වූ අදායම් හා වියදම් මූලාංග මත පිහිටා ය.

### 2.4.2 විලම්බිත බදුකරණය

විලම්බිත බදු ප්‍රතිපාදනය කරනු ලබනුයේ, වත්කම්වල හා බැරකම්වල බදු පදනම් සහ මූල්‍ය වාර්තාකරණ කාල පරිච්ඡේදය සඳහා වූ ඒවායේ ධාරණ අගයන් අතර ශේෂ පත්‍රයේ දිනට පවත්නා සියලුම තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රමය භාවිතයට යොදා ගනිමිනි.

අනාගතයේදී බදු ගෙවිය යුතු වන ලාභයෙහි ඉහළ යාමක් අපේක්ෂිත සියලුම තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු බැර හඳුනා ගැනේ. අනාගතයේදී බදු ගෙවිය යුතු වන ලාභයෙහි පහළ යාමක් අපේක්ෂිත සියලුම තාවකාලික වෙනස්කම් වෙනුවෙන් ද, යම් අප්‍රයෝජිත බදු අලාභ හෝ අප්‍රයෝජිත බදු බැර සඳහා ද විලම්බිත බදු බැර හඳුනා ගැනේ. ආපසු අයකර නොගැනිමේ වැඩි හැකියාවක් ඇති ඉහළම මුදල් ප්‍රමාණයට, ප්‍රවර්තන හෝ ඇස්තමේන්තුගත අනාගත බදුවන ලාභය පදනම් කරගෙන, විලම්බිත බදු මානනය කෙරේ.

සෑම රපෝර්තු දිනයකදී ම විලම්බිත බදු වත්කම්වල ශුද්ධ ධාරණ අගය සමාලෝචනයට හසු කෙරන අතර අනාගතයේදී බදු මත ලාභවල ප්‍රවර්තන තක්සේරුව නිරූපණය වනු පිණිස ගළපනු ලැබේ. යම් ගැළපුමක් වෙතොත්, ඒවා ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනා ගැනේ.

විලම්බිත බදු ගණනය කෙරෙනුයේ, විලම්බිත බදු වත්කම උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන කාල පරිච්ඡේදයට අයත් බදු මත ලභය (බදු ආලභය) කෙරෙහි අදාළ වීමට අපේක්ෂිත බදු අනු ප්‍රමාණ හෝ බේරුම් කළ යුතු වන්නා වූ විලම්බිත බදු බැරකම් අනුව, රපෝර්තු කාල පරිච්ඡේදය අවසානය වන විට පනවා ඇති හෝ ප්‍රමාණවත් ලෙස පනවනු ලැබ ඇති බදු අනු ප්‍රමාණවල පදනම මත පිහිටා ය.

## 2.5 විදේශ ව්‍යාවහාර මුදල් පරිවර්තනය

සමාගමේ කෘත්‍යාත්මක හා ඉදිරිපත් කරනු ලැබීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල අනුසාරයෙන් මූල්‍ය ප්‍රකාශ පිළිගන්වනු ලැබේ. විදේශ ව්‍යාවහාර මුදල් වලින් සිදු කෙරෙන ගනුදෙනු, අදාළ ගනුදෙනුව සිදුවන දිනයේ පාලනය වන කෘත්‍යාත්මක මුදල් ඒකකය මත මූලික වශයෙන් වාර්තා කරනු ලැබේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකක වලින් නාමනය කරනු ලබන මූල්‍ය වත්කම් හා බැරකම්, ශේෂ පත්‍රයේ දිනට පාලනය වන කෘත්‍යාත්මක මුදල් ඒකක විනිමය අනුපාතය අනුව නැවත පරිවර්තනය කෙරේ. සිදුවන සියලු වෙනස්කම් ලාභය හෝ අලාභය වෙත උකහා ගැනේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකයක අනුසාරයෙන් ඓතිහාසික පිරිවැය ප්‍රකාරව මානනය කරනු ලබන මුදල්මය නොවන අයිතම, අදාළ මූලික ගණුදෙනු සිදුවූ දිනට පැවති විනිමය අනුපාත යොදා ගනිමින් පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකයක් අනුසාරයෙන් සාධාරණ අගය මත මානනය කරනු ලබන මුදල්මය නොවන අයිතම අදාළ සාධරණ අගය නිශ්චය කළ දිනට පැවති විනිමය අනුපාත යොදා ගනිමින් පරිවර්තනය කෙරේ.

## 2.6 ආයෝජන හා වෙනත් මූල්‍ය වත්කම්

### 2.6.1 වර්ගීකරණය

2018 ජනවාරි 1 දින සිට, මණ්ඩලය එහි මුල්‍ය වත්කම් පහත සඳහන් මැනීම් වර්ගීකරණ තුළ වර්ගීකරණය කරයි

- සාධාරණ අගයට (අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් හො ලාභය හෝ අලාභය තුළින්) පසුකාලීනව මනිනු ලබන මුල්‍ය වත්කම්
- ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන මුල්‍ය වත්කම්
- මෙම වර්ගකීකරණය රඳා පවතින්නේ ආයතනයේ මුල්‍ය වත්කම් කළමනාකරණය කිරීමේ ව්‍යාපාර ආකෘතිය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ ගිවිසුම්ගත නියමයන් මතවේ.

සාධාරණ අගයට මනිනු ලබන මුල්‍ය වතක්ම් සඳහා, ලාභ හෝ අලාභ ලාභය හෝ අලාභය තුළ හෝ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ වාර්තා කරනු ලැබේ. වෙළඳාම සඳහා තබා නොමැති ස්කන්ධ උපකරණවල අයෝජන සඳහා, අරමුදල අනෙකුත් විස්තරාත්මක අදායම තුළින් සාධාරණ අගයට (FVOCI) ස්කන්ධ ආයෝජනය සඳහා ගණනය කිරීම සඳහා මුලින් හඳුනා ගන්නා අවස්ථාවේදී වෙනස් නොකලහැකි තේරීමක් සිදු කර ඇත යන පදනම මත රඳා පවතී. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ ඉදිරිපත් කරන ප්‍රමාණය පසුකාලිනව ආදායම් ප්‍රකාශනයට මාරු නොකෙරේ. එවැනි ආයෝජන මත ලාභාංශ අදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගනී.

අරමුදල ණය ආයෝජන වර්ගීකරණය කරන්නේ එවැනි වත්කම් කළමනාකරණය කිරිම සඳහා එහි ව්‍යාපාර මාදිලිය වෙනස්වන විට පමණක්වේ.

### 2.6.2 හඳුනා ගැනීම සහ හඳුනා නොගැනීම

මුල්‍ය වත්කම් නිත්‍ය ආකාරයෙන් මිලදී ගැනීම් සහ විකුණුම්, වත්කම් මිලදී ගැනිමට හෝ විකිණීම කළ දිනය අනුව වෙළෙඳ දිනට හඳුනා ගනී. මූල්‍ය වත්කම්වලින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය කල් ඉකුත්වී ඇති විට හෝ මාරු කර ඇති විට සහ අරමුදල විසින් හිමිකාරීත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර ඇති විට මුල්‍ය වත්කම් හඳුනා නොගනී.

### 2.6.3 මැණුම්කරණය

මුලික හඳුනාගැනිමේදි, අරමුදල මුල්‍ය වත්කම් එහි සාධාරණ වටිනාකම සමඟ, ලාභ හෝ අලාභ (FVTPL) හරහා සාධාරණ වටිනාකමක් නොලබන මුල්‍ය වත්කම් සම්බන්ධයෙන්, මුල්‍ය වත්කම් අත්පත්කර ගැනිම සඳහා සෘජුවම ආරෝපනය කළ හැකි ගනුදෙනු පිරිවැය මනිනු ලබයි. FVTPL ට ගෙන යන මුල්‍ය වත්කම්වල ගණුදෙණු පිරිවැය ආදායම් ප්‍රකාශයේ වියදම් කෙරේ. බද්ධවූ ව්‍යුත්පන්න සහිත මූල්‍ය වත්කම්, ඒවායේ මුදල් ප්‍රවාහයන් තීරණය කිරීමේදි මූලික මුදලත් පොළිය පමණක් සලකා බලනු ලැබේ.

#### 2.6.3.1 ණය උපකරණ

ණය උපකරණවල පසුකාලීන මැණුම්කරණය, වත්කම කළමනාකරණය තරමට අරමුදලේ ව්‍යාපාර මාදිලිය සහ වත්කමේ මුදල් ප්‍රවාහ ගතිලක්ෂණ මත රඳා පවති. අරමුදල ණය උපකරණ වර්ගීකරණය කරන මිණුම්කරණ තුනක් ඇත.

**ක්‍රමක්ෂය කළ පිරිවැය :** ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරිම සඳහා දරාගෙන සිටින වත්කම්වල එම මුදල් ප්‍රවාහ මුල් මුදල සහ පොළිය ගෙවීම් පමණක් නියෝජනය කර අවස්ථාවක ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලබයි. මෙම මුල්‍ය වත්කම්වලින් පොළි ආදායම එලදායි පොළි අනුපාත ක්‍රමය භාවිතයෙන් මුල්‍ය ආදායම තුළ ඇතුලත් කෙරේ. හඳුනා නොගැනීම මත ඇතිවන යම් ලාභ හෝ අලාභ සෘජුවම ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගන්නා අතර විදේශ විනිමය ලාභ සහ අලාභ සමඟ එක්ව වෙන් ලාභ/ (අලාභ) තුළ ඉදිරිපත් කෙරේ. හානිකරණ අලාභ ආදායම් ප්‍රකාශනය තුල වෙනම තිරුවක ඉදිරිපත් කෙරේ.

**වෙනත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගය (FVTOCI) :** ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරිම සඳහා සහ මුල්‍ය වත්කම් විකිණීම සඳහා දරාගෙන සිටින වත්කම්, එම වත්කම්වල මුදල් ප්‍රවාහ මුල් මුදල සහ පොළිය ගෙවීම් පමණක් නියෝජනය කර අවස්ථාවක, අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මනිනු ලබයි. ධාරණ අගය තුළ වෙනස්වීම් අදායම් ප්‍රකාශය තුළ හඳුනාගන්නා හානිකරණ ලාභ හෝ අලාභ, පොළි ආදායම සහ විදේශ විනිමය ලාභ සහ අලාභ හඳුනාගැනිම හැර අනෙකුත් විස්තරාත්මක ආදායම් තුළින් ගනු ලැබේ. මුල්‍ය වත්කම් හඳුනා නොගන්නා විට, අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ මෙයට පරෙ හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ ස්කන්ධවල සිට ලාභය හෝ අලාභ දක්වා නැවත වර්ගීකරණය කර වෙනත් ලාභ/ (අලාභ) තුළි හඳුනා ගනී. මෙම මූල්‍ය වත්කම්වලින් පොළි ආදායම එලදායි පොළි අනුපාත ක්‍රමය භාවිතයෙන් මූල්‍ය අදායම තුළ ඇතුළත් කෙරේ. විදේශ

විනිමය ලාභ සහ අලාභ වෙනත් ලාභ/ (අලාභ) තුළ ඉදිරිපත් කරන අතර හානිකරණ වියදම් ආදායම් ප්‍රකාශනය තුළ වෙනම තීරුවක ඉදිරිපත් කෙරේ.

**ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය:** FVTPL ක්‍රමක්ෂය පිරිවැය හෝ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගය සඳහා නිර්නායක නොසපුරන වත්කම් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මනිනු ලැබේ. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට පසුකාලීනව මනින ණය උපකරණයක් මත ලාභයක් හෝ අලාභයක් ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගන්නා අතර ලාභ/ (අලාභ) තුළ ශුද්ධ ලෙස ඉදිරිපත් කෙරේ.

### 2.6.3.2 කොටස් හිමිකම් සාධන පත්‍ර

අරමුදල සිය සියලු කොටස් හිමිකම් ආයෝජන සාධාරණ අගයට අනුව පසු කාලීනව මානනය කරයි. අරමුදල් කළමනාකරණය විසින් වෙනත් විස්තීරණ ආදායම් තුළ කොටස් හිමිකම් ආයෝජන මත සාධාරණ අගය සහිත ලාභ හෝ අලාභ ඉදිරිපත් කරනු ලැබීමට තෝරා ගනු ලැබ ඇති අවස්ථාවක දී, අදාළ ආයෝජනය හඳුනා නොගැනීම මත සිදුවන සාධාරණ අගය සහිත ලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභ කරා පසු කාලීනව ප්‍රතිවර්ගීකරණයට යටත් නොවේ. ගෙවීම් ලබා ගැනීම පිළිබඳ වූ අරමුදලට අයත් ස්වකීය අයිතිය තහවුරු වූ කල්හි ලාභ හෝ අලාභ තුළ එම ආයෝජන වෙතින් උත්පාදනය වන ලාභාංශ වෙනත් විස්තීරණ ආදායම් වශයෙන් හඳුනා ගැනීම නොකඩවා සිදු වේ.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය මත ගණනය කරන ලද මූල්‍ය වත්කම්හි සාධාරණ අගයෙහි සිදුවන වෙනස්කම්, අදාළ වන පරිදි ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ වෙනත් ලාභ / (අලාභ) යටතේ හඳුනා ගැනේ. වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ මානනය කරන ලද කොටස් හිමිකම් ආයොජන මත සිදුවන අපහායන අලාභ (සහ අපහායන අලාභ වල ප්‍රත්‍යාවර්තනය) සාධාරණ අගය විෂයෙහි සිදුවන වෙනස්කම් වලින් වෙන් කරනු ලැබ වාර්තා නොකෙරේ.

**මූලික මූල්‍ය මෙවලම්**

අලෙවිය සඳහා රඳවාගත් මූල්‍ය වත්කම්, කල්පිරෙන තෙක් රඳවාගත් මූල්‍ය වත්කම්, ණය සහ ලැබීම් නියමිත සහ විකුණුම් සඳහා පවත්නා මූල්‍ය වත්කම් යනුවෙන් මූල්‍ය වත්කම් වර්ගීකරණය කෙරේ. මූලික හඳුනා ගැනීමේ අවස්ථාවේදි සමාගම ස්වකීය මූල්‍ය වත්කම් පිළිබඳ වර්ගීකරණය නිගමනය කරයි.

**ණය සහ ලැබීම් නියමිත**

ණය ලැබීම් නියමිතවලට මුදල් හා කෙටිකාලීන තැන්පතු, ස්ථාවර තැන්පතු සහ වෙළඳ සහ වෙනත් ලැබීම් නියමිත ඇතුළත්වේ. ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය අනුව ගණනය කෙරෙන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් හැරණු විට, සියළුම මූල්‍ය මෙවලම් ආරම්භක අවස්ථාවේදී මානනය කරනු ලබන්නේ ඒවායේ ගණුදෙනු කිරිමේ පිරිවැය සහිත සාධාරණ අගයට අනුවය.

ණය සහ ලැබීම් නියමිත වනුයේ සක්‍රිය වෙළඳපළක් තුළ මිල ප්‍රකාශ නොවූ ස්ථාවර හෝ නිශ්චයාත්මක ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික මිනුම්කරණයෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් පසුකාලීනව ක්‍රමක්ෂිත පිරිවැය අනුව මානනය කෙරේ. දුබලතා හේතුවෙන් උද්ගතවන අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

**මූල්‍ය වත්කම් හානියට පත් වීම**

මූල්‍ය වත්කමක් හානියට පත්ව ඇති බවට කිසියම් ආත්මානුරූපික වූ සාක්ෂි තිබේ ද යනුවෙන් සමාගම විසින් සෑම වාර්තාකරණ දිනයකදී ම තක්සේරු කරනු ලබයි. මූල්‍ය වත්කමක් හානියට පත්ව ඇති බවට සලකනු ලබන්නේ, අදාළ වත්කම විෂයයෙහි එම දුබලතා මූලික වශයෙන් හඳුනා ගැනීමෙන් පසුව සිදු වූ එක් සිදුවීමක හෝ ඊට වැඩි සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස හානියට පත් වූ බවට ආත්මානුරූපික වූ සාක්ෂි ඇත්නම් සහ එම අලාභ සිදුවීම, විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කමක ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මත බලපෑමක් ඇති කරන්නේ නම් පමණක් ම වන්නේ ය. ණයගැතියන් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතාවලට හෝ පොලී හෝ මූලික ගෙවීම් පැහැර හැරීම්වලට හෝ ඒවා ගෙවීමෙන් වැළැකී සිටීම්වලට මුහුණ දෙමින් සිටින බවට පිළිබිඹු වන කරුණු ද, ඔවුන් බංකොලොත් භාවයට පත් වීමේ හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ඇතුළත් වීමේ සම්භාවිතාව යන කරුණු ද, හිඟ හිට ඇති මුදල්වල වෙනස්වීම් හෝ මුදල් ගෙවීම් පැහැර හැරීම් සමඟ සහසම්බන්ධ වන ආර්ථික තත්ත්වයන් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ අගයෙහි මැනිය හැකි යම් අඩුවීමක් ඇති බව දත්ත මඟින් නිරීක්ෂණය වන කරුණු ද වත්කම් හානියට පත් වීම පිළිබඳව හඟවන සළකුණුවලට අන්තර්ගත විය හැකි ය.

**මූල්‍ය බැරකම්**

මූල්‍ය බැරකම් වර්ගීකරණය කෙරෙනුයේ කොන්ත්‍රාත්තුමය ගිවිසුමේ හරය සහ මූල්‍ය බැරකම්වල අර්ථකථනය අනුව ලාභය හෝ අලාභය හරහා හෝ වෙනත් මූල්‍ය බැරකම් හරහා සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය බැරකම් වශයෙනි. ලාභය හෝ අලාභය හරහා ගණනය කරනු ලැබ සටහන් කරනු ලබන මූල්‍ය බැරකම් සම්බන්ධයෙන් හැරුණු විට, සියලුම මූල්‍ය මෙවලම් ආරම්භයේදී මානනය කරනු ලබන්නේ ගණුදෙනු කිරීමේ පිරිවැය සහිත ඒවායේ සාධරණ අගයට අනුවය.

පොලී දරන ණය සහ ණය ගැනුම් ද, වෙනත් මූල්‍ය බැරකම්ද (වෙළඳ හා අනෙකුත් ගෙවීම් නියමිත) ඇතුළු මූල්‍ය බැරකම් ආරම්භක අවස්ථාවේදී මානනය කරනු ලබන්නේ, අත්කර ගැනීම් කෙරහි සෘජුවම ආරෝපනය කළ හැකි ගණුදෙනු කිරීමේ පිරිවැය අඩුකරන ලද සාධාරණ අගය අනුව වන අතර ඒවා පසුකාලීනව සඵල පොලී අනුපාත ක්‍රමය යොදාගනිමින් ක්‍රමක්ෂිත පිරිවැය අනුව මානනය කෙරේ. ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ, නිකුතුව මත වන්නාවූ යම් වට්ටම් හෝ අධිමිල සහ සඵල පොලී අනුපාතයේ මුඛ්‍යාංගයක් වන පිරිවැය සැලකිල්ලට ගනිමිනි.

මූල්‍ය බැරකමක් හඳුනා නොගනු ලබන්නේ, බැරකම යටතේ  පවත්නා බැඳියාව නිදහස් කරනු ලබන හෝ අවලංගු කරනු ලබන හෝ කල්ඉකුත් වන කල්හීය.  දැනටමත් පවත්නා මූල්‍ය බැරකමක් සැලැකිය යුතු අයුරින් වෙනස් කම් දක්වන නියමයන් මත එකම පාර්ශවකරුවා විසින් ඉදිරිපත්කරනු ලබන වෙනත් මූල්‍ය බැරකමකින් ප්‍රතිස්ථාපනය කෙරෙන්නේ නම් හෝ දැනටමත් පවත්නා බැරකමක නියමයන් ප්‍රමණවත් පරිදි වෙනස් කෙරෙන්නේ නම් එබඳු හුවමාරුවක් හෝ අමුතු කිරීමක් මුල් බැරකම නොපිලිගැනිමක් ලෙසත්, නව බැරකමක් හඳුනා ගැනිමක් ලෙසත් සලකනු ලබන්නේය. මුල් මූල්‍ය බැරකමෙහි ධාරණ අගය සහ ගෙවනු ලබන ප්‍රතිෂ්ඨාව අතර වෙනස ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

## 2.7 දේපළ, පිරියත හා උපකරණ

### 2.7.1 හඳුනා ගැනිමේ පදනම

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා ඒමේ සම්භාවිතාව පවතී නම් හා වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම්, දේපළ, පිරියත සහ උපකරණ හඳුනා ගැනේ. රුපියල් 10,000 ක් වූ ප්‍රමාණයට වඩා අඩු අයිතමයක ඒකක පිරිවැයක් (උපයෝගී පිරිවැය ද ඇතුළුව) දේපළක්, පිරියතක් සහ උපකරණයක් ලෙස හඳුනා නොගෙන එම අයිතම, වියදමක් ලෙස හඳුනා ගැනීම  මණ්ඩලයේ ප්‍රතිපත්තිය වන්නේ ය. කෙසේ වෙතත්, ඉඩම්, ගොඩනැගිලි සහ වාහනවල පිරිවැය (උපයෝගී පිරිවැය ද ඇතුළුව), ඒකක සීමාව රුපියල් 10,000 ක් වූ ප්‍රමාණය නොතකා ප්‍රාග්ධනීකරණය කෙරේ.

### 2.7.2 මානනය කිරීමේ පදනම

නිරවුල් ඉඩම් හැර වෙනත් දේපල, පිරියත සහ උපකරණ අයිතම, පිරිවැය ඌණ සමුච්චිත ක්ෂය වීම්  එල්ලේ සහ යම් දුබලතා අලාභ කිසිවක් වේ නම් එවා එල්ලේ මිනිනු ලැබේ.

ප්‍රති තක්සේරු කිරීමේ සහ ද්‍රව්‍යමය භාවයේ පවත්නා ප්‍රායෝගික දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් 2022 ජනවාරි මස 01 වන දිනට වත්කම්වල මූලික පිරිවැය ලෙස දැනට ඇති වත්කම්වල අගය අඩු කළ වටිනාකම ගණනය කරනු ලැබ ඇත.

වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් පිරිවැයට ඇතුළත් වේ. ස්වයං නිර්මිත වත්කම්වල පිරිවැය, ද්‍රව්‍යවල පිරිවැය සහ සෘජු ශ්‍රමයෙන් ද, වත්කම් ඒවායේ අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන එනු පිණිස සෘජුවම ආරෝපණය කළ හැකි වෙනත් යම් වියදම් වලින් ද, අයිතම වල කොටස් ගැලවීමට හා ඉවත් කිරීමට සහ ඒවා පවතින අඩවිය ප්‍රතිස්ථාපනය කිරීමට දරන්නා වූ පිරිවැයෙන් ද සමන්විත වන අතර සුදුසුකම් සහිත ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනු ලැබ ඇත.

දේපල, පිරියත සහ උපකරණ යන අයිතමවලට අයත් කොටස්වල විවිධ ප්‍රයෝජ්‍ය ආයු කාල ඇති විට, ඒවා දේපල, පිරියත සහ උපකරණ යන වෙනම අයිතම ලෙස ගිණුම්හි ගණනය කරනු ලැබේ.

### 2.7.3 තදනන්තර පිරිවැය

දේපල, පිරියත සහ උපකරණ යන අයිතමවල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගල ඒමේ සම්භාවිතාවක් තිබේ නම් හා එහි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම්, එම අයිතම කොටස රැගෙන යන ධාරණ වටිනාකමේ ප්‍රමාණයෙන් හඳුනා ගෙන ඇත. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි රැගෙන යන ධාරණ වටිනාකමේ ප්‍රමාණය හඳුනා ගනු නොලැබේ. දේපල, පිරියත සහ උපකරණවල එදිනෙදා සේවා කිරීම් සඳහා වන වියදම් එවායේ වැය දැරීමට සිදු වන අවස්ථාවේදී දරනු ලැබේ.

මුලින් තක්සේරු කරන ලද කාර්ය සාධන ප්‍රමිතියෙන් බලාපොරොත්තු වන අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රතිෂ්ඨාපනය කිරීම හෝ පවත්වාගෙන යාම සඳහා දේපළ, පිරියත සහ උපකරණ අලුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම සඳහා වන වියදම, එය දරනු ලබන කල්හි, ආදායම් ප්‍රකාශය තුළ වියදමක් ලෙස හඳුනා ගැනේ.

### 2.7.4 ක්ෂය වීම

දේපළ, පිරියත සහ උපකරණ යන අයිතමයක එක් එක් අංගයේ ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය මුළුල්ලේ, සරල මාර්ග පදනමක් මත, ලාභය හෝ අලාභය තුළ ක්ෂය වීම හඳුනා ගැනේ. ඉඩම් ක්ෂය නොකෙරේ. තනි වත්කම්වල සැලකිය යුතු අංග තක්සේරු කරනු ලබන අතර, එම වත්කමේ ඉතිරිව ඇති කොටසට වඩා වෙනස් වූ ප්‍රයෝජ්‍ය ආයු කාලයක් යම් අංගයකට තිබේ නම්, එම අංගය වෙන් වශයෙන් ක්ෂය කරනු ලැබේ.වත්කමක් ක්ෂය වීම ආරම්භ වන්නේ, එය භාවිතය පිණිස පවත්නා කල්හි වන අතර, එය, අදාළ වත්කම විකිණීමට තබා ඇති බවට වර්ගීකරණය කර ඇති දිනය හෝ වත්කම හඳුනා ගනු නොලබන දිනය යන දෙකින් කලින් එළඹෙන දිනයේ දී අවසන් වේ.

වත්කම් ක්ෂය වීම ආරම්භ වන්නේ, එය භාවිතය සඳහා පවතින මාසයේ දී වන අතර ඒවා ව්‍යපහරණය කළ මාසයේ දී ක්ෂය නොකෙරේ.ක්ෂය වීම් ක්‍රම, ප්‍රයෝජ්‍ය ආයු කාල සහ අවශේෂ අගයන් වාර්තා කරන දිනයේ දී තක්සේරු කර, සුදුසු වන්නේ නම්, ඊට ගැළපුම් සිදු කරනු ලැබේ.

| | වසර ගණන ප්‍රයෝජනවත් ආයු කාලය | ක්ෂයවීම් අනුපාතය |
|---|---|---|
| ගොඩනැගිලි | වසර 40 | 2.5% |
| මෝටර් වාහන | වසර 05 | 20% |
| පරිගණක උපකරණ | වසර 05 | 20% |
| ගෘහ භාණ්ඩ | වසර 10 | 10% |
| සවි කිරීම් සහ වැද්දුම් | වසර 10 | 10% |
| වෙනත් උපකරණ | වසර 05 | 20% |

### 2.7.5 දේපල, පිරියත හා උපකරණ හඳුනා නොගැනීම

දේපල, පිරියත සහ උපකරණවල අයිතමයක් සහ මුලින් හඳුනාගත් කිසියම් සැලකිය යුතු කොටසක් බැහැර කිරීමේ දී හෝ එය භාවිතා කිරීමෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන කල්හි හෝ හඳුනා ගනු නොලැබේ. වත්කම් හඳුනා නොගැනීමෙන් ඇතිවන යම්කිසි ලාභයක් හෝ අලාභයක්, එම වත්කම හඳුනා ගනු නොලබන කල්හි ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි ඇතුළත් කෙරේ.

දේපල, පිරියත සහ උපකරණවල අවශේෂ අගයන්, ප්‍රයෝජ්‍ය ආයු කාල සහ ක්ෂය වීමේ ක්‍රම එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සමාලෝචනය කර, සුදුසු වන්නේ නම්, භවිත්‍ය ලෙස ඊට අවශ්‍ය ගැළපුම් සිදු කරනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ ආශ්‍රිත අයිතම සම්මුච්චිත ක්ෂය සහ යම් දුබලතා අලාභ වෙතොත ඒවා අඩුකරන ලද ඓතිහාසික පිරිවැයට අනුව මානනය කෙරේ. ක්ෂයවීම් සඳහා අය කෙරෙනුයේ වාර්ෂික අනුප්‍රමාණ අඩුකළ වත්කම්හි පිරිවැය වෙන්කර දෙනු ලැබිය හැකි අයුරින් වන අතර, පහත දැක්වෙන දේපළ, පිරියත හා උපකරණ ක්ෂය විම් සඳහා එය යොදා ගැනේ.

| | | |
|---|---|---|
| ගොඩනැගිලි හා සින්නක්කර ඉඩම් | ... | 2.5% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | | |
| - පොම්ප හා උපකරණ | ... | 20% |
| - වෙනත් (මේස ලුණු බලාගාරය, අයඩිකරණ කම්හල, දොඹකර සහ වෙනත් පිරියත) | ... | 10% |
| උපකරණ | ... | 10% |
| ලීබඩු සහ සවිකිරීම් | ... | 10% |
| මෘදුකාංග සහ අනෙකුත් පරිගණක ජාලයන් | ... | 50% |
| මොටර් වාහන | | |
| - මහමාර්ග වාහන | ... | 10% |
| - ට්‍රැක්ටර් සහ ට්‍රලර් | ... | 20% |
| සංවර්ධන වැඩ | ... | 20% |
| වැඩුනු වතුවගා - පොල් | ... | 02% |

වත්කමක ක්ෂය අනුපාතය, ප්‍රයෝජන ආයු කාලය හෝ අවශේෂ අගය තුළ සැලකිය යුතු වෙනස්කම් කිසිවක් විද්‍යාමාන වේ නම් එම වත්කම ආශ්‍රිත ශේෂය නව අරමුණු පිළිබිඹු වනු පිණිස ඉදිරියට බලාත්මක වෙන පරිදි ප්‍රතිශෝධනය කෙරේ.

දේපළ, පිරියත හා උපකරණ ආශ්‍රිත අයිතමයක් ඒවායේ ව්‍යාපහරණය මත හෝ එහි භාවිතයෙන් හෝ ව්‍යපහරණයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට හඳුනා ගැනීමක් සිදු නොකෙරේ. එසේ වත්කම හඳුනා නොග ැනීම නිසා උද්ගත වන ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ ව්‍යපහරණ මුදල හා වත්කමෙහි ධාරණ අගය අතර වෙනස වශයෙන් ගණනය කරන ලද) එකී වත්කම පිළිනොගැනෙන වර්ෂය තුළ ලාභයෙහි හෝ අලාභයෙහි අන්තරගත කරනු ලැබේ.

- **ජෛවවත්කම්**

ජෛව වත්කම්, පරිණත වූ ජෛව වත්කම් සහ පරිණත නොවූ ජෛව වත්කම් යනුවෙන් වර්ග දෙකකට බෙදේ. පරිණත වූ ජෛව වත්කම් වනුයේ, අස්වනු ලබා ගත හැකි අයුරින් විශේෂිතත්වයට පත් වූ හෝ නිරතුරුව අස්වනු දැරිය හැකි හෝ වත්කම් වර්ගයෝයි. පරිණත නොවූ ජෛව වත්කම් වනුයේ, මේ වන විටත් අස්වනු ලබා ගත හැකි අයුරින් විශේෂිතත්වයට පත් නොවූ වත්කම් වර්ගයෝයි. පොල් වගා සහ පැල තවාන් ජෛව වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. ධාරක ජෛව වත්කම්වලට, විකිණීමට හෝ අස්වනු නෙලා ගැනීමට අදහස් නොකරන එහෙත්, කෘෂි නිෂ්පාදන ලෙස අස්වනු ලබා ගැනීම පිණිස යොදා නොගැනෙන ජෛව වත්කම් ඇතුළත් වේ. අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන්, අදාළ වත්කම් හා බැඳී පවත්නා අනාගත ආර්ථික ප්‍රතිලාභ තමන් වෙත ගලා එනු ඇතැයි සහ එම වත්කම්වල සාධාරණ අගය හෝ පිරිවැය විශ්වාසදායක ලෙස මානනය කරනු ලැබිය හැකි වෙතැයි අස්ථිත්වය විසින් අනුමාන කරනු ලබන කල්හී සහ එම අස්ථිත්වය එකී අදාළ වත්කම් පාලනය කරනු ලබන අවස්ථාවක දී පමණක් එම අස්ථිත්වය තම ජෛව වත්කම් හඳුනා ගනියි. ජෛව වත්කම් විෂයයෙහි සිදුවන ස්ථිර හායනයවීම් පූර්ණ වශයෙන් ලාභ හෝ අලාභ ප්‍රකාශයන් හී අයගත කරනු ලැබ, අදාළ අලාභය නිශ්චය වශයෙන් දැන ගැනීමෙන් පසුව, එකී අලාභය සිදුවූ වසර තුළදී එම වත්කම්වලට අයත් ශුද්ධ ඉදිරියට ගෙන යන ගණන් ප්‍රමාණවලට අවකරණය කරනු ලැබේ.

- **ධාරක ජෛවවත්කම්**

ධාරක ජෛව වත්කම්, අංක 16 දරන ලංකා ගිණුම් ප්‍රමිත - දේපළ, පිරියත සහ උපකරණ අනුව, ඒවායේ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හායන අලාභ ඇත්නම් ඒවා ද අඩු කරන ලද පිරිවැය මත, මනිනු ලැබේ.පැල සිටුවීම සහ අස්වනු නෙලීම (පැල රෝපණය කරන ලද ප්‍රදේශය මෝරා වැඩුනු අවස්ථාව වන විට) අතර කාලය තුළ සිදුවූ ඉඩම් පිළියෙළ කිරීම, පුනරුත්ථාපනය, අභිනවයෙන් පැල සිටුවීම, නැවත පැල සිටුවීම, භෝග විවිධාංගීකරණය, අතුරු පැල සිටුවීම සහ පොහොර යෙදීම යනාදිය සඳහා වූ පිරිවැය පරිණත නොවූ වගාවන් ලෙස වර්ගීකරණය කෙරේ. මෙම පරිණත නොවූ වගාවන්, එකී පරිණත නොවූ වගාවන් සඳහා මූල්‍යනය සලසනු පිණිස යොදා ගැනුනු දිගු කාලීන ණය මුදල්වලට ආරෝපණය වන පොලී ප්‍රමාණ ද ඇතුළු අනෙකුත් ආරෝපිත වන්නා වූ පොදු කාර්ය වියදම් සහිත වූ සෘජු පිරිවැයට අනුව ගෙන හැර දක්වනු ලැබේ. වසර තුළදී ඵල දරන ධාරක ජෛව වත්කම්(පොල්)මත දරනු ලබන වියදම්, පරිණත වූ වගාවන් වෙත මාරු කෙරේ.

## 2.8 ආයෝජන දේපළ

ආයෝජන දේපළ, ඒවායේ ගණුදෙනු කිරීමේ පිරිවැයද ඇතුළුව ආරම්භක අවස්ථාවේදී පිරිවැයට මානනය කෙරේ. මුල් හඳුනාගැනීමෙන් අනතුරුව, වාර්තාකරණ දිනයට අදාල වෙළඳපොළ තත්වය පිළිබිඹු කෙරෙන සාධාරණ අගයට අනුව ආයෝජන දේපළ සටහන් කරනු ලැබේ. ආයෝජන දේපලවල සාධාරණ වටිනාකම තුළ සිදුවන වෙනස්කම් නිසා උද්ගතවන යම් ලාභ හෝ අලාභ ඒවා පැනනගින කාල පරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශයෙහි අන්තර්ගත කරනු ලැබේ.

මණ්ඩලය සතු ආයෝජන සෑම තෙවසරකට ම වරක් විවෘත වෙළඳපොළ තුළ පවත්නා අගය අනුව එහි ධාරණ අගයක් වෙතොත් එහි වෙනසද සමග විස්තීර්ණ අදායම් ගිණුමෙහි හඳුනාගනු ලැබ ප්‍රත්‍යාගණනය කළ යුතු වන්නේය. ලැබිය යුතු කුලිය ඒවායේ කල්බදු කාල සීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත විහිදුවා හැරිය යුතුය. යම් කුලී නිවැසියෙකුට කිසියම් දිරිගැන්වීමක් (කුලී රහිත කාල සීමාවක් වැනි) ලබා දෙන්නේ නම්, අදාළආයෝජන දේපළෙහි ධාරණ අගයෙන් මෙම පදනම මත කුලී ආදායම් හඳුනා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස වෙනමම වත්කමක් සේ වාර්තාවූ මුදල් ප්‍රමාණ කිසිවක් බැහැර විය යුතු වන්නේය.

මණ්ඩලය සතුව කොළඹ 02, නවම් මාවතෙහි පිහිටි අක්කර 2 රූඩ් 1 පර්චස් 28 ක වපසරියකින් යුත් ඉඩමක් පවතින අතර, එය රජයේ තක්සේරුකරු විසින් 2022 අගෝස්තු මස 24 වන දින තක්සේරු කරන ලදි. එම තක්සේරුකරුගේ වාර්තාවට අනුව, එම ඉඩමෙහි සාධාරණ අගය රු.4,587,406,450 ක් වූ ප්‍රමාණයක් දක්වා ඉහළ ගොස් තිබුණි. 2023 වසරේ අවසන් ගිණුම් සකස් කිරීම සදහා එම ඉඩම තක්සේරු කිරීම සඳහා ලිපියක් යොමු කරන ලද අතර, එම ලිපියට පිළිතුරු වශයෙන් එම දෙපාර්තමේන්තුව 2023 සැප්තැම්බර් මස 23 දිනැති ලිපිය මගින් දන්වා ඇත්තේ මෙම දේපල සම්බන්ධයෙන් නිකුත් කර ඇති තක්සේරු වාර්තාව 2018 දෙසැම්බර් මස 31 දිනැති භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කර ඇති වත්කම් කලමනාකරණ චක්‍ර ලේඛ අංක 4/2018 දරණ චක්‍ර ලේඛය අනුව වසර 05කට වලංගු බවය.

### 2.8.1 (අ) මණ්ඩලය සතු ආයෝජන දේපළවල තොරතුරු - ප්‍රමාණය සහ පිහිටි ස්ථානය

| පිහිටි ස්ථානය | ප්‍රමාණය (පර්චස්) | ආයෝජන දේපළෙහි සාධාරණ අගය |
|---|---|---|
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, නවම් මාවත, කොළඹ 02. | 388 | රු. 4,566,000,000.00 |

| පිහිටි ස්ථානය | ගොඩනැගිලි (වර්ග අඩි) | ආයෝජන දේපළෙහි සාධාරණ අගය |
|---|---|---|
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, නවම් මාවත, කොළඹ 02. | 19,319 | රු. 21,406,450.00 |

**2.8.2 (ආ) මණ්ඩලය සතු ආයෝජන දේපළවල තොරතුරු - තක්සේරු**

| **වෘත්තීය තක්සේරුකරුගේ නම / පිහිටි ස්ථානය හා ලිපිනය** | **තක්සේරු කිරීමේ ක්‍රමය සහ සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහෙන යෙදවුම්** | **නිරීක්ෂණය කළ නොහෙන යෙදවුම් සඳහා වන ඇස්තමේන්තු පරාසය රු.** | **ආයෝජන දේපළෙහි සාධාරණ අගය රු.** |
|---|---|---|---|
| රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව, "තක්සේරු මන්දිරය", අංක 748, මරදාන පාර, කොළඹ 10. | වෙළඳපළ සංසන්දනාත්මක ක්‍රමය<br>• පර්චස් එකක මිල<br>• වර්ග අඩියක මිල | පර්චස් එකක් 11,823,212.50 බැගින්<br>වර්ග අඩියක් 625 - 1955 බැගින් | 4,566,000,000.00<br><br>21,406,450.00 |

**2.8.3 (ඇ) සමූහය සතු ආයෝජන දේපළවල සාධාරණ අගය මානනය කිරීමේ තක්සේරු ශිල්ප ක්‍රම හා එහි සංවේදකතාවය**

| **තක්සේරු ශිල්ප ක්‍රමය** | **සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහෙන තක්සේරු යෙදවුම්** | **යෙදවුම් එල්ලේ සාධාරණ අගය මානනය කිරීමේ සංවේදකතාවය** |
|---|---|---|
| වෙළඳපළ සංසන්දනාත්මක ක්‍රමය - ප්‍රතිතක්සේරු කිරීමට භාජනය වන දේපළවල සාධාරණ වටිනාකම තීරණය කිරීමේ දී, ඒ හා සමාන දේපළක යුක්ති සහගත නුදුරු කාල පරිච්ඡේදයක් තුළ පැවති විකුණුම් මිල මෙම ක්‍රමය මගින් සලකා බැලේ. මෙයට සමාන වත්කම්වල පැවති මෑත කාලීන සක්‍රීය වෙළඳපළ මිල තක්සේරු කිරීම මීට අදාළ කර ගනු ලබන අතර එකී නිශ්චිත දේපළෙහි ප්‍රමාණය, ස්වභාවය, ස්ථානීය පිහිටීම සහ තත්ත්වය යනාදියෙහි වෙනස්කම් සඳහා සුදුසු ගැළපීම් කිරීම ද එහි දී සිදු වේ. | • පර්චස් එකක මිල<br>• වර්ග අඩියක මිල | ඇස්තමේන්තුගත සාධාරණ අගය පහත දැක්වෙන තත්වයන් යටතේ වැඩි වනු ඇත./ (අඩු වනු ඇත.)<br>- පර්චස් එකක මිල වැඩි වන්නේ / (අඩු වන්නේ) නම්;<br>- වර්ග අඩියක මිල වැඩි වන්නේ / (අඩු වන්නේ) නම්. |

## 2.9 අස්පෘශ්‍ය වත්කම්

**2.9.1 බාහිර වශයෙන් අත්කරගන්නා ලද අස්පෘශ්‍ය වත්කම්**

වෙන් වෙන්ව අත්කර ගත් අස්පෘශ්‍ය වත්කම් ආරම්භක හඳුනා ගැනීමේ අවස්ථාවේදී පිරිවැයට අනුව මානනය කෙරේ. එසේ ආරම්භක හඳුනාගැනීමෙන් අනතුරුව, අස්පෘශ්‍ය වත්කම් ඉදිරියට ගෙන යනු ලබන්නේ, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත දුබලතා අලාභ අඩුකළ පිරිවැයට අනුවය. අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජ්‍ය ආයු කාලය නියත හෝ අනියත වශයෙන් තක්සේරු කරනු ලැබේ.

නියත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ඒවායේ ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබන අතර අදාළ අස්පෘශ්‍ය වත්කම දුබලත්වයට පත්ව ඇති බවක් විද්‍යාමාන වන කල්හි ඒවායේ දුබලතා එල්ලේද තක්සේරු කිරීමක් කරනු ලැබේ. යටත් පිරිසෙයින් එක් වාර්තකරණ කාල පරිච්ඡේදයක් අවසානයේදී, නියත ප්‍රයෝජ්‍ය ආයු කලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක් සඳහාවූ ක්‍රමක්ෂය කිරීමේ කාල පරිච්ඡේදය සහ අදාළ ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය සමාලෝචනයට භාජනය කෙරේ. වත්කමෙහි අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය තුළ හෝ වත්කම තුළ අඩංගු අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව තුළ සිදුවන වෙනස්කම් සුදුසු පරිදි ක්‍රමක්ෂය කිරීමේ කාලසීමාව හෝ ක්‍රමය වෙනස් කරමින් සලකා බලනු ලබන අතර ගිණුම් ඇස්තමේන්තු තුළ සිදුවන වෙනස්කම් ලෙස සලකනු ලබන්නේය. නියත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් මත සිදුවන ක්‍රමක්ෂය වියදම් අදාළ අස්පෘශ්‍ය වත්කමෙහි ක්‍රියාකාරීත්වය හා අනුකූල වන පරිදි වියදම් කාණ්ඩය තුළ අදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කමක් හඳුනා නොගැනීමෙන් උද්ගතව වන ලාභ හෝ අලාභ, ශුද්ධ ව්‍යපහරණ මුදල සහ වත්කමෙහි ධාරණ අගය අතර වෙනස ලෙස මානනය කරනු ලබන අතර එකී වත්කම නොපිලිගැනෙන අවස්ථාවේදී,එය අදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

### 2.9.2 පරිගණක මෘදුකාංග පැකේජ

පරිගණක මෘදුකාංග පැකේජ අත්කරගැනීමේ සහ වැඩිදියුණු කිරීමේ අවස්ථාවේදී දරනුලබන මුදල අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලබන අතර වසර තුනක කාල සීමාවක් ඔස්සේ ක්‍රමක්ෂය කරනු ලැබේ.

### 2.10 කල්බදු දේපළ

දේපළ, පිරියත හා උපකරණ යටතේ කලින් වර්ගීකරණය කර තක්සේරුව අනුව සටහන් කරන ලද ඉඩම් පරිහරණය පිළිබඳ අයිතිවාසිකම් ඇතුළත් කල්බදුකර දේපළ, "කල්බදුකර දේපළ" ලෙස නැවත වර්ගීකරණය කරනු ලැබ තිබේ. හම්බන්තොට පිහිටි ඉඩම සඳහා ගෙවන ලද කල්බදු මුදල වසර 30ක් වූ කල්බදු කාල සීමාවක් මුළුල්ලේ ප්‍රාග්ධනීකරණය කර ක්‍රමක්ෂය කරනු ලැබ ඇත.

### 2.10.1 මෙහෙයුම් කල්බදු

හිමිකාරිත්වය කෙරෙහි ආනුෂංගික වන්නාවූ අවදානම් හා ප්‍රතිලාභ සියල්ල ප්‍රමාණවත් පරිදි මණ්ඩලය වෙත (මෙහෙයුම් කල්බදු) මාරු කරනු නොලබන අවස්ථාවේදි, බදුකරය යටතේ ගෙවිය යුතුවන්නාවූ මුළුකුලී මුදල් ප්‍රමාණ බදු කාලසීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අයගත කෙරේ.

### 2.11 වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන මුදලින් අඩු අගයට ගණනය කරනු ලැබේ. එසේ ගණනය කරනු ලබන්නේ අභාවිත හා මන්දගාමීව චලනය වන වට්ටෝරු භාණ්ඩවලට නියමිත පරිදි අවශ්‍ය ඉඩ සලසාදීමෙන් පසුවය.

අභාවිත හා මන්දගාමීව චලනය වන වට්ටෝරු භාණ්ඩවලට නියමිත පරිදි අවශ්‍ය ඉඩ සලසාදීමෙන් පසු එකී වට්ටෝරු භාණ්ඩ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන මුදලින් අඩු අගයට ගණනය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි වටිකාම යනු, සාමන්‍ය වෙළෙඳ ක්‍රියා මාර්ගය තුළ අදාළ වට්ටෝරු භාණ්ඩ විකුණුම සම්පූර්ණ කිරීම පිණිස ඇස්තමේනතුගත පිරිවැය හා අදාළ විකුණුම් සිදුකිරීම සඳහා අවශ්‍ය වන්නාවූ ඇස්තමේන්තුගත පිරිවැය අඩුකරන ලද එය විකුණනු ලැබිය හැකි මිලය.

පහත දැක්වෙන පිරිවැය විධික්‍රම උපයෝගී කර ගනිමින්, අදාළ භාණ්ඩ තොග ඒවායේ වර්තමාන ස්ථානයට හා තත්වයට ගෙන ඒම සඳහා වැය කරන ලද වියදම ගණනය කරනු ලැබේ.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | - පළමුව පැමිණ පළමුව පිටවන පිරිවැය පදනම මතවූ ගැනුම් වියදම අනුව |
| නිමි භාණ්ඩ | - සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ සුදුසු ප්‍රාදේශිය නිෂ්පාදන පොදු කාර්ය වියදම්වල අනුපාතයන් සඳහාවූ වියදම අනුව |
| කෙරෙමින් පවත්නා වැඩ | - ඝනත්වයේ 12 වන මට්ටමට සහ ඉන් ඉහළට තැන්පත්ව පැවති ලුණුවල ගණනය කරන ලද ප්‍රමාණයට අනුව විභජනය කරන ලද පසුගිය අස්වනු වාරයේදි පැවති කරදිය සංසරණය සහ ලුණු ලියැදි සැකසීමේ වියදමින් 25% ක්වූ ප්‍රමාණයට අනුව |
| පරිභෝජ්‍ය ද්‍රව්‍ය හා අමතර කොටස් | - පළමුව පැමිණ පළමුව පිටවන පදනම මත ගැනුම් පිරිවැය අනුව |

ශුද්ධ උපලබ්ධි වටිනාකම යනු සාමාන්‍ය ක්‍රියා මාර්ගය තුළ විකුණුම් සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකුණුම් සිදු කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ ඇස්තමේන්තුගත පිරිවැය අඩුකරන ලද ඇස්මේන්තු ගත විකුණුම් මිලය.

### 2.12 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

#### 2.12.1 සේවක ප්‍රතිලාභ

සමාගම සන්තකයේ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හා නිශ්චිත දායකත්ව සැලසුම් යන දෙවර්ගය ම පවතී. නිශ්චිත දායකත්ව සැලසුමක් යනු, සමාගම විසින් වෙනත් ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවනු ලැබීමක් යටතේ ක්‍රියාත්මක වන විශ්‍රාම සැලසුමකි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් මගින්, සේවකයා ස්වකීය සේවයෙන් විශ්‍රාම ගැනිමේදී තමාගේ සේවා කාලය හා ඊට අදාළ වන්දි මුදල මත පදනම්ව ලබා ගන්නා විශ්‍රාම වැටුප් මුදලකි.

#### 2.12.2 නිශ්චිත දායකත්ව සැලසුම්

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාරව සේවක සේවිකාවන්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වයට සහ සේවා නියුකතයන්ගේ භාර අරමුදලේදායකත්වයට සුදුසුකම් ලැබේ. මණ්ඩලය විසින් සේවක සේවිකාවන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් 15% ක් සහ 3% ක් වනසේ පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවනු ලැබේ.

පවත්නා ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාරවසියලුම සේවක සේවිකාවන්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වයට සහ සේවා නියුකතයන්ගේ භාර අරමුදලේ දායකත්වයට සුදුසුකම් ලැබේ.සමාගම විසින් සේවක සේවිකාවන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් 12% ක් සහ 3% ක් වනසේ පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවනු ලැබේ.

#### 2.12.3 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

සේවක ප්‍රතිලාභ නැමති ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 19 අනුව සියළුම සේවක සේවිකාවන් සඳහා ඔවුන්ගේ සේවා කාලයේ පළමු වසරේ සිට විශ්‍රාම පාරිතෝෂිත ලබාගනු පිණිස ප්‍රතිපාදන සලසා දෙනු ලැබ ඇත. එසේ වුවද 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව, වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් සේවකයෙකුට එලෙස පාරිතෝෂිත මුදල් ගෙවීමේ වගකිම උද්ගත වන්නේය. මෙම වගකීම් දැරීම බාහිර වශයෙන් මුල්‍යයනය කෙරෙන්නක් නොවේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු, නිශ්චිත දායකත්ව සැලැස්මක් නොව පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලස්මකි. නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලැසුම් මත ආයතනයේ ශුද්ධ බැදියාව, ප්‍රවර්තන හා පූර්ව සේවා කාල පර්ච්ඡේදයන් සඳහා සේවක සේවිකාවන්ගේ සේවා දායකත්වය මත උපයන ලද අනාගත ප්‍රතිලාභ ඇස්තමේන්තු කිරීම මගින් ගණනය කරනු ලබන අතර එම ප්‍රතිලාභය අදාළ වර්තමාන වටිනාකම තීරණය කිරිම සඳහා වට්ටම් කරනු ලැබේ. යම් හඳුනානොගත් පූර්ව සේවා පිරිවැයක් වෙතොත් ඒවා අවකරණය කරනු ලැබේ.

ආයතනය සතු බැඳියාවන් හි නියමයන් සමඟ සන්නිකර්ෂනීය වන්නාවූ කල්පිරීමේ දිනයන් ඇත්තාවූ ද, අදාළ ප්‍රතිලාභ ගෙවනු ලැබීම අපේක්ෂිත එක හා සමාන ව්‍යාවහාර මුදල් ඒකක අනුව නාමනය කරනු ලැබ ඇත්තාවූද රපෝර්තු දිනට පවත්නා උසස් තත්වයේ සංස්ථාපිත බැඳුම්කරවල ඵලදාව වට්ටම් අනුපාතය වන්නේය. අදාළ ගණනය කිරීම ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය යොදා ගනිමින් සුදුසුකම් ලත් ආයුගණක විශේෂඥයෙකු ලවා වාර්ෂිකව ඉටු කරවා ගනු ලැබේ.

සැලසුමක අඩංගු ප්‍රතිලාභ වැඩි දියුණු වන කල්හි සේවක සේවිකාවන් විසින් ඉටු කරන ලද අතීත සේවයට අදාළ ඉහළ ප්‍රතිලාභවලට අයත් කොටස, එකී ප්‍රතිලාභ පවරා දෙනු ලබන තෙක්වූ සාමාන්‍ය කාල සීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනා ගැනේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් තුළින් උද්ගතවන සියලු ජීවගණක ලාභ හෝ අලාභ වෙනත් විස්තීර්ණ ආදායම තුළ ආයතනය විසින් හඳුනා ගනු ලැබේ.

සේවක සේවිකාවන්ගේ සේවා කාලය මත හා ඔවුන් විසින් දැනට ලබන මාසික වැටුප්හි ප්‍රතිශතය මත අදාළ ප්‍රතිලාභ පදනම්වී ඇති කල්හි තම සියලුම නිත්‍ය සේවක සේවිකාවන් ආවරණය කරමින් සැදුම්ලත් අරමුදල් නොසැපයූ දායකත්ව නොවන නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් සමාගම සතුව පවතී. අදාළ වගකීමෙහි වටිනාකම ගණනය කිරිමෙහිලා ඇස්තමේන්තුගත අනාගත වැටුප් වැඩිවීම්වල සරල කිරීම්ද, වත්මන් සේවක සේවිකාවන්ගේ අනාගත සේවා කාලද, වත්මන් සේවක සේවිකාවන්ගේ සේවාස්ථ මර්ත්‍යතාව ද 28.19 වගන්තිය ප්‍රකාරව උපයෝගී කරගනු ලැබ තිබේ. පාරිතෝෂිකයට අදාළ වගකීම සම්බන්ධයෙන් අරමුදල් සපයනු ලැබ නොමැති අතර එය ආයුගණක වශයෙන් අගයනු ලැබද නොමැත.

### 2.13 සම කොටස් හිමිකම

#### 2.13.1 සාමාජික අරමුදල

වර්ෂය තුළ සාමාජික සාමාජිකවන් වෙත ගෙවන ලද ආපසු ගෙවිය යුතු අරමුදල් අඩුකරන ලද සාමාජික සාමාජිකාවන් වෙතින් ලද හා ලැබිය යුතු දායක මුදල් ඊට ඔවුන් වෙුවෙන් උපචිත වන්නාවූ පොලි හා ලාභාංශද සමඟ සාමාජික අරමුදල සමන්විත වන්නේය.

#### 2.13.2 ලාභාංශ

ලාභාංශ හඳුනාගනු ලබනුයේ, ඒවා ලැබගැනීමේ අරමුදල සතු අයිතිය තහවුරු වූ කල්හිය.

#### 2.13.3 සංචිත

ප්‍රත්‍යාගණන සංචිතය, සින්නක්කර ඉඩමෙහි හා ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණනයට අදාළ වන අතර අදාළ ප්‍රත්‍යාගණන දිනයට පවත්නා ඉඩම් හා ගොනැගිලිවල සාධාරණ අගයෙහි වෙනස්කම් ඉන් නියෝජනය කරයි. ඒ අනුව, නවම් මාවතේ පිහිටි ඉඩමේ ගැණුම් පිරිවැය ඉක්මවූ වෙළඳපොළ වටිනාකමේ ඉහළ යාම අනුව සංචිතය ගොඩ නැගී ඇත.

රඳවාගත් ඉපැයුම් ගිණුමෙන් ලාභාංශ හා පොලි ගෙවීමෙන් පසුව උද්ගතවන අතිරික්ත ලාභය මණ්ඩලය විසින් ලාභාංශ සමකිරීමේ සංචිත ගිණුමට මාරුකරනු ලබයි. මෙම සංචිතය පිහිටුවීමේ අරමුණ වනුයේ, මතු අපේක්ෂිත ලාභාංශ ගෙවීම් සපුරාලීමත්, රඳවාගත් ඉපැයුම් වෙතින් මුදල් විගලනය අඩුකිරීමත් යන කරුණුය.

වත්කම් හඳුනා නොගැනීම හෝ ඒවා දුබලතාවයටපත්වන තෙක් විකුණුම් සඳහා පවත්නා මූල්‍ය ආයෝජනවල සාධාරණ අගයෙහි සමුච්චිත ශුද්ධ වෙනස විකුණුම් සඳහා පවත්නා සංචිතය තුළ සමන්විතවේ.

### 2.14 ප්‍රතිපාදන

අවිනිශ්චිත කාල නිර්ණ සහ මුදල් ප්‍රමාණ හා බැඳි බැරකම් සඳහා මණ්ඩලය විසින් ප්‍රතිපාදන හඳුනා ගනු ලැබ ඇත. රපෝර්තු දිනය වන විට අදාළ බැඳියාව නිරවුල් කරනු පිණිස අවශ්‍ය වන්නාවූ වියදමෙහි ප්‍රශස්තම වියදම් ඇස්තමේන්තුව මත ප්‍රතිපාදනය මිනිනු ලැබ මුදලෙහි කාල වටිනාකම හා බැඳි වර්තමාන වෙළඳපොල තක්සේරුව මත සහ අදාළ බැරකමට විශේෂිත වන්නා වූ අවදානම් පිළිබිඹු වන බදු පූර්ව අනුප්‍රමාණයක් මත එය වට්ටම් ගත කරනු ලැබේ.

අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් සමාගම සතුව වර්තමාන නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳියාවක් පවත්නා විට ද, අදාළ බැඳියාව නිරවුල් කිරීම පිණිස ආර්ථික ප්‍රතිලාභ පවරාදීමක් අවශ්‍ය වේදැයි යනුවෙන් හෝ අදාළ මුදල විශ්වාසදායක අයුරින් ඇස්තමේන්තු කළ හැකි වේදැයි යනුවෙන් අනුමානයක් පවතින කල්හිද නෛතික හිමිකම් ඉල්ලා සිටීම සඳහා ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ.

අදාළ මුදලෙහි කාල වටිනාකම හා බැඳි වර්තමාන වෙළඳපොළ තක්සේරුව සහ එකී බැඳියාවට අදාළ වන්නා වූ විශේෂිත අවදානම් පිළිබිඹු වන බදු පූර්ව අනුප්‍රමාණයක් යොදා ගනිමින් එම බැඳියාව නිරවුල් කිරීම සඳහා අවශ්‍යවන්නාවූ අනාගත මුදල් ප්‍රමාණයෙහි වර්තමාන වටිනාකම මත ප්‍රතිපාදනය මිනිනු ලැබේ. කල්ගතවීම නිසා ප්‍රතිපාදනයෙහි සිදුවන වැඩිවීම් පොලි වියදමක් ලෙස හඳුනා ගනු ඇත.

### 2.15 වෙළඳ හා වෙනත් ලැබිම් නියමිත

බොහොමයක් විකුණුම් සිදු කෙරෙනුයේ සාමාන්‍ය ණය කොන්දේසි පදනමක් මතය. ඊට අදාළ ලැබිම් නියමිත තුළ පොලී නොඅදැරේ. සාමාන්‍ය ණය කොන්දේසි ඉක්මවා යමින් ණය විස්තාරණයක් සිදුවන අවස්ථාවකදී සඵල පොලී අනුපාතය උපයෝගි කර ගනිමින් ලැබිම් නියමිත ගණනය කෙරෙනුයේ ක්‍රමක්ෂිත පිරිවැයට අනුවය. එක් එක් රපෝර්තු කාල පරිච්ඡේදය අවසානයේදි වෙළඳ හා වෙනත් ලැබිම් නියමිතවල ධාරණ අගය, අදාළ මුදල් ප්‍රමාණ ආපසු අයකර ගත නොහැකි වෙතැයි යනුවෙන් යම් විෂය නිශ්‍රිත සාක්ෂි පවතීදැයි නිශ්චය කරනු පිණිස සමාලෝචනයට භාජනය කරනු ලැබේ. එසේ පවතීනම්, වහාම ලාභය හෝ අලාභය තුළ දුබලතා අලාභයක් හඳුනා ගනු ඇත.

## 2.16 වෙළඳ ගෙවීම් නියමිත

වෙළඳ ගෙවීම් නියමිත යනු සාමාන්‍ය ණය කොන්දේසි මත වන්නාවූ බැඳීම් වන අතර, ඒ සඳහා පොලී නොදැරේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකයකින් නාමනය කරන ලද වෙළඳ ගෙවීම් නියමිත රපෝර්තු දිනය වන විට පවත්නා විනිමය අනුපාතය යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියලට පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යාවහාර මුදල් විනිමය ලාභ හෝ අලාභ වෙනත් ආදායම තුළ හෝ වෙනත් වියදම් තුළ අන්තර්ගතවේ.

## 2.17 මුදල් හා මුදලට සමාන දෑ

මුදල් හා මුදලට සමාන දෑ යනු දන්නා මුදල් අගයන්ට යුහුසුළුව පරිවර්තනය කළහැකි සහ වටිනාකම හා බැඳි වෙනස්කම්වල සැලකිය නොහෙන අවදානමකට යටත් අතැති මුදල් ද, ඒක්ෂණ තැන්පතු ද, කෙටිකාලීනවූ අතිශය ද්‍රවශීල ආයෝජනද වන්නේය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා, මුදල් හා මුදලට සමාන දෑ තුළ පරිශේෂව පවත්නා බැංකු අයිරා අඩුකරන ලද අතැති මුදලද, බැංකුවෙහි ඇති තැන්පතුද අඩංගු වන්නේය. කෙටිකාලීන කල්පිරීමක් සහිත ආයෝජන එනම්, ඒවා අත්කරගත් දින සිට තෙමසක් හෝ ඊට අඩු ආයෝජනයන්ද සැලකෙනුයේ මුදලට සමාන දෑ ලෙසය.

## 2.18 ප්‍රදාන සහ සහනාධාර

මණ්ඩලය විසින් වත්කම්වලට අදාළ මූල්‍ය ප්‍රදාන, පිරිවැය ලෙස හඳුනා ගනු ලබන අතර, ඒවා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ විලම්බනය කර වත්කම්වල ප්‍රයෝජ්‍ය ආයු කාලය මුළුල්ලේ විස්තීරණ ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ. ලද ප්‍රදානය විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි ක්‍රමක්ෂ කර ඇත්තේ පහත දැක්වෙන පරිදි ය.

| | |
|---|---|
| පරිගණක මෘදුකාංග | 33.33% |
| මෝටර් වාහන | 20% |

ප්‍රදානය ලැබෙනු ඇති බවට සහ සියලුම ඒ හා සම්බන්ධ කොන්දේසි වලට අනුකූල වන බවට සාධාරණ සහතිකයක් ඇති විට ප්‍රදාන හඳුනා ගනු ලැබේ. ප්‍රදානය වියදම් අයිතමයකට අදාළ වන විට, එය, ඒ සඳහා හානි පූරණය කිරීමට අදහස් කරන පිරිවැයට ක්‍රමානුකූල පදනමක් මත ප්‍රදානය ගැළපීමට අවශ්‍ය කාල සීමාව මුළුල්ලේ ආදායමක් ලෙස හඳුනා ගැනේ. ප්‍රදානය වත්කමකට අදාළ වන විට, එය අදාළ වත්කමේ අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා විලම්බිත ආදායමක් ලෙස පිහිටුවා ගැනේ. මණ්ඩලයට මූල්‍ය නොවන ප්‍රදාන ලැබෙන විට, වත්කම සහ එම ප්‍රදානය නාමික ප්‍රමාණවලින් සටහන් කර පහත සඳහන් පරිදි සමාන වාර්ෂික වාරිකවලින් අදාළ වත්කම්වල අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශය වෙත මුදා හරිනු ලැබේ :

ලැබෙන ප්‍රදාන, සංචිත ගිණුමකට බැර කරනු ලැබ පහත දැක්වෙන පරිදි ආදායම් ප්‍රකාශයට ක්‍රමක්ෂය කෙරේ.

| | |
|---|---|
| අයඩීකරණ යන්ත්‍රාගාරය සඳහා ප්‍රදානය | 10% |
| මෝටර් රථය සඳහා ප්‍රදානය | 10% |
| ගොඩනැගිලි සඳහා ප්‍රදාන | 2.5% |
| පොම්පාගාරය සඳහා ප්‍රදානය | 2.5% |

සේවකයින්ට වන්දි ලබා දීම සඳහා ප්‍රදානය - ගෙවනු ලබන වන්දි මුදලින් අඩු කිරීම.

## 2.19 වත්කම් අපහායනය

### 2.19.1 මූල්‍ය වත්කම් අපහායනය

SLFRS 9 අනුව ණයකර ආයෝජන සහ ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලබන වෙනත් මූල්‍ය උපකරණ සඳහා අපේක්ෂිත ණය පාඩු සඳහා මණ්ඩලය ප්‍රතිභාගයන් වාර්තා කරයි.

**ඉදිරි දැක්මක් සහිත අවස්ථා ඇතුළත් කිරීම**

දරණ ලද අලාභ ආකෘතියට ප්‍රති විරුද්ධව, අනාගත අපේක්ෂිත අලාභ SLFRS 9 විසින් හඳුන්වා දෙන ලද අපේක්ෂිත ණය අලාභ ආදර්ශය යටතේ තක්සේරු කිරීමට අවශ්‍යවේ. එයට ඉදිරිය දකින සාර්ව ආර්ථික දත්ත සහ ආයතනයට සෘජුව සම්බන්ධ නොවන උපකල්පන භාවිතය අවශ්‍ය වේ. මෙය ආර්ථික සාධක ගැලපීම හරහා හානිකරණය ගණනය කිරීම තුලට ඇතුළත් කෙරේ.

**ණය සුරැකුම්පත් තුළ අයෝජනය සඳහා අපහායන එළඹුම (FVTPL නොවන)**

බාහිර ණය ශ්‍රේණිගතකරණ දත්ත වෙන්කිරීම් ස්ථාපිත කිරීමට භාවිතා කළ හැකිය. තවද, ණය ශ්‍රේණිගතකරණය පිරිහීම, ප්‍රකාශිත මූල්‍ය සහ වෙනත් තොරතුරු ණය අවාදනම තුළ සැලකියුතු වැඩිකිරීම් තක්සේරු කිරීමට සහ ජීවකාල වෙන්කිරීමක් සිදු කිරීම පිණිස උපකරණ ආයෝජන ශ්‍රේණියක්ද යන්න සමාලෝචනය කළ යුතුව ඇත. බාහිරි ශ්‍රේණිගතකරණ දත්ත නොමැතිකම තුළ, පැහැර හැරී අනුපාත අපේක්ෂිත ණය අලාභ ස්ථාපිත කිරීම පිණිස ව්‍යුහගත ක්‍රම/ ණය විසිරීම්/ ණය ලකුණු භාවිතා කරමින් ස්ථාපිත කළ යුතුව ඇත.

**අපේක්ෂිත ණය පාඩුවල මූලික සංරචක**

- **ගෙවීම් පැහර හැරීමේ සම්භාවිතාව තක්සේරු කිරීම**
  ණයකර, ස්ථාවර තැන්පතු සහ ණය සහ ලැබිය යුතුදේ සඳහා ඓතිහාසික ගෙවීම් පැහැර හැරීමේ දත්ත නොතිබූ හෙයින්, S & P Global Ratings විසින් ප්‍රකාශයට පත්කළ 2018 Annual Gloval Corporate Default Study and Rating Transitioñ හි දත්ත භාවිතා කරන ලදි.

- **පාඩු ඇති කරන පැහැරහැරීම (LGD) තක්සේරු කිරීම**
  ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් SLFRS 9 අදාළ කර ගැනීම සම්බන්ධව බලපත්‍රලාභී බැංකුවලට නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව, දත්ත හෝ ආදාන මඳවීම නිසා බලපත්‍රලාභී බැංකුවකට පාඩු ඇති කරන පැහැර හැරීම් ගණනය කරගැනීමට නොහැකිවූ විට, එවැනි බැංකුවක් එවැනි නිරාවරණයක් සඳහා අවම වශයෙන් සියයට 45 ක පාඩු ඇති කරන පැහැර හැරීම් තක්සේරුවක් යොදාගත යුතුය.

- **ගෙවීම් පැහැර හැරීම් නිරාවරණය (EAD) තක්සේරු කිරීම**
  අපේක්ෂිත ණය අලාභ ආයතනය ණය අලාභයට නිරාවරණය වන කාලසීමාව පුරා මනිනු ලබයි. පැහැර හැරීමේදී වන කාලසීමාව පුරා මනිනු ලබයි. පැහැර හැරීමේදී නිරාවරණය යනු ණය අලාභයට නිරාවරණය වන සමහර මූල්‍ය උපකරණවල අයෝජනය කරන මුදලේ ප්‍රමාණයයි.

  2019 ජනවාරි 1 දින සිට, ක්‍රමක්ෂය පිරිවැයට සහ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට ගෙන යන ණය උපකරණ හා බැඳුණු අපේක්ෂිත ණය අලාභ (ECL) අනාගතය දකින පදනමකින් අරමුදල තක්සේරු කරයි. යොදා ගන්නා හානිකරණ ක්‍රමවේදය ණය අලාභවල සැලැකිය යුතු වැඩිවීමක් තිබේද යන්න රඳා පවතී.

  මණ්ඩලය ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නොමනින ලද පහත සඳහන් මූල්‍ය උපකරණ මත අපේක්ෂිත ණය අලාභ (ECL) සඳහා අලාභ දීමනා හඳුනා ගනී.

  - ලැයිස්තුගත - ණයකර
  - ස්ථාවර තැන්පතු
  - රාජ්‍ය උකස් හා අයෝජන බැංකුව සමඟ ණය යෝජනා ක්‍රම තැන්පතුව
  - ජාතික සංවර්ධන බැංකුව සමඟ ණයයෝජනා ක්‍රමය

**2.19.2 මූල්‍ය නොවන වත්කම් දුබලතාවයට පත්වීම**

කිසියම් වත්කමක් දුබලතාවයට පත්වීමේ ලක්ෂණ පහළවී තිබේදැයි යනුවෙන් සෑම රපෝර්තු දිනකම මණ්ඩලය තක්සේරු කර බලයි. ඒ පිළිබඳව හඟවන යම් කරුණු වේ නම් හෝ කිසියම් වත්කමක් විෂයෙහි වාර්ෂික දුබලතා පරීක්ෂණයක් අවශ්‍ය වේ නම් අදාළ වත්කමෙහි ආපසු අයකර ගතහැකි වටිනාකම මණ්ඩලය විසින් තක්සේරු කරනු ලබයි. වත්කමක ආපසු අයකර ගත හැකි මුදල වන්නේ එම වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි විකුණුම්

පිරිවැය අඩු කළ සාධාරණ අගයෙහි හෝ භාවිත වටිනාකම යන දෙකෙහි ඉහළ අගයයි. වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි ධාරණ වටිනාකම ආපසු අයකර ගත හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම දුබලතාවයට පත්වූ ලෙස සලකා එහි ආපසු අයකර ගත හැකි වටිනාකම ලියා දක්වනු ලැබේ.

භාවිත වටිනාකම තක්සේරු කිරීමෙහිලා ඇස්තමේන්තු කළඅනාගත මුදල් ප්‍රවාහ, අදාළ මුදලෙහි කාලානුරූප වටිනාකමෙහි ප්‍රවර්තන වෙළඳපොළ තක්සේරුව හා අදාළ වත්කමට විශේෂිත වන්නා වූ අවදානම් ප්‍රවර්තන වෙළෙඳපොළ තක්සේරුව පිළිඹිඹු වන බදු පූර්ව වට්ටම් අනුපාතයක් යොදා ගනිමින් ඒවායේ ප්‍රවර්තන අගය අනුව වට්ටම් ගත කෙරේ. සාධාරණ අගයෙන් අඩු කළ විකුණුම් පිරිවැය නිශ්චය කිරීමෙහිලා ප්‍රශස්ත තක්සේරු කිරීමේ ආකෘතියක් යොදාගනු ලැබේ. මෙම ආගනනයන්, තක්සේරුවල බහුවිධ ක්‍රම, ප්‍රසිද්ධ වෙළඳ සමාගම් වල මිල ප්‍රකාශිත කොටස් හෝ පවත්නා වෙනත් සාධාරණ අගය දැක්වීමේ දර්ශක මගින් තහවුරු කෙරේ.

වත්කම් සඳහා පූර්ව වශයෙන් හඳුනා ගන්නා ලද දුබලතා අලාභ තව දුරටත් නොපවතින්නේද නැතහොත් අඩුවී තිබේද යන්න පිළිබඳව තක්සේරුවක් සෑම රපෝර්තු දිනයකදීම සිදු කරනු ලැබේ. එබඳු දැනවුමක් පවතී නම්, අදාළ වත්කමෙහි හෝ මූල්‍ය උත්පාදන ඒකකයෙහි ආපසු අයකරගත හැකි වටිනාකම මණ්ඩලය විසින් ඇස්තමේන්තු කරනු ලැබේ.  අවසන් දුබලතා අලාභය හඳුනා ගන්නා ලද අවස්ථාවේ වත්කමෙහි ආපසු අයකර ගත හැකි වටිනාකම නිර්ණය කිරීමට භාවිතා කරන ලද උපකල්පනයන් හි වෙනසක් පවතින්නේ නම් පමණක් පූර්ව වශයෙන් හඳුනාගන්නා ලද දුබලතා අලාභය අවලංගු කෙරේ. වත්කම සඳහා පූර්ව වර්ෂ තුළ අදාළ දුබලතා ආලභ කිසිවක් හඳුනාගෙන නොතිබියේ නම්, ක්ෂය වීම් අඩු කළ වත්කමෙහි ධාරණ වටිනාකම එහි ආපසු අයකරගත හැකි මුදල ඉක්මවා නොයන අයුරින් හෝ නිශ්චය කරනු ලැබිය යුතුව තිබූ ඊට අදාළ ධාරණ අගය ඉක්මවා නොයන අයුරින් එකී අවලංගු කිරීම සීමා කරනු ලැබේ. එබඳු අවලංගුකිරීම් ආදයම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

## 2.20 ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්කම්

### 2.20.1 ආයෝජනමය දේපළ තක්සේරු කිරීම

ස්වකීය ආයෝජනමය දේපළවල සාධාරණ අගය නිශ්චය කර ගැනිම පිණිස ආයතනය බාහිර තක්සේරු කරුවෙකු ලවා ඒවා හා සම්බන්ධ තක්සේරු කිරීම් ඉටුකරවා ගනියි. මෙම තක්සේරු කිරීම්, අනාගත කුලී ආදායම්, අපේක්ෂිත නඩත්තු පිරිවැය, අනාගත සංවර්ධන වියදම් සහ ප්‍රශස්ත වට්ටම් අනුපාත ඇතුළු උපකල්පන මත පදනම්වී ඇත. මෙහිලා තක්සේරු කරුවා මේ හා සමාන දේපළවල ගණුදෙනු  කිරීමේ මිල ගණන් ආශ්‍රිත වෙළඳ පොළ සාක්ෂි පිළිබඳවද අවධානය යොමු කරයි.

### 2.20.2 මූල්‍ය මෙවලම්වල සාධාරණ අගය

තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රම භාවිතයට ගනිමින් මිල ප්‍රකාශිත නොවූ මූල්‍ය මෙවලම්හි සාධාරණ අගය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබයි. වට්ටම් අනුපාත සහ අනාගත මුදල් ප්‍රවාහවල ඇස්තමේන්තු ඇතුළුව යොදාගනු ලැබ ඇති උපකල්පන මගින් එබඳු ශිල්ප ක්‍රම කෙරෙහි සැලකිය යුතු බලපෑම් ඇති කරයි. එම කාරණයෙහිලා, එලෙස ලබා ගන්නා සාධාරණ අගය පිළිබඳ ඇස්තමේන්තු ස්වාධීන වෙළඳපළ තත්වයන් සමඟ සංසන්දනය කිරීම මගින් සෑම විටම සනාථ කළ නොහෙන අතර බොහෝ අවස්ථාවලදී ඒවා වහා උපලබ්ධි කර ගැනිමේ හැකියාවක්ද නොමැති විය හැකිය.

### 2.20.3 දේපළ, පිරියත හා උපකරණ සඳහා ප්‍රශස්ත ප්‍රයෝජ්‍ය ආයුකාල සහ අවශේෂ අගය

ආයතනය ස්වකීය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුව කටයුතු කරමින් ඉහත අයිතමවල ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ ඒවායේ අවශේෂ  වටිනාකම් වල ඇස්තමේන්තු ප්‍රශස්තව පවතින්නේදැයි වාර්ෂිකව පරීක්ෂා කර බලයි.

### 2.20.4 ව්‍යාපාර සංකලන සහ පාලනමය නොවන සබැඳියා අත්කර ගැනිම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 1997 වර්ෂයේදී සීමාසහිත ලංකා ලුණු සමාගමේ කොටස් වලින් 90% ක්වූ ප්‍රමාණයක් අත්කරගෙන ඇත.  ඒ හා බැඳි කීර්තිනාමයෙහි වටිනාකම රුපියල් 378,926,440 ක් වශයෙන් ගණනය වන අතර එලෙස එම කොටස් අත්කරගත් දිනයේ සිට බලපැවැත්වෙන ගිණුම් පරිචයන් මත පදනම්ව අදාළ අත්කරගත් දිනයේ සිට ආරම්භ වන 05 අවුරුදු කාලසීමාවක් මුළුල්ලේ එකී කොටස් වටිනාකම ක්‍රමක්ෂය වන බව හඟිනු ලැබ ඇත.

මෙම ව්‍යාපාර සංකලනය පිළිබඳ විස්තර පහත දක්වේ.

| | සමූහය | |
|---|---|---|
| | රු. | රු. |
| පවරන ලද ප්‍රතිෂ්ඨාව<br>හඳුනාගත් ශුද්ධ වත්කම් වල පිළිගන්නා ලද<br>වටිනාකමෙහි සමානුපාතික කොටස | | 470,960,938 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 31,500,000 | |
| සංචිත | 60,534,498 | 92,034,498 |
| **කීර්ති නාමය** | | **378,926,440** |

කීර්ති නාමය පූර්ණ වශයෙන් ක්‍රමක්ෂය කරනු ලැබ තිබූ හෙයින්, සමාලෝචනයට භාජනය වන වසර තුළ ගිණුම් ද්වයම වෙනුවෙන් ගැළපුම් කිසිවක් නොවීය.

## 3. සාමාජික අරමුදලට කළ ගැළපුම්

### 3.1 2024 සාමාජික අරමුදලට කළ ගැළපුම්

| | රු. |
|---|---|
| ගෙවනු ලැබූ දායක මුදල් සඳහා අධිභාර | 748,624.69 |
| දායක මුදල් (C/A 150) | 168,288.91 |
| වැඩිපුර ගෙවන ලද ආපසු ගෙවීම් | (1,774,197.86) |
| ගෙවන ලද දායක මුදල් සඳහා අධිභාර | (2,700,370.31) |
| **එකතුව** | **(3,557,654.57)** |

| | | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | සටහන | 2024 | 2023 | 2024 | 2023 |
| | | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **4** | **පොළී ආදායම** | | | | | |
| | පරිනත වීම තෙක් රඳවාගත් මූල්‍ය ආයෝජන | 4.1 | 62,194,449 | 64,834,198 | 61,819,095 | 64,380,505 |
| | | | **62,194,449** | **64,834,198** | **61,819,095** | **64,380,505** |
| | | | | | | |
| **4.1** | **පරිනත වීම තෙක් රඳවාගත් මූල්‍ය ආයෝජන** | | | | | |
| | ස්ථාවර තැන්පත් පොළී | | 421,675 | 563,082 | 52,714 | 113,593 |
| | ණයකර පොළී | | 674,976 | 868,109 | 674,976 | 868,109 |
| | භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රතිලාභ | | 56,742,181 | 54,641,660 | 56,742,181 | 54,641,660 |
| | භාණ්ඩාගාර බිල්පත් මත ආන්තිකය | | 3,728,228 | 8,260,737 | 3,728,228 | 8,260,737 |
| | ප්‍රතිමිලදී ගැණුම් ගිවිසුම් පොළී | | 537,942 | 403,480 | 537,942 | 403,480 |
| | මුදල් වෙළඳපොළ පොළී | | 3,712 | 4,588 | 3,712 | 4,588 |
| | වියන නිවාස ණය පොළී | | 51,536 | 60,136 | 51,536 | 60,136 |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නිවාස ණය පොළී | | 9,297 | 8,940 | 9,297 | 8,940 |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ තැන්පතුව මත පොළී | | 473 | 489 | 473 | 489 |
| | **සේවක ණය** | | | | | |
| | විශේෂ ණය මත පොළිය | | 1,120 | 1,103 | 1,120 | 1,103 |
| | වාහන ණය මත පොළිය | | 7,550 | 8,469 | 7,550 | 8,469 |
| | විශේෂ ආපදා ණය මත පොළිය | | 15,398 | 13,184 | 9,006 | 8,980 |
| | විශේෂ උත්සව ණය මත පොළිය | | 361 | 219 | 361 | 219 |
| | විශේෂ අත්තිකාරම් මත පොළිය | | 1 | 1 | 1 | 1 |
| | | | **62,194,449** | **64,834,198** | **61,819,095** | **64,380,505** |
| | | | | | | |
| **5** | **ශුද්ධ වෙළඳ ආදායම** | | | | | |
| | ශුද්ධ ආදායම | 5.1 | 3,450,552 | 4,022,659 | - | - |
| | (-) විකුණුම් පිරිවැය | | (2,175,081) | (1,873,746) | - | - |
| | | | **1,275,472** | **2,148,913** | **-** | **-** |
| | | | | | | |
| **5.1** | **ශුද්ධ ආදායම** | | | | | |
| | දළ ආදායම | | 4,071,652 | 4,626,058 | - | - |
| | (-) එකතුකළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බද්ද | | (621,099) | (603,399) | - | - |
| | | | **3,450,552** | **4,022,659** | **-** | **-** |
| | | | | | | |
| **6** | **ලාභාංශ ආදායම** | | | | | |
| | කොටස් මත ලාභාංශ - ලැයිස්තුගත | | 955,397 | 894,331 | 955,397 | 894,331 |
| | කොටස් මත ලාභාංශ - ලැයිස්තුගත නොවන | | 539,065 | 315,000 | 539,065 | 315,000 |
| | | | **1,494,462** | **1,209,331** | **1,494,462** | **1,209,331** |
| | | | | | | |
| **7** | **ලාභ හෝ අලාභ හිණුම හරහා මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/ (අලාභ)** | | | | | |
| | මිල ප්‍රකාශිත කොටස් විකිණීමෙන් ලාභ | | 1,143,331 | 324,878 | 1,143,331 | 324,878 |
| | කොටස් මත සාධාරණ වටිනාකම ගැලපීම | | 896,887 | 1,203,482 | 896,887 | 1,203,482 |
| | | | **2,040,218** | **1,528,360** | **2,040,218** | **1,528,360** |

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | | සටහන | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2024 | 2023 | 2024 | 2023 |
| | | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **8** | **වෙනත් ආදායම** | | | | | |
| | රජයේ ප්‍රදානය ක්‍රමක්ෂය කිරීම | | 5,329 | 4,535 | 3,617 | 2,823 |
| | කුලී ආදායම | | 1,996 | 1,917 | 320 | 300 |
| | ලිබඩු සහ උපකරණ විකිනීම මත ලාභය | | - | 4,380 | - | 4,380 |
| | අධිභාර | | 560,922 | 598,028 | 560,922 | 598,028 |
| | සේවක ණය ආදායම | | 31,576 | 34,151 | 31,576 | 34,151 |
| | විවිධ ආදායම | | 18,739 | 59,338 | 2,698 | 847 |
| | රථගාලෙන් ලද ලාභය/ (පාඩුව) නවම් මාවත | | 37,915 | 37,568 | 37,915 | 37,568 |
| | නිවාඩු නිකේතනයෙන් ලද ලාභය/ (අලාභය) | | (2,915) | (3,614) | (2,915) | (3,614) |
| | ප්‍රවාහන අයකිරීම් | | 16,507 | 20,618 | - | - |
| | | | **670,069** | **756,921** | **634,132** | **674,482** |
| **9** | **කාර්ය මණ්ඩල වියදම්** | | | | | |
| | වැටුප් හා වේතන | 9.1 | 867,526 | 778,965 | 765,481 | 699,730 |
| | කොටිකාලින මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභ | 9.2 | 671,235 | 988,609 | 455,649 | 461,419 |
| | නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම | 9.3 | 70,126 | 51,463 | 53,950 | 48,334 |
| | වෙනත් දිගුකාලීන සේවක ප්‍රතිලාභ | 9.4 | 157,795 | 121,797 | 125,535 | 114,623 |
| | | | **1,766,683** | **1,940,835** | **1,400,616** | **1,324,106** |
| **9.1** | **වැටුප් හා වේතන** | | | | | |
| | **සේවක පිරිවැය (අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු ඇතුළුව)** | | | | | |
| | වැටුප් | | 628,870 | 634,934 | 533,429 | 562,996 |
| | අධ්‍යක්ෂක ගාස්තු | | 3,508 | 3,367 | 1,570 | 1,817 |
| | ජීවන වියදම් දීමනාව | | 163,397 | 82,437 | 163,397 | 82,437 |
| | ආහාර දීමනාව | | 11,941 | 12,898 | 11,941 | 12,898 |
| | අතිකාල | | 43,551 | 33,164 | 38,885 | 27,417 |
| | නිවාඩු දින ගෙවීම් | | 16,260 | 12,165 | 16,260 | 12,165 |
| | | | **867,526** | **778,965** | **765,481** | **699,730** |
| **9.2** | **කෙටි කාලීන මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභ** | | | | | |
| | පුහුණු සහ සංවර්ධන වියදම් | | 4,803 | 6,647 | 4,393 | 6,163 |
| | බඳවා ගැනීමේ වියදම් | | 600 | 405 | 600 | 405 |
| | සේවක සුභසාධනය | | 85,929 | 71,168 | 49,390 | 41,454 |
| | දිරිදීමනා | | 142,578 | 132,183 | 141,870 | 131,941 |
| | ලබානොගත් නිවාඩු සඳහා ගෙවීම් | | 19,489 | 28,144 | 19,489 | 28,144 |
| | ප්‍රසාද දීමනා | | 253,767 | 575,964 | 78,113 | 80,801 |
| | වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය | | 118,858 | 128,612 | 116,584 | 128,197 |
| | සේවක ණය පිරිවැය | | 31,576 | 34,151 | 31,576 | 34,151 |
| | නිවාස ණය මත පොළී | | 7,015 | 8,963 | 7,015 | 8,963 |
| | සේවක වන්දි | | 6,619 | 1,173 | 6,619 | - |
| | සේවක අනතුරු වන්දි යෝජනා ක්‍රමය | | - | 1,200 | - | 1,200 |
(ඇ) නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් මණ්ඩලයේ කාර්යයන් හා සේවාවන්හි කාර්යක්ෂමතාව හා ඵලදායිතාවය වැඩි කිරීම සඳහා මණ්ඩලය හා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය අතර 2016 නොවැම්බර් 27 දින ගිවිසුමකට එළඹ 2021 ඔක්තෝබර් ව්‍යාපෘති කටයුතු නිම කිරීමට සැලසුම් කර තිබුණි. සැලසුම් කාලය වරින්වර සංශෝධනය කර තිබූ නමුත් 2025 අප්‍රේල් මස වන විටත් ව්‍යාපෘති කටයුතු නිමකර සජීවී මෙහෙයුම් ක්‍රියාවලිය බවට පත්කරගැනීමට නොහැකි වී තිබුණි. එමෙන්ම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ඉතා අත්‍යවශ්‍යයැයි හඳුනාගනු ලැබූ දෘඩාංග මිලදී ගැනීම වෙනුවෙන් රු.මිලියන 145.7 ක් වැය දරා තිබුණද, ඉන් රු.මිලියන 18.6 ක් වටිනා උපකරණ 2025 මාර්තු මස අවසානය වන විටත් ගබඩාවේ නිෂ්කාර්යව රඳවා තිබුණි. සේවා ඒකක පිහිටුවීම දැනට පවතින පද්ධතියෙන් නව පද්ධතියට නිවැරදි දත්ත මාරු කිරීම් කටයුතු, විභජනය නොවූ දායක මුදල් හා Lanka Clear සම්බන්ධ කටයුතු නිමකර අරමුණු ඉටුකර ගැනීමට මණ්ඩලය මේ දක්වා අපොහොසත් වී තිබුණි.

(ඈ) ප්‍රාදේශීය කාර්යාලයක් ඉදි කිරීම සඳහා මණ්ඩලය විසින් කරන ලද ඉල්ලීමකට අනුව ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිරිබෝපුර 90 ග්‍රාම නිලධාරී වසමේ හෙක්ටයාර 0.1012 ක්රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධියට පත්කර මණ්ඩලය වෙත පවරා දී තිබුණි. ඉඩම වෙනුවෙන්2020 සිට 2024 වර්ෂය දක්වා වාර්ෂිකව රු.240,000 බැගින් බදු මුදල් ගෙවීම් කර තිබුණද, අදාල අරමුණ ඉටුකර කරගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ඉ) 2006 වර්ෂයේ සිට චෙක්පත් එකතු කිරීමේ පහසුකම් ලබාදීම වෙනුවෙන් ලංකා බැංකුව හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය අතර වූ එකඟතාවය අනුව රු.මිලියන 10 ක් ප්‍රතිමිලදී ගැනුම්වල හා රු.මිලියන 490 ක් ස්ථාවර තැන්පතු ලෙස රු.මිලියන 500 ක් ආයෝජනය කර තිබුණි. ලංකා බැංකුවේ වසර 10 කට අධික කාලයක් තිස්සේ පවත්වාගෙන යනු ලබන මෙම තැන්පතු සම්බන්ධයෙන් ඉහල ප්‍රතිලාභ අනුපාතයක් මණ්ඩලය වෙත ලබාගැනීම සඳහා ගිවිසුම් සංශෝධනය කර ගැනීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.3. වෙනත් කරුණු

(අ) නවම් මාවත වාහන නැවතුම්කරුවන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු හිඟ බදු මුදල රු.මිලියන 6.79 ක් වූ අතර මේ තුළ 2016 සිට 2024 වර්ෂය දක්වා කාල පරාසයට අයත් ආයතන 63 කින් අයවිය යුතු මුදල රු.මිලියන 3.65 ක් විය. නැවතුම්කරුවන්සමඟ ගිවිසුම්වලට එළඹීමට මණ්ඩලය කටයුතු කර නොතිබීම හේතුවෙන් විධිමත්ව හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ගයන් ගැනීමට බාධාවක් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) මණ්ඩලය විසින් 1994 වර්ෂයේ දී සියයට 14.48 ක ස්ථාවර පොළී අනුපාතයක් යටතේ වැවිලි සමාගමක කරන ලද රු.මිලියන 15 ක ණයකර ආයෝජනය වෙනුවෙන්2024 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු හිඟ පොළී මුදල රු.මිලියන 26.29 ක් විය. මේ සම්බන්ධයෙන් අදාල ආයතන හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මැදිහත් වීම මත කරන ලද සාකච්ඡා අනුව හිඟ මුදල මණ්ඩලයට ගෙවීමට

පියවර ගන්නා ලෙස නියම කර තිබුණද, 2025 මැයි මස වනවිටත් මෙම මුදල් අයකර ගැනීමේ නිශ්චිත තහවුරුවක් නොතිබුණි.

(ඇ) 2002 හා 2007 වර්ෂවල දී කල්පිරීමට යටත්ව සමාගමක පොරොන්දු නෝට්ටුවල හා ණයකරවල ආයෝජනය කර තිබූ පිළිවෙලින් රු.මිලියන 12.17 ක් හා රු.මිලියන 7.45 ක් සඳහා අයවිය යුතු පොළී මුදල් ප්‍රමාණය රු.මිලියන 15.58 ක් විය. මෙම ආයතනය ඇවර කිරීම සඳහා දිසා අධිකරණයේ නියෝග ලබා දී තිබුණද, 2025 මැයි වන විටත් මෙම මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නිශ්චිත තහවුරුවක් මණ්ඩලයට නොතිබුණි. මේ නිසා සාමාජිකයන් වෙත ගෙවිය යුතු රු.මිලියන 15.58 ක ප්‍රතිලාභ අඩු වී තිබුණි.

(ඈ) 2016 අගෝස්තු 26 පැවති ගිණුම් කාරක රැස්වීමේ දී ලබා දී තිබූ පහත නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ වී නොතිබුණි.

(i) මණ්ඩලය රජයේ සුරැකුම්පත්වල අරමුදල් ආයෝජනය කරන ප්‍රධාන පෙළේ ආයතනයක් වුවද, සුරැකුම්පත් වෙන්දේසි වලදී සෘජුවම මිල ගණන් ඉදිරිපත් කිරීමේ පහසුකම (Direct Bidding Facility) ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු ලෙස ලියාපදිංචි වීම.

(ii) මණ්ඩලයේ සාමාජික අරමුදලේ ආයෝජන කළමණාකරන කටයුතු සඳහා වරලත් මූල්‍ය විශ්ලේෂක තනතුරට ස්ථිර නිලධාරියෙකු කඩිනමින් පත් කරගැනීම.

(iii) සංස්ථාපිත පනත අනුව මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරි මණ්ඩලයේ සභාපති වන නමුත්, මූල්‍ය කටයුතු සම්බන්ධ ආයතනයක් ලෙස මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරි එහි සභාපති විය යුතු බවට වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 5 (2) වගන්තිය සංශෝධනය කිරීම.

(ඉ) මණ්ඩලයේ මූල්‍ය අංශයේ මෙහෙයුම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව, ඵලදායිතාවය වර්ධනය කිරීම සහ ගිණුම්කරණ ක්‍රියාවලිය මණ්ඩලයේ අපේක්ෂිත හරයාත්මක පද්ධති (Core System) ව්‍යාපෘති සමඟ අන්තර්ග්‍රහණය කිරීමේ අරමුණින් මණ්ඩලය ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය හා පුද්ගලික සමාගමක් අතර ත්‍රෛපාර්ශික ගිවිසුමකට එළඹ තිබුණි. 2021 අගෝස්තු ගිවිසුම් කාලය අවසන් වී 2022 අගෝස්තු දක්වා වසරක නඩත්තු හා සේවා කටයුතු ලබාදීමට එකඟ වී තිබුණ ද ගිවිසුම් කාලය නිමා වීමෙන් පසු සහයක හා නඩත්තු ගිවිසුමකට එළඹීම 2025 පෙබරවාරි 27 දින සිදුකර තිබුණි. 2024 වර්ෂයේ දීගිණුම්කරණ පද්ධතිය ආශ්‍රිත ගැටළුකාරී තත්ත්වයන් වෙනුවෙන් රු.705,820 ක මුදලක් අදාල සමාගම වෙත අමතර වැය දැරීමක් කිරීමට ද මණ්ඩලයට සිදුවී තිබුණි. 2022 සිට 2024 වර්ෂය දක්වා මෘදුකාංග භාවිතය වෙනුවෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තු ලෙස රු.මිලියන 5.65 ක මුදලක් ද ගෙවීම් කර තිබුණි. ව්‍යාපාර අරමුණ වූ හරයාත්මක පද්ධතිය සමඟ ඒකාබද්ධ කිරීමේ කටයුතුමේ දක්වා සම්පූර්ණයෙන් ඉටුකර ගෙන නොතිබුණි.

(ඊ) නාරාහේන්පිට විශේෂ ආර්ථික මධ්‍යස්ථානයේ කුලී පදනමින් පවත්වාගෙන යනු ලබන මණ්ඩලයේ ලේඛනාගාරය සඳහා ගෙවිය යුතු හිඟ මුදල රු.මිලියන 6.4 ක් වූ අතර 2022 අප්‍රේල් සිට මේ දක්වා විධිමත් කුලී ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.

(උ) මණ්ඩලයේ සේවයෙන් ඉවත්වී ඇති නිලධාරීන් 14 දෙනෙකුට ලබා දී ඇති ආපදා හා වාහන ණය මුදලින් රු.මිලියන 5.5 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ජී.එච්.ඩී.ධර්මපාල.
විගණකාධිපති (වැ.බ.)

2024 විගණකාධිපති වාර්තාව

**සම්බන්ධයෙන්**

**කළමණාකාරිත්වයේ**

**අදහස් දැක්වීම**

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සහ එහි පාලිතයෙහි 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවේ ඇතුලත් කරුණු සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**

## 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 1981 වර්ෂයේ සිට 2023 වර්ෂය අවසානය දක්වා විභජනය නොකරන ලද දායක මුදල්වල එකතුව රු.මිලියන 597 වුවත් එමගින් 1981-2014 දක්වා කාලපරිච්ඡේදයට අදාලව විභජනය නොකළ ශේෂය රු.මිලියන 14.547 වන අතර මෙම ශේෂය ප්‍රධාන වශයෙන් සේවායෝජක ආයතන 03කට අදාලව වේ.

| S/N | Employer No. | Employer Name | Amount (Rs.) |
|---|---|---|---|
| 01 | M 618 | Sri Lanka Sugar Corporation, Hingurana. | 10,222,460.48 |
| 02 | F 2926 | Terre Des Hommes, Nuwara Eliya. | 229,931.00 |
| 03 | B 30440 | Excel Apparel (Pvt) Ltd., Boralesgamuwa. | 83,443.50 |
| | | **Total** | **10,535,834.98** |

මෙකී සේවායෝජක ආයතන පිළිවෙලින් මීට වසර 35කට, වසර 31ට සහ වසර 17කට පෙර වසා දමා තිබෙන ආයතන වූ බැවින් එම මුදල් විභජනය සඳහා සාමාජික විස්තර අප සතුව නොමැති අතරම ඉහත සේවායෝජක ආයතනවලින් ලබාග ැනීමේ හැකියාවක් නොමැති බැවින් 1981-2014 කාලපරිච්ඡේදයට අදාල විභජනය නොකරන ලද මුදල් තාවකාලිකව අවහිර කිරීමට කටයුතු කරන ලදි.

2025.06.13 දිනට 2015-2023 කාලපරිච්ඡේදයට අදාල විභජනය නොකරන ලද දායක මුදල්වල එකතුව රු.මිලියන 535 දක්වා අඩු වී තිබෙන අතර සක්‍රීය ආයතනවලට අදාලව සාමාජික තොරතුරු ලබාදී නොමැති සේවායෝජකයන්ගෙ න් එක් එක් ලැබීම්වලට අදාලව විස්තර ප්‍රාදේශීය කාර්යාලවලට ලබාදී තිබෙන හෙයින් ඉදිරියේදී මෙම ශේෂයන්ගේ අඩුවීමක් අපේක්ෂා කරනු ලැබේ. තවද, ඉහත කාලයට අදාලව අක්‍රීය සේවායෝජක ආයතනවල සේවායෝජකයින් විසින් මහා බැංකුවේ සේවක අර්ථසාධක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද "C" වාර්තා අප විසින් ඉල්ලා තිබෙන අතර එමගින් සේවායෝජකයන් 150කට අදාලව "C" වාර්තා 790ක් පමණ අපවෙත ලබාදී තිබේ.

2025.06.13 දිනට යථෝක්ත "C" වාර්තා 250ක පමණ ආකෘති II වාර්තා සකස් කර තිබෙන අතර එම වාර්තා පරික්ෂා කර Header ඇතුලත් කර දත්ත පරිගණකගත කිරීමෙන් පසුව එම මුදල් විභජනය කර අදාල සාමාජික ගිණුම්වලට බැර කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) හඳුනාගත නොහැකි දායක මුදල් සම්බන්ධයෙන් වූ සාමාජිකයන්ගේ නම සහ හැඳුනුම්පත් අංකය සහිතව පවතින සාමාජික ගිණුම් 212න් සාමාජික ගිණුම් 3කට අදාලව සාමාජිකයාගේ නම ඇතුලත් කර තිබේ.
Y/9274/80500 - අදාල සාමාජිකයාට දායක මුදල් බැර කර ඇත. (සා. අංකය. 1220)
A-15892-07
A-28833-65

තවද මෙම සාමාජික ගිණුම් 212න් අක්‍රීය සේවායෝජක ආයතන 37කට අදාල සාමාජික ගිණුම් 65ක් ඇති අතර සක්‍රීය සේවායෝජක ආයතන 30කට අදාල සාමාජික ගිණුම් 147ක් ඇත. මෙම සාමාජික ගිණුම් 212න් 90%ක් පමණ 2002ට පෙර සේවායෝජකයින් විසින් ගෙවන ලද දායක මුදල් බැවින් මෙම සාමාජික මුදල් බැරවිය යුතු නිවැරදි සාමාජිකයින්ගේ තොරතුරු සොයා ගැනීමට හැකියාවක් නොමැත. මීට පෙර අවස්ථා කිහිපයකදී සක්‍රීය සේවායෝජක ආයතන වෙත දුරකථන ඇමතුම් ලබාදී තොරතුරු ලබාගැනීමට උත්සහ කළද එම තොරතුරු ඔවුන් සතුවද නොමැති බව පවසන ලදි.

තවද මෙම සක්‍රීය ආතනවලට අදාල නම සහ වලංගු හැදුනුම්පත් අංකය රහිත සාමාජික ගිණුම්වල සදහන් සාමාජික අංකවලින් සාමාජික අංක 136ක් අප විසින් ලබාදී ඇති තාවකාලික අංක බැවින්ද සේවායෝජක වෙතින් එම තොරතුරු ලබාගැනීමට අපහසුය. එමෙන්ම 2009 වර්ෂයට පෙර ආකෘති ii වාර්තා සාමාජික සේවා කොට්ඨාශය විසින් ඉවත් කර ඇති බැවින් මෙම සාමාජිකයින්ගේ තොරතුරුද සොයාගත නොහැකිය.

එබැවින් මෙම ගිණුම් අක්‍රීය ගිණුම් බවට පත්කර යම් අවස්ථාවක අදාල සාමාජිකයාගේ සනාථ කළහැකි තොරතුරු ඉදිරිපත් කළහොත් එම ගිණුම නැවත සක්‍රීය කර මුදල් ගෙවීමටත්, සනාථ කළ හැකි ලේඛණ අදාල සාමාජිකයා හෝ සේවායෝජක විසින් ඉදිරිපත් කළහොත් එම සාමාජික ගිණුම්වල නම් ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ.

(ඇ) ඇතැම් සේවායෝජකයන් දායක මුදල් මණ්ඩලය වෙත ප්‍රේෂණය කර ඇතත් එම ගෙවීම් කරන ලද සේවායෝජකයන් පිළිබඳ විස්තර නියමිත පරිදි නොලැබීම හේතුවෙන් හඳුනාගැනීමට නොහැකි මුදල් V 100 හා V 999 අවිනිශ්චිත ගිණුම්වලට ගිණුම්ගත කොට සේවායෝජක තොරතුරු ලබාගැනීමෙන් පසු අදාල ගිණුම්වලට මාරුකිරීම සිදුකෙරේ. පරිගණක පද්ධතිය මගින් ලබාගත් අවිනිශ්චිත ගිණුම් යටතේ වාර්තා කර ඇති සේවායෝජක විස්තර පහත පරිදි වේ.

V 100 හා V 999 ගිණුම්ගත කර ඇති ශේෂයන් පිළිබඳ තොරතුරු

i. 2024.12.31 දිනට දායක මුදල් අවිනිශ්චිත ගිණුම්වලට අදාල තොරතුරු පහත පරිදි වේ.

| ගිණුම් ගණන | 2024.12.31 දිනට ශේෂය (රු) |
|---|---|
| 02 | 6,616,156.52 |

ii. 2024.12.31 දිනට වයස් විශ්ලේෂණය

| වර්ෂය | දායක මුදල (රු) | අධිභාර මුදල (රු) |
|---|---|---|
| 1982 | 333,758.40 | |
| 1983 | 346,376.38 | |
| 1984 | 316,512.62 | |
| 1985 | 62,374.00 | |
| 1986 | 522,207.80 | |
| 1987 | 152,798.57 | |
| 1988 | 1,055,049.72 | |
| 1989 | 139,706.38 | |
| 1991 | 976.73 | |
| 1992 | 215.78 | |
| 1994 | 238.67 | |
| 1995 | 120.00 | |
| 1996 | 934,299.89 | |
| 1997 | 932,033.66 | |
| 1998 | 137,581.19 | |
| 1999 | 125,079.64 | 793.20 |
| 2000 | 566,905.58 | 52,601.98 |
| 2001 | 301,057.94 | 18,772.22 |
| 2002 | 55,752.45 | |
| 2003 | 69,385.58 | |
| 2004 | 81,288.15 | 11,311.98 |
| 2006 | 2,000.00 | |
| 2020 | 306,694.90 | |
| 2021 | 66,517.00 | |
| 2022 | 16,200.00 | |
| | **6,525,131.03** | **91,025.49** |

එම මුදල් අතුරින් 2020ට පසු සේවායෝජකයින් විසින් බැංකුගත කර තිබූ රු.389,411.90ක් වූ මුදලට අදාල ගෙවීම් විස්තර වරින්වර සේවායෝජකයින් විසින් සපයනු ලබන අතර අදාල අවස්ථාවන්වලදී එම ගෙවීම් V999 ගිණුමේ සිට නිවැරදි සේවායෝජක ගිණුම්වල ගිණුම්ගත කිරීම සිදුකරනු ලැබේ.

එහෙත් 2006 වසරට පෙර සිදුකර ඇති රු.6,226,744.62ක් වූ බැරකිරීම් මේ වනවිට හඳුනාගත නොහැකි බැවින් හා ඒ සම්බන්ධ ඉල්ලීම් සිදුනොවන බැවින් එම මුදල් ඉවත්කිරීම සඳහා වන අනුමැතිය ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මගින් ලබාගැනීමෙන් අනතුරුව ඉවත්කිරීම සිදුකිරීමට නියමිතය.

**2.2.2**

(අ) 2022 දෙසැම්බර් 22 දිනැති අංක 2311/39 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව සාමාජිකයන් 15ට වැඩි සේවකයින් සහිත සේවායෝජකයන් ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් මණ්ඩලයට දායක මුදල් ගෙවීම අනිවාර්ය කර ඇති බැවින් ඒ සඳහා සේවායෝජකයන් යොමුකිරීම සඳහා අවශ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් සාමාජික සේවා කොට්ඨාශය, ප්‍රාදේශීය කාර්යාල මගින් සහ දායක මුදල් රැස්කිරීමේ අංශය මගින් පවත්වන ලදි.

2023 වර්ෂයට අදාලව සක්‍රීය සහ අක්‍රීය ආයතනවලට අදාලව ආකෘති ii වාර්තා 1353ක් සේවායෝජක ආයතන වෙතින් නොලැබීම මත විභජනය කිරීමට නොහැකිව පැවැති දායක මුදල් ශේෂය රු.මිලියන 112ක් දක්වා අඩු වී තිබේ. 2025.05.14 දිනට රු.මිලියන 117ක් පැවැති අතර 2025.06.13 දිනට ප්‍රගතිය රු.මිලියන 05කි.

2015 - 2022 අතර සක්‍රීය සහ අක්‍රීය සේවායෝජක ආයතනවලට අදාල ආකෘති ii වාර්තා 2,833ක් තවදුරටත් ලැබිය යුතු අතර ඒ තුල විභජනය කිරීමට ඇති දායක මුදල් ප්‍රමාණය රු.මිලියන 148ක් දක්වා අඩු වී තිබුණෙන් ප්‍රගතිය රු.මිලියන 23කි.

දායක මුදල් විභජනය කිරීම සඳහා සක්‍රීය සේවායෝජක ආයතනවලට අදාල ලැයිස්තු සකස් කර සියලු ප්‍රාදේශීය කාර්යාල වෙත යොමුකර තිබෙන අතර, එම ප්‍රාදේශීය කාර්යාල මගින් මේ වනවිට වාර්තා ලබාදෙමින් පවතින අතර ඉදිරියේදි ඉතිරි වාර්තා ලැබීමට නියමිතය.

අක්‍රීය සේවායෝජක ආයතනවල ආකෘති ii වාර්තා ලබාගැනීම සඳහා මහා බැංකුවේ සේවක අර්ථසාධක දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කරනු ලැබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සේවායෝජක ආයතන 150කට අදාල "C" වාර්තා 790ක් පමණ අපවෙත ලැබී තිබුණෙන් ආකෘති ii වාර්තා නොලැබීම මත විභජනය කිරීමට නොහැකිව ඉතිරි වී තිබූ දායක මුදල් විභජනය කරමින් අදාල සාමාජික ගිණුම් වෙත බැර කිරීමට කටයුතු කරමින් සිටියි.

(ආ) i. ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් ලැයිස්තුවෙහි රු.744,665/-ක් වූ වටිනාකමට අදාල චෙක්පත් 16 පිළිබඳව සවිස්තරාත්මක පැහැදිලි කිරීම් ඇමුණුමෙහි දැක්වේ.

ii. මුදල් රෙගුලාසි 756 (6) ප්‍රකාරව 2024 වර්ෂයට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2025 අප්‍රේල් මස 04 වන දින ආරම්භ කරන ලදි. මුදල් අංශයේ නිලධාරින්ගේ තනතුරු පුරප්පාඩු පවතින බැවින් භාණ්ඩ සමීක්ෂණ කටයුතු ප්‍රමාද වුවද මේ වනවිට අවසන් අදියරේ පවතින බැවින් භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ජූලි මස 15 වෙනි දිනට ප්‍රථම ලබාදීමට කටයුතු කරනු ලැබේ.

එමෙන්ම 2023 වර්ෂයට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙන් අනාවරණය වූ ඌණතා හා අතිරික්තතාවයන්ට අදාල ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවද ජූලි මස 15 වෙනි දිනට ප්‍රථම ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන්ද අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.

iii. මණ්ඩලය දැනට භාවිතා කරනු ලබන ධාවන සටහන් පොතක් සාමාන්‍යයෙන් මාස 3ක් පමණ වූ කාලපරිච්ඡේදයක් භාවිතා කරනු ලබන අතර එක් ලිත් මාසයක් අවසන්වීමෙන් පසුව එළඹෙන මාසයේදී නව ධාවන සටහන් පොතක් ලබාදීම සිදුනොකරයි. ඒ අනුව සෑම මාසයක් අවසානයේදීම වාහන ධාවන සටහන් පොත් ප්‍රවාහන අංශය වෙත නොලැබේ. මින් ඉදිරියට අපවෙත ලැබෙන ධාවන සටහන් පොත් සාරාංශ සම්පූර්ණ කිරීමෙන් අනතුරුව යොමුකිරීමට කටයුතු කරමි.

(ඇ) i. වාහන වල ඉන්ධන දහනය පරීක්ෂාව සඳහා අප මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරි (පරිපාලන හා මානව සම්පත්)ගේ ප්‍රධානත්වයෙන් ත්‍රිපුද්ගල අභ්‍යන්තර කමිටුවක් පත්කර ඇති අතර, ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත වාහනවල ඉන්ධන පරිභෝජනය මේ වනවිට පරීක්ෂා කර අවසන් කර තිබෙන මුත් ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත වාහනවලට අදාල පරීක්ෂාව දනික රාජකාරි බහුලවීම නිසා සිදුකිරීමට නොහැකි වී ඇති අතර හැකි ඉක්මනින් අදාල කටයුතු සිදුකිරීමට කටයුතු කරන්නෙමු.

ii. මණ්ඩලීය රථ සඳහා ඉන්ධන සපයනුයේ රියදුරු සමග, ලියාපදිංචි පිරවුම්හලක් වෙත නිලධාරි මහතකු ගොස් ඉන්ධන සම්පූර්ණ ලෙස පිරවීම මගිනි. එහිදී රියදුරු වෙත වවුචරයක් ලබාදී රථයේ ඉන්ධන හා ධාවනය කළ දුර තුලනය කිරීම සිදුනොවේ. එසේ කළහොත් ඉන්ධන පිරවීමේදී යොදන ඉන්ධන ප්‍රමාණය හා ගණනය කළ ඉන්ධන ප්‍රමාණය අතර පරස්පරතාවයක් ඇතිවේ.

### 2.2.3

(අ) 1993 අංක 18 දරන සංශෝධිත පනතින් 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් (මෙහි මින්මතු "පනත" පනුවෙන් හඳුන්වනු ලබන) පනතේ 37 (අ) වගන්තියේ පහත පරිදි ප්‍රතිපාදන සලස්වා ඇත.

37 (අ) දායක මුදල්වලට අදාල වාර වාර්තාවක් සපයන ලෙස මේ පනතින් හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝග යකින් හෝ මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ යම් විධානයකින් නියම කරනු ලැබූ සේවායෝජකයකු එකී පනතේ, නියෝගයේ හෝ විධානයේ සඳහන් කාලසීමාව ඇතුලත ඒ වාර්තාව සැපයීම පැහැර හැරියහොත් හෝ සාවද්‍ය හෝ අසම්පූර්ණ වාර්තාවක් සැපයුවහොත් සහ එකී කාලසීමාව ඇතුලත අවස්ථාවෝචිත පරිදි ඒ වාර්තාව සැපයීම පැහැර හැරීමට හෝ සාවද්‍ය හෝ අසම්පූර්ණ වාර්තාවක් සැපයීමට හේතුව මණ්ඩලයට ඒත්තු යන පරිදි, නැතහොත් තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ නිලධරයකුට ඒත්තු යන පරිදි දැක්වීමට ඒ සේවායෝජකයාට නොහැකි වුවහොත් ඒ වාර්තාව සැපයිය යුතු වන්නේ යම් දිනයකදීද, නැතහොත් යම් දිනයකට පෙරද, එදින සිට යථා පරිදි සම්පූර්ණ සහ නිරවද්‍ය වාර්තාවක් මණ්ඩලය වෙත ලැබෙන දිනය දක්වා කාලය වෙනුවෙන් ඒ වාර්තාවට සම්බන්ධ දායක මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් සෑම සම්පූර්ණ මාසයකට හෝ ඉන් කොටසකට සියයට එක බැගින් වූ අධිභාරයක් අරමුදලට ගෙවීමට ඒ සේවායෝජකයා යටත් වන්නේය.

මීට අතිරේකව උක්ත පනතේ 39 වගන්තිය යටතේ වැරදි හා දණ්ඩන සම්බන්ධයෙන් පහත ප්‍රතිපාදන සලස්වා ඇත.

39 (අ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග කිසිවක් කඩකරන හෝ ඒ අනුව ක්‍රියාකිරීම පැහැර හරින හෝ,

(ආ) මේ පනත යටතේ කරන ලද නැතහොත් දෙන ලද යම් විධානයක් හෝ නියමයක් හෝ අනුව ක්‍රියාකිරීම පැහැර හරින හෝ,

(ඇ) මේ පනතේ 37 වන වගන්තිය යටතේ සැපයීමට නියම කරනු ලැබූ යම් වාර වාර්තාවක් හෝ තොරතුරක් අසත්‍ය බව දැනදැනම සපයන හෝ සැපයීමට සලස්වන,

සෑම තැනැත්තකුම වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේදී වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් වියයුතුය.

පනතේ 37(අ) වගන්තියේ දක්වා ඇති අදාල වාර වාර්තා නියමිත දින පසුවී මණ්ඩලයට ඉදිරිපත් කළහොත් පනතේ විධිවිධාන ප්‍රකාරව ගණනය කරන අධිභාරයන් ජනනය වීම හේතුවෙන් උද්ගතවන අධිභාර මුදලක් ගෙවීම් වගකීම මගහැරීමේ අරමුණින් අදාල සේවායෝජකයින් විසින් පසුගිය කාලයට අදාල වාර වාර්තා ඉදිරිපත් කිරීමෙන් වැළකී දායක මුදල් පමණක් ප්‍රේෂණය කිරීමේ සිද්ධීන් උද්ගතවීමේ හැකියාවක් පැවතිය හැකි බවට නිරීක්ෂණය වුවද ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු මගින් නිශ්චිතව තහවුරු කිරීමකින් තොරව නිගමනයකට එළැඹීම දුෂ්කරය. පනතේ අදාල ප්‍රතිපාදනවලට අනුකූලව සිදුවන මෙම ක්‍රියාවලිය සඳහා මණ්ඩලයේ නිශ්චිත කොට්ඨාශ/අංශයන් කිහිපයක්ම දායක වේ. ඒ සම්බන්ධයෙන් අදාල වන පනතේ ප්‍රතිපාදනයන් අතර ගැටුමක් නොමැති අතර එම ප්‍රතිපාදනයන්ට අනුකූලව කටයුතු කළයුතු වේ.

ඒ අනුව සේවායෝජකයන්ගෙන් අදාල වාර වාර්තා නියමිත දින වනවිට ලබාගැනීමට සහ එම වාර වාර්තා ඉදිරිපත් කිරීම මත අධිභාරයන්ට යටත් කිරීමට අදාල අංශවලින් කටයුතු කරනු ලබයි. එසේම යම් සේවායෝජකයකු පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු නොකර අදාල වාර වාර්තා නියමිත පරිදි මණ්ඩලයට ඉදිරිපත් නොකිරීම වළක්වා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වනවිටත් මණ්ඩලය විසින් ආරම්භ කර ඇත. 39 වන වගන්තියේ සඳහන් වැරදි හා දණ්ඩන සම්බන්ධයෙන් දැනට පවතින ප්‍රතිපාදන සම්බන්ධයෙන් දැනටමත් යෝජිත සංශෝධන පහත පරිදි වේ.

39 (අ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග කිසිවක් කඩකරන හෝ ඒ අනුව ක්‍රියාකිරීම පැහැර හරින හෝ,

(ආ) මේ පනත යටතේ කරන ලද නැතහොත් දෙන ලද යම් විධානයක් හෝ නියමයක් හෝ අනුව ක්‍රියාකිරීම පැහැර හරින හෝ,

(ඇ) මේ පනතේ 37 වන වගන්තිය යටතේ සැපයීමට නියම කරනු ලැබූ යම් වාර වාර්තාවක් හෝ තොරතුරක් අසත්‍ය බව දැනදැනම සපයන හෝ සැපයීමට සලස්වන,

සෑම තැනැත්තකුම වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේදී වරදකරු කරනු ලැබූ විට රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක්, දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් වියයුතුය. එම නියෝගය නිකුත් කළ දින සිට මාස තුනක් ඇතුලත අවස්ථාවෝචිත පරිදි නිවැරදි වාර්තාව හෝ තොරතුරු මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙසද, යම් අසත්‍ය වාර්තාවක් හෝ තොරතුරු සපයන ලද හෝ සැපයීමට සලස්වන ලද තැනැත්තකුට මහේස්ත්‍රාත්වරයා නියෝග කළයුතුය.

තවද, උක්ත පනතේ 43 වන වගන්තියෙන් අමාත්‍යවරයා වෙත සතු කරන ලද බලතල ප්‍රකාර සාදන ලද නියෝග 1981 ජනවාරි 23 වන දින නිකුත් කර ඇති අංක 125 දරන ගැසට් පත්‍රයේ පළවන කොටසේ 3වන නියෝගයේ පහත පරිදි ප්‍රතිපාදන සලස්වා ඇත.

(ආ) 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 22 වගන්තිය ප්‍රකාරව අරමුදලේ සාමාජිකයන්ගේ ගිණුම්වලට 3%ක් වූ අනුපාතයට පොළියක් ආරම්භයේ සිටම බැර කරනු ලැබූ අතර ඊට අමතරව ඉතිරිවන ලාභයෙන් පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව ලාභාංශ ගෙවා තිබේ. ඒ අනුව 2020 සිට 2024 දක්වා වන පසුගිය වරස 05 තුල පොළී සහ ලාභාංශ වශයෙන් පිළිවෙලින් 8%, 7.25%, 8.75%, 10% සහ 10% ක් සාමාජිකයින්ගේ ගිණුම්වලට බැර කර තිබේ. ඒ අනුව 3% අවම පොළී ප්‍රතිශතයට අමතරව ලාභාංශ වශයෙන්ද අතිරික්ත ලාභය 5%, 4.25%, 5.75%, 7%ක් සහ 7%ක් වශයෙන් සාමාජික ගිණුම්වලට බැර කර තිබේ.

## 2.2.4

(අ) සෑම වසර 3කට හෝ 4කට වරක් භාවිතයට නොගැනෙන/අතිරික්ත නිලඇඳුම් අනුමත අපහරණ ක්‍රියාවලිය අනුග මනය කරමින් ගබඩාවෙන් ඉවත්කිරීමට කටයුතු සිදුකෙරේ. එසේම 2018 වසර සිට 2022 වසර දක්වා එසේ එකතු වූ නිලඇඳුම් තොග අපහරණය කිරීමේ කටයුතු ද මේ වනවිට සිදුකෙරෙමින් පවතී.

2018-2022 වසර දක්වා එකතු වූ අතිරික්ත නිලඇඳුම් අපහරණය සම්බන්ධයෙන් මිළ තීරණය කිරීම සඳහා කමිටුවක් පත්කරන ලද අතර ඒ සදහා ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇගලුම් ආයතනයෙහි තාක්ෂණවේදියකුගේ සේවයද ලබාග න්නා ලදි. ඒ අනුව අපහරණය කිරිමට අවශ්‍ය අවම මිළ තීරණය කරන ලදි.

අවම මිළ තීරණය කිරීමේදී එම රෙදිපිළි මිළ, වර්තමාන තත්වය සහ වර්තමාන වෙළෙඳපොලෙහි වටිනාකම පිළිබඳවද සැලකිලිමත් වූ අතර ඒ අනුව අවම මිළ ගණන් තීරණය කරන ලදි.

මෙම රෙදිපිළි අපහරණය කිරීමේදී මණ්ඩලීය කාර්ය මණ්ඩලයට ප්‍රමුඛස්ථානය දියයුතු බව අවධාරණය වූයෙන් සෘජුවම කාර්යය මණ්ඩලයට විකිණීමට ඇති ප්‍රායෝගික අපහසුතාවන් සැලකිල්ලට ගෙන මණ්ඩලය තුල සක්‍රීයව ක්‍රියාත්මක වන සුභසාධන සංගමය මගින් මෙම අවස්ථාව කාර්ය මණ්ඩලයට ලබාදිය හැකි බව නිරීක්ෂණය විය.

ඒ අනුව මණ්ඩලයේ සුභසාධන සංගම් දෙකක් වන ක්‍රීඩා සමාජය සහ අන්‍යෝන්‍යාධාර මිත්‍ර සංගමය ක්‍රියාත්මක වන අතර මිළ ගණන් මෙම සංගම්වලින් කැඳවීමෙන් අනතුරුව වැඩිම මිළ ගණන් ඉදිරිපත් කරන සංගමයට පිරිනැමීමට තීරණය විය.

එහෙත් 2024 වසර මැද තෙක් 'ක්‍රීඩා සංගමය' ක්‍රියාකාරිත්වය යහපත් මට්ටමකින් නොපැවැත්වුණු අතර මේ කාලසීමාවේ මිළ ගණන් කැඳවීම සිදුකළා නම් එක් සංගමයක් පමණක් මිළ ගණන් ඉදිරිපත් වීම තුලින් මිළ තරඟකාරිත්වයක් නොමැතිවීමෙන් මිළ සාධාරණයක් ඇති නොවීමටද ඉඩ තිබුණි.

(ආ) මණ්ඩලය සඳහා වූ නව හරයාත්මක පද්ධති ව්‍යාපෘතියෙහි මෙහෙයුම් පිළිගැනීමේ සැසි 2023 වර්ෂයේ දෙවන භාගය තුල ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. මෙම මෙහෙයුම් පිළිගැනීමේ සැසි ආරම්භ කිරීම සිදුවන විට ඊට අදාල දෘඪාංග (Hardware Devices) මිළදී ගැනීම සිදුකළ යුතු බව ICTA ආයතනය මගින් අවධාරණය කරන ලදි.

ඒ අනුව ශ්‍රමීය අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව ප්‍රසම්පාදනය සිදුකර ඉහත සඳහන් QR Code Scanners සහ QR Code Printers මිළදී ගැනීම සිදුවිය. නමුත් සැලසුම් කළ පරිදි නියමිත කාලසීමාව තුල මෙහෙයුම් පිළිගැනීමේ සැසි ආරම්භ කිරීමට නොහැකි විය.

එහෙත් මේ වනවිට ව්‍යාපාර ක්‍රියාවලි සිතියම් ගත කිරීමට සහ මෘදුකාංග පරිසරය සකස් කිරීමට අදාල ක්‍රියාවලීන් පද්ධතියට අදාල සියලු අංශ සමඟ සිදුකරමින් පවතී. හරයාත්මක පද්ධතිය තුල වැඩිබරක් ගන්නා ක්‍රියාත්මක කිරීමේ මොඩියුලයට (Enforcement Module) අදාල ව්‍යාපාර ක්‍රියාවලීන් ලේඛණගත කිරීම මේ වනවිට 80% පමණ අවසන් කර තිබේ.

තීරණාත්මක මෘදුකාංග අවශ්‍යතා සපුරාලීම සඳහා හැකි ඉක්මනින් ව්‍යාපෘතියට අදාල වැඩකටයුතු නැවත ආරම්භ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියද ලැබී තිබේ.

පද්ධතියේ කටයුතු සාර්ථක කර ගැනීමෙන් අනතුරුව ඉහත දෘඩාංග සියල්ල භාවිතයට ගනු ලැබේ.

මණ්ඩලයේ පහත දැක්වෙන ලේඛණ ප්‍රධාන වශයෙන් පරිලෝකනය කිරීම (Scan) දැනට සිදුකරයි.

- Claim Forms
- Claims Schedule
- R1
- Emp. Corrections (Journals)
- Form II
- Form II Letters
- R4
- Self-Claims
- Self-Claim Schedule
- Surcharge
- Member Cards (Self)
- Registration Form (Self)

මේ සඳහා ක්‍රියාත්මක කිරීමේ (Enforcement) ලේඛණ, නීති ලේඛණ සහ ලිපිගොනුද ඉදිරියේදී එක්කර ගැනීමට අවශ්‍ය කටයුතු දැනට සිදුකරගෙන යනු ලබයි.

දැනට ප්‍රධාන කාර්යාලයේ කොට්ඨාශ කිහිපයකම සහ ප්‍රාදේශීය කාර්යාල 06ක පමණ සක්‍රියව මෙම ලේඛණ පරිලෝකනය කිරීමේ ක්‍රියාවලිය සිදුකරගෙන යනු ලබයි. මෙම ලේඛණ පරිලෝකනය කිරීමේ ක්‍රියාවලිය නැවත විධිමත් ක්‍රියාවලියක් යටතට ගෙන පුළුල් කිරීම ඇරැඹීම සිදුවූයේ 2023 වර්ෂයේ මැද භාගයේය. තවදුරටත් නව ලේඛණ එක්කර ගැනීමෙන් සහ ලේඛණ පරිලෝකනය කරනු ලබන ප්‍රාදේශීය කාර්යාල ගණන වැඩි කිරීමෙන් මෙම ක්‍රියාවලිය පුළුල් කිරීමේ සැලසුම දැනට සිදුකරමින් පවතී. මිළදී ගත් ලේඛණ පරිලෝකන යන්ත්‍රවලින් බොහෝමයක් දැනටමත් භාවිතා කරනු ලබන අතර ගබඩාවේ 2025.05.09 දින වනවිට ඉතිරිව තිබූ යන්ත්‍ර 11ක ප්‍රමාණය ඉහත සැලසුම ක්‍රියාත්මක කිරීමේදී භාවිතයට ගනු ලැබේ.

(ඇ) සැලසුම් කරනු ලැබූ කාලපරිච්ඡේදය තුල ව්‍යාපෘති කටයුතු නිම නොවීමට ප්‍රධාන වශයෙන් කරුණු කිහිපයක් බලපාන ලදි.

- ව්‍යාපෘති කළමනාකාරිත්වය ICTA ආයතනය විසින් දැරූ අතර ව්‍යාපෘති කළමනාකාරිත්වයේ ගැටලු මූලික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රමාදයට බලපෑවේය.
- කොවිඩ් අධිවසංගත තත්වය.
- වෙනස් ඉල්ලුම් (CR) සම්පූර්ණ කිරීමට සැලකිය යුතු කාලයක් ගතවීම.
- තවත් ප්‍රධාන වෙනස්කම් කිහිපයක් පද්ධතිය හා සජීවී යාමට පෙර සම්පූර්ණ කළයුතුව තිබීම.
- මෘදුකාංග පිළිගැනීමේ සැසි (OAT) ආරම්භ කිරීමට පෙර පද්ධතිය පරීක්ෂා කිරීමේදී පද්ධතිය තුල ගැටලු සහ දෝෂ හඳුනාගැනීම.

මෙම ව්‍යාපෘතියේ මෘදුකාංග පිළිගැනීමේ සැසි 2023 වර්ෂයේ දෙවන භාගය තුල ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. මෙම මෘදුකාංග පිළිගැනීමේ සැසි ආරම්භ කිරීම සිදුවන විට ඊට අදාල දෘඩාංග (Hardware Devices) මිළදී ගැනීම සිදුකළ යුතු බව ව්‍යාපෘති කළමනාකාරිත්වය දැරූ ICTA ආයතනය මගින් අවධාරණය කරන ලදි. ඒ වනවිට ව්‍යාපෘතියේ සියළු මොඩියුලයන්ට අදාලව පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ වාර්තාවලට (User Acceptance Testing Report) අප මණ්ඩලයේ අදාල අංශ ප්‍රධානීන් සාර්ථකව අවසන් කර ඇති බවට සහතික කර අත්සන් තබා තිබුණි.

මීට අමතරව මණ්ඩලය තුල දැඩි උපාංග හිඟයක් පැවතීම නිසාවෙන් එදිනෙදා වැඩකටයුතුවලට බාධා එල්ලවූයෙන් ලැප්ටොප් පරිගණක යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර (PC) හා ලේඛණ පරිලෝකන යන්ත්‍රවල (ADF Scanners) දැඩි අවශ්‍යතාවයක් මතුවිය.

ඒ වෙනුවෙන් හඳුනාගත් අවශ්‍යතා ප්‍රසම්පාදන සැලසුමට ඇතුලත් කර රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ලබාග ැනීමෙන් අනතුරුව ප්‍රසම්පාදනය සිදුකර දෘඩාංග උපාංග මිළදී ගැනීම සිදුවිය.

ඉහත දෘඩාංග හරයාත්මක පද්ධති ව්‍යාපෘතිය හා එදිනෙදා වැඩකටයුතු බාධාවකින් තොරව කරගෙන යාම යන කරුණු දෙකම සපුරා ගැනීම සඳහා මිළදී ගත් ඒවා වන අතර ඉහත සඳහන් යන්ත්‍ර හැර අනෙක් සියලු යන්ත්‍ර දැනටමත් ප්‍රයෝජනයට ගෙන තිබුණෙන් මණ්ඩලයේ ඵලදායිතාව ඉහළ දැමීම සඳහා උපයෝගී වී තිබේ. ගබඩාවේ 2025.05.09 දින වනවිට ඉතිරිව ඇති ලේඛණ පරිලෝකන යන්ත්‍ර 11ක ප්‍රමාණය ඉහත සඳහන් කළ සැලසුම ක්‍රියාත්මක කිරීමේදී භාවිතා කරනු ලැබේ. පද්ධතියේ කටයුතු සාර්ථක කර ගැනීමෙන් අනතුරුව ක්ෂණික ප්‍රතිචාර කේත පරිලෝකන යන්ත්‍ර (QR Code Scanners) සහ ක්ෂණික ප්‍රතිචාර මුද්‍රණ යන්ත්‍ර (QR Code Printers) සියල්ල භාවිතයට අවශ්‍ය වේ.

ජාතික ගෙවීම් තලය - National Payment Platform (NPP) හි භාරකාරිත්වය ICTA ආයතනය දරනු ලබයි. එය මෙම පද්ධතිය සඳහා සැපයීම, අවබෝධතා ගිවිසුමේ 3.8 ඡේදයට අනුව ICTA ආයතනයෙහි වගකීමක් වූයෙන් දැනටමත් පද්ධතිය සමග NPP පද්ධතිය හා ඒකාබද්ධ කර තිබේ.

ව්‍යාපෘතිය දියත් කිරීමට පෙර සාමාජිකයන්ට හා සේවායෝජකයන්ට සේවය සැලසීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම පිණිස සේවා ඒකක පිහිටුවීම සඳහා දැනටමත් අවශ්‍ය කටයුතු ආරම්භ කර තිබේ. ව්‍යාපෘතියට අදාලව ඉදිකළ යුතු නව පාරිභෝගික සේවා ඒකකය, පද්ධතියට අනුකූල ලෙස සකස් කිරීමට අදාලව 'නිර්මාණ උපදේශක' තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය මේ වනවිට අවසන් කර තිබෙන අතර ඊට අදාල මූලික නිර්මාණ සැලසුම අප වෙත නිර්මාණ උපදේශක විසින් භාරදී තිබේ. මීට අදාල විස්තීර්ණ සැලසුම අපවෙත ලැබීමෙන් අනතුරුව අදාල ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඉදිකිරීම් ආරම්භ කිරීමට හැකි ඉක්මනින් කටයුතු කරනු ලබයි. මේ වසර තුල මෙහි ඉදිකිරීම අවසන් කිරීමට සැලසුම් කර තිබේ.

සංවර්ධනය කරන ලද නව පද්ධතියේ මෙහෙයුම් පිලිගැනීමේ සැසි (OAT) සිදුකිරීම සඳහා දැනට පවතින පද්ධතියෙන් දත්ත මාරු කිරීම සිදුවිය. ඊට අමතරව එම ක්‍රියාවලියට අයත්ව දත්ත පිරිසිදු කිරීමක්ද (Data Cleanse) සිදුකළ යුතුව තිබුණි. මීට අදාලව අවසාන දත්ත මාරු කිරීම පද්ධතිය සමග සජීවීව යාමට තීරණය කළ දින සිට දින කිහිපයකට කලින් සිදුකළ යුතුව පවතී.

දත්ත මාරු කිරීමට සකස් කර ඇති වැඩසටහන් පිරිවිතරය (Programme Script) නිරවද්‍යතාවය ක්‍රියාත්මක කිරීමට පෙර පරීක්ෂා කළ යුතුය. හුවමාරු වන දත්තවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා ඒ ඒ අංශ නියෝජනය වන පරිදි කමිටුවක් පත්කිරීම දැනටමත් සිදුකර තිබේ.

මෙහෙයුම් පිළිගැනීමේ සැසි (OAT) ආරම්භ කිරීමට පෙර පද්ධතියට අදාලව වැඩ ප්‍රවාහ හඳුනාගැනීම සහ පද්ධති පරීක්ෂණ ක්‍රියාවලියකට භාජනය කිරීම අවශ්‍ය විය. මේ අවස්ථාවේදී පද්ධතියට අදාල වැඩ ප්‍රවාහ නිසි ආකාරයෙන් හඳුනාගෙන ඒවා සියල්ල ආවරණය වන පරිදි පද්ධතිය තුල පරීක්ෂා කර බැලීම ප්‍රමුඛ කාර්ය ලෙස හඳුනාගෙන ඊට අදාලව වැඩ කටයුතු සිදුකරමින් පවතී. ඉන් අනතුරුව දත්ත මාරු කිරීම සහ දත්තවල නිවැරදිතාවය පරීක්ෂා කිරීමේ කටයුතු නැවත ආරම්භ කිරීමට අපේක්ෂිතය.

පද්ධතියට අදාලව බැර නොකළ දායක මුදල් (Unallocated Receipt) හා බිඹන් කෑර සම්බන්ධයෙන් හඳුනාගනු ලැබූ ඉල්ලීම් 02ක් සම්බන්ධ කටයුතු පද්ධතියේ මෙහෙයුම් පිළිගැනීමේ පරීක්ෂණය සාර්ථකව සිදුකර අවසන් කිරීමෙන් පසුව ආරම්භ කිරීමට තීරණය වී තිබේ.

ව්‍යාපාර ක්‍රියාවලි සිතියම් ගත කිරීමට සහ මෙහෙයුම් පරිසරය සකස් කිරීමට අදාල ක්‍රියාවලියන් පද්ධතියට අදාල සියලු අංශ සමඟ එක්වී සිදුකරගෙන යමින් පවතී. හරයාත්මක පද්ධතිය තුල වැඩිබරක් ගන්නා ක්‍රියාත්මක කිරීමේ මොඩියුලයට (Enforcement Module) අදාල ව්‍යාපාර ක්‍රියාවලීන් ලේඛණගත කිරීම මේ වනවිට 80% පමණ අවසන් කර ඇත.

ව්‍යාපෘතියේ වර්තමාන තත්වය සැකවින් පහත දැක්වේ.

**ව්‍යාපෘති තත්ව වාර්තාව**

1. **තාක්ෂණික යෝජනාවේ විමර්ශනය සහ ඇගයීම**
   තාක්ෂණික යෝජනාව පිළිබඳ විශේෂිත විමර්ශනයක් සහ විශේෂ සාකච්ඡා කිහිපයක් පවත්වා තිබේ. එහිදී යෝජිත තාක්ෂණික ව්‍යුහය නවීන කාර්මික ප්‍රමිතීන්ට අනුකූල වන අතර වර්තමාන තාක්ෂණික අවශ්‍යතා සපුරාලිය හැකි බව තහවුරු විය. පිරිවැය කාර්යක්ෂමතාව සැලකිල්ලට ගනිමින් වැඩි පිරිසක් විසින් භාවිතා කරන විවෘත මූලාශ්‍ර මෘදුකාංග විසඳුම් (Open-Source Software Solutions) බොහෝ අවස්ථාවලදී භාවිතා කර තිබේ. මෙම විසඳුම තිරසාර හා පරිමාණය කළහැකි (Scalable) බව සහතික කරයි.

2. **ක්‍රියාවලීන් අතර වෙනස සහ ගැටලු විශ්ලේෂණය**
   ක්‍රියාත්මක කිරීමේ අංශයේ (Enforcement Division) වත්මන් ක්‍රියාවලීන් සහ සංවර්ධනය වෙමින් පවතින Core System පද්ධතියේ ක්‍රියාවන් අතර සැළකිය යුතු සැසඳීමක් සිදුකර තිබේ. එහිදී හඳුනාගත් පරස්පරතාවයන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී සාර්ථකව විසඳිය හැකි ගැටලු පමණක් වූ අතර එම ගැටලු හඳුනාගැනීම සඳහා මුහුණට මුහුණ සාකච්ඡා සහ ව්‍යාපාර ක්‍රියාවලි විශ්ලේෂණ (Business Process Analysis) සිදුකරන ලදි.

3. **පරීක්ෂණ කටයුතු (Testing)**
   පද්ධතිය සත්‍යාපනය කිරීම සඳහා 500කට වැඩි පරීක්ෂණ සිද්ධි (Test Cases) ලේඛණගත කර තිබේ. මෙකී පරීක්ෂණවලින් ප්‍රමාණවත් සාම්පල 2025 මැයි මාසය තුලදී ක්‍රියාත්මක කිරීම් මොඩියුලය (Enforcement Module) සඳහා පරීක්ෂා කිරීමට නියමිතය. මෙයින් ඉතිරිව ඇති තාක්ෂණික ගැටලු හඳුනාගෙන ඒවා විසඳීම අපේක්ෂා කෙරේ.

4. **අවශ්‍යතා රැස්කිරීමේ වාර (Requirement Gathering Sessions)**
   ඉදිරි මාස 2 ක කාලපරිච්ඡේදය තුල ක්‍රියාත්මක කිරීමේ, රැස්කිරීමේ සහ අධිභාර අංශ (Enforcement, Collection and Surcharge Divisions) සඳහා අවශ්‍යතා රැස්කිරීමේ වාර ක්‍රියාත්මක කිරීමට කාලසටහනක් සකස් කර තිබේ.

5. **ව්‍යාපෘති කළමනාකරණ කණ්ඩායම පිහිටුවීම**
   2025 මැයි මාසය අවසන් වනවිට ව්‍යාපෘති කළමනාකරණ කණ්ඩායම පත්කිරීමට නියමිතය.

6. **නව ගිවිසුම**
   දැනට පවතින ගිවිසුම කල් ඉකුත් වී ඇති බැවින් ETFB, ICTA සහ Inova IT Systems (Pvt) Ltd. අතර නව ත්‍රිපාර්ශ්වික ව්‍යාපෘති ගිවිසුම් ගතවීම 2025 ජූනි මාසය තුල අවසන් කිරීම.

(ඈ) 2020.07.03 දිනැති රජයේ ගැසට් පත්‍රයකින් අවුරුදු 30ක බදු පදනම මත ලබාදෙන ලද හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිරිබෝපුර, 90 ග්‍රාම නිලධාරී වසමේ හෙක්ටයාර 0.1012ක් මණ්ඩලය වෙත පවරා දෙන ලදි. 2020 වර්ෂයේ ඇති වූ කොරෝනා අධිවසංගතය හා අනෙකුත් ආර්ථික අර්බුදයන් හමුවේ ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 (02)හි ගොඩනැගිලි ඉදිකිරීම හා කුලියට ගැනීම අහෝසිකර තිබේ. එම සීමාවන් 2023 වර්ෂය සඳහා මෙන්ම 01/2024 ජාතික අයවැය චක්‍රලේඛයේ අනු අංක 07.01 උපඡේදයේ ගොඩනැගිලි ඉදිකිරීම් සීමාකර ඇති බැවින් එය ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් භාවිතා කළ නොහැකි වූ අතර එවැනි සීමාවන් හමුවේ ඵලදායී ලෙස උපයෝජනය කිරීමට මෙතෙක් නොහැකි වී තිබේ.

(ඉ) වාර්ෂිකව අළුත්කිරීමේ පදනම මත රු.මිලියන 500ක් වූ ස්ථාවර තැන්පතු හා ප්‍රතිමිළදී ගැණුම්වල ආයෝජනය කර ඇත්තේ මණ්ඩලයේ ප්‍රධානතම දායක මුදල් රැස්කිරීමේ ගිණුම පවත්වාගෙන යාමේ පහසුකම ලබාදීම වෙනුවෙන් ලංකා බැංකුව සහ මණ්ඩලය අතර ඇති වූ එකඟතාවයක් අනුවය. එසේම එම ආයෝජනය වාර්ෂිකව අළුත්කරන අවස්ථාවේදී ප්‍රතිමිළදී ගැනීම් හා ස්ථාවර තැන්පතු සඳහා රාජ්‍ය බැංකු 3හි එදිනට පවතින පොළී අනුපාත සංසන්ධනය කර වඩා වාසිදායක පොළී අනුපාතය යටතේ ලංකා බැංකුවේ ආයෝජනය කරන ලදි. ඒ අනුව වාර්ෂිකව වෙළඳපොළ පොළී අනුපාතවල විචලනය අනුව පවත්නා පොළී අනුපාත යටතේ එම තැන්පතු පවත්වා ගැනීම සිදුකෙරේ.

මණ්ඩලය වෙත චෙක්පත් මගින් කෙරෙන දායක මුදල් රැස්කිරීම් සඳහා පවත්වාගෙන යනු ලබන ප්‍රධාන බැංකු ගිණුම වන මෙමගින් 2024 වර්ෂයේ චෙක්පත් 496,027ක් සඳහා රු.මිලියන 7,049ක් වටිනා ගණුදෙනු සිදුකර තිබේ. ඊට අමතරව ගිණුමට අදාලව එම වර්ෂයේ අගරු චෙක්පත් 1,583ක වටිනාකම රු.මිලියන 30.5ක් වේ.

මෙම බැංකු ගිණුම පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් විශේෂ පහසුකම් ලංකා බැංකුව විසින් ලබාදී තිබේ.

- දිනකට දෙවරක් ලංකා බැංකුවේ නියෝජිතයෙකු මණ්ඩලය වෙත පැමිණ චෙක්පත් රැගෙන යාම (ප.ව. 12.00 සහ ප.ව. 2.30)
- බැංකු ප්‍රකාශන සහ අගරු චෙක්පත් මණ්ඩලය වෙත භාරදීම.
- බැංකුව වෙත ප.ව.12.00 දක්වා ලබාදෙන චෙක්පත්වල වටිනාකම පසුදින බැංකු ගිණුම් බැර කිරීම සහ අනතුරුව ලබාදෙන චෙක්පත්වල වටිනාකම පසුදින හෝ ඊට පසුදින වනවිට ගිණුමට බැර කිරීම.

මේ අනුව බැංකුව විසින් ලබාදෙන සේවාවන් සහ විශේෂ පහසුකම් සදහා රු.100,000/-ක මාසික සේවා ගාස්තුවක් 2005 වර්ෂයේ එකඟ වී ඇති පරිදි වර්තමානය දක්වා කිසිදු වැඩි කිරීමකින් තොරව මණ්ඩලය විසින් ගෙවීම සිදුකෙරේ.

## 2.3 වෙනත් කරුණු

(අ) ගණුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලට එළැඹීමට අවශ්‍ය උපදෙස් ලබාදී තිබෙන අතර අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.

(ආ) හිඟ පොළී මුදල පියවීම සඳහා ඇල්කඩුව වැවිලි සමාගමෙන් වාරික සැලැස්මක් (Installment Repayment Plan) මේ වනවිට ඉදිරිපත් කර තිබෙන අතර එය අධ්‍යනය කිරීමෙන් අනතුරුව දෙපාර්ශවයේ එකඟතාවය මත එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබේ.

(ඇ) මෙම සමාගම ඈවර කිරීම සදහා 2018 වර්ෂයේදී අධිකරණය විසින් නියෝගයක් ලබාදී තිබෙන මුත් මේ දක්වා ඈවරකරුවකු පත් කොට නොමැත.

පසුකාලීනව මෙම සමාගමේ ණයගැති පාර්ශවයක් විසින් අධිකරණ නියෝගයක් මත රුපියල් මිලියන 42.6ක් වූ මුදලක් මෙම ඈවර කිරීමේ නඩුවේ බැරට තැන්පත් කර තිබේ. එම මුදලින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට අයවීමට ඇති මුදලක් ඇතිනම් එය අයකර ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් 2024.03.12 දින නීතිපති උපදෙස් පතා ලිපියක් යොමුකර තිබේ. මේ පිළිබඳව නිතිපතා පසුවිපරම් කරනු ලබන මුත් මෙතෙක් පිළිතුරක් ලැබී නොමැත. ඒ අනුව එම පිළිතුරද ලැබුණු පසුව, එහි අන්තර්ගතයද සළකා බලා මෙම මුදල සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) i. මෙම පහසුකම ලබාගැනීම සඳහා අනුමැතිය ලබාගැනීමට පවතින දුෂ්කරතා, දැරීමට සිදුවන ප්‍රාග්ධන වියදම් සීමා, නව කාර්ය මණ්ඩල බඳවාගැනීම්වලට පවතින සීමා, පවතින වැටුප් පරිමාවන් යටතේ එම ක්ෂේත්‍රයේ සුදුසුකම්ලත් දක්ෂ නිලධාරීන් බඳවාගැනීම, රඳවාගැනීම සහ නැවත බඳවාගැනීමට ඇති අපහසුව සහ මීට අදාල අනෙකුත් යටිතල පහසුකම් සපයාගැනීමේ පවතින ගැටළු වැනි කරුණු සලකා බලා මෙම පහසුකම රාජ්‍ය බැංකුවක් වන මහජන බැංකුව මගින් කිසිදු වියදමකින් සහ අමතර සේවකයින් යෙදවීමකින් තොරව මෙතෙක් සිදුකරගෙන යනු ලබයි.

ii. මණ්ඩලයේ පවතින කළමනාකරන ධූරාවලියට අනුව මෙවැනි තනතුරක් මෙතෙක් ස්ථාපනය කර නොමැති අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත බඳවාගැනීමේ පරිපාටිය අනුව ආයෝජන කොට්ඨාශයේ ප්‍රධාන තනතුරු සඳහා බඳවාගැනීමේදී, බඳවාගැනීමේ පරිපාටියෙහි සඳහන් අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව වරලත් මූල්‍ය විශ්ලේෂක සුදුසුකමද සපුරා තිබීම එම තනතුරට බඳවාගැනීමේ විශේෂ සුදුසුකමක් ලෙස සලකා දැන්වීම් පළකරනු ලැබේ. එසේ වුවද මෙතෙක් එවැනි තනතුරු පුරප්පාඩු වූ අවස්ථාවල කිසිදු එවැනි සුදුසුකම් සහිත වෘත්තිකයෙකු එම තනතුර සඳහා අයදුම්කර නොතිබුණි.

වර්තමානයේ මණ්ඩලයේ ක්‍රියාත්මක බඳවාගැනීමේ පරිපාටිය අනුව එම තනතුරු සඳහා නියමිත වැටුප් පරිමාව සහ අනෙකුත් ප්‍රතිලාභ සැසඳීමේදී වෙළඳපොලේ වරලත් මූල්‍ය විශ්ලේෂක සුදුසුකම් සහිත තනතුරක් සඳහා ගෙවනු ලබන ඉහළ වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ අතර විශාල පරතරයක් පවතින බව නිරීක්ෂණය වී තිබේ. මෙම කරුණු

සළකා බලා මෙවැනි සුදුසුකම් සහ ආයෝජන ක්ෂේත්‍රයේ ප්‍රමාණවත් විශේෂඥ පළපුරුද්දක් සහිත වෘත්තිකයෙකු උපදේශක මට්ටමෙන් බඳවාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු වී තිබේ.

iii. (1) මෙම කාරණයට අදාල ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට අනුව පෙර පැවැති තත්වය හා පසුකාලීනව එය සංශෝධනය කිරීම නිසා පවතින තත්වය

1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මුල් පනතේ 5(2) වගන්තියෙහි "මණ්ඩලයේ සභාපතිවරයා අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතුය" යනුවෙන් සඳහන් වන අතර එම වගන්තිය "මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා වන මණ්ඩලයේ සභාපතිවරයා, අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන්නේය" යනුවෙන් 1988 අංක (සංශෝධන) 47 පනතින් සංශෝධනය කර තිබේ. ඒ අනුව මෙම සංශෝධනය මගින් සභාපතිධූරය පමණක් දැරෑ තැනැත්තාට සභාපතිධූරයට අමතරව ප්‍රධාන විධායක නිලධාරි තනතුරද හිමිවී තිබේ.

(2) උක්ත කාරණය සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් සිදුකර ඇති නිර්දේශය

මෙම කාරණය සම්බන්ධයෙන් 2016 අගෝස්තු 26 වන දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී පහත සඳහන් නිර්දේශය කර තිබුණි.

"මූල්‍ය ආයතනයක ප්‍රධාන විධායක නිලධාරි තනතුර සහ සභාපති යන තනතුරු දෙකම එකම පුද්ගලයකු විසින් හෙබවීම යෝග්‍ය නොවන බවත් ඒ සම්බන්ධ පනත සංශෝධනය කිරීමකින් මේ තත්වය වෙනස් වියයුතු බවත් කාරක සභාවේ මතය විය".

(3) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශයට අදාලව පනත සංශෝධනය කිරීම සඳහා මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාවන්

මණ්ඩලය විසින් මේ පිළිබඳව පුළුල්ව අධ්‍යයනය කර යථෝක්ත නිර්දේශයට අනුකූලව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 5(2) වගන්තිය සංශෝධනය කිරීමට පහත අයුරින් යෝජනා ඉදිරිපත් කෙරුණි.

- මණ්ඩලයේ සභාපති තනතුර හා ප්‍රධාන විධායක නිලධාරි තනතුර එකම පුද්ගලයකු විසින් දරනවා වෙනුවට එම තනතුරු සඳහා පුද්ගලයින් දෙදෙනෙකු විසින් දැරිය හැකි පරිදි පනත සංශෝධනය කිරීම.
- මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරි වශයෙන් මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිධූරය දරන පුද්ගලයාව පත්කිරීම.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා මණ්ඩලය විසින් ගෙන ඇති පියවර සැකෙවින් පහත පරිදි වේ.

(4) 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත අවසන් වරට 1993 වර්ෂයේදී සංශෝධනය කර ඇති අතර ඒ අනුව පනතේ වගන්ති කිහිපයක්ම සංශෝධනය කිරීම සඳහා 2016 වර්ෂය වනවිට යෝජනා ඉදිරිපත් වී තිබුණි.

උක්ත නිර්දේශය ලැබීමෙන් පසුව 2016 වර්ෂයේ සිට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ඇතුලත් වන විෂයභාර අමාත්‍යවරයා හා රේඛීය අමාත්‍යාංශය අවස්ථා ගණනාවකදීම වරින්වර වෙනස් වූ අතර ඒ අතරතුර කාලයේ ධූරවල සිටි අධ්‍යක්ෂවරුන් හා සභාපතිවරුන්ද අවස්ථා කිහිපයකදීම මේ දක්වා වෙනස් වී තිබේ. තවද පසුගිය කාලයේදී රටේ පැවැති ආර්ථික තත්වය සහ කෝවිඩ් 19 අධිවසංගත තත්වයක් උද්ගතව තිබීමද පනත සංශෝධනය කිරීමේ සමස්ථ ක්‍රියාවලියට අදාල තීරණ ගැනීමේ හා පියවර ගැනීමේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය කෙරෙහි බලපා තිබුණි.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශයට අනුකූලව ඉහත ආකාරයෙන් පනතේ 5(2) වගන්තිය සංශෝධනය සඳහා යෝජනාවද ඇතුලත් සංශෝධන සඳහා 2021.07.26 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලැබුණි. එකී අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සහ යෝජිත සංශෝධන 2021.08.11 දිනැති ලිපිය මගින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමුකරනු ලැබීය.

(5) මුදල් අමාත්‍යංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කැඳවීමක් අනුව මෙම යෝජිත සංශෝධන පිළිබඳව සාකච්ඡාවක් 2021.11.23 දින මුදල් අමාත්‍යාංශයේදී පැවැත්වුණු අතර එහිදී ලැබුණු උපදෙස් හා නිර්දේශ අනුව අදාල යෝජනා නැවත සංශෝධනය කරනු ලැබීය.

(6) ඒ අනුව යෝජිත සංශෝධන අනුමැතිය සඳහා 2022.05.30 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරනු ලැබීය. එහිදී හදිසි අවශ්‍යතාවයක් සේ සළකා ඉලෙක්ට්‍රොනිකව දායක මුදල් හා මාසිකව වාර්තා ඉදිරිපත් කිරීමට අදාල යෝජිත සංශෝධන සඳහා අමාත්‍යවරයා මගින් රෙගුලාසි සකස් කිරීම සුදුසු බවට උපදෙස් ලැබුණු අතර ඒ වනවිට රටේ උද්ගතව පැවැති තත්වය සැළකිල්ලට ගෙන සෙසු යෝජිත සංශෝධන සලකා බැලීම මාස 06ක කාලයක් දක්වා කල්තැබීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදි.

(7) 2022.06.27 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඉහත කී අයුරින් යෝජිත සංශෝධන කිහිපයක් සඳහා රෙගුලාසි සකස් කිරීමට අනුමැතිය ලැබුණු අතර එම තීරණය මහා භාණ්ඩාගාර ලේකම් වෙත යොමුකර අමාත්‍යවරයා මගින් රෙගුලාසි සකස් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස 2022.08.04 හා 2022.12.14 දිනැති ලිපි මගින් ඉල්ලා සිටිනු ලැබීය. ඒ අනුව 2022.12.22 දින අදාල රෙගුලාසි ගැසට් පත්‍රයේ පලකරනු ලැබීය.

(8) 2022.12.19 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මුදල් අමාත්‍යවරයාගේ 2023 අයවැය කථාවේ ඇතුලත්ව තිබූ මණ්ඩලයට අදාල යෝජනාද ඇතුලත් කර නැවත සකස් කරනු ලැබූ පනත සඳහා යෝජිත සංශෝධන කිහිපයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබුණු අතර පනතේ උක්ත 5(2) වගන්තිය සංශෝධනය කිරීම සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යවරයා.ෙන් උපදෙස් ලබාගෙන, එම උපදෙස්වලට අනුකූලව අවශ්‍ය පියවර ඉදිරියේදී ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරනු ලැබූ අතර එම තීරණ මණ්ඩලයේ සභාපතිවරයා විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත 2022.12.21 දිනැති ලිපිය මගින් දැනුම් දී තිබේ. ඒ අනුව මේ වනවිට 2022.12.19 වන දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කළ යෝජිත සංශෝධන, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකර එම සංශෝධනවලට අදාල මූලික කෙටුම්පත සකස් කර තිබේ.

(9) ඉහත සඳහන් අයුරින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත සංශෝධන කිරීමට සමගාමීව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබාදී ඇති උක්ත නිර්දේශයට අනුකූලව සංශෝධනය ක්‍රියාත්මක කිරීම පිළිබඳව 2023.04.24 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කෙරුණු අතර මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අදහස් හා උපදෙස් ලිඛි;ව ලබාගෙන ඊට අදාල අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීමට මණ්ඩලය තීරණය කරනු ලැබීය.

(10) ඒ අනුව 2023.04.24 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඉහත කාරණය සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණය හා යෝජිත සංශෝධන, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත මණ්ඩලයේ සභාපතිවරයා විසින් 2023.05.02 දිනැති ලිපිය මගින් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා යොමු කරනු ලැබීය.

(11) භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් භාණ්ඩාගාරයේ නීති කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සභාපතිවරයාට පිටපතක් සහිතව 2023.05.15 දිනැතිව යොමු කරනු ලැබූ ලිපිය අනුව, මේ වනවිට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත සංශෝධනය සඳහා කෙටුම්පත් කර ඇති මූලික කෙටුම්පතට උක්ත 5(2) වගන්;ය සඳහා යෝජිත සංශෝධනද ඇතුලත් කිරීමට ඇති හැකියාව පිළිබඳව දෙයාා බලන ලෙස දැනුම් දී තිබේ. ඒ අනුව මේ වනවිට මේ සම්බන්ධයෙන් අදාල කටයුතු සිදුකෙරෙමින් පවතී.

(12) එසේම සේවා නියුක්තයන්ගේ භර අරමුදල් පනත සඳහා යෝජිත සංශෝධන පිළිබඳව 2025 ජනවාරි 27 වන දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩලයේ 764 වන රැස්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර මේ කාරණය පිළිබඳව සාකච්ඡා කරනු ලැබීය. ඒ අනුව පනතේ 5(2) වගන්තිය සඳහා යෝජිත සංශෝධනය පිළිබඳව වර්තමාන විෂයභාර නියෝජ්‍ය අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කරනු ලබන බවට තීරණය විය.

මෙම ක්‍රියාවලියේ ප්‍රගතිය පිළිබඳව මණ්ඩලය විසින් අඛණ්ඩව පසුවිපරම් කරමින් පවතී.

(ඉ) Evolve Technologies (Pvt) Ltd. ආයතනය සමඟ නඩත්තු ගිවිසුමකට මේ වනවිට එළඹ තිබේ. ඒ අනුව 2025.02.17 දින සිට බලපැවැත්වන පරිදි නඩත්තු ගිවිසුම ක්‍රියාත්මක වේ.

Core System පද්ධතිය ක්‍රියාත්මක වීම ආරම්භ කර මෙහෙයුම් පිළිගැනීමේ සැසි (OAT) අවසන් කිරීමෙන් පසුව එම පද්ධතිය සමග මෙම Accpac පද්ධතිය ඒකාබද්ධ කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඊ) මෙම ගබඩා පරිශ්‍රය මණ්ඩලයේ ලේඛණාගාරයක් ලෙස පවත්වාගෙන යාමට 2019 වර්ෂයේදී තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් යටතේ පැවැති නාරාහේන්පිට විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරය වෙතින් විධිමත්ව ලබාගෙන තිබූ අතර, 2022 අප්‍රේල් මාසයේ සිට එම ගබඩා ප්‍රාදේශීය නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදුකළ යුතුව පවතී. අවස්ථා කිහිපයකදී ලිපි හා දුරකථන ඇමතුම් ලබාදී අඛණ්ඩව මේ පිළිබඳ විමසීම් කරන ලදි. තවද මේ පිළිබඳව සිහිකැඳවීම් කරමින් අධ්‍යක්ෂ (ඉඩම් සංවර්ධන හා කළමනාකරණ) නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගොස් හමුවී සාකච්ඡා කරන ලදි. එහෙත් ඒ පිළිබඳව පිළිතුරක් නොලැබුණු බැවින් අප විසින් නැවතත් සිහිකැඳවීමේ ලිපියක් 2025.02.17 දින යොමුකර ඇති අතර නැවත දුරකථන ඇමතුම් ලබාදී මේ පිළිබඳ සිහිකැඳවීම් සිදුකරන ලදි. මණ්ඩලය විසින් කුලී පදනම මත ලබාගෙන ඇති මෙම ගොඩනැගිලිවලට අදාලව බදු ගිවිසුම් සකස් කිරීම බදුදීමනාකරු විසින් සිදුකරනු ලබයි. එබැවින් නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රමාදය මත මෙම ගිවිසුම්ගතවීම ප්‍රමාද වී ඇති අතර ගිවිසුමකින් තොරව මෙම මණ්ඩලයට කුලී ගෙවීම් සිදුකළ නොහැකි බැවින් ගාස්තු සඳහා දඩ මුදල්ද එකතු කර තිබේ. මෙකී ගිවිසුම්ගත නොවීමේ ගැටලුව පිළිබඳ මේ වනවිට ද නාගරික සංවර්ධන අධිකාරියේ අදාල නිලධාරීන් සමඟ සාකච්ඡා කරමින් තිබේ.

(උ) සේවයෙන් විශ්‍රාම ගෙන යාම, සේවය අත්හිටුවීම, සේවයෙන් පහකිරීම යන කරුණු හේතුවෙන් මේ වනවිට මෙකී නිලධාරීන් මණ්ඩලීය සේවයෙන් ඉවත් වී ඇති බැවින් ඔවුන්ගෙන් අයවීමට පවතින මුදල් අවසන් ගෙවීම් වලින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. එසේම ලබාගෙන ඇති ණයමුදල් වලට අදාල ගිවිසුම් ප්‍රකාරව අදාල ඇපකරුවන්ගෙන් හිඟමුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලබන අතර මේ සම්බන්ධයෙන් සිහිකැඳවීම් ලිපි යොමුකර තිබේ.

මීට - විශ්වාසී,
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය



**සෝමසිරි ඒකනායක**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
ANNUAL REPORT
2024


EMPLOYEES' TRUST FUND BOARD

19 – 23 Floors, "MEHEWARA PIYESA",
P.O.Box 807, Kirula Road, Narahenpita, Colombo 05.
Tel: 011 7747201 | Fax: 011 2503917
Email: finance@etfb.lk
Web: www.etfb.lk